විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම 2022–2032

ජාතියේ කෘෂි ආර්ථික හා
සංචාරක කේන්ද්‍රස්ථානයේ මහා නගරය

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

විසල් දඹුල්ල
සංවර්ධන සැලැස්ම
2022–2032

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම 2022–2032
© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2022

සියළුම හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රති ප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්‍ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම හෝ බෙදා හැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශනය
නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව-2022
6, 7 හා 9වන මහල් “සෙත්සිරිපාය” බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
2022

වෙබ් අඩවිය - www.uda.gov.lk
ඊමේල් - info@uda.gov.lk
දුරකථනය - + 94112873637

විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම (2022–2032) ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, එය පළමු වෙළුම හා දෙවන වෙළුම වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. එහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර, එය පළමුවන කොටස හා දෙවන කොටස වශයෙන් සඳහන් කර ඇත. මෙහි එකී පළමු වෙළුමේ පළමුවන කොටස මඟින් සංවර්ධන සැලසුම හැඳින්වීම, පසුබිම අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර, එහි දෙවන කොටස මඟින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණ හා පරමාර්ථ, සංකල්පිත සැලැස්ම, සංවර්ධන උපාය මාර්ග සැලසුම් යනාදිය අන්තර්ගත කර ඇත. සංවර්ධන සැලැස්මේ දෙවන වෙළුම වෙනම ප්‍රකාශනයක් ලෙස සකස් කර ඇති අතර, එහි 2022–2032 කාල පරිච්ඡේදය සඳහා බල පවත්වන සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි හා කලාපීයකරණ රෙගුලාසි අන්තර්ගත කර ඇත.

විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම (2022–2032) නාගරික සංවර්ධන අධිකාරියේ මාතලේ දිස්ත්‍රික් කාර්යාලය සැලසුම් අංශය විසින් සකස් කර ඇති අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්ගෙන් හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මඟ පෙන්වීම පෙරදැරි කර ගෙන සිදු කර ඇත.

අධීක්ෂණ කටයුතු
නිමේශ් හේරත් – ***සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය***, නගර නිර්මාණ ශිල්පි එන්. පී. කේ. රණවීර – ***අධ්‍යක්‍ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය***, නගර නිර්මාණ ශිල්පි මහින්ද විතානාරච්චි – ***අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය***, නගර නිර්මාණි ශිල්පි එම්.පි. රණතුංග – ***නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් (සැලසුම්) – කලාප I, නාගරික සංවර්ධන අධිකාරිය***, නගර නිර්මාණ ශිල්පි ප්‍රියාණි නවරත්න – ***අධ්‍යක්‍ෂ උපාය මාර්ගික සැලසුම් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය***, නගර නිර්මාණ ශිල්පි බි.එච්.එම්. රංජිත් බණ්ඩාර – ***කා.නි අධ්‍යක්‍ෂ (මධ්‍යම පළාත) නාගරික සංවර්ධන අධිකාරිය***, නගර නිර්මාණ ශිල්පි ඊ.එම්.එස්.බි. ඒකනායක – ***හිටපු අධ්‍යක්‍ෂ (මධ්‍යම පළාත) – නාගරික සංවර්ධන අධිකාරිය***, නගර නිර්මාණ ශිල්පි එස්.ඒ.එස්.එම්. නිශ්ශංක – ***හිටපු අධ්‍යක්‍ෂ (මධ්‍යම පළාත) – නාගරික සංවර්ධන අධිකාරිය***, නගර නිර්මාණ ශිල්පි වයි.ඒ.ජී.කේ.ගුණතිලක – ***හිටපු අධ්‍යක්‍ෂ (මධ්‍යම පළාත) – නාගරික සංවර්ධන අධිකාරිය.***

සැලසුම් කණ්ඩායම්
නගර නිර්මාණ ශිල්පි එල්.එම්.සමන්ත කුමාර – ***නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (සැලසුම්), මාතලේ දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය***, ඩබ්. එම්. සී. ඕෂධි වීරසිංහ – ***නගර නිර්මාණ ශිල්පි, මාතලේ දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය***, නගර නිර්මාණ ශිල්පි ඩබ්.වි.කේ. ගුණපාල – ***හිටපු නගර නිර්මාණ ශිල්පි, මාතලේ දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය***, අයි.ජී.එන්.පි. තැඹේවත්ත – ***සැලසුම් නිලධාරි, මාතලේ දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය***, ඩි.ඒ.සි. පි.කේ. ආරියරත්න – ***හිටපු සැලසුම් නිලධාරි, මාතලේ දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය***, එච්.එම්.ජී. බණ්ඩාර – ***හිටපු සැලසුම් නිලධාරි, මාතලේ දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය***, කේ.ඒ.එම්.ඩී.එස්. කොඩිතුවක්කු – ***සංවර්ධන නිලධාරී, නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය***, ආර්.එම්.ඩි.වයි. බණ්ඩාර – ***පුහුණු නගර නිර්මාණ ශිල්පි, මාතලේ දිස්ත්‍රික් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය***

සහය කණ්ඩායම්
උපායමාර්ගික සැලසුම් අංශය - *අධීක්ෂණ, නියාමනය සහ ගැසට් කිරීම*
පරිසර හා භූ දර්ශන අංශය - *(පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම, ආපදා අවදානම අවම කිරීමේ සැලැස්ම, සංරක්ෂණය, සංස්කෘතික හා උරුම සැලැසුම් සකස් කිරීම)*
භූගෝලීය තොරතුරු පද්ධති අංශය - *(භූගෝලීය තොරතුරු දත්ත සැපයීම)*
පර්යේෂණ හා සංවර්ධන අංශය - *(නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටන් පැවත්වීම)*

ප්‍රණාමය

විසල් දඹුල්ල නගර සංවර්ධන සැලැස්ම (2022 – 2032) සකස් කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ මාතලේ දිස්ත්‍රික් කාර්යාලය හා අදාළ පාර්ශවකරුවන්ගේ, ආයතනයන්ගේ උපදේශනය ඇතිව සිදු කරන ලද සහයෝගී ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා විවිධ අයුරින් දායක වූ අය බොහෝය.

නිසි වෙලාවට අවශ්‍ය සහයෝගය සහ මග පෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිදුන් හට අපගේ ගෞරවණීය කෘතවේදීත්වය එළ කර සිටිමු. එසේම නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ ලේකම් තුමා ඇතුළු අමාත්‍යාංශයේ සියලුම කාර්යය මණ්ඩලය විසින් සැලසුම් සකස් කිරීමෙහි ලා ලබාදුන් සහයෝගය ගෞරවයෙන් සිහිපත් කර සිටිමු.

දඹුල්ල මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමා, නාගරික කොමසාරිස්තුමා සහ කාර්යය මණ්ඩලය ලබාදුන් සහයෝගය සහ දායකත්වය වෙනුවෙන් අපගේ විශේෂ ස්තුතිය මෙයින් පුද කර සිටිමු.

එසේම, දඹුල්ල, නාඋල, ගලේවෙල, පලාගල හා කැකිරාව යන ප්‍රාදේශීය සභාවල ගරු සභාපතිතුමන්ලා, ලේකම්තුමන්ලා සහ කාර්යය මණ්ඩලය විසින් ලබාදුන් සහයෝගය සහ දායකත්වය වෙනුවෙන් අපගේ විශේෂ ස්තුතිය මෙයින් පුද කර සිටිමු.

මෙහි විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය පුරා අවශ්‍ය දත්ත, අදහස් හා යෝජනා ලබාදීම මගින් දායක වූ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට අපගේ කෘතවේදීත්වය පිරිනමන අතර ලබාදුන් එම සහයෝගය, සැලසුම සාර්ථක කර ගැනීම සඳහා බෙහෙවින් පිටුවහල් වූ බව සිහිපත් කරන්නෙමු. මෙම සැලැස්ම සකස් කිරීම සඳහා මූලික අඩිතාලම යොදමින් විවිධ නව සැලසුම් ශිල්පීය ක්‍රම හඳුන්වා දීම සහ මග පෙන්වීම හරහා දැක්වූ සහයෝගය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියේ හිටපු සභාපති, මොරටුව විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය ජගත් මුණසිංහ මහතා ගෞරවණීය කෘතවේදීත්වයෙන් යුතුව මෙම අවස්ථාවේ සිහිපත් කරන්නෙමු. එසේම පොදු මහජනතාව විසින් මෙම විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම සඳහා ලබාදුන් අදහස් හා යෝජනා හා නිරීක්ෂණයන් වෙනුවෙන්ද විශේෂයෙන්ම පාර්ශවකරුවන්ගේ රැස්වීම්, සාකච්ඡා සහ සංසදවලට සහභාගී වීමෙන් හා වෙබ් අඩවි හා සමාජ මාධ්‍ය හරහා ලබාදුන් සහයෝගය වෙනුවෙන්ද අපගේ ගෞරවණීය ස්තුතිය පුද කර සිටිමු.

එසේම නාගරික සංවර්ධන අධිකාරියේ වත්මන් සභාපති නිමේෂ් හේරත් මහතා සහ අධ්‍යක්ෂ ජනරාල්, වරලත් නගර නිර්මාණ ශිල්පි ප්‍රසාද් රණවීර මහතා මෙම සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය තුළ දැක්වූ අධීක්ෂණය සහ මාර්ගෝපදේශකත්වය ගෞරවණීය කෘතවේදීත්වයෙන් යුතුව සිහිපත් කරන්නෙමු. තවද නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප - I, වරලත් නගර නිර්මාණ ශිල්පි එම්. පී. රණතුංග මහතා ඇතුළු සියලුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වරුන් සහ සියලුම අංශයන්හි අධ්‍යක්ෂවරුන් සැලසුම සකස් කිරීමේ ක්‍රියාවලිය පුරාවට ලබාදුන් දිරිගැන්වීම, අධීක්ෂණය සහ උපදේශකත්වය වෙනුවෙන් අපගේ ස්තුතිය පුදකර සිටිමු.

ගරු අමාත්‍යතුමාගේ පෙරවදන

“විසල් දඹුල්ල” නගර සංවර්ධනය යථාර්ථයක් කරා...

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව “ගම සහ නගරය පිළිබඳ වෙනසක් නැති සැමට අවශ්‍ය සියළු පහසුකම්, සැම තැන්හිම පවතින ආකාරයට අපේ රටේ භෞතික අවකාශය ප්‍රයෝජනයට ගත යුතුයි. ඒ සඳහා නව ප්‍රතිනාගරීකරණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යයය”.

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය හදුනාගත් නගර 26 ක් සඳහා කඩිනම් නගර සංවර්ධන සැලැසුම් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබෙන අතර තවත් නගර 50 ක් සඳහා සංවර්ධන සැලසුම් මෙම වසර තුල සකස්කර නීතිගත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. “විසල් දඹුල්ල” නගර සංවර්ධන සැලැස්ම ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වන විට මෙවැනි නගර සංවර්ධන සැලසුම් 130 කට වැඩි ප්‍රමාණයක් සැකසීම සඳහා සැලසුම්කර ඇත.

විසල් දඹුල්ල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ජාතියේ කෘෂි ආර්ථික හා සංචාරක කේන්ද්‍රස්ථානයේ මහා නගරය ලෙස සංවර්ධනය කිරීමට විභවතාවයක් පවතින බැවින් විසල් දඹුල්ල නාගරික සංවර්ධන කලාපය වන දඹුල්ල, නාඋල, ගලේවෙල, මඩාටුගම, හබරණ, කිඹිස්ස වැනි නගරවලට පමණක් නොව මුළු මහත් ශ්‍රී ලංකාවේම සංවර්ධනයට මෙම සංවර්ධන සැලැස්ම තුළින් දායකත්වය හිමි වේ. එසේම ප්‍රදේශයේ පවතින ස්වාභාවික පරිසර පද්ධතිය, පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද විධිමත්ව කළමනාකරණය කර ගනිමින් සියළු ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදී වෘත්තීයවේදීන්, විශේෂඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර එය නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් හරහා මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවේශයන් ලබාගන්නා ලදී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුළින් විසල් දඹුල්ල සංවර්ධන සැලසුම (2022-2032) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

ප්‍රසන්න රණතුංග
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

ගරු සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමේ මූලික පරමාර්ථය වී ඇත්තේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය හා නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමයි.

ඒ අනුව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ (II අ කොටස) 8 (1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලැසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සාමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් ක්‍රමෝපායන් උපයොගී කර ගනිමින් විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම 2022-2032 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු හඳුනා ගැනීම තුළින් ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීම හා ඒ හරහා උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර තවදුරටත් සංවර්ධන සැලසුම තුළින් සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා නියාමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යතා ඉටු කරනු වස් මෙම සැලැස්ම බලාත්මක කිරීම තුළින් එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන්ගෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටිමි.

විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම නියමිත කාලය තුළ සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. තවද මෙම කර්තව්‍ය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

නිමේෂ් හේරත්
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය.

ගරු නගරාධිපතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ පණිවිඩය

අපගේ විසල් දඹුල්ල බල ප්‍රදේශය; ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 කින් සමන්විත වර්ග කිලෝමීටර් 1070 ක භූමි ප්‍රමාණයක පැතිර යන අතර එම ප්‍රදේශය ඒකාබද්ධ සැලසුම් ප්‍රදේශයක් බවට ඒකාබද්ධ කරමින් පොදු සැලැස්මක් සකස් කිරීමට ගෙන ඇති මූලිකත්වය පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියට අපගේ ප්‍රණාමය පුදකර සිටිමු. මෙම සියලු ප්‍රදේශ එකම සැලැස්මක් අනුගමනය කිරීමෙන්, හවුල් දැක්මක් අනුගමනය කරමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 ම මනා ලෙස සංවර්ධනය කිරීමට අපට හැකි වනු ඇතැයි අපි විශ්වාස කරමු.

අප විසින් ලබා දී ඇති නිර්දේශ, යෝජනා සහ විවේචන ඇතුළත් කරමින් විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම සහයෝගී සහ සහභාගීත්ව ව්‍යායාමයක් බවට පත් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය දරන උත්සාහය අපි අගය කරමු. එබැවින්, අපි එය අපගේ සැලැස්ම ලෙස ප්‍රකාශ කර ඉදිරි වසර දහය තුළ විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අපගේ සහයෝගය සහතික කරමු. එසේම, විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම 2022-2032 මගින් අපේක්ෂා කරන පරිදි පොදු දැක්ම වෙත නගරය මෙහෙයවීම සඳහා තනි පුද්ගල සහ ආයතනික මට්ටමින් ක්‍රියා කරන ලෙස විසල් දඹුල්ල පුරවරයේ සියලුම පුරවැසියන්ගෙන් සහ පාර්ශවකරුවන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

පූර්විකාව

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයට හා උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් කොටසකට අයත් වර්ග කිලෝ මීටර් 1070ක් පමණ වන වාණිජ, කෘෂි ආර්ථිකයක් සහිත ප්‍රදේශයක පැතිරි පවතින විසල් දඹුල්ල ප්‍රදේශය ශ්‍රී ලංකාව මධ්‍යයේ පවතින ඓතිහාසික විකාශනයක් සහිත ප්‍රමුඛතම නගරයක් වේ. රංගිරි දඹුල්ල ලෙන් විහාර සංකීර්ණය, සීගිරිය යන ප්‍රධාන ලෝක උරුමයන්ගෙන් සමන්විත මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ මධ්‍යය නිරූපණය කරන නාලන්දා ගෙඩිගේ, ඉබ්බන්කටුව ප්‍රාග් ඓතිහාසික සොහොන් බිම්, පිදුරංගල, ජාතික නාමල් උයන හා රෝස තිරුවානා කන්ද ආදි ඓතිහාසික පුරාවිද්‍යාත්මක සහ පූජනීය ස්ථාන රැසකින් මෙන්ම ඉහළ සංචාරක ආකර්ශණයක් සහිත ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශය හඳුනා ගත හැක. මෙම කරුණු හේතුවෙන් අවුරුද්ද මුළුල්ලේම ලංකාවේ සියළු ප්‍රදේශයන්ගෙන් මිලියනයක පමණ සංචාරකයින් ප්‍රමාණයක් මෙම ප්‍රදේශයට පැමිණේ. විසල් දඹුල්ල ප්‍රදේශය එහි පවත්නා පුරාවිද්‍යාත්මක වැදගත්කම, ආගමික, සංස්කෘතික සුරක්ෂිතභාවය මෙන්ම ස්වභාවික සෞන්දර්යාත්මක පරිසරයේ සුරක්ෂිතභාවය හා කෘෂි කර්මාන්තය මූලික කරගත් ආර්ථිකය මත පදනම්ව ගොඩ නැගි ඇත.

එබැවින් විසල් දඹුල්ල ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සකස් කර ඇති, මෙම සංවර්ධන සැලසුම මගින් ඉදිරි වසර 10ක කාල සීමාවක් සඳහා එනම්, 2022-2032 වසර දක්වා ප්‍රදේශයේ සංවර්ධනයට මග පෙන්වමින් ඉහළ ආර්ථික, භෞතික සංවර්ධනය තුලින් විසල් දඹුල්ල ස්වභාවික පරිසරය හා දඹුල්ල ඇතුළු ආගමික පුරාවිද්‍යාත්මක ප්‍රදේශයන්හි පූජනීයත්වය ආරක්ෂා කරමින් "ජාතියේ කෘෂි ආර්ථික හා සංචාරක කේන්ද්‍රස්ථානයේ මහා නගරය" බවට මෙම ප්‍රදේශය පත් කිරීම ප්‍රධාන අපේක්ෂාවයි.

මෙම නගර සංවර්ධන සැලසුම සකස් කිරීමේදී ප්‍රදේශයේ පවත්නා භූමි පරිහරණ රටාව, ප්‍රදේශයට පැමිණෙන සංචාරක ජන සංඛ්‍යාව, ආර්ථික රටාව, සෞඛ්‍ය, අධ්‍යාපන, ආගමික හා යටිතල පහසුකම්වල ස්වභාවය, ජනගහණ හා නිවාස ව්‍යාප්තිය, භූ විෂමතාවය, ජලවහන රටාව ආදි ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි අවධානය යොමුකර ඇති අතර, "ජාතියේ කෘෂි ආර්ථික හා සංචාරක කේන්ද්‍රස්ථානයේ මහා නගරය" යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සියළු සංවර්ධන රෙගුලාසි හා උපාය මාර්ගික ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත.

නගර සංවර්ධන සැලසුම ප්‍රධාන කොටස් 02 කින් සමන්විත වන අතර, ඉන් පළමු කොටස තුළ අධ්‍යයන ප්‍රදේශයේ තොරතුරු හා උපාය මාර්ගික සැලසුම් ව්‍යාපෘතීන්ද සංවර්ධන සැලසුමේ දෙවන කොටස තුළ ප්‍රදේශයට අදාල සංවර්ධන රෙගුලාසිද ඇතුලත් කර ඇත.

රාජ්‍ය නිවේදනය

දඹුල්ල මහ නගර සභාව සහ දඹුල්ල ප්‍රාදේශීය සභාව සහ ගලේවෙල ප්‍රාදේශීය සභාව සහ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මම 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2022 අගෝස්තු මස 25 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන දඹුල්ල මහ නගර සභාව සහ දඹුල්ල ප්‍රාදේශීය සභාව සහ ගලේවෙල ප්‍රාදේශීය සභාව සහ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

2022 10 **මස** 31 **වන දින.**

ගැසට් නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2306/09 - 2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා - 2022.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

දඹුල්ල මහ නගර සභාව සහ දඹුල්ල ප්‍රාදේශීය සභාව සහ ගලේවෙල ප්‍රාදේශීය සභාව සහ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මම 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2022 අගෝස්තු මස 25 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන දඹුල්ල මහ නගර සභාව සහ දඹුල්ල ප්‍රාදේශීය සභාව සහ ගලේවෙල ප්‍රාදේශීය සභාව සහ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 11-0134/1

1A - PG 6040— 46 (2022/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

දඹුල්ල මහ නගර සභාව සහ දඹුල්ල ප්‍රාදේශීය සභාව සහ ගලේවෙල ප්‍රාදේශීය සභාව සහ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, දඹුල්ල මහ නගර සභාව සහ දඹුල්ල ප්‍රාදේශීය සභාව සහ ගලේවෙල ප්‍රාදේශීය සභාව සහ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම 2022 ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

ප්‍රසන්න රණතුංග (පා.ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 නොවැම්බර් මස 14 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EO 11-0134/2

දඹුල්ල මහ නගර සභාව සහ දඹුල්ල ප්‍රාදේශීය සභාව සහ ගලේවෙල ප්‍රාදේශීය සභාව සහ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව දඹුල්ල මහ නගර සභාව සහ දඹුල්ල ප්‍රාදේශීය සභාව සහ ගලේවෙල ප්‍රාදේශීය සභාව සහ නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ පලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සහ කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 ඔක්තෝබර් මස 31 දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

නිමේෂ් හේරත්,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය

2022 නොවැම්බර් මස 14 වැනි දින,

EOG 11-0134/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

පටුන

ප්‍රණාමය ... III
ගරු අමාත්‍යතුමාගේ පෙරවදන ... IV
ගරු සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය ... V
ගරු නගරාධිපතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා සභාපතිවරුන්ගේ පණිවිඩය ... VI
පූර්විකාව ... VII
රාජ්‍ය නිවේදනය ... VIII
ගැසට් නිවේදනය ... IX
පටුන ... XI

I වන කොටස ... XV

01 වන පරිච්ඡේදය : සංවර්ධන සැලැස්මේ පසුබිම ... 1

1.1. හැඳින්වීම ... 2
1.2. සැලැස්මේ පාර්ශවකරුවන් ... 3
1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය ... 5
1.4. සැලසුම් ක්‍රියාවලිය ... 7

1.4.1. පසුබිම් අධ්‍යයනය ... 7
1.4.2. විෂය පථය හඳුනා ගැනීම ... 8
1.4.3. සංවර්ධන විභවතා හා ගැටළු හඳුනා ගැනීම ... 8
1.4.4. දැක්ම, අරමුණු හා පරමාර්ථ සකස් කිරීම ... 8
1.4.5. සවිස්තරාත්මක විශ්ලේෂණය ... 8
1.4.6. උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම ... 9
1.4.7. නීති හා රෙගුලාසි සකස් කිරීම ... 9
1.4.8. මහජන අදහස් ලබා ගැනීම සඳහා දළ සැලැස්ම පළාත් පාලන ආයතන වලට ඉදිරිපත් කිරීම ... 9
1.4.9. ලේඛනගත සැලැස්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම ... 9
1.4.10. සංවර්ධන සැලසුම ප්‍රකාශයට පත් කිරීම ... 9

02 වන පරිච්ඡේදය : මූලික අධ්‍යයනය ... 11

2.1. අධ්‍යයන ප්‍රදේශය ... 12
2.2. සැලසුම් සීමාව නිර්ණය කිරීම ... 15

2.2.1. හැඳින්වීම ... 15
2.2.2. ක්‍රියාකාරී සීමාව ... 16
2.2.3. භූ ගෝලීය සීමාව ... 20
2.2.4. පරිපාලන සීමාව ... 23
2.2.5. සැලසුම් සීමාව ... 24

2.3. සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය 24

2.3.1. දේශගුණික හා භූ විෂමතා ලක්ෂණ 24
2.3.2. ඓතිහාසික පසුබිම 26
2.3.3. ජාතික සහ කලාපීය සම්බන්ධතා 29
2.3.4. පෙර සැලසුම් උත්සාහයන් 33
2.3.5. ජාතික සහ කලාපීය ප්‍රතිපත්ති 37

2.4. තත්ත්ව විග්‍රහය 43

2.4.1. ජනගහනය 43
2.4.2. නිවාස ව්‍යාප්තිය 46
2.4.3. භූමි පරිහරණ රටාව 49
2.4.4. ඉඩම් වටිනාකම්, ඉඩම් අයිතිය සහ අනාගත ප්‍රවනතා 51
2.4.5. ආර්ථික පදනම 52
2.4.6. මාර්ග පද්ධති ව්‍යාප්තිය 52
2.4.7. ජල සැපයුම 53
2.4.8. විදුලි බල පහසුකම් 54
2.4.9. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය 55
2.4.10. පාරසරික තත්ත්වය 56
2.4.11. විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශයෙහි පවතින පොදු එළිමහන් විනෝද පහසුකම් 65

03 වන පරිච්ඡේදය : සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය *73*

3.1. හැඳින්වීම 74
3.2. හඳුනාගත් ගැටලු 74

3.2.1. සංචාරක සංවර්ධන පීඩනය සහ පුරාවිද්‍යාව / පරිසරය සංරක්ෂණය අතර සමතුලිතතාවය පවත්වා ගැනීමට නොහැකිවීම. 74
3.2.2. මහ දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සහ මගීන්ට ප්‍රමාණවත් සමාජ හා භෞතික යටිතල පහසුකම් නොමැති වීම. 76
3.2.3 විසල් දඹුල්ල ප්‍රදේශයේ විභවතාවයන් නිසි පරිදි ආර්ථික සංවර්ධනය සඳහා උපයෝගි කර නොගැනීම. 77

3.3. හඳුනාගත් විභවතා 77

3.3.1. ආගමික, සංස්කෘතික හා පුරා විද්‍යාත්මක වශයෙන් හිමිව පවතින ප්‍රමුඛතාවය 77
3.3.2. හොඳින් ස්ථාපිත පුරාවිද්‍යා, පාරිසරික කෘෂි සංචාරක කර්මාන්තය 79
3.3.3. දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය පැවතීම 79
3.3.4. විසල් දඹුල්ල ප්‍රදේශයේ ස්ථානීය වැදගත්කම 79
3.3.5. පවත්නා හා යෝජිත යටිතල පහසුකම් ව්‍යාපෘතිය 79

04 වන පරිච්ඡේදය : සංවර්ධන සැලසුම් රාමුව* *81

4.1. දැක්ම 82
4.2. දැක්මේ ප්‍රකාශණය 82
4.3. ඉලක්ක 84
4.4. අභිමතාර්ථ 84

05 වන පරිච්ඡේදය : ශදුඅත විශ්ලේෂණය* *89

5.1. සංක්ෂිප්ත ශ. දු. අ. ත. විශ්ලේෂණය 90

5.1.1. ඉලක්ක 01 90
5.1.2. ඉලක්ක 02 92
5.1.3. ඉලක්ක 03 94
5.1.4. ඉලක්ක 04 96

5.2. සවිස්තරාත්මක ශ.දු.අ.ත. දත්ත විශ්ලේෂණය 98

5.2.1. ඉලක්ක 01 98
5.2.2 ඉලක්ක 02 121
5.2.3. ඉලක්ක 03 135
5.2.4 ඉලක්ක 04 143

06 වන පරිච්ඡේදය : සංවර්ධන සැලැස්ම* *153

6.1. සංකල්පිත දැක්ම 154
6.2. යෝජිත භූමි පරිහරණ සැලැස්ම 156
6.3. සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග 159

6.3.1. සාමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 159
6.3.2 භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 171

6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ග 186

6.4.1. වාණිජ සැලැස්ම 187
6.4.2. කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම 188
6.4.3. සංචාරක සංවර්ධන සැලැස්ම 189

6.5 තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග 195

6.5.1 යෝජිත පාරිසරික සංරක්ෂණ සැලැස්ම 195
6.5.2 යෝජිත පොදු එළිමහන් විවේක විනෝද පහසුකම් පිලිබඳ අවකාශීය සැලැස්ම 196

6.5.3 ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම 200
6.5.4 තිරසාර පරිසර උපායමාර්ගික සැලැස්ම 203
6.5.5 අනෙකුත් ප්‍රදේශ සඳහා පරිසර සංරක්ෂණ උපාය මාර්ගික ව්‍යාපෘති 206

6.6. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග 209

6.6.1. හැඳින්වීම 209
6.6.2. ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම 209
6.6.3 ව්‍යාපෘති පිළිබඳ විස්තරය 212

II වන කොටස 279

07 වන පරිච්ඡේදය : සංවර්ධන කලාප හා කලාප නියමතා 281

7.1. හැදින්වීම 282
7.2. සංවර්ධන කලාප 283
7.3. කලාප සංගුණකය 284
7.4. සැලසුම් ප්‍රදේශ සඳහා වු පොදු නියමතා 285

08 වන පරිච්ඡේදය : සංවර්ධන කලාප නියමතා 291

8.1. යෝජිත භූමි පරිහරණ කලාප 292
8.2. යෝජිත කලාපීකරණ නියමතා 292

8.2.1. පුරාවිද්‍යා සංරක්ෂිත කලාපය 292
8.2.2. ගුවන් තොටුපල කලාපය 293
8.2.3. පරිසර සංරක්ෂණ කලාපය 294
8.2.4. කර්මාන්ත කලාපය 296
8.2.5. මිශ්‍ර සංවර්ධන කලාපය - I 298
8.2.6. මිශ්‍ර සංවර්ධන කලාපය - II 302
8.2.7. මිශ්‍ර නේවාසික කලාපය 306
8.2.8. සංචාරක සංවර්ධන කලාපය 310
8.2.9. ස්වභාවික තෙත්බිම් සංරක්ෂිත කලාපය 313
8.2.10. කුඹුරු වගා සහ තෙත් බිම් කෘෂිකාර්මික කලාපය 316

උපලේඛනය 318

09 වන පරිච්ඡේදය : යෝජිත මාර්ග පළල, ගොඩනැගිළි සීමා සහ රක්ෂිත 321

9.1. ගොඩනැගිලි සීමා සහ යෝජිත මාර්ග පළල 322

9.1.1. ගොඩනැගිලි සීමා හා යෝජිත මාර්ග පළල - දඹුල්ල 322
9.1.2. ගොඩනැගිලි සීමා හා යෝජිත මාර්ග පළල - ගලේවෙල 325

9.1.3. ගොඩනැගිලි සීමා හා යෝජිත මාර්ග පළල - සීගිරිය 325
9.1.4. ගොඩනැගිලි සීමා හා යෝජිත මාර්ග පළල - නාඋල 327
9.1.5. ගොඩනැගිලි සීමා හා යෝජිත මාර්ග පළල - මඩාටුගම 329

9.2. දුම්රිය සහ අධිවේගී මාර්ග රක්ෂිත 331
9.3. ඇල මාර්ග, ගංගා හා ජලාශ සඳහා රක්ෂිත 332

9.3.1. ජලාශ රක්ෂිත ඉඩම් වල ඉදිකිරීම් කටයුතු - ගලේවෙල 332
9.3.2. ඇල මාර්ග, ගංගා හා ජලාශ සඳහා රක්ෂිත - සීගිරිය 332
9.3.3. ඇල මාර්ග, ගංගා හා ජලාශ සඳහා රක්ෂිත - නාඋල 333
9.3.4. ජලාශ රක්ෂිත ඉඩම්වල ඉදිකිරීම් කටයුතු - මඩාටුගම 334

III වන කොටස *337*

ඇමුණුම් 338

කාර්මාන්ත කලාපය - කලාපීයකරණ මායිම 338
පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය - කලාපීයකරණ මායිම 340
ගුවන් තොටුපල කලාපය - කලාපීයකරණ මායිම 348
මිශ්‍ර සංවර්ධන කලාපය - I - කලාපීයකරණ මායිම 350
මිශ්‍ර සංවර්ධන කලාපය - II - කලාපීයකරණ මායිම 356
සංචාරක සංවර්ධන කලාපය - කලාපීයකරණ මායිම 368
මිශ්‍ර නේවාසික කලාපය - කලාපීයකරණ මායිම 374
කුඹුරු වගා සහ තෙත් බිම් කෘෂිකාර්මික කලාපය - කලාපීයකරණ මායිම 375
ස්වභාවික වන සංරක්ෂණ කලාපය - කලාපීයකරණ මායිම 376

සිතියම් ලැයිස්තුව 377
රූප සටහන් ලැයිස්තුව 379
වගු ලැයිස්තුව 380
ප්‍රස්තාර ලැයිස්තුව 381
පරිශීලිත මූලාශ්‍ර 382

I වන කොටස


12
1
2
3
4
5
6
7
8
9
10
11

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

පරිච්ඡේදය 01
සංවර්ධන
සැලැස්මේ පසුබිම

හැඳින්වීම

1.1. හැඳින්වීම

නගරයක අනාගතය උදෙසා සැලසුම් සකස් කිරීම ආරම්භ වන්නේ අධ්‍යාපන, සමාජ, ආර්ථික, දේශපාලන හා පාරිසරික නිර්නායකයන්ගේ හැසිරීම් ප්‍රවනතාවයක් පාදක කර ගනිමිනි. මෙලෙස නගරයක විකාශය වෙනස්වීම අනිවාර්ය ක්‍රියාවලියක් වන නමුත් නගරයක යහපත් පැවැත්ම සඳහා නිවැරදි ඉදිරි දර්ශනයක් සමග නගරයේ පවතින විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් නව නගර සංවර්ධන අවස්ථාවන් උදාකර දීම හා සංවර්ධන ප්‍රතිලාභ ජනතාවට ලබාදීම අරමුණු කොට ගනිමින් නගර සැලසුම් සකස් කිරීම සිදු කරයි.

ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනයේ නියාමන ආයතනය ලෙස 1978 අංක 41 දරණ පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටවූ අතර 1982 අංක 04 දරණ පනත යටතේ නාගරික ප්‍රදේශයන්හි භෞතික, සාමාජීය, ආර්ථික හා පාරිසරික අංශයන් පිළිබඳ තුලනාත්මකව අගයමින් තිරසාර සංවර්ධනයක් ඇති කරමින් නීති මාර්ගෝපදේශනය ලබාදීම අරමුණු කොට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරියට නාගරික සැලසුම් සකස් කිරීම සඳහා බලතල ලබාදී ඇත. එම පනත ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ නීතිමය රාමුවේ ප්‍රධානතම අංගයක් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රදේශ ගණනාවක්ම නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරන ලදි.

ඒ අනුව විසල් දඹුල්ල සංවර්ධන ප්‍රදේශය වර්ෂ 2005 ජූලි මස 20 වන දින අංක 40/2005 දරණ කැබිනට් සංදේශය මගින් අනුමැතිය ලබා වර්ෂ 2005 නොවැම්බර් 17 වන දින ගැසට් අංක 1419/10 යටතේ නාගරික බල ප්‍රදේශයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රකාශයට පත්විය. සංවර්ධනය සඳහා උචිත විභවයක් ඇති ප්‍රදේශයක සංවර්ධනය, සැලසුම් සහගතව සිදු කිරීම අත්‍යාවශ්‍ය වේ. එම අවශ්‍යතාවය මත විසල් දඹුල්ල සංවර්ධන ප්‍රදේශය තෝරා ගන්නා ලද්දේ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් කොටසක් සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල, කැකිරාව, පලුගස්වැව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් කොටසක් ඇතුලත් වන ආකාරයෙනි. තවද, විසල් දඹුල්ල සැලසුම් ප්‍රදේශය ග්‍රාම නිලධාරි කොට්ඨාශ 200 කින්ද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 6 කින්ද සමන්විත වර්ග කිලෝමීටර් 1070 ක භූමි ප්‍රමාණයක පැතිර යන ප්‍රදේශයකි. එබැවින් මෙම උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම කලාපීය සංවර්ධන සැලැස්මක් ලෙස හඳුන්වයි.

ශ්‍රී ලංකාවේ මධ්‍ය නිරූපණය කරන සංචාරක, ආගමික, වාණිජ වැදගත්කමක් සහිත ප්‍රධානතම ස්ථානයක් ලෙස විසල් දඹුල්ල ප්‍රදේශය විවිධ සමාජ, ආර්ථික, දේශපාලන හා පාරිසරික සාධකයන්ගේ බලපෑම අනුව ඉතා සීග්‍රයෙන් නාගරිකරණය වෙමින් වර්තමානය තෙක් විකාශනය වී ඇති අතර තවදුරටත් විකාශනය වෙමින් පවතින නාගරික ප්‍රදේශයකි.

ඒ අනුව පවතින සංවර්ධන සීග්‍රතාවයන් මත නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාශිත සංවර්ධන ප්‍රදේශයක් වන විසල් දඹුල්ල නාගරික සංවර්ධන ප්‍රදේශයේ ආර්ථික, සමාජ, භෞතික, සංස්කෘතික, ආගමික ලක්ෂණ හා පාරිසරික වටිනාකම් ආරක්ෂා කර ගනිමින් අනාගත තත්වයන් සඳහා දැක්මකට අනුව සිදු කිරීම ඉතා වැදගත් බව හඳුනාගන්නා ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වර්ෂයේදි නාගරික සංවර්ධන අධිකාරිය විසින් ග්‍රාම නිලධාරී වසම් 200 කින් සමන්විත විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශය සඳහා නව උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා මූලික පියවර ගන්නා ලද අතර එය වසර 2022-2032 එනම් වසර 10 ක කාල පරාසයකට අදාල වන අයුරින් සකස් කරනු ලැබේ.

1.2. සැලැස්මේ පාර්ශවකරුවන්

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය සඳහා උපාය මාර්ගික නගර සංවර්ධන සැලසුම සකස් කිරීම සඳහා ප්‍රදේශයේ රාජ්‍ය ආයතන හා වෙනත් සංවිධානවල දායකත්වයෙන් අදහස් හා යෝජනා ලබා ගැනීම සිදු වූ අතර, ඒ සඳහා සම්බන්ධ වූ ප්‍රධාන පාර්ශව ආයතන හා අනෙකුත් පාර්ශව ආයතන පහත පරිදි හඳුනාගත හැකිය.

ප්‍රධාන පාර්ශව ආයතන

1. මහා නගර සභාව - දඹුල්ල
2. ප්‍රාදේශීය සභාව - දඹුල්ල
3. ප්‍රාදේශීය සභාව - නාඋල
4. ප්‍රාදේශීය සභාව - ගලේවෙල
5. ප්‍රාදේශීය සභාව - පලාගල
6. ප්‍රාදේශීය සභාව - කැකිරාව

අනෙකුත් පාර්ශව ආයතන

7. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දඹුල්ල
8. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - නාඋල
9. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගලේවෙල
10. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කැකිරාව
11. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පලාගල
12. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පලුගස්වැව
13. රංගිරි දඹුළු රජමහා විහාරය
14. ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව - දඹුල්ල
15. ශ්‍රී ලංකා ගුවන් හමුදාව - සීගිරිය
16. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

17. මිනින්දෝරු දෙපාර්තමේන්තුව
18. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
19. කලාප අධ්‍යාපන කාර්යාලය
20. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය
21. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
22. ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
23. ලංකා විදුලි බල මණ්ඩලය
24. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
25. මාර්ග සංවර්ධන අධිකාරිය
26. මධ්‍යම පරිසර අධිකාරිය
27. විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය
28. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
29. මධ්‍යම සංස්කෘතික අරමුදල
30. ශ්‍රී ලංකා ටෙලිකොම්
31. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය
32. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
33. දඹුල්ල විශේෂ ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය
34. ගොඩනැගිලි පර්යේෂණ ආයතනය.
35. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
36. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
37. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
38. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
39. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය
40. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
41. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
42. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
43. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
44. මහජන සෞඛ්‍ය නිලධාරී කාර්යාලය
45. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
46. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
47. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
48. මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය
49. ජාතික මිරිදිය ධීවර හා ජලජීවී වගා පුහුණු ආයතනය
50. අපනයන සංවර්ධන මණ්ඩලය
51. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
52. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
53. ශ්‍රී ලංකා හෝටල් සංස්ථාව

පාර්ශව කණ්ඩායම්

54. වෙළඳ සංගමය - දඹුල්ල
55. ත්‍රී රෝද රථ සංගමය - දඹුල්ල
56. පුද්ගලික බස් රථ සංගමය - දඹුල්ල
57. රියදුරු සංගමය - දඹුල්ල
58. රංගිරි දඹුළු කුළී රථ ප්‍රවාහකයින්ගේ සංගමය

1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය

විසල් දඹුල්ල නගර සංවර්ධන සැලසුම සකස් කිරීම වර්ෂ 2020 ජනවාරි මස සිට ආරම්භ කල අතර දෙවසරක් වැනි සීමිත කාල පරිච්ඡේදයක් තුල සැලසුම් කිරීමට නියමිත විය. විසල් දඹුල්ල ප්‍රදේශයේ සන්දර්භය හඳුනා ගැනීම සඳහා ප්‍රදේශයේ සැකැස්ම හා එහි වටපිටාව පිළිබඳ පුළුල් පසුබිම් අධ්‍යයනයක් මගින් විමර්ෂනය සිදුකල අතර, එහිදී විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම වර්ග කිලෝමීටර 1070 කින් සමන්විත නාගරික ප්‍රදේශයට සීමා වන බව හඳුනාගන්නා ලදී. තවද මෙම සංවර්ධන සැලැස්ම මගින් ඉදිරි වසර 10ක කාල පරාසයක් සඳහා සංවර්ධන සැලසුම් හා මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ මධ්‍ය නිරූපනය කෙරෙන සංචාරක, ආගමික හා වාණිජ වැදගත්කමක් සහිත ප්‍රධානතම ස්ථානයක් ලෙස විසල් දඹුල්ල ප්‍රදේශය විවිධ සමාජ, ආර්ථික, දේශපාලන හා පාරිසරික සාධකයන්ගේ බලපෑම අනුව ඉතා සීඝ්‍රයෙන් නාගරීකරණය වෙමින් වර්තමාන ස්වරූපය තෙක් විකාශනය වී ඇති අතර තව දුරටත් විකාශනය වෙමින් පවතින නාගරික ප්‍රදේශයකි.

අන්තර්ජාතික, කලාපීය හා ප්‍රාදේශීය සබඳතා රැසකින් සමන්විත විසල් දඹුල්ල ප්‍රදේශය ලෝක උරුම නගරයක් වන දඹුල්ල හා සීගිරිය යන නගරයන්ගෙන් ද සමන්විත වේ. මීට අමතරව කෘෂි වෙළඳ ආර්ථිකය, සංචාරක කර්මාන්තය පාදක කරගත් විසල් දඹුල්ල ප්‍රදේශයේ නගර සංවර්ධන සැලසුම සකස් කිරීමේදි ජාතික හා ප්‍රාදේශීය සබඳතාවන් ජාතික භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය 2011-2030 හා නව ජාතික භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය 2017-2050 සැලැස්ම පිළිබඳවද අවධානය යොමු කරන ලදි. තවද වර්ෂ 1981 අප්‍රේල් මස 16 වන දින අංක 137 දරණ ගැසට් පත්‍රය මගින් දඹුල්ල රජමහා විහාරය හා ඒ අවට කලාපය පූජා භූමි

පරිච්ඡේදය 01
සංවර්ධන
සැලැස්මේ පසුබිම

සංවර්ධන සැලැස්මේ
විෂය පථය

නගර සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ දඹුල්ල සංස්කෘතික උරුමය හා පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම හා සංරක්ෂණය, වන්දනාකරුවන් සහ සංචාරකයන් සඳහා සුදුසු පරිසරයක් සැකසීම හා පහසුකම් සැපයීම, පූජනීය ස්ථාන හා අවට ප්‍රදේශවල ජන ඝනත්වය පාලනය සහ පූජනීයත්වය ආරක්ෂා කිරීම, ක්‍රමවත් යටිතල පහසුකම් සැපයීම අරමුණු කොට ගනිමින් දඹුල්ල පූජා භූමි ප්‍රදේශය සංරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

පසුව කඩිනම් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය මත නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය යටතේ දඹුල්ල ප්‍රදේශය සුළු නගර සභා ප්‍රදේශයක් ලෙස 1994 මාර්තු මස 28 වන දින අංක 811/17 දරණ ගැසට් අංකය යටතේ ප්‍රකාශයට පත් කරන ලදි.

පසුව දඹුල්ල නගරය කේන්ද්‍ර කර ගනිමින් අවට ප්‍රදේශ වල සිදු වන සීඝ්‍ර සංවර්ධනය සැලකිල්ලට ගෙන 2005 නොවැම්බර් 17 වන වර්ග කි.මී, 1070 ක ප්‍රදේශයක් දින මහා දඹුල්ල නාගරික සංවර්ධන ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්විය.

මේ ආකාරයෙන් විභවතාවයන් රැසක් හිමි විසල් දඹුල්ල ප්‍රදේශයේ ආගමික, සංස්කෘතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික වටිනාකම් ආරක්ෂා කරමින් ජාතික මට්ටමේ සැලසුම් වලට අනුගත වන ලෙස හා ඒ සඳහා උපකාරී වන පරිදි කලාපීය මට්ටමින් අදාල කරගත හැකි සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම අපේක්ෂා කරන අතර, විසල් දඹුල්ල ප්‍රදේශයේ පවත්නා භෞතික, සාමාජීය, ආර්ථික හා පාරිසරික අංශ ඔස්සේ පුළුල් ලෙස අධ්‍යයනය කරමින් ඒවායේ ප්‍රවණතාවයන්ට හා යහ පැවැත්මට අනුකූලව ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් සකස් කිරීමද අරමුණ වන අතර එයට අදාල ව්‍යාපෘති හදුනා ගැනීම, භෞතික සංවර්ධනයේදි අදාල නීති රෙගුලාසි හඳුන්වාදීමටද අපේක්ෂා කෙරේ.

1.4. සැලසුම් ක්‍රියාවලිය

පසුබිම් අධ්‍යයනය

විෂය පථය හඳුනා ගැනීම

සංවර්ධන විභවතා හා ගැටළු හඳුනා ගැනීම

දැක්ම, අරමුණු හා පරමාර්ථ සකස් කිරීම

සවිස්තරාත්මක විශ්ලේෂණය

උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම

නීති රෙගුලාසි සකස් කිරීම

මහජන අදහස් ලබා ගැනීම සඳහා දළ සැලැස්ම පළාත් පාලන ආයතන වලට ඉදිරිපත් කිරීම

ලේඛනගත සැලැස්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම

සංවර්ධන සැලසුම ප්‍රකාශයට පත් කිරීම

රූප සටහන අංක 1.1 : සැලසුම් ක්‍රියාවලිය

1.4.1. පසුබිම් අධ්‍යයනය

විසල් දඹුල්ල නගර සංවර්ධන සැලසුම සකස් කිරීම සඳහා විසල් දඹුල්ල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ප්‍රදේශ පිළිබඳ භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික ආදි සියලු පැතිකඩයන් පිළිබඳ ප්‍රාථමික සමීක්ෂණය හා විමර්ෂණය මූලික භූගෝලීය දත්ත එක්රැස් කිරීම හා සිතියම් සකස් කිරීම පසුබිම් අධ්‍යයනය යටතේ සිදු කරන ලදි. මෙහිදි භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන මණ්ඩලය, විදුලිබල මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වනජීවී හා වන සංරක්ෂණ කාර්යාල, සෞඛ්‍ය ආයතන, අධ්‍යාපන කාර්යාල, විශේෂ ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය, සංචාරක සංවර්ධන අධිකාරිය වැනි විවිධ ආයතන මගින් අවශ්‍ය කරන දත්ත ලබා ගනිමින් විද්‍යානුකූල ක්‍රමයට විශ්ලේෂණය සිදු කරන ලදි.

1.4.2. විෂය පථය හඳුනා ගැනීම

මෙහිදි නාගරික ධුරාවලියට අනුව විසල් දඹුල්ල ප්‍රදේශයේ ස්ථානගත වීම ජාතික මට්ටමේ සැලසුම් මගින් හා ජාතික වශයෙන් නගරයට හිමිව ඇති වැදගත්කම හා ප්‍රදේශයට එමගින් සිදුවන බලපෑම මෙන්ම ප්‍රදේශය තුල විවිධ ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන හා යෝජිත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ අවධානයට ලක් කල අතර ඒ අනුව විසල් දඹුල්ල නගර සංවර්ධන සැලසුම සකස් කිරීමේ අවශ්‍යතාවය හා විෂය පථය හඳුනා ගැනීම සිදු කරන ලදි.

1.4.3. සංවර්ධන විභවතා හා ගැටළු හඳුනා ගැනීම

විසල් දඹුල්ල ප්‍රදේශය පිළිබඳ පසුබිම් අධ්‍යයනය තුලින් හඳුනාගත් ප්‍රවණතා, විභවතා, ගැටළු වලට අමතරව 2018 පෙබරවාරි මස 02 වන දින පැවැත්වූ විසල් දඹුල්ල ප්‍රදේශයේ නගර සංවර්ධනය සඳහා වූ පාර්ශවකරුවන්ගේ සාකච්ඡාව (Stakeholder Meeting) මගින් ද අධ්‍යයනය ප්‍රදේශයේ විවිධ අංශයන් ඔස්සේ පැන නැගි ඇති ගැටළු මෙන්ම ප්‍රදේශයේ සංවර්ධන ප්‍රවණතා හඳුනා ගැනීමත් සංවර්ධන ප්‍රවණතා අනුව සැලසුම් සකස් කිරීමේදි පවත්නා පරතරය හඳුනා ගැනීමක් සිදුකරන ලදි.

1.4.4. දැක්ම, අරමුණු හා පරමාර්ථ සකස් කිරීම

මෙහිදි ප්‍රදේශය තුල පවත්නා සංවර්ධන විභවතාවයන්ගෙන් මනා ලෙස ප්‍රයෝජන ගැනීමක්, ප්‍රදේශය තුල ඇති සංවර්ධනයේ ගැටළුකාරි තත්ත්වයන් මග හරවා ගනිමින් භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික අංශයන්ගේ සමබර සංවර්ධනය තුලින් විසල් දඹුල්ල නගර සංවර්ධනය උදෙසා වන අනාගත දර්ශනයක් (Vision) සකස් කරන ලද අතර ඒ සඳහා උපයෝගි වන අරමුණු (Goals) හා පරමාර්ථයන් (Objectives) සකස් කරන ලද අතර එමගින් විසල් දඹුල්ල නගරයේ සංවර්ධනයේ ඉදිරි දැක්ම ළගා කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රමවත්ව කේන්ද්‍රගත කරන ලදි.

1.4.5. සවිස්තරාත්මක විශ්ලේෂණය

විසල් දඹුල්ල ප්‍රදේශයේ අනාගත දර්ශනය සහ එම දර්ශනය ළගාකර ගැනීමට අවැසි අරමුණු හා පරමාර්ථ ගොඩනැගිමෙන් අනතුරුව එම අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා සවිස්තරාත්මක විශ්ලේෂණය විද්‍යානුකූල ක්‍රමවේදයන් අනුව සිදු කරනු ලැබීය. එහිදි ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන (SWOT) විශ්ලේෂණයට අමතරව ප්‍රදේශයේ විභවතා අධ්‍යයනය (Potential Analysis), පාරිසරික සංවේදිතාව අධ්‍යයනය (Sensitivity Analysis), සංවර්ධන පීඩන අධ්‍යයනය (Development Pressure Analysis) ආදි විශ්ලේෂණ ක්‍රමවේද තවදුරටත් සිදු කරන ලදි.

1.4.6. උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම

මෙම උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමේ අදියර යටතේ විසල් දඹුල්ල ප්‍රදේශය සඳහා ගොඩ නගන ලද ඉදිරි දර්ශනය සාක්ෂාත් කර ගැනීම උදෙසා ගොඩ නගන ලද අරමුණු හා පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන උපාය මාර්ග අනුව භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික අංශයන් ඔස්සේ යෝජිත කලාපීකරණ සැලසුම, යෝජිත සංචාරක සංවර්ධන සැලසුම, යෝජිත කෘෂිකාර්මික සංවර්ධන සැලසුම, යෝජිත සේවා කලමනාකරණ සැලසුම, යෝජිත මාර්ග හා ප්‍රවාහන උපායමාර්ගික සැලසුම, යෝජිත පොදු එළිමහන් විවේක විනෝද පහසුකම් පිළිබඳ අවකාශීය සැලසුම, යෝජිත පාරිසරික සංරක්ෂණ සැලසුම හා ආපදා අවදානම අවම කිරීමේ සැලසුම ආදි සැලසුම් සකස් කරන ලදි.

1.4.7. නීති හා රෙගුලාසි සකස් කිරීම

සංවර්ධන සැලසුම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය පරිදි ගොඩනැගිලි ඉදිකිරීම හා ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් වන නීති හා රෙගුලාසි මෙන්ම සංවර්ධන සැලසුමේ දර්ශනය කරා ළඟාවීම සඳහා ඇති/ඇතිවන ගැටළුකාරි තත්ත්වයන් අවම කර ගැනීම සඳහා ද නීතිමය රාමුවක් සකස් කිරීම මෙහිදි සිදුවිය.

1.4.8. මහජන අදහස් ලබා ගැනීම සඳහා දළ සැලැස්ම පළාත් පාලන ආයතන වලට ඉදිරිපත් කිරීම

සංවර්ධන සැලසුම් සකස් කිරීමෙන් පසු එම සැලසුමට අනුගත වන මහජනතාවගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා යොමු කිරීම මෙහිදි අපේක්ෂා කරයි.

1.4.9. ලේඛනගත සැලැස්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම

ලේඛනගත කරන ලද සැලසුම තවදුරටත් නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් හා යෝජනා ලබා ගැනීම හා අනුමැතිය ලබා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

1.4.10. සංවර්ධන සැලසුම ප්‍රකාශයට පත් කිරීම

මහජන අදහස් ලබා ගැනීමෙන් පසු නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුවේ උපදෙස් අනුව තවදුරටත් සංශෝධනය කරන ලද සංවර්ධන සැලසුම් කෙටුම්පත නිත්‍යානුකූල සංවර්ධන සැලසුමක් ලෙස විෂයභාර අමාත්‍යතුමාගේ අත්සන සහිතව ප්‍රකාශයට පත්කරයි.

02 වන පරිච්ඡේදය

මූලික අධ්‍යයනය

පරිච්ඡේදය 02
මූලික අධ්‍යයනය

අධ්‍යයන ප්‍රදේශය

2.1. අධ්‍යයන ප්‍රදේශය

ශ්‍රී ලංකාවේ මධ්‍ය නිරූපණය කරන මධ්‍යම පළාතේ උතුරින් පිහිටි මාතලේ දිස්ත්‍රික්කය හා උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු සීමාවට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශ කිහිපයකින් සමන්විතව විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය පිහිටා ඇත.

වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 03 වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කය තුල පිහිටි පහත සදහන් නාගරික ප්‍රදේශ මෙම අධිකාරිය යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

මාතලේ මහ නගර සභා සීමාව	*1979 ජූනි 01*	*ගැසට් අංක 38/16*
සීගිරිය (ඉනාමළු කෝරලය)	*1989 ජනවාරි 27*	*ගැසට් අංක 542/10*
දඹුල්ල සුළු නගර සභා ප්‍රදේශය	*1994 මාර්තු 28*	*ගැසට් අංක 811/17*
මහා දඹුල්ල සංවර්ධන ප්‍රදේශය	*2005 නොවැම්බර් 17*	*ගැසට් අංක 1419/10*
පල්ලේපොල නාගරික බල ප්‍රදේශය	*2010 ජනවාරි 17*	*ගැසට් අංක 1435/26*
රත්තොට නාගරික බල ප්‍රදේශය	*2019 සැප්තැම්බර් 24*	*ගැසට් අංක 2142/17*
උකුවෙල නාගරික බල ප්‍රදේශය	*2021 ජනවාරි 04*	*ගැසට් අංක 2209/12*

එමෙන්ම 1981 . 04 . 16 වන දින අංක 137 දරණ ගැසට් පත්‍රය මගින් නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව යටතේ දඹුල්ල රජමහා විහාරය හා ඒ අවට ප්‍රදේශය පූජා භූමි සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. පසුව කඩිනම් නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය මත නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස මෙම අධිකාරිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද්දේ 1994 දීය. මෙම ප්‍රදේශය හෙක්ටයාර් 386 කින් සමන්විත සුළු නගර සභාවක් ලෙස පැවතිනි.

සංවර්ධනය සඳහා උචිත විභවතාවයක් ඇති ප්‍රදේශයක සංවර්ධනය සැලසුම් සහගතව සිදු කිරීම අවශ්‍යතාවය වේ. එම අවශ්‍යතාවය මත දඹුල්ල නගරය ප්‍රධාන කොටගෙන සීඝ්‍රයෙන් සිදුවෙන සංවර්ධනය සහ එම ප්‍රදේශය ඊට උචිතව ඇති විභවතාවය පදනම් කරගෙන දඹුල්ල හා ඒ අවට උප නගර කිහිපයක් සමග විසල් දඹුල්ල සංවර්ධන ප්‍රදේශය හඳුනාගෙන ඇති අතර වර්ෂ 2005 ජූලි මස 20 වන දින අංක 40/2005 දරණ කැබිනට් සංදේශය මගින් අනුමැතිය ලබා 2005 නොවැම්බර් 17 වන දින ගැසට් අංක 1419/10 යටතේ නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් විය.

අධ්‍යයන ප්‍රදේශය

ඒ යටතේ දඹුල්ල නගරය ප්‍රධාන නගරය වශයෙන්ද ගලේවෙල, නාඋල - නාලන්ද, හබරණ - සීගිරිය, මඩාටුගම යන උප නාගරික ප්‍රදේශයන්ගෙන් විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය සමන්විත වේ.

විසල් දඹුල්ල සංවර්ධන ප්‍රදේශය උතුරින් කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, දකුණින් මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, නැගෙනහිරින් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද, බටහිරින් ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්ද මායිම්ව ඇති අතර, මෙය මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කය හා උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට ද අයත් වේ.

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්	*ග්‍රාම නිලධාරී කොට්ඨාශ 59*
ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්	*ග්‍රාම නිලධාරී කොට්ඨාශ 59*
නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්	*ග්‍රාම නිලධාරී කොට්ඨාශ 42*
පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්	*ග්‍රාම නිලධාරී කොට්ඨාශ 16*
පළුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්	*ග්‍රාම නිලධාරී කොට්ඨාශ 05*
කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන්	*ග්‍රාම නිලධාරී කොට්ඨාශ 19*

වර්ග කිලෝමීටර් 1070.87 ක භූමි ප්‍රමාණයක් විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයට අයත් වේ.







සිතියම් අංක 2.1 : විසල් දඹුල්ල ප්‍රදේශයේ පිහිටීම

2.2. සැලසුම් සීමාව නිර්ණය කිරීම

2.2.1. හැඳින්වීම

සැලසුම්කරුවන්ගේ සංජානනය මත පදනම්ව, වැඩිදුර ඇගයීම් සඳහා මූලික සැලසුම් සීමාවන් හඳුනා ගන්නා ලදී. යාබද නගර මධ්‍යස්ථාන සහ දඹුල්ල අතර අන්තර්ක්‍රියා සැලකිල්ලට ගනිමින් සැලකිය යුතු සැලසුම් මායිම හඳුනා ගන්නා ලදී. ගලේවෙල, නාඋල, හබරණ, සීගිරිය සහ මඩාටුගම වැනි කිලෝමීටර 20 ක් පමණ දුරින් පිහිටි නගර ඇගයීමට ලක් කරන ලදී.

තවද, පාරිසරික සංවේදී ප්‍රදේශ, සංචාරක කර්මාන්තයේ වැදගත් ස්ථානය මායිම අර්ථ දැක්වීම සඳහා සැලකිල්ලට ගන්නා ලදී.



***රූප සටහන අංක 2.1 :** සැලසුම් මායිම පිළිබඳ සැලසුම්කරුවන්ගේ සංජානනය*

2.2.2. ක්‍රියාකාරී සීමාව

විසල් දඹුල්ල ප්‍රදේශයේ ප්‍රධානම නාගරික කලාපය වන්නේ දඹුල්ල නගරයයි. මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රධානතම පරිපාලන ආයතන කිහිපයකින්ද සමන්විත මෙම නගරය වෙත පරිපාලන සේවා කටයුතු සඳහා, අධ්‍යාපන කටයුතු සඳහා, වෛද්‍ය සේවාවන් සඳහා මෙන්ම දෛනික පරිභෝජන අවශ්‍යතා සඳහාද ජනයා මෙම නගරය වෙත ඇදී එති.

එසේම ශ්‍රී ලංකාවේ ප්‍රධානතම එළවළු බෙදා හැරීමේ මධ්‍යස්ථානය වන්නේ දඹුල්ල විශේෂ ආර්ථික වෙළද මධ්‍යස්ථානයයි. මෙම ආර්ථික කටයුතු සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක විශාල ප්‍රමාණයකින් වෙළදුන් දිනපතාම දඹුල්ල නගරය කරා ඇදි එති. තවද විසල් දඹුල්ල නාගරික කලාපය ලෝක උරුම ස්ථාන දෙකකින් (සීගිරිය - දඹුල්ල) සමන්විත ශ්‍රී ලංකාවේ ප්‍රධානම සංචාරක සංධිස්ථානය වන අතර දෛනික දෙස් විදෙස් සංචාරකයින් විශාල ප්‍රමාණයක් පැමිණෙන නගරයක්ද වේ.

මෙම සියළු දෙයින් සමන්විත මෙම ප්‍රදේශය තුළ දෛනිකව පැමිණෙන ජනගහනය 170,000 – 200,000 පමණ විවිධ කටයුතු සඳහා අවට ප්‍රදේශ වලින් දඹුල්ල නගරය වෙත පැමිණෙන බැවින් මෙම ප්‍රදේශයේ විසල් දඹුල්ල නාගරික කලාපයේම සේවා ලබා දෙනු ලබන ප්‍රධානතම පෝෂක ප්‍රදේශය (Catchment) ලෙසද වැඩිදුරටත් හදුනාගත හැකිය.

දඹුල්ල නාගරික බල ප්‍රදේශය කේන්ද්‍ර කරගත් විසල් දඹුල්ල නාගරික කලාපයේ තොරතුරු ආශ්‍රයෙන් සිදු කරනු ලැබු සංවර්ධක පීඩක විශ්ලේෂණය (Development Pressure Analysis) අනුව දඹුල්ල නගරයට ප්‍රවේශ වන මහනුවර - යාපනය (A9) මාර්ගය දෙපසත්, අඹේපුස්ස - ත්‍රිකුණාමලය (A6) මාර්ගය දෙපසත්, නාගරික ක්‍රියාකාරකම් බහුල ප්‍රදේශය ලෙස තවදුරටත් එම විශ්ලේෂණයෙන් හදුනා ගන්නා ලදි.

එසේම දඹුල්ල ප්‍රධාන නගරයට යාබද විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශයේ පවතින අනෙකුත් උප නගරවන ගලේවෙල, නාඋල, හබරණ හා මඩාටුගම යන නගර ආශ්‍රිතව ප්‍රධාන මාර්ග දෙපස නාගරික ක්‍රියාකාරකම් ව්‍යාප්තව පැවතීම මෙමගින් හදුනා ගත හැක.

තවද මෙමගින් දැනට පවතින නාගරික ක්‍රියාකාරකම් නාගරික කලාපය තුළ තවදුරටත් එම සීමාවන්ගෙන් ඔබ්බට ව්‍යාප්ත වී යාම වැඩිදුරටත් හදුනා ගත හැක. ඒ අනුව විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශයේ ක්‍රියාකාරිත්ව සීමාවන් දඹුල්ල මහ නගර සභා සීමාව ආශ්‍රිතව මෙන්ම උප නගරයන්හිද සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම හදුනාගත හැකි ප්‍රධාන ලක්ෂණයකි.

පරිච්ඡේදය 02
මූලික අධ්‍යයනය

සැලසුම් සීමාව නිර්ණය කිරීම

ක්‍රියාකාරී සීමාව



රූප සටහන අංක 2.2 : සැලසුම් මායිම පිළිබඳ සැලසුම්කරුවන්ගේ සංජානනය



සිතියම් අංක 2.2 : *සංවර්ධක පීඩක විශ්ලේෂණය*



සිතියම් අංක 2.3 : විසල් දඹුල්ල මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය

2.2.3. භූ ගෝලීය සීමාව

විසල් දඹුල්ල නාගරික කලාපය ශ්‍රී ලංකාව මධ්‍යයේ පිහිටා තිබෙන අතර මෙම කලාපය තුළට කොළඹ සිට අඹේපුස්ස - ත්‍රිකුණාමලය (A6) මාර්ගය ඔස්සේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වෙතත්, මහනුවර සිට මහනුවර - යාපනය (A9) ප්‍රධාන මාර්ගය ඔස්සේ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වෙතත්, අනුරාධපුර සිට මහනුවර - යාපනය (A9) මාර්ගය ඔස්සේ උතුරු දෙසින් කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩාටුගම නගරය වෙතත්, ත්‍රිකුණාමලය සිට නැගෙනහිර දෙසින් අඹේපුස්ස - ත්‍රිකුණාමලය (A6) මාර්ගය ඔස්සේ හබරණ නගරය වෙතත් ළගා වීමෙන් විසල් දඹුල්ල නාගරික කලාපය වෙත පිවිසිය හැක.

මෙම කලාපයේ නැගෙනහිර සීමාව ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුකරයෙන් මායිම් වේ. තවද මෙම ප්‍රදේශයේ උතුරු දෙසින් රෝස තිරුවානා කන්ද පවතී. විසල් දඹුල්ල ප්‍රදේශයේ විශේෂිතම භූ ගෝලීය ලක්ෂණය වන්නේ තැනින් තැන පිහිටි ශේෂ කඳුය. ප්‍රධාන වශයෙන් සීගිරිය, දඹුල්ල ආදී කඳු මෙම ගනයට අයත් වේ.

කඳුකර වියළි කලාපීය වෘක්ෂලතා වලින් සපිරි ස්වභාවික විභවතාවයන් සහිත අනන්‍ය වූ භූ ලක්ෂණයන්ගෙන් හෙබි විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය අතිශය සංවේදී පාරිසරික සාධකයන්ගෙන් යුක්ත වන කලාපයක් ලෙස පාරිසරික අධි සංවේදී කලාපයේ පිහිටීමත්, පාරිසරික සංවේදිතා විශ්ලේෂණය මගිනුත් හදුනාගෙන ඇත. ඒ අනුව සංවර්ධන කටයුතු සඳහා ඔබින භූමි සීමාවන් හදුනාගෙන සංවර්ධන ක්‍රියාවන් සිදු කිරීම හඳුනාගන්නා ලදි.



සිතියම් අංක 2.4 : *භූ විෂමතාවය*



සිතියම් අංක 2.5 : *ජල මූලාශ්‍ර*



සිතියම් අංක 2.6 : *ස්වභාවික වෘක්ෂලතා*



සිතියම් අංක 2.7 : *වනාන්තර ආවරණය*



සිතියම් අංක 2.8 : *විසල් දඹුල්ල ප්‍රදේශයේ සංවේදී පාරිසරික කලාපය*

2.2.4. පරිපාලන සීමාව

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, ගලේවෙල, නාඋල (කොටසක්) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල (කොටසක්), කැකිරාව (කොටසක්), පළුගස්වැව (කොටසක්) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසල් දඹුල්ල සංවර්ධන කලාපයට අයත් වේ.



සිතියම් අංක 2.9 : *විසල් දඹුල්ල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී සීමා මායිම*

2.2.5. සැලසුම් සීමාව

ඒ අනුව, ක්‍රියාකාරී ප්‍රදේශය, භූගෝලීය සීමාවන් හා පරිපාලන සීමාවන් පිළිබඳව සිදු කරන ලද අධ්‍යනයන් අවසානයේ මෙම සියලු කරුණු සැලකිල්ලට ගනිමින් විසල් දඹුල්ල සංවර්ධන සැලසුම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය යටතේ නාගරික බල ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති මහ දඹුල්ල නාගරික බල ප්‍රදේශයට අයත් පරිපාලන සීමාව මේ සඳහා යොදා ගැනීම සුදුසු බව තීරණය විය.

ඒ අනුව, දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශයද, ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයද, දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයද, නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්ද, කැකිරාව ප්‍රාදේශීය සභාවෙන් කොටසක්ද, පලාගල ප්‍රාදේශීය සභාවෙන් කොටසක්ද අයත්වේ. තවද, විසල් දඹුල්ල ප්‍රදේශයෙහි නැගෙනහිර මායිමට ආසන්නව පිහිටා ඇති පාරිසරික සංවේදී කලාපය එහි පවත්නා විභවතාවයන් සැලකිල්ලට ගනිමින් සැලසුම් සීමාව තුළට ඇතුලත් කර-ගෙන ඇත.

2.3. සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය

2.3.1. දේශගුණික හා භූ විෂමතා ලක්ෂණ

වියළි කලාපයට අයත් විසල් දඹුල්ල ප්‍රදේශයේ සෙල්සියස් අංශක 23-33ක සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වයක් පවතින අතර, 1200mm – 1500mm වාර්ෂික වර්ෂාපතනයක් පවතී. වර්ෂයේ වැඩි කාලයක් වියළි කලාගුණයක් පැවතියද වැඩිම වර්ෂාපතනයක් ඔක්තෝම්බර් සිට දෙසැම්බර් මාස වලදී ඊශාන දිග මෝසම් වර්ෂාපතනයෙන් ලැබේ. භූ විෂමතාවය අනුව මාතලේ දිස්ත්‍රික්කය උතුරු දිග තැනිතලා ප්‍රදේශයට අයත් වන අතර මුහුදු මට්ටමේ සිට අඩි 551 (මීටර් 168) ක උසින් පිහිටා ඇත. මෙම ප්‍රදේශයේ ප්‍රධාන භූ විෂමතා ලක්ෂණ ලෙස ශේෂ කඳු පිහිටීම හඳුනාගත හඳුනාගත හැක.

මේ අතර සීගිරිය, දඹුල්ල හා අරංගල කන්ද ආදි කඳු කැපී පෙනේ. මෙම කඳු මුදුන් සෑම එකක්ම පාහේ පහසුවෙන් ජීර්ණය නොවන ග්‍රැනයුලයිට් පාෂාණ වලින් සමන්විත වේ. මෙම ප්‍රදේශයේ රතු දුඹුරු හියුමස් පස ප්‍රධාන වශයෙන් දක්නට ලැබේ. මාතලේ නකල්ස් කඳු වැටිය කේන්ද්‍ර කර උතුරු දෙසට විහිදී යන කඳු වැටිවල අවසාන කොටස් බටහිර සහ උතුරු දිශාවෙන් දඹුල්ල නාගරික ප්‍රදේශයට දිස්වේ. මෙම ප්‍රදේශයේ තුල ස්වාභාවික හා රක්ෂිත කැළෑ ප්‍රධාන වශයෙන් පවතින අතර, කොහොඹ, බුරුත, පළු, වීර, සියඹලා හා කරුවල යනාදිය වියළි කලාපයට අයත් වෘකෂලතා ප්‍රධාන වශයෙන් දක්නට ලැබේ.

එමෙන්ම, ප්‍රදේශය පුරා පැතිරුණු ජල මූලාශ්‍ර ජාලයක් ව්‍යාප්තව ඇත. ඒ අතරින් ප්‍රධාන වශයෙන් ඉබ්බන්කටුව ජලාශය, දඹුළුඔය, බෝවතැන්න ජලා-ශය, දේවහුව ජලාශය, කළා වැව, කණ්ඩලම ආදිය කැපී පෙනේ.



සූචිය

- විසල් දඹුල්ල මායිම

භූ විෂමතාවය

- 781 - 855
- 707 - 781
- 633 - 707
- 559 - 633
- 485 - 559
- 411 - 485
- 337 - 411
- 263 - 337
- 189 - 263
- 115 - 189

විසල් දඹුල්ල ප්‍රදේශයේ භූ විෂමතාවය

විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශය

නාගරික සංවර්ධන අධිකාරිය
මාතලේ දිස්ත්‍රික් කාර්යාලය
දඹුල්ල
නොවැම්බර් 2020

සැලසුම් අංශය | විසල් දඹුල්ල නගර සංවර්ධන සැලැස්ම (2022 - 2032)

සිතියම් අංක 2.10 : *විසල් දඹුල්ල ප්‍රදේශයේ භූ විෂමතාවය*



***සිතියම් අංක 2.12 :** විසල් දඹුල්ල ප්‍රදේශයේ දේශගුණික කලාප*

2.3.2. ඓතිහාසික පසුබිම

මහ දඹුල්ල නාගරික ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිව යයි. එනම් දඹුළුගල පාමුල පිහිටි ඉබ්බන්කටුව ප්‍රදේශයෙන් හමු වූ වසර 2500 කට වඩා වැඩි පැරණි ඉතිහාසයකට හිමිකම් කියන ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ යක්ෂ ගෝත්‍රික නායකයන්ගේ මෘත දේහයන් සහිත සොහොන් හා තඹ රන් කූරක බහාලන ලද මැටි බඳුන් හමුවීමෙන් මේවා ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් බව පුරාවිද්‍යාඥයින් විසින් තහවුරු කර ඇත.

එමෙන්ම ඇඹුල් අඹේ ප්‍රදේශයෙන් හමුවූ සෙල් ලිපියකට අනුව ක්‍රි.පූ 1 වන සියවසේ පමණ මෙම ප්‍රදේශය ජනාවාසව පැවති බවටත් “රජ” යන අභිධානයෙන් හඳුන්වන ලද පුද්ගලයෙකු මෙම ප්‍රදේශය පාලනය කළ බව එහි සඳහන් වේ.

යටත් විජිත සමයට පෙර සමය ගැන සැලකූ විට ක්‍රි.ව. 1 වන සියවසේ රජකල වට්ටගාමිණී අභය හෙවත් වළගම්බා රජු විසින් ද්‍රවිඩ ආක්‍රමණිකයන්ගෙන් පැරදී සැඟව සිටියදී දඹුලු ලෙන් විහාරය කරවා ඇති බව පූජාවලියේ සඳහන් වේ.

පණ්ඩුකාභය කුමරා අනුරාධපුර රාජධානිය පිහිටුවාගත් පසු ඔහුගේ මයිලනුවන්ගෙන් අයෙකු වූ ගිරිබණ්ඩශිව මාතුල ජනපදයේ පාලනය භාරදුන් අතර දඹුල්ල ප්‍රදේශය අයත් වූයේ මෙම ජනපදයටය. ආර්ය ජනයාගෙන් ක්‍රම ක්‍රමයෙන් දඹුල්ල ප්‍රදේශය ජනාවාස වූ අතර අනුරාධපුර රාජධානියට ආසන්න ප්‍රදේශයක්වූ බැවින් උසස් ජන දිවියක් මෙම ප්‍රදේශයේ පැවතුනු බවට වර්තමානයේ දක්නට ලැබෙන නටඹුන් වලින් පැහැදිලි වේ.

ලක්දිව බුදුදහම ලැබීමත් සමග බෞද්ධ ජීවන මාර්ගයකට නැඹුරු වූ ජනයා බොහෝ ගිරි ලෙන්වල දැකුම්කළු පිළිම ගෙවල් හා විහාර කර්මාන්ත කරවා වත් පිළිවෙත් කරවන ලදි. එඬේරගල, පිදුරංගල, සීගිරිය වැනි ලෙන් විහාරවල අදද මෙම ශ්‍රී විභූතිය මනාව පිළිබිඹු වේ.

එමෙන්ම සෙල් ලිපි රාශියක් ද මෙම ප්‍රදේශයේ විසිරී ඇති අතර ක්‍රි. පූ. 01 වන සියවසට අයත් බ්‍රාහ්මීය අක්ෂර සහිත සෙල් ලිපි කිහිපයක් දඹුල්ල, සීගිරිය, පිදුරංගල හා කළුදිය පොකුණ අවට ප්‍රදේශවලින් සොයා ගෙන ඇත. තවද මැණික්දෙන නැමති ස්ථානයේ ඇති පුරාවස්තු මගින් ප්‍රදේශයට අභිමානයක් ගෙන දේ.

ක්‍රි. ව. 477 සිට 495 දක්වා කාලය තුල රජකල 1 වන කාශ්‍යප රජු අනුරාධපුරය තම රාජධානිය කර ගැනීම මගින් තමාගේ ආරක්ෂාව කෙරෙහි බලපෑම් ඇති විය හැකි බව වටහාගත් අතර තම අග නගරය ලෙස සීගිරිය තෝරා ගන්නා ලදී. ඔහුගේ පාලන සමය, දඹුල්ල මෙන්ම මාතලේ ප්‍රදේශයේද ඉතිහාසයේ ස්වර්ණමය අකුරින් ලියවුණු කාල පරිච්ඡේදයකි. එතෙක් කලක් විහාරයක්ව පැවති සීගිරිය මහානර්ඝ අගනුවරක් බවට පත් කරවීමේ ගෞරවය 1 වන කාශ්‍යප රජුට හිමිවේ.

එම අගනුවරට ආරක්ෂාව සලසා ගැනීම පිණිස ප්‍රතාපවත් බල කොටුවක් කරවූ හෙතෙම ඊට කලාත්මක හා සාහිත්‍යමය වටිනාකමක් එක් කරමින් නිමකල සීගිරි බිතු සිතුවම් හා කුරුටු ගී අදද සුරැකිව පවතී. එමෙන්ම සීගිරි නිර්මාණ ආශ්‍රිතව ජලාපවාහන පද්ධතිය තවද නූතන ඉංජිනේරු තාක්ෂණයට අභියෝගයක්ව පවතී.

ක්‍රි.ව. 1055 ක්‍රි.ව. 1110 රජකල පළමුවන විජයබාහු රජ දවස මෙම ප්‍රදේශය “දඹුල්ල” ලෙස ස්ථාපිත විය. “දඹ” යනු ගල ලෙසත් “උල්ල” යනු උල්පත ලෙසත් හඳුන්වා ගලෙන් වෑහෙන උල්පත යනුවෙන් “දඹ - උල්ල” පසුව “දඹුල්ල” ලෙස හඳුන්වන ලදි.

ක්‍රි.ව.1132 ක්‍රි.ව. 1153 කාලයේ රජකල දෙවන ගජබා රජ දවස දඹුල්ල අයත් වූයේ රජරට රාජධානියටය. පරාක්‍රමබාහු කුමරා ප්‍රථම වරට රජුගේ යුධ ශක්තිය පිළිබඳ එතුමාගේ සෙන්පතියෙකු සමග රහසේ කුමන්ත්‍රණය කර ඇත්තේ මැණික්දෙන දීය. පසු කාලේකදී ගජබා රජු පරාජය කොට රට එක්සේසත් කිරීමට පරාක්‍රමබාහු රජු සමත් විය.

පරාක්‍රමබාහු රජ සමයේද රාමඤ්ඤ දේශය යටත්කර ගැනීමේ සටන මෙහෙය වූ සෙන්පතිවරු දෙදෙනාගෙන් කෙනෙකු වූ කීර්ති නගරසිරිගේ නිජබිම ඇරැවුල අසල දෙවනගල, නුවරගල ප්‍රදේශයයි. ඔහුගේ මෙම දක්‍ෂතාවය ඇගයීම කරනු වස් පරාක්‍රමබාහු රජු විසින් සැකසූ ප්‍රසාද සෙල් ලිපියක් මෙම ප්‍රදේශයෙන් හමු වී ඇත. ඇරැවුල අසල පිහිටි මෙම කඳුගැටයේ අද ද පොළොන්නරුව යුගයට අයත් ගොඩනැගිලි රාශියක නටඹුන් විසිර පවති. මෙම පුවත චූල වංශයේද සදහන් වේ.

ක්‍රි.ව. 1187 ක්‍රි.ව. 1196 කීර්ති ශ්‍රී නිශ්ශංක රජ සමයේදි දඹුළු ලෙන් විහාරයේ රන්පත් ගල්වා අලංකාර කොට තම පිළිරුවක්ද එහි ස්ථාපිත කර ඇත. මෙතැන් සිට දඹුළු විහාරය රංගිරි දඹුළු විහාරය ලෙස හැදින්වූ බව සදහන් වේ.

මෙම කාලයේ සිට මහනුවර යුගයේ දෙවන රාජසිංහ යුගය දක්වා කාලය තුල (ක්‍රි.ව 1635- ක්‍රි.ව 1697) දඹුල්ල ප්‍රදේශය පිලිබද සදහනක් ඉතිහාසයේ සදහන්ව නැති අතර, එම යුගයේ දි ප්‍රාදේශිය රජවරුවන් විසින් මෙම ප්‍රදේශය පාලනය කල බව සැලකිය හැක.

යටත් විජිත පාලන යුගයේදි දඹුල්ල ප්‍රධාන මං සන්ධි ජනාවාසයක් ලෙස පැවතුණි. මීට ප්‍රධාන හේතුවක් වන්නේ ත්‍රිකුණාමලය වරායත් මහනුවරත් සම්බන්ධ කෙරෙන මාර්ගය දඹුල්ල ඔස්සේ පැවතීමයි. පසුව 1830 දී දඹුල්ල ඔස්සේ කුරුණෑගලත්, ත්‍රිකුණාමලයත් සම්බන්ධ කෙරෙන ප්‍රධාන මාර්ගය ඉදිකිරීම හා 1831 දී මාතලේ දඹුල්ල මාර්ගය විධිමත්ව සංවර්ධනය කිරීමත් සිදුකර ඇත.

1848 දි ඉංග්‍රීසින්ට එරෙහිව දියත් කෙරුණු දෙවන කැරැල්ලට නායකත්වය සපයන ලද්දේ දඹුල්ල ප්‍රදේශයෙනි. මෙම කැරැල්ල මෙහෙය වීමට මූලික වූ ගොංගාලේ ගොඩ බණ්ඩා 1848.07.20 වන දින දඹුළු විහාරයේ දි රාජාභිෂේක කරන ලදි. මෙම කැරැල්ලේ සියලුම සේවා සංවිධානය කරන ලද්දේ දඹුල්ල ප්‍රදේශයේ දීය.

නිදහසින් පසු සමයේ පැරණි පළාත් පාලන රටාවක් පැවති කාලයේ සුළු නගර සභාවක් වශයෙන් දඹුල්ල පාලනය විය.

වර්ෂ 1982 දී දඹුල්ල රජමහා විහාරය සහ අවට ප්‍රදේශය පූජා නගර සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව යටතේ අත්පත් කරගෙන පූජා භූමි නගරයක් ලෙස සංවර්ධනය කරන ලදි.

1987 දී ඇති කරන ලද ප්‍රාදේශීය සභා පනත යටතේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්විය.

1994 දී දඹුල්ල සුළු නගර ප්‍රදේශය මෙම අධිකාරිය යටතේ නාගරික ප්‍රදේශයක් වශයෙන් පත්විය.

පසුව දඹුල්ල නගරය හා ඒ අවට ප්‍රදේශයේ සිදුවන සීඝ්‍ර සංවර්ධනයට අදාලව “විසල් දඹුල්ල සංවර්ධන ප්‍රදේශය” 2005 නොවැම්බර් මස 17 වන දින ගැසට් මගින් ප්‍රකාශයට පත්කරන ලදි.

2.3.3. ජාතික සහ කලාපීය සම්බන්ධතා

දඹුල්ල නගරයේ සිට ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර වලට A6 හා A9 ප්‍රධාන මාර්ග හරහා පහත දුරවල් වලින් සම්බන්ධ වේ.

- දඹුල්ල - කුරුණෑගල (A6) - 58.2 km
- දඹුල්ල - අනුරාධපුර (A9) - 65 km
- දඹුල්ල - මහනුවර (A9) - 72 km
- දඹුල්ල - ත්‍රිකුණාමලය - 106 km
- දඹුල්ල - මන්නාරම - 171 km
- දඹුල්ල - කොළඹ (A6) - 160 km
- දඹුල්ල - යාපනය (A6) - 243 km



සිතියම් අංක 2.13 : *ජාතික සහ කලාපීය සම්බන්ධතා*

තවද, ජාතික වශයෙන් හඳුනාගත් නාමල් උයන හා රෝස තිරුවානා කන්ද, දඹුල්ල ලෙන් විහාරය, සීගිරිය, නාලන්දා ගෙඩිගේ සහ දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානය මෙම ප්‍රදේශයේ පිහිටා ඇත. මෙහි පවත්නා පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වැදගත්කම නිසා ජාතික වශයෙන් දඹුල්ල නගරය හඳුනාගෙන තිබේ. සැලසුම් ප්‍රදේශය ජාතික සංස්කෘතික ත්‍රිකෝණය තුළ පිහිටා ඇත.

මීට අමතරව සීගිරියෙහි පිහිටා ඇති ගෘහස්ථ ගුවන් තොටුපල, රංගිරි දඹුළු ක්‍රීඩාංගණය ජාතික වශයෙන් වැදගත්කමක් උසුලයි.



***සිතියම් අංක 2.14 :** ජාතිකමය වශයෙන් වැදගත් ස්ථාන*

විසල් දඹුල්ල ප්‍රදේශයේ වැදගත් ස්ථාන

***රූප සටහන අංක 2.3 :** විසල් දඹුල්ල ප්‍රදේශයේ වැදගත් ස්ථාන*

විසල් දඹුල්ල ප්‍රදේශය තුළ සම්බන්ධතා සැලකීමේදී, දඹුල්ල නගරයට ආසන්නයෙන් පහත දැක්වෙන නගර පිහිටා ඇත.

- දඹුල්ල - මඩාටුගම - 11km
- දඹුල්ල - ගලේවෙල - 18km
- දඹුල්ල - නාඋල - 22km
- දඹුල්ල - කැකිරාව - 22km
- දඹුල්ල - හබරණ - 23km



සිතියම් අංක 2.15 : *ප්‍රාදේශිය මාර්ග සම්බන්ධතා*

2.3.4. පෙර සැලසුම් උත්සාහයන්

1. පූජා භූමි සංවර්ධන සැලැස්ම (1981)

දඹුල්ල ප්‍රදේශයෙහි ප්‍රථම සංවර්ධන මැදිහත්වීම සිදුකර ඇත්තේ පූජා භූමි සංවර්ධන සැලැස්ම මගිනි. දඹුල්ල ලෙන් විහාරය ආශ්‍රිතව වර්ග කිලෝමීටර් 2.2 ක පමණ භූමි ප්‍රමාණයක් මෙම සැලැස්මෙන් ආවරණය කර ඇත. එහි ප්‍රධාන අරමුණු වී ඇත්තේ, මහජන උපයෝගිතා සහ යටිතල පහසුකම් සැපයීමෙන් රට තුළ ආගමික වැදගත්කමක් සහ ඓතිහාසික වටිනාකමක් ඇති පූජනීය ප්‍රදේශ සංරක්ෂණය කිරීම, එවැනි ප්‍රදේශවල වාසය කරන ජනතාවගේ ජීවන රටාව වැඩි දියුණු කිරීම හා තිරසාර සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ වෙනත් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ආදියයි.



රූප සටහන අංක 2.4 : *පූජා භූමි සංවර්ධන සැලැස්ම (1981)*

මෙම සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගත් ප්‍රධාන ව්‍යාපෘතීන් වන්නේ උඩවැව සංවර්ධනය කිරීම, හරිත තීරුව සංවර්ධනය, කඩ 50 සංවර්ධනය, සංචාරක තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම. කණ්ඩලම මංසන්ධිය සංවර්ධනය ආදියයි. මේ වන විට මෙම ව්‍යාපෘති වලින් 50% ක පමණ ප්‍රමාණයක් 2020 වන විට නිම කර ඇත.



රූප සටහන අංක 2.5 : *හඳුනාගත් ප්‍රධාන ව්‍යාපෘතීන් - පූජා භූමි සංවර්ධන සැලැස්ම (1981)*

2. නාගරික සංවර්ධන අධිකාරිය සහ නගර හා ග්‍රාම සැලසුම් දෙපාර්තමේන්තුවෙන් දඹුළු නගරය සඳහා සිදුකළ සැලසුම (1994)

මෙම සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගත් ව්‍යාපෘතීන් පහත පරිදි වේ. මේ වන විට මෙම ව්‍යාපෘතින්ගෙන් 40% ක පමණ ප්‍රමාණයක් 2020 වන විට සම්පූර්ණ කර ඇත.

- පූජනීය ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය.
  - නේවාසික සහ වාණිජ ස්ථානගත කිරීම.
  - හරිත පටි ව්‍යාපෘතිය.
  - පහසුකම් සහ තොරතුරු මධ්‍යස්ථාන.
  - උඩ වැව නැවත සංවර්ධනය කිරීම.
  - කණ්ඩලම හන්දිය වැඩිදියුණු කිරීම.
  - විකල්ප මාර්ගය අඛණ්ඩව සංවර්ධනය කිරීම.
- බස් නැවතුම සංවර්ධන ව්‍යාපෘතිය.
- අභ්‍යන්තර මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය.
- පොදු විවෘත අවකාශ සංවර්ධනය.
- රජයේ ආයතන සඳහා ඉඩම් වෙන් කිරීම.
- කෘෂිකාර්මික වෙළඳපොල.
- මූල්‍ය ආයතන සඳහා ඉඩම් වෙන් කිරීම.
- පොදු වැසිකිළි පහසුකම් සැපයීම.

- නේවාසික හා මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා ඉඩම් වෙන් කිරීම.
- එළිමහන් රංග ශාලාවක් සැපයීම.
- සිනමා ශාලා සංවර්ධනය.
- කාර්මික සංවර්ධනය සඳහා ඉඩම් වෙන් කිරීම.



***රූප සටහන අංක 2.6 :** සංවර්ධන සැලසුම් සිතියම*

පරිච්ඡේදය 02
මූලික අධ්‍යයනය

3. විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම (2013 – 2020)

මෙම සංවර්ධන සැලැස්ම විසල් දඹුල්ල ප්‍රදේශය සඳහා කොටස් 05 කින් යුතුව සැලසුම් කර ඇත. එහිදී ප්‍රධාන නගර මූලික කරගනිමින් දඹුල්ල, නාවුල, ගලේවෙල, මඩාටුගම සහ සීගිරිය හබරන නගර සඳහා සංවර්ධන සැලසුම් වෙන වෙනම පිලියෙල කර ඇත. සංවර්ධන සැලැස්ම යටතේ යෝජනා කර ඇති කලාපී සැලසුම් අනුව විසල් දඹුල්ල ප්‍රදේශය මිශ්‍ර සංවර්ධන කලාපය, මිශ්‍ර නේවාසික කලාපය, පුරාවිද්‍යාත්මක කලාපය, කෘෂිකාර්මික කලාපය හා වන සංරක්ෂණ කලාපය ලෙස වෙන්කර ඇත.



රූප සටහන අංක 2.7 : *මහා දඹුල්ල සංවර්ධන සැලැස්මේ (2013-2020) කොටස්*

2.3.5. ජාතික සහ කලාපීය ප්‍රතිපත්ති

1. ජාතික භෞතික සැලැස්ම 2017 – 2050

ජාතික භෞතික සැලැස්ම 2017 – 2050 ට අනුකූලව දඹුල්ල ප්‍රදේශය නැගෙනහිර - බටහිර ආර්ථික කොරිඩෝවේ පිහිටා ඇත. A6 මාර්ගය දෙපස කිලෝමීටර් 30 ක පමණ දිගක් විසල් දඹුල්ල ප්‍රදේශය තුළ නැගෙනහිර - බටහිර ආර්ථික කොරිඩෝවට අයත් වේ. මෙම ආර්ථික කොරිඩෝව තුළ 2050 වර්ෂයේදි මිලියන 8ක පමණ ජනගහනයක් අපේක්ෂිතය.

ජාතික භෞතික සැලැස්මට අනුව දඹුල්ල නගරය 'මහා නගරයක්' ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව අපේක්ෂිත ජනගහනය මිලියන 0.5 ක් පමණ වේ. තවද, විසල් දඹුල්ල ප්‍රදේශයෙහි බටහිරින් පිහිටා ඇති වනාන්තර ප්‍රදේශය මධ්‍යම පරිසර සංවේදී ප්‍රදේශයට අයත් වේ.



සිතියම් අංක 2.16 : *ජාතික භෞතික සැලැස්ම 2017 – 2050*



සිතියම් අංක 2.17 : *අපේක්ෂිත ජනගහනය ව්‍යාප්තිය 2017 – 2050*



සිතියම් අංක 2.18 : *ජාතික භෞතික සැලැස්ම 2017 – 2050 හි විසල් දඹුල්ල නගරයේ හි පිහිටීම*

යෝජිත ජාතික භෞතික සැලැස්මෙහි (2017 – 2050) ප්‍රවාහන යෝජනා යටතේ නව කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගයක් දඹුල්ල හරහා හඳුනාගෙන ඇත. මෙහිදී දුම්රිය නැවතුම් ස්ථාන ගලේවෙල, දඹුල්ල හා හබරණ නගර ආශ්‍රිතව හඳුනාගෙන ඇත.

කොළඹ සහ කුරුණෑගල, දඹුල්ලට සම්බන්ධ කරමින් නැගෙනහිර අධිවේගී මාර්ගය ජාතික භෞතික සැලැස්ම යටතේ යෝජනා කර ඇත. 2030 වන විට දඹුල්ල දක්වා අධිවේගී මාර්ගය ඉදිකිරීමට කටයුතු සැලසුම් කර ඇත. මෙහි යෝජිත අන්තර් හුවමාරු ගලේවෙල හා දඹුල්ල නගර ආශ්‍රිතව හඳුනාගෙන ඇත. තවද, ප්‍රධාන මහා මාර්ග ලෙස දඹුල්ල - අනුරාධපුර මාර්ගය, දඹුල්ල - ත්‍රිකුණාමල මාර්ගය, දඹුල්ල - පොළොන්නරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජිතය.



***සිතියම් අංක 2.19 :** යෝජිත ප්‍රවාහන සැලසුම*
(යෝජිත ජාතික භෞතික සැලැස්ම (2017 – 2050)

ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති යටතේ පහත කර්මාන්ත දඹුල්ල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

- කෘෂිකර්ම හා කෘෂි පාදක කර්මාන්ත
  - කෘෂි පාදක කර්මාන්ත පොකුරු
    - යෝජිත කෘෂි සැකසුම් ප්‍රදේශ
    - මැවිලි පදනම් කරගත් මධ්‍යස්ථානය
- ධීවර හා මාළු සැකසුම් හා අගය එකතු කිරීමේ කර්මාන්ත
  - ධීවර හා මාළු සැකසුම් මධ්‍යස්ථානය
- ඛනිජ හා පතල් පදනම් කරගත් කර්මාන්ත
- සේවා අංශයේ කර්මාන්ත
  - සේවා පදනම් කරගත් කාර්මික පොකුරු
    - සේවා පදනම් කරගත් කර්මාන්ත
    - සංචාරක ප්‍රමුඛතා ප්‍රදේශ
      - සංචාරක ස්ථාන
      - උරුම අඩවි
- නවෝත්පාදන හා දැනුම පදනම් කරගත් කර්මාන්ත
- නවෝත්පාදන හා දැනුම පදනම් කරගත් මධ්‍යස්ථාන



සිතියම් අංක 2.20 : *ආර්ථික සංවර්ධන සැලසුම (යෝජිත ජාතික භෞතික සැලැස්ම (2017 – 2050)*

2. *රජයේ ප්‍රතිපත්ති 2032*

රජයේ ප්‍රතිපත්ති 2032 අනුව සම්බන්ධ වන නගරයක් (Connec-ting city) ලෙස දඹුල්ල හඳුනාගෙන ඇත. දඹුල්ල, බහු-මාන වාණිජ නගර (Multidimensional city) ලෙස හඳුනාගෙන ඇති කොළඹ, යාපනය, හම්බන්- තොට හා ත්‍රිකුණාමලය නගර සමග පහත දුරවල් වලින් සම්බන්ධ වේ.

- දඹුල්ල - කොළඹ - 160 Km
- දඹුල්ල - යාපනය - 243 Km
- දඹුල්ල - ත්‍රිකුණාමලය - 106 Km
- යාපනය - හම්බන්තොට - 284 Km



සිතියම් අංක 2.21 : *රජයේ ප්‍රතිපත්ති 2032 මගින් හඳුනාගත් නගර*

පරිච්ඡේදය 02
මූලික අධ්‍යයනය

සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය

ජාතික සහ කලාපීය ප්‍රතිපත්ති

3. ශ්‍රී ලංකා සංචාරක උපායමාර්ගික සැලැස්ම (2017 - 2020)

ශ්‍රී ලංකාවේ සංචාරක මණ්ඩලය විසින් දඹුල්ල, සීගිරිය, හබරණ ප්‍රදේශ ප්‍රධාන සංචාරක කේන්ද්‍රස්ථානයක් ලෙස හඳුනා ගෙන ඇත.



සිතියම් අංක 2.22 : ශ්‍රී ලංකා සංචාරක උපායමාර්ගික සැලැස්ම (2017 - 2020)

2.4. තත්ත්ව විග්‍රහය

2.4.1. ජනගහනය

2.4.1.1. ජනගහන ව්‍යාප්තිය

විසල් දඹුල්ල ප්‍රදේශයේ වර්ෂ 2001 හා 2012 වර්ෂ වල ජනගහනය සැළකීමේදි වර්ෂ 2001 ජනගහනය 191,329 ක් වන අතර 2012 ජන හා සංඛ්‍යා ලේඛනයට අනුව ජනගහනය 213,190ක් වේ. එය 2018 වසර වන විට 249,920 ක් බව සංඛ්‍යා ලේඛන අනුව හඳුනාගත හැක. එමෙන්ම විසල් දඹුල්ල ප්‍රදේශයේ ස්වභාවික වාර්ෂික ජන සංඛ්‍යා වර්ධන වේගය 1.54 % පමණ වන අතර විසල් දඹුල්ල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව ජන සංඛ්‍යා ව්‍යාප්තිය පහත පරිදි හඳුනාගත හැක.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	2001	2012	2018 (සම්පත් පැතිකඩ දත්ත)
දඹුල්ල	61,230	72,026	83,723
ගලේවෙල	61,999	69,715	81,037
නාඋල	22,948	26,760	30003
කැකිරාව	21,191	20,528	24,924
පලාගල	16,283	18,643	21,670
පළුගස්වැව	7,678	5,518	8,563
එකතුව	**191,329**	**213,190**	**249,920**

වගු අංක 2.1 : *විසල් දඹුල්ල ප්‍රදේශයේ ජනගහනය 2001 – 2018*
මූලාශ්‍රය : *ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා සම්පත් පැතිකඩ 2018*

2.4.1.2. ජනගහන පුරෝකථනය

ගණනය කරන ලද ජනගහන වර්ධන වේගය අනුව, 2030 දී ජනගහනය 300,000 කට ආසන්න අගයක් වනු ඇත. ඉදිරි දශක සඳහා ජනගහන වර්ධන වේගය එලෙසම පවතිනු ඇතැයි උපකල්පනය කරන ලදී.

වර්ෂය	ජනගහනය	ස්වභාවික ජනගහන වර්ධන වේගය
2001	191,329	1.54%
2012	213,190	
2018	249,920	
2030	298,471	

වගු අංක 2.2 : *ජනගහන පුරෝකථනය*
මූලාශ්‍රය : *ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා සම්පත් පැතිකඩ 2018*



සිතියම් අංක 2.23 : *ජනගහන ව්‍යාප්තිය 2001*



සිතියම් අංක 2.24 : *ජනගහන ව්‍යාප්තිය 2012*



සිතියම් අංක 2.25 : *ජනගහන ව්‍යාප්තිය 2017*



සිතියම් අංක 2.26 : *ජනගහන ව්‍යාප්තිය 2030*

2.4.1.3. ජනගහන ඝනත්වය

ප්‍රදේශයේ ජන ඝනත්වය සැළකිමේදි වර්ෂ 2018 වන විට වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 231 ක ප්‍රමාණයක් හදුනාගත හැක.

විසල් දඹුල්ල ප්‍රදේශය	*2001*	*2011*	*2019*
මුළු ජනගහනය	*191,329*	*213,190*	*249,920*
වර්ග කිලෝමීටරයට ජන ඝනත්වය	*178*	*199*	*233*

වගු අංක 2.3 : *ජන ඝනත්වය*
මූලාශ්‍රය : *ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා සම්පත් පැතිකඩ 2018*

2.4.1.4. නගරයට පැමිණෙන ජනගහනය

දෛනික පාවෙන ජනගහනය දඹුල්ල නාගරික ප්‍රදේශයේ පමණක් 170,000ක ප්‍රමාණයක් හදුනාගත හැකි අතර විසල් දඹුල්ල ප්‍රදේශයේ වැඩිම ජනගහනයක් දඹුල්ල, ගලේවෙල හා හබරණ යන ග්‍රාම සේවා වසම් ආශ්‍රිතව හදුනාගත හැක.

2.4.1.5. ජන වර්ග අනුව ජන සංයුතිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	*සිංහල*	*ද්‍රවිඩ*	*මුස්ලිම්*	*වෙනත්*
දඹුල්ල	*80,231*	*1,000*	*2,448*	*43*
ගලේවෙල	*68,933*	*1,368*	*10,681*	*55*
නාඋල	*28,375*	*1,440*	*177*	*10*
කැකිරාව	*19,886*	*127*	*4,900*	*12*
පලාගල	*18,999*	*78*	*2,592*	*1*
පළුගස්වැව	*8,373*	*163*	*16*	*23*

වගු අංක 2.4 : *ජන වර්ග අනුව ජන සංයුතිය*
මූලාශ්‍රය : *ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා සම්පත් පැතිකඩ 2018*

2017 වර්ෂයේ විසල් දඹුල්ල ප්‍රදේශයේ ජනගහනයට අනුව මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස 90% ක සිංහල ජන වර්ගය නියෝජනය කරන අතර මුස්ලිම් ජනගහනය 8% ක්ද, ද්‍රවිඩ ජනගහනය 2% ක් ද නියෝජනය වේ.

ජාතීන් අනුව ජන සංයුතිය



ප්‍රස්තාර අංක 2.1 : *ජාතීන් අනුව ජන සංයුතිය*

2.4.1.6. ස්ත්‍රී/පුරුෂ භාවය අනුව ජනගහනය

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය	*2001*	*%*	*2012*	*%*	*2017*	*%*
ස්ත්‍රී	*97.202*	*51*	*109,061*	*51*	*112,503*	*49*
පුරුෂ	*91,936*	*49*	*105,943*	*49*	*118,292*	*51*

වගු අංක 2.5 : *ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනය*
මූලාශ්‍රය : *ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා සම්පත් පැතිකඩ - 2017*

2.4.2. නිවාස ව්‍යාප්තිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	*2001*	*2011*	*2018*
දඹුල්ල	*16,593*	*19,190*	*24,624*
ගලේවෙල	*17,598*	*18,817*	*23,834*
නාඋල	*6,360*	*7,563*	*8,824*
කැකිරාව	*5,822*	*6,475*	*7,224*
පලාගල	*4,762*	*5,375*	*6,728*
පළුගස්වැව	*1,942*	*1,990*	*2,473*
එකතුව	***53,437***	***59,410***	***73,708***

වගු අංක 2.6 : *නිවාස ව්‍යාප්තිය 2001-2011*
මූලාශ්‍රය : *ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා සම්පත් පැතිකඩ - 2018*

2.4.2.1. නිවාස ඝනත්වය

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයේ නිවාස ඝනත්වය පිළිබඳ සලකා බැලීමේදි දඹුල්ල, ගලේවෙල හා හබරණ ඉහළ නිවාස ඝනත්වයක් පෙන්නුම් කරන නගර ලෙස සැළකිය හැක. මෙහිදි ප්‍රධාන වශයෙන් දඹුල්ල නගරය කේන්ද්‍ර කර ගනිමින් ප්‍රදේශයේ මිනිසුන් ජනාවාස පිහිටුවා ගෙන ඇති බව හදුනාගත හැක.

සමාජීය හා භෞතික පහසුකම් ජනාවාස ඇතිවීම කෙරෙහි බලපෑමක් ඇති කරන බව ඉන් වඩාත් පැහැදිලි වන කරුණක් වන අතර නගරයෙන් ඔබ්බට වන්නට නිවාස ඝනත්වය අඩු වී යන බව පෙනි යයි. ඊට ප්‍රධාන හේතුව වශයෙන් භෞතික හා සමාජීය අපරව්‍යුහ පහසුකම්වල නොදියුණු බව මෙන්ම ස්වභාවික වන රක්ෂිත හා ජලාශයන්හි පිහිටීම හදුනාගත හැක.

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය	*2001*	*2010*	*2018*
මුළු නිවාස	*53,437*	*59,410*	*73 708*
වර්ග කිලෝමීටරයට නිවාස ඝනත්වය	*50*	*55*	*69*

වගු අංක 2.7 : *නිවාස ඝනත්වය*
මූලාශ්‍රය : *ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා සම්පත් පැතිකඩ - 2018*



සිතියම් අංක 2.27 : *නිවාස ඝනත්වය 2001*



සිතියම් අංක 2.28 : *නිවාස ඝනත්වය 2011*



සිතියම් අංක 2.29 : නිවාස ඝනත්වය 2017



සිතියම් අංක 2.30 : නිවාස ඝනත්වය 2032

2.4.2.2 ස්වභාවය අනුව නිවාස ව්‍යාප්තිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ස්ථිර	අර්ධ ස්ථිර	තාවකාලික	නිවාස නොමැති
දඹුල්ල	18,112	3,467	1,100	368
ගලේවෙල	16,226	3,736	1,072	955
නාඋල	6,407	921	160	121
කැකිරාව	5,018	2,177	186	616
පලාගල	4,400	818	871	0
පළුගස්වැව	1,887	177	48	0
එකතුව	**55,050**	**12,167**	**3,437**	**2,060**

වගු අංක 2.8 : ස්වභාවය අනුව නිවාස ව්‍යාප්තිය
මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා සම්පත් පැතිකඩ 2018

ඒ අනුව විසල් දඹුල්ල ප්‍රදේශයේ ස්ථිර නිවාස 75% ක ප්‍රමාණයක්ද, අර්ධ ස්ථිර නිවාස 16% ක ප්‍රමාණයක්ද, තාවකාලික නිවාස 5% ක්ද නිවාස නොමැති පවුල් ගණන 4% ක්ද ලෙස හඳුනාගත හැක.

2.4.3. භූමි පරිහරණ රටාව

අධ්‍යයන ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී. 1070 ක් පමණ වන අතර භූමි පරිභෝජන රටාව අනුව සමස්ථ භූමියෙන් 35% පමණ ප්‍රමාණයක් රක්ෂිත වනාන්තර, ජලාශ හා පාෂාණ වලට අයත් වේ. අනෙකුත් සියළු භූමි පරිභෝග රටාවන් විවිධාංගීකරණය වී ඇත්තේ සමස්ථ භූමියෙන් 65% ක පමණ ප්‍රමාණයක් ඇතුළත්ය. තවද අධ්‍යයන ප්‍රදේශය අධි පාරිසරික සංවේදී ප්‍රදේශයට අයත් වන අතර අධ්‍යයන ප්‍රදේශයේ නැගෙනහිර ප්‍රදේශයේ වනාන්තර ඝනත්වය වැඩි අගයක් පෙන්නුම් කරයි.



සිතියම් අංක 2.31 : *විසල් දඹුල්ල ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව - 2020*

2010 සිට 2020 යන වසර 10ක කාල සීමාව තුළ වනාන්තර සහ ලඳු කැලෑ, කුඹුරු, වෙනත් කෘෂිකර්ම, පාෂාණ, වගුරු බිම් ගහණයෙහි අඩුවීමක්ද, ගොඩනැගිලි සහ ගෙවතු වගා ප්‍රදේශ 5.5% ක පමණ වර්ධනයක්ද හඳුනාගත හැක. තවද, දත්ත රැස්කිරීමෙහි පැවතිය හැකි ගැටළු හේතුවෙන් ඇතැම් භූමි පරිභෝජන රටාවන්හි සුළු වෙනස් වීම් දැකගත හැකිය.

අනු අංකය	භූමි පරිභෝජනය	2010		2020		
		භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)	%	භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)	%	වෙනස (%)
1	පුරාවිද්‍යා	1,073.30	0.98%	1,073.30	0.98%	0.00%
2	ගුවන්	55.93	0.05%	55.93	0.05%	0.00%
3	ගොඩනැගිලි	893	0.82%	1929	1.76%	0.94%
4	වනාන්තර සහ ලඳු කැලෑ	42,715.32	39.08%	41,761.09	38.20%	-0.88%
5	ගෙවතු	20,599.68	18.84%	25,270.47	23.12%	4.28%
6	වෙනත් කෘෂිකර්ම	13,798.31	12.62%	13,220.41	12.09%	-0.53%
7	කුඹුරු	21,873.72	20.01%	18,049.49	16.51%	-3.50%
8	පාෂාණ	828.4	0.76%	777.46	0.71%	-0.05%
9	වගුරු බිම්	1,672.05	1.53%	1,372.56	1.26%	-0.27%
10	ජලාශ	5,801.47	5.31%	5,801.47	5.31%	0.00%
	මුලු එකතුව	**109,311.18**	**100.00 %**	**109,311.18**	**100.00%**	**0.00%**



__වගු අංක 2.9 :__ භූමි පරිහරණ රටාව වෙනස්වීම (2010–2020)
__මූලාශ්‍රය :__ භූගෝලීය තොරතුරු පද්ධති අංශය, නාගරික සංවර්ධන අධිකාරිය (2020)

2.4.4. ඉඩම් වටිනාකම්, ඉඩම් අයිතිය සහ අනාගත ප්‍රවනතා

දඹුල්ල නගරයේ ඉඩම් අයිතියේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ඉඩම් වලින් 90% ක්ම පාහේ විහාර සහ දේවාල ගම් පනත යටතේ පාලනය වන දඹුල්ල රජමහා විහාරයේ රාජකාරි වලට යටත්ව විවිධ පුද්ගලයින් විසින් ඒවා භුක්ති විඳිනු ලැබීමයි.

එසේ වුවද නගරයේ ඉඩම් අයිතියේ කැපී පෙනෙන වෙනසක් සිදු වනුයේ 1978 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව විසින් එවකට සුළු නගර සභා සීමාවට අයත් ඉඩම් විශාල ප්‍රමාණයක් රජයට අත්පත් කර ගැනීමයි.

වර්තමාන නගරයේ පවතින සංවර්ධනය කළ හැකි මුළු ඉඩම් වලින් 25% ක් පමණ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍රලාභී ඉඩම් වේ. මෙම ප්‍රදේශයට අයත් ඉඩම් වලින් 55% කට වැඩි ප්‍රමාණයක් වන රක්ෂිත ප්‍රදේශ වශයෙන් වන රක්ෂණ දෙපාර්තමේන්තුව සතු වේ. මේ සියල්ල හැරුණු විට පෞද්ගලික ඉඩම් පිහිටා ඇත්තේ 10% ක වඩා අඩු ප්‍රතිශතයකි.

වාණිජකරණය තුලින් නගරයේ ඉඩම් වටිනාකම සීග්‍රයෙන් ඉහළ ගොස් ඇති අතර වාණිජ කටයුතු ව්‍යාප්ත වී ඇති කොටස්වල අධික ඉඩම් මිලක් දක්නට ලැබේ. රජයට ඉඩම් පවරාගෙන තිබීම මේ තත්ත්වයට බොහෝ දුරට බලපා ඇති අතර නියම ඉඩම් වටිනාකම පවත්නා වෙළඳපල තුලින්ද විද්‍යාමාන නොවේ. කෙසේ වුවද නගරයේ ප්‍රධාන පාරට මුහුණලා ඇති ප්‍රදේශයේ පර්චසය රු 2,000,000 - රු 2,500.000 දක්වා වන අතර මේ තත්ත්වය නිසා සංචාරක හොටෙල් වැනි කාර්යයන් නගරයෙන් ඉවතට ඇදී යාමක් දක්නට ලැබේ.

පාරිසරික සංවේදිතාවය, සංචාරක කර්මාන්තය සඳහා යොදා ගැනීම අලුත්ම සංචාරක උපාය මාර්ගයක් ලෙස දැක්විය. එබැවින් නගර අභ්‍යන්තරයේ සේවා පහසුකම් අඩු ප්‍රදේශවල ඉඩම් මිල පර්චසය රු.50,000 -200,000 අතර වේ.

කෙසේ වුවද පවතින සේවා පහසුකම් සහ නියම ඉඩම් මිල වර්තමාන මිල තුලින් පිළිබිඹු නොවන අතර මහා දඹුල්ල සංචාරක සැලසුම්කරණයේදී සපයනු ලබන සේවා පහසුකම් වලට සමානුපාතික ලෙස ඉඩම් මිල සමායෝජනය කිරීම අපේක්ෂා කෙරේ.

2.4.5. ආර්ථික පදනම

එවකට දඹුල්ල රජමහා විහාරයේ වන්දනාකරුවන්ගේ අවශ්‍යයතාවය සපුරාලීමට කුඩා කඩමණ්ඩියක් මත පදනම්ව තිබූ නගරයේ ආර්තිකයෙන් 90% ක් පමණ හේන් ගොවිතැන හා කුඹුරු පදනම් කරගෙන පැවති බවට තහවුරු වේ.

එසේ වුවද ප්‍රධාන මාර්ගයන් නගරය හරහා පිහිටීම තුලින් මංසන්ධිය; ජනාවාසයක් බවටත් ඉන් අනතුරුව සංචාරක මධ්‍යස්ථානයන්හි බලපෑම තුලින් පෝෂණය වී වාණිජ මධ්‍යස්ථානයක් ලෙස විකාශනය වීම ඇරඹුණි. මෙලෙස ක්‍රමයෙන් සංවර්ධනය වූ නගර ආර්ථිකයට ප්‍රධාන කඩඉම වූයේ මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය නගර පර්යන්ත ප්‍රදේශයට එකතු කළ ආර්ථික ප්‍රබෝධයයි.

මෙතෙක් පෝෂිතව හෝ පැරණි සුළු වාරි මාර්ග යටතේ පැවති කෘෂිකර්මාන්තය මහා පරිමාණ කෘෂිකර්මාන්තයක් බවට පත්වීමත් සමගම මාර්ග සංධිස්ථානයක් ලෙස නගරය ලබා තිබූ විභවතාවයේ උපරිම ඵලදායිතාව තුල නගරයේ ආර්ථිකය පෝෂණය විය.

ඒ අනුව පසුකාලීනව දඹුල්ල නගරය කේන්ද්‍ර කොට ගෙන නගරයේ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 55 ක් පමණ වාණිජ කටයුතු සඳහා යොදාගෙන තිබීම සහ ලංකාවේ ඉතා හොඳින් ප්‍රවර්ධනය වූ ප්‍රධානතම එළවළු තොග වෙළඳපලක් මෙන්ම අනුබද්ධිත අනෙකුත් වාණිජ කාර්යයන් ව්‍යාප්ත වීම සිදු වී ඇත..

එමෙන්ම අවට ප්‍රදේශ ලැබූ කෘෂි කාර්මික ඵල ප්‍රයෝජන උකහා ගනු ලැබුවේ දඹුල්ල නගර යයි. දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පමණක් 67% ක පමණ ප්‍රමාණයක් ගොඩ ඉඩම් වගාව සඳහා යොදා ගන්නා අතර ඉන් ද වැඩි ප්‍රමාණයක් විශේෂයෙන් දඹුල්ල ප්‍රදේශයේ ප්‍රසිද්ධියක් උසුලන ලොකු ළූණු, එළවළු හා පළතුරු වගාවන් සඳහා යොදාගෙන ඇත. මෙම කෘෂි ද්‍රව්‍ය මෙහි සිට ලංකාව පුරාම බෙදා හැරීම සිදු වේ.

2.4.6. මාර්ග පද්ධති ව්‍යාප්තිය

මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය තුලට A9 හා A6 යන ජාතික මට්ටමේ මාර්ග 02 ක්ද ඊට සමගාමීව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් පාලන ආයතනය සතු මාර්ග ජාලයකින් සමන්විතව ඇති නමුත්, මාර්ග ජාලය නිසි ලෙස සංවර්ධනයට දායක වන පරිදි සංවර්ධනය වී නොමැත. තවද ජාතික මට්ටමේ ව්‍යාපෘති ඔස්සේ දුම්රිය මාර්ගය හා අධිවේගි මාර්ග ව්‍යාපෘතියක් ද යෝජනා වී ඇත.



සිතියම් අංක 2.32 : මාර්ග ව්‍යාජතිය

2.4.7. ජල සැපයුම

ප්‍රදේශයේ ප්‍රධාන ජල මූලාශ්‍රය වන්නේ දඹුළු ඔය හා ඉබ්බන්කටුව ජලාශයයි. එයට අමතරව ළිං සහ නල ළිං ඇතුළු අනෙකුත් ජල මූලාශ්‍ර භාවිතා කරයි. විසල් දඹුල්ල ප්‍රදේශයේ ප්‍රධාන ජල සැපයුම විසල් දඹුල්ල ජල සැපයුම් ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.

පරිච්ඡේදය 02
මූලික අධ්‍යයනය

තත්ත්ව විග්‍රහය

මාර්ග පද්ධති ව්‍යාප්තිය

ජල සැපයුම

විදුලි බල පහසුකම්

දිනකට ඝන මීටර් 32,000 ක ජල ධාරිතාවක් නිකුත් කරන අතර එය ව.කි.මී. 228 ක ප්‍රමාණයක් මුළු ප්‍රදේශය තුල ආවරණය කරයි. එය ගලේවෙල, දඹුල්ල, කණ්ඩලම, තිත්තවැල්ගොල්ල, කිතුල්හිටියාව, ඉනාමළුව, සීගිරිය, හබරණ යන ප්‍රදේශ ආවරණය කොටගෙන ව්‍යාප්තව පවති.

2030 වර්ෂය වන විට අපේක්ෂිත ජනගහණය අනුව අපේක්ෂිත දෛනික ජල පරිභෝජනය ඝන මීටර් 30,000ක් පමණ වේ. ඒ අනුව, යෝජිත විසල් දඹුල්ල ජල සැපයුම මඟින් දෛනික ජල අවශ්‍යතාවය සපුරාලිය හැකිය.

පානීය ජල සැපයුම් ප්‍රතිශත



***ප්‍රස්තාර අංක 2.2 :** පානීය ජල සැපයුම් ප්‍රතිශත*
***මූලාශ්‍රය :** සම්පත් පැතිකඩ - 2018*

2.4.8. විදුලි බල පහසුකම්

ලංකා විදුලිබල මණ්ඩලය මගින් විදුලිය සපයන අතර මෙම ප්‍රදේශයට විදුලි බලය සපයනු ලබන්නේ හබරණ බෙදා හැරීමේ මධ්‍යස්ථානයෙන් සහ උකුවෙල බෙදා හැරීමේ මධ්‍යස්ථානය උපයෝගි කරගෙනය. නගරයේ විදුලිය බෙදා හැරීම සඳහා උප පොළවල් 04 ක් නගරය තුල පිහිටුවා ඇත.

මෙම ප්‍රදේශයේ 8% ක ප්‍රමාණයක් සූර්යතාපය භාවිතා කරනු ලැබේ. වියළි කලාපයේ දේශගුණික තත්ත්වයට සමාන දේශගුණයක් පිහිටා ඇති මෙම ප්‍රදේශයේ සූර්යතාපය පරිහරණය කිරීම සඳහා පූර්වාදර්ශයක් ලැබී තිබීම ඉතා වැදගත් වේ.

කර්මාන්ත ඒකක වලින් 95% ක් සඳහා විදුලිය පහසුකම් ලබා දී ඇති අතර විදුලි බල මණ්ඩලයේ තොරතුරු අනුව කුරුණෑගල මාර්ගයේ විදුලි බලය සඳහා වැඩි ඉල්ලුමක් පවතින බව පැහැදිලි වේ. කෙසේ වුවද විදුලිය ධාරිතාවය අතින් නගරය තුල හොඳ සේවාවක් පැවතුන ද ඉදිරි සංවර්ධන කටයුතු සඳහා විශේෂයෙන් සංචාරක කටයුතු සහ නිෂ්පාදන කර්මාන්ත සහ ඇතාබැඳි වැව කර්මාන්ත පුරය ආදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා විදුලි බල පද්ධතියේ ද වැඩි වර්ධනයක් මෙම සැලැස්ම තුලින් අපේක්ෂා කෙරේ. කුරුණෑගල සහ මාතලේ යන මාර්ග දෙකම ආශ්‍රිතව බොහෝ දුරට අනාගත සංවර්ධන කටයුතු ව්‍යාප්ත කිරීමේ අභිලාෂය මත විදුලිය සැපයීමේ නව යෝජනා එම මාර්ග දෙකේම පොදු ලෙස ව්‍යාප්ත කිරීම නිර්දේශ කල හැකිය. එසේම දඹුල්ල ප්‍රමුඛකොට විදුලි බලය ව්‍යාප්ත කිරීම සඳහා නව උප පද්ධතියක් පිහිටු වීම ද නිර්දේශ කෙරේ. වර්ෂ 2017 වන විට විසල් දඹුල්ල ප්‍රදේශයේ විදුලි සැපයුම 100% ක් වන අතර එය ඉදිරි සංවර්ධන කටයුතු සඳහා ද ප්‍රමාණවත් වන ලෙස ව්‍යාප්ත කිරීම අපේක්ෂා කෙරේ.

2.4.9. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

දෛනික ඝන අපද්‍රව්‍ය ජනනය 2.10 වගුවේ දක්වා ඇත. දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය උත්පාදනය හේතුවෙන් දඹුල්ල මහ නගර සභාවෙහි ඝන අපද්‍රව්‍ය ජනනය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. 2032 වන විට අපද්‍රව්‍ය ලෙස බැහැර කරන එළවළු සහ පලතුරු ප්‍රමාණය අවම කිරීම මෙම සැලසුමේ අරමුණයි.

පළාත් පාලන ආයතනය	*අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානය*	*අපද්‍රව්‍ය ජනනය - දිනකට (ටොන්)*	*අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමය*
දඹුල්ල මහ නගර සභාව	*දිගම්පතහ*	*18-25*	*විවෘත*
ගලේවෙල නගරය	*බම්බාව ඇල්ල*	*< 1*	*විවෘත*
මඩාටුගම	*මඩාටුගම ආදාහනාගාරය*	*< 1*	*විවෘත*
නාඋල නගරය	*සෙරුදන්ඩාපොල*	*0.5*	*15*20*30 අඩි වලවල්*

***වගු අංක 2.10 :** අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන*
***මූලාශ්‍රය :** විසල් දඹුල්ල පළාත් පාලන ආයතන (2017)*

මෙම ප්‍රදේශයේ ප්‍රධාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ දිගම්පතහ ප්‍රදේශයේ වන අතර එහි දෛනික ධාරිතාව ටොන් 50 කි. කොම්පෝස්ට් නිෂ්පාදනය මෙම අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රතිදානයයි. 2032 වන විට අතිරේක ඝන අපද්‍රව්‍ය ජනනය කිරීම සඳහා ව්‍යාපෘතියට ප්‍රමාණවත් ධාරිතාවක් ඇත.

2.4.10. පාරසරික තත්ත්වය

මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය ස්වභාව සෞන්දර්යෙන් අනූන ප්‍රදේශයක් වන අතර එහි ඇති දර්ශනීයත්වයට වැඩි අගයක් එක් කිරීමට අවට පිහිටි කඳු පන්ති මෙන්ම ජලාශද ඉවහල් වී ඇත. වියළි කලාපීය දේශගුණයක් සහිත ප්‍රදේශයක් වන අතර සාමාන්‍ය උෂ්ණත්වය 23°C - 33°C ද සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 1200මිමි - 1500මිමි වේ. ශිලා විද්‍යාවට (Lithology) අනුව වන්නි සංකීර්ණයට (wanni complex) අයත්වන අතර භූරූපණ විද්‍යාවට (geomorphology) අනුව කඳු හා නිම්න වලින් සමන්විත ශුෂ්ක කලාපීය වෘක්ෂ-ලතා හා මානව නිර්මිත තෙත් බිම් වන කුඹුරු ඉඩම් හරිත ප්‍රදේශ ලෙස ඉහල අගයක් එකතු කරනු ලබයි. සමස්ත ප්‍රදේශය භූගෝලීය ලක්ෂණ සැලකීමෙදී ශේෂ කඳු ලෙස සිගිරිය (1193ft), දඹුල්ල (1146ft) බට්ටා කන්ද (1402ft), ලෙනාව (1666ft), මැණික් දෙන (2341ft), ලෙනදොර (1309ft), කුඩා දඹුල්ල (8222ft) පිහිටා ඇත. මෙම කඳු පන්ති සියල්ලද ඇතුලත්ව මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය තුල වනාන්තර ප්‍රදේශ විශාල ප්‍රමාණයක් පිහිටා ඇති අතර සිතියම් අංක 2.35 මගින් ඒවායේ පැතිරීම පෙන්නුම් කෙරේ.

ස්වභාවික භූදර්ශන ප්‍රදේශ (natural landscape area) ලෙස සහ වක්‍ර විනෝද පහසුකම් (passive recreational spaces) ඉඩකඩ ලෙස දේශීය විදේශීය සංචාරකයින් සිත් ඇදගන්නා භූ රූපන ලක්ෂණයන්ගෙන් සමන්විත ප්‍රදේශයක් ලෙසද මෙම වනාන්තර ප්‍රදේශ පිහිටා ඇත. පාංශු තත්වය සැලකීමේදී රතු දුඹුරු පස් සහිත භූමියක් වන අතර ශේෂ කඳු Quartz-feldspathic, Quartzites resistant rocks with dolomitic marble, biotite-sillimanite gneisses පාෂාණ වලින් සමන්විත ගල් හා පර්වත ඉහත කඳු පන්තිය තුල හඳුනාගෙන ඇත .



සිතියම් අංක 2.33 : *විසල් දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය තුළ පවතින වනාන්තර ප්‍රදේශ*

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් 2020–2050 සඳහා පිළියෙළ කරන ලද ජාතික භෞතික සැලැස්මට අනුව මාතලේ, නුවර, බදුල්ල, නුවරඑළිය යන ප්‍රදේශයන් ප්‍රධාන ගංගාවල ජල පෝෂක / ජලධාරක ප්‍රදේශ වන බැවින් හා ඉහල උන්නතාන්ශයකින් යුත් ප්‍රදේශද වන බැවින් මධ්‍ය සංවේදී ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති අතර සිතියම් අංක 2.36 හි මෙම ප්‍රදේශ ඇතුලත් වේ.

සිතියම් අංක 2.34 : *ශ්‍රී ලංකාවේ පවතින මධ්‍ය සංවේදී ප්‍රදේශ*

2.4.10.1. විසල් දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය තුළ පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ

දඹුල්ල මහා නාගරික ප්‍රදේශයට අවේනික වූ ජෛව පරිසර පද්ධතීන් රාශියක් පවතින අතර ඒ තුල පවත්නා ජානමය සම්පත්, දුර්ලභ හා අප රටට ආවේනික ශාක හා සත්ව විශේෂ සඳහා වාසස්ථාන සැපයීම, ජෛව පරිසර පද්ධති සමබරතාවය පවත්වාගනයාම පාරිසරික සංවේදී ප්‍රදේශ මගින් සිදුවේ. විවිධ අණ පනත් මගින් සංවේදී ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති සහ පවත්නා පරිසර පද්ධති සේවාවන් හා අගයන් සැලකිල්ලට ගනිමින් පහත සදහන් ප්‍රදේශ පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත.

සංවේදී ප්‍රදේශ	*භූමි පරිහරණ ප්‍රතිශතයක් ලෙස %*
මානව නිර්මිත තෙත් බිම් -කුඹුරු ඉඩම්	*15%*
වනාන්තර හා තෘණ බිම් (ශේෂ කදු පන්තින්ද ඇතුලත්ව)	*31 %*
ගල් පර්වත	*1%*
ජල මූලාශ්‍ර	*6 %*

***වගු අංක 2.11 :** විසල් දඹුල්ල පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ පවතින භූමි පරිහරණ රටාව*

වගු අංක 2.11 අනුව බල ප්‍රදේශය තුළ පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස වනාන්තර ප්‍රදේශ (තෘණ භූමි ඇතුලත්ව) හෙක්ටයාර් 33,436 ක් පුරා පැතිර පවතින අතර නාමල් උයන රක්ෂිතය, මැණික්දෙන රක්ෂිතය, සිගිරිය රක්ෂිතය, ප්‍රධාන වනාන්තර ලෙස පිහිටා ඇත. වනාන්තර හා තෘණ භූමි ලෙස, ශේෂ කඳු පන්තින්ද ඇතුලත්ව භූමි පරිහරණ රටාව තුල 31% ප්‍රතිශතයක් පෙන්නුම් කරයි. මානව නිර්මිත තෙත් බිම් ලෙස කුඹුරු ඉඩම් මුළු භූමි පරිහරණයත් 15% පමණ වේ. මහා දඹුල්ල නාගරික ප්‍රදේශය කෘෂි ආර්ථික රටාවක් මත පදනම් වී ඇති බව ආර්ථික සැලැස්ම මගින් පෙන්නුම් කෙරේ. මෙම සංවර්ධන සැලැස්ම තුල මානව නිර්මිත තෙත් බිම් වන කුඹුරු මගින් නගර ආර්ථිකයට විශාල දායකත්වයක් සැපයීම මෙන්ම අවට පරිසරයේ ජීවී අජීවී කොටස්වලට පරිසර පද්ධති සේවාව (ecosystem service) හා පරිසර පද්ධති අගයන් (ecosystem values) සැපයෙන අතර මින් ලැබෙන ආර්ථික දායකත්වය පිලිබඳව ආර්ථික සැලැස්ම තුල සාකච්ඡා කෙරේ.

වනාන්තර ප්‍රදේශ තුල ස්වභාව ධර්මයෙන් නිර්මාණය වූ ගල් පර්වත සමඟ එක් වූ මුළු ලෝකය පුදුම කරවන භූ දර්ශන නිර්මාණයන් හා ගෘහනිර්මානත්මක ගොඩනැගිලිවලින් වලින් යුත් උද්‍යාන භූමි ප්‍රදේශ පවති. මෙම ප්‍රදේශ නීතිමය තත්වයන් මගින් සංරක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇත. නාමල් උයන, සිගිරිය ගල, පිදුරංගල, දඹුළුගල ඒ අතර ප්‍රධාන ස්ථානයන් වේ.

සංස්කෘතික සේවාවන් හා වටිනාකම් ලෙස (cultural services and values) ආගමික වටිනාකම් සහිත ප්‍රදේශ , (සිගිරිය පිදුරංගල) අධ්‍යාපනික දැනුම ඉහල නන්වන ස්ථාන සහ පාරිසරික සංචාරක කර්මන්තය (eco-tourism) සඳහාම වෙන් වූ ස්ථානයන් පිහිටීම අධ්‍යාත්මික, මානසික හා ශාරීරික සුවය ඇතිකරනු ලබන විනෝදාත්මක ප්‍රදේශ පිහිටා තිබීම මහා දඹුල්ල නාගරික ප්‍රදේශයේ සුවිශේෂි ලක්ෂණයකි. එමෙන්ම මිනිසාගේ අවශ්‍යතා වන ආහාර සැපයීම ඉන්දන වශයෙන් දැව සැපයීම පාරිසරික වායු තත්වය මනාලෙස පවත්වාගෙනයාම ජලය පිරිසිදු කිරීම (water purification) පස සංවර්ධනය කිරීම (soil formation) ජල චක්‍රය (water cycle) පවත්වාගන යාම ප්‍රධාන වශයෙන් සිදුවේ.

2.4.10.1.1. පාරසරික සංවේදී ප්‍රදේශ - ජල මූලාශ්‍ර

දඹුල්ල මහා නාගරික බල ප්‍රදේශය තුල වාරිමාර්ග පද්ධතියක් (water cascading system) පවතින අතර, මෙහි විශාල ජලාශ, පුරක ජලාශ කුඩා ප්‍රමාණයේ ග්‍රාමීය වැව් ජල පෝෂක ඇළ මාර්ග පිහිටා ඇත. මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශයේ කණ්ඩලම වැව, ඉබ්බන්කටුව වැව, කළා වැව, බළලු වැව, මොරගහකන්ද ජලාශය ප්‍රධාන ජල මූලාශ්‍ර ලෙස හඳුනාගත හැක.

විසල් දඹුල්ල ප්‍රදේශයේ සහ අවට කලාපයේ පවතින වැව්, අමුණු, සහ ඇල මාර්ග ආශ්‍රිතව නිර්මානය වී ඇති මනා ජල ජල කළමනාකරණ තුලින් මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය කුඹුරු ඉඩම් හෙක්ටයාර් 23544ක් යල කන්නය සහ මහා කන්නය දෙකෙහිම වගා කටයුතු සිදු කරයි. ජනතාවගේ එදිනෙදා ජීවනෝපාය කටයුතු සඳහා මෙන්ම ජෛව විවිධත්ව අගයන් හා වටිනාකම් ඉහල පරිසර පද්ධති නිර්මාණය වීම සඳහා මෙම වැව් ඉවහල් වී ඇත. මෙම වැව් ජලාශ හා හරිත ප්‍රදේශ වඳවී යාමේ තර්ජනයට ලක්වී ඇති ශ්‍රී ලංකාවේ අලි ඇතුන් සඳහා සහ අනෙක් සත්ව කොට්ඨාශ සඳහා නියත් කාලයන් වලදී අවශ්‍ය ජලය සහ අනෙකුත් සේවාවන් සපයමින් හා පරිසරයේ ජීවමාන බව ඉහල නංවමින් ස්භාවික භූ දර්ශන ප්‍රදේශ ලෙස ක්‍රියාකරනු ලබයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ප්‍රකාශයට පත්කර ඇති ලෝක උරුම කෘෂිකාර්මික ක්‍රමයක් ලෙස ජාත්‍යන්තර වශයෙන් පිළිගනු ලබන (tank village system) මහා දඹුල්ල ප්‍රදේශය අදටත් දක්නට ඇත. වගු අංක 2 12 සහ වගු අංක 2 13හි මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශයේ පවතින ජල මූලාශ්‍ර සහ ඉඩකඩ ප්‍රමාණයන් ඇතුලත් වේ.

වැව	වට ප්‍රමාණය /පරිමිතිය Perimeter (km)
කලා වැව	16
මොරගහකන්ද ජලාශය (මහා දඹුල්ල ප්‍රදේශය)	9
බළලු වැව	7
කණ්ඩලම වැව	6
දේවහුව වැව	4
ඉබ්බන්කටුව වැව	3
බෝවතැන්න ජලාශය (මහා දඹුල්ල ප්‍රදේශය)	2
වැවමැදිල්ල ජලාශය	1
එකතුව	**48**

වගු අංක 2.12 : ප්‍රධාන වැව් වල පරිමිතිය / වට ප්‍රමාණය (කිලෝමීටර්)

ඇළ මාර්ගය	දිග (කිලෝමීටර්)
ඉබ්බන්කටුව / කලා වැව ඇළ මාර්ගය	7
දඹුලු ඔය	7
මිරිස්ගොනියාව ඔය	5
වැවමැඩිල්ල ඉබ්බන්කටුව ඇළ	4
ඇළහැර ඇළ	15
එකතුව	**38**

වගු අංක 2.13 : ඇළ මාර්ගවල දිග ප්‍රමාණය

2.4.10.1.2. පාරසරික සංවේදී ප්‍රදේශ - තෙත් බිම්

මානව නිර්මිත තෙත් බිම් ලෙස කුඹුරු ඉඩම් මුළු භූමි පරිහරණයෙන් 15% ප්‍රතිශතයක් පෙන්නුම් කරනු ලබයි. මහා දඹුල්ල නාගරික ප්‍රදේශය කෘෂිකාර්මික ආර්ථික රටාවක් ලෙස සංවර්ධනය වී ඇත. මානව නිර්මිත තෙත් බිම් හා ජල මූලාශ්‍ර මගින් නාගරික උෂ්ණත්වය පාලනය කිරීම සහ නගරයේ හරිත පැහැය ආරක්ෂා කිරීමට නිරන්තර සම්බන්ධතාවයක් පවත්වාගනු ලබයි. සිතියම් අංක 2.44 මගින් දඹුල්ල මහා නාගරික ප්‍රදේශයේ පරිසර සංවේදී ප්‍රදේශ වන තෙත් බිම් වල ව්‍යාප්තිය පෙන්නුම් කරන අතර, මෙම තෙත් බිම් මගින් පහත සඳහන් සේවාවන් සපයනු ලබයි.

පවත්නා තෙත් බිම් තුලින් ඒ ආශ්‍රිත ජීවී අජීවී (biotic abiotic) පරිසරයට සැපයෙන පරිසර පද්ධති සේවාවන් (ecosystem service) ලෙස ජල ගැලීම් පාලනය කිරීම,ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, ජලය පිරිසිදු කිරීම තෙත් බිම් වල සෞන්දර්යාත්මක අගයන් තුලින් සංචාරක ආකර්ෂණය වැඩිවීම සහ සමාජ ආර්ථික සංවර්ධන කාර්යයන් සඳහා තෙත් බිම් යොදා ගැනීම නිරන්තරයෙන් සිදුවේ.



සිතියම් අංක 2.35 : *පාරසරික සංවේදී ප්‍රදේශ - තෙත් බිම්*

2.4.10.2. විසල් දඹුල්ල ප්‍රදේශයේ ආපදා තත්වයන්

2.4.10.2.1. ස්වභාවික ආපදා

මධ්‍යම පළාත සහා උතුරු මැද පළාත තුළ දක්නට ලැබෙන ප්‍රධානතම ආපදා ලෙස නායයාම්, නියග, ගං වතුර, සුළි සුළං සහ අකුණු ගැසීම් හඳුනාගත හැකි නමුත් විසල් දඹුල්ල නාගරික සැලසුම් බල ප්‍රදේශයේ ඉහත ආපදා වලින් ප්‍රබල බලපෑම් දක්නට නොලැබේ. වියළි කලාපය තුළ පිහිටා ඇති විසල් දඹුල්ල බල ප්‍රදේශයේ කාලානුරූපීව ඇතිවන නියග සහ ජල ගැලීම් දක්නට ලැබෙන නමුත් ආපදා වල ප්‍රබලත්වය ජාතික මට්ටමේදි සැලකිය යුතු අගයක් ගෙන නොමැත. නාගරික සැලසුම් බල ප්‍රදේශය කේන්ද්‍රය හරහා ගමන් කෙරෙන තම්මැන්නා ඇළ, මිරිස්ගෝනියා ඔයට සම්බන්ධ වන ස්ථානයේදී අධික වාර්ෂා කාල වලදි සුළු පරිමාණ ජල ගැලීම් තත්ත්වයක් ඇති වන නමුත් එම තත්ත්වයන් ජීවිත හානි ඇති කිරීමට තරම් ප්‍රබල තත්ත්වයක් ගෙන නොමැත.



සිතියම් අංක 2.36 : *ස්වභාවික ආපදා - ජල ගැලීම්*

තම්මැන්නා ඇළට ජලය නිකුත් කරන ප්‍රධාන ජල ප්‍රබවයක් ලෙස පහල වැව සහ ඒ ආශ්‍රිත කුඩා වැව් අධික වර්ෂා කාල වලදී වාන් දැමීම තුළින් එම ජලය තම්මැන්නා ඇළ හරහා මිරිස්ගෝනියා ඔයට ගලායන අතර අදාළ ජල මාර්ග දෙක සම්බන්ධ ස්ථානයේ පටු බව හේතුවෙන් ඉහත ආකාරයේ ජල ගැලීම් තත්ත්වයක් නිර්මාණය වීම සිදු වේ. මෙහිදී ඒ ආශ්‍රිත නේවාසික සහ කෘෂිකාර්මික දේපල වලට සුළු පරිමාණ හානි වීමේ තත්ත්වයක් උද්ගතව ඇත.

2.4.10.2.2. සත්ව හානි - අලි මිනිස් ගැටුම

විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ කොටසක් මෙන්ම උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොටසක්ද ඇතුලත් වූ සැලසුම් බල ප්‍රදේශයකි. විසල් දඹුල්ල බල ප්‍රදේශය උතුරින් විශාල අලි සහණයක් සහිත හබරණ රක්ෂිත කලාපයටද, නැගෙනහිරින් මින්නේරිය වන සංරක්ෂිතයටද, දකුණු දෙසින් මොරගහකන්ද, කළුගඟ, අඹන් ගඟ, රක්ෂිත කලාපයන්ටද මායිම්ව ඇති බැවින්, වන අලීන් ගමන් කිරීමේ මාර්ග (Elephant Corridors) විසල් දඹුල්ල සැලසුම් බල ප්‍රදේශය හරහාද වැටී ඇත.

ඒ අනුව මඩාටුගම, දිගම්පතහ, හබරණ, සීගිරිය, කණ්ඩලම, ඇරැවුල, වැවල, බඹරගස්වත්ත, කෝනගහවෙල, අඹන, ලග්ගල, පල්ලේගම, වැනි කෘෂි කාර්මික ප්‍රදේශ හරහා වන අලීන් ගමන් කිරීමේ මාර්ග වැටී ඇති බැවින් ඒ ආශ්‍රිතව දේපල හා වගා හානි සිදු කිරීම දක්නට ලැබේ.



සිතියම් අංක 2.37 : සත්ව හානි - අලි මිනිස් ගැටුම

2.4.11. විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශයෙහි පවතින පොදු එළිමහන් විනෝද පහසුකම්

විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශයෙහි නගරය තුළ ජීවත් වන හා නගරයට පැමිණෙන ජනගහනයට පොදු එළිමහන් විනෝද පහසුකම් (public outdoor recreational spaces) සැපයීම සඳහා පහත සඳහන් ස්ථාන ප්‍රදේශ, උද්‍යාන, ක්‍රීඩා පිටි, ක්‍රියාකාරී විනෝද පහසුකම් ස්ථාන (active recreational spaces) ලෙස සහ අක්‍රිය විනෝද පහසුකම් ස්ථාන (passive recreational spaces) ලෙස ස්වභාව ධර්මය මගින් නිර්මාණය වී ඇති ස්වභාවික භූ දර්ශන ප්‍රදේශ සංවර්ධන බල ප්‍රදේශය තුළ හා ඉන් පරිබාහිර ප්‍රදේශයන් තුලද ව්‍යාප්තව වී ඇත. මෙම ක්‍රියාකාරී විනෝද පහසුකම් සහ අක්‍රිය විනෝද පහසුකම්, උද්‍යාන දුරාවලියට අනුව කුඩා උද්‍යානය (mini park) සිට මධ්‍යම උද්‍යාන (centralized park) දක්වා ව්‍යාපත්වී ඇත.

පරිච්ඡේදය 02
මූලික අධ්‍යයනය

විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශයෙහි පවතින පොදු එළිමහන් විනෝද පහසුකම්

2.4.11.1. ක්‍රියාකාරී විනෝද පහසුකම් ස්ථාන (active recreational spaces)

වගු අංක 2.16 මගින් ක්‍රියාකාරී විනෝද පහසුකම් ස්ථාන (active recreational spaces) වශයෙන් පවතින ක්‍රීඩාපිටි පෙන්නුම් කරන අතර, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගනයක් දඹුල්ල පොහොරන්වැව ග්‍රාම නිලධාරී වසම තුල පිහිටා ඇත. ඉහත වගුවේ ඇතුලත් ක්‍රීඩාපිටි විසල් දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශයෙහි පැතිර පවතින ආකාරය සිතියම් අංක 2.46 මගින් පෙන්නුම් කෙරේ.

ග්‍රාම නිලධාරී වසම	අංකය	වර්ග ප්‍රමාණය (හෙක්ටයාර්)	ක්‍රීඩාංගනය
දඹුල්ල	ECP01	2.32	දඹුල්ල ක්‍රීඩාංගනය
පොහොරන්වැව	ELP01	1.48	පොහොරන්වැව ක්‍රීඩාංගනය
නිදිගම	ELP02	1.97	නිදිගම ක්‍රීඩාංගනය
රණාව	ELP04	1.13	රණාව ක්‍රීඩාංගනය
නාඋල	ELP05	2.19	නාඋල ක්‍රීඩාංගනය
ගලේවෙල නගරය	ELP06	1.67	ගලේවෙල පොදු ක්‍රීඩාංගනය
පැල්වෙහෙර	EMP01	0.79	කෘෂි විද්‍යාල ක්‍රීඩාංගනය
කණ්ඩලම නැගෙනහිර	EMP02	0.27	කණ්ඩලම නැගෙනහිර ක්‍රීඩාංගනය
උනගොල්ලේවැව	EMP03	0.4	උනගොල්ලේවැව ක්‍රීඩාංගනය
දඹේවටන	EMP04	0.73	දඹේවටන ක්‍රීඩාංගනය
බරවිල	EMP05	0.67	බරවිල ක්‍රීඩාංගනය
කලුගහ නැගෙනහිර	EMP06	0.76	කලුගහ නැගෙනහිර ක්‍රීඩාංගනය
රත්මල්ගම නැගෙනහිර	EMP07	0.52	රත්මල්ගම නැගෙනහිර ක්‍රීඩාංගනය
ඉලමල්පොත	EMP08	0.84	ඉලමල්පොත ක්‍රීඩාංගනය
පට්ටිවෙල	EMP09	0.73	පට්ටිවෙල ක්‍රීඩාංගනය
සියඹලාගස්වෙල	EMP10	0.35	සියඹලාගස්වෙල ක්‍රීඩාංගනය
මැදබැද්ද උතුර	EMP11	0.53	මැදබැද්ද උතුර ක්‍රීඩාංගනය
මාරගමුව	EMP12	0.78	මොරගහකන්ද ක්‍රීඩාංගනය
ඉහළ බම්බුව	EPP01	0.11	ඉහළ බම්බුව ක්‍රීඩාංගනය
පොහොරන්වැව	ICS	16.36	අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනය (ICS)

වගු අංක 2.14 : ක්‍රියාකාරී විනෝද පහසුකම් ස්ථාන



සිතියම් අංක 2.38 : *පවතින ක්‍රීඩාපිටි සහ උද්‍යාන*

පරිච්ඡේදය 02
මූලික අධ්‍යයනය

විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශයෙහි පවතින පොදු එළිමහන් විනෝද පහසුකම්

චක්‍ර විනෝද පහසුකම් ස්ථාන

2.4.11.2. චක්‍ර විනෝද පහසුකම් ස්ථාන (Passive recreational spaces)

2.4.11.2.1. සීගිරි උද්‍යානය

සීගිරි භූමි දර්ශන සැලැස්ම ශ්‍රී ලංකාවේ නිර්මාණය වී ඇති භූදර්ශන සැලසුම් කරණයේ අති විශිෂ්ඨ නිර්මාණයක් ලෙස සීගිරි නිර්මාණය දැකිය හැක. භූමි සැළසුම ඉතාමත් අලංකාර සහ සුක්ෂ්‍යම ලෙස සකස් කරන ලද්දක් වන අතර, සැලසුම් සකස් කිරීමේදී ජ්‍යාමිතික සැළසුම් සහ අවට පිහිටි ස්වාභාවික භූ දර්ශන වස්තූන්ගෙන් පිහිටීම හා භූ රූපන ලක්ෂණ පිළිබඳව ඉතා හොඳින් නිරීක්ෂණය කර මේ මහා භූ දර්ශන නිර්මාණය සිදුකර ඇත. සීගිරි පර්වතයෙහි ක්‍රි.ව.5 වන සියවෙස් පැවති නාගරික සැලසුම් ක්‍රම, භූමි දර්ශන, නිර්මාණ ක්‍රම, ඉංජිනේරු විද්‍යාව, ජල තාක්ෂණය ගෘහ නිර්මාණ ශිල්පය සහ කලා ශිල්ප හා සාහිත්‍ය එකිනෙකට ගලපමින් මෙම නිර්මාණය සිදුකර ඇත.

තව ද මෙම වාස්තු විද්‍යාත්මක හා භූ දර්ශන කලාව සඳහා පැරණි මිසර හෝ පර්සියන් උද්‍යානවල දක්නට ඇති ජ්‍යාමිතික ලක්ෂණ සුසන්ගත සැලසුම් ක්‍රම මූලික සිද්ධාන්ත ලෙස භාවිත කර ඇත. මේසා විශාල පර්වතය මත මාළිගා සංකීර්ණයක් ඉදිකිරීම කඳු මුදුනට නැගීම සඳහා මාර්ග පද්ධතිත් නිර්මාණය ගර්භාගාර, සන්නිපාත ශාලා, පොකුණු රැසකින් වට වූ ශෛලමය සිංහාසනය සීගිරි ගල මුදුනෙහි නිර්මාණය කර ඇත. මෙම මහා වාස්තු විද්‍යාත්මක හා භූ දර්ශන සැලසුම්කරණ කේන්ද්‍ර-ස්ථානයත් වූයේ මේ මාළිගාවයි. ගල මුදුනේ අක්කර තුන හමාරක බිම් ප්‍රමාණයක් වසා ගෙන ඇති මේ සුවිසල් මාළිගය රාජ්‍ය බලයත්, මිනිස් ශ්‍රමයත් පිළිබිඹු කරන කදිම ස්මාරකයකි. මාළිගයේ අගය තීව්‍ර වන ලෙස නිර්මාණය කර ඇති මණ්ඩප උද්‍යාන (Terraced gardens) ශිලා උද්‍යාන (bolder garden) පොලව යටින් දිවෙන ජල පීඩන ක්‍රමයක් යොදා ගෙන බුබුළු නගමින් පතිත වන දියමල්වලින් (water fountain) යුත් ජල උද්‍යානය (water garden) ද දිය අගල් හා සීගිරිය වැව ඇතුලත්ව මෙම මහා නිර්මාණය ක්‍රියාකාරී සහ අක්‍රිය විනෝද පහසුකම් සපයමින් මෙම උද්‍යාන පැතිර පවතී.

රූප සටහන අංක 2.8 : සීගිරි උද්‍යානය

2.4.11.2.2. පිදුරංගල

සීගිරිය මුහුදු මට්ටමේ සිට මීටර 349ක පමණ උසකින් පිහිටා ඇති අතර, පිදුරංගල ඊට වඩා මීටරයක් පමණ උසින් අඩු ගල් තලාවක් හා එම ගල් තලාව පාමුල සැතපෙන පිළිමයක් අදටත් විරාජමානව පවතී. පිදුරංගල මුදුනට නැගුණු විට හාත්පස සුන්දර දර්ශන නැරඹිය හැකි දර්ශනීය ස්ථානයක් (view point) වන අතර සීගිරියේ මනස්කාන්ත දර්ශනයක් ද දැකගත හැකියි. පිදුරංගලට වසර දහස් ගණනක් ඈතට විහිදුණු ඉතිහාසයක් තිබේ.



රූප සටහන අංක 2.9 : *පිදුරංගල*

පිදුරංගල ගල් පර්වත මුදුනෙහි සිට මනස්කාන්ත දර්ශන නැරඹීමට අමතරව එහි පාමුල සිට අක්‍රිය විනෝද පහසුකම් ලෙස ඓතිහාසික හා ආගමික වටිනාකමකින් යුතු ස්ථාන රාශියක් පිහිටා ඇත. පිදුරංගල නැගීමේ ආරම්භ කරන ස්ථානය වම්පස කාශ්‍යප ස්තූපය නම් ගරාවැටුණු චෛත්‍යයක නටඹුන් දැකගත හැකියි. අපේ රටට අවේනික සත්ව විශේෂ සහ පිදුරංගල සීගිරිය වන අලි ගැවසෙන ප්‍රදේශයක්ද වේ. පිදුරංගල සංස්කෘතික, අධ්‍යාපනික හා විනෝදාත්මක ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම තුලින් මෙම සංවර්ධන ප්‍රදේශය ආර්ථික වර්ධන ඉලක්ක ලගා කරගත හැකිය.

2.4.11.2.3. නාමල් උයන

ජාතික නාමල් උයනේ භෞතික වශයෙන් කැපී පෙනෙන ලක්ෂණ ලෙස ප්‍රදේශයේ භූමි ප්‍රමාණයෙන් අක්කර 750 ක ප්‍රමාණයක් පුරා නා ගස් (බටු නා ගස් සහ දිය නා ගස්) සහ වසර මිලියන 500 ක භූමියක් පුරා පැතිරුණ රෝස තිරුවානා කන්ද කඳු වැටි 7 කින් සැදුම්ලත් අතර, එය දකුණු ආසියාවේ විශාලතම රෝස තිරුවානා කඳු පන්තිය ද වේ. මෙහිදී සාමාන්‍ය පරිසරයේ දකින නා විශේෂයන්ට වඩා අතු බෙදුණු විශාල නා කඳන් සහිත නා ගස් දැකීමට හැකි අතර, නාපත්‍ර දළු අවධියේ දී රක්ත වර්ණයෙන් දිස්වන අතර, පරිණත වන විට දී දිලිසෙන තද කොළ පැහැයෙන් දැකීමට හැකිවීම කැපී පෙනෙන ලක්ෂණයකි. නා උයන නා මල් පිපෙන කාලය අප්‍රියෙල් සිට ජූනි කාලය වන අතර මෙම කාලයේදී පරිසර සුන්දරත්වය වඩාත් තිව්‍ර වේ.

විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශයෙහි පවතින පොදු එළිමහන් විනෝද පහසුකම්

වක්‍ර විනෝද පහසුකම් ස්ථාන

මෙම වන උයනෙහි විවිධ වෙහෙර විහාර ද රාශියක් දැක ගත හැකිය. ඒ අතරින් සඳකඩ පහණ, නාමල් සෑය, රෝස තිරුවානා ගල්වලින් ඉදි කර ඇති බෝධිඝරය, පිළිම ගෙය, රෝස තිරුවානා බුදු පිළිමය, ආවාස ගෙය, ගල් කණු භාවිත කරමින් තනා ඇති සීමා මාලකය, පට්ඨානඝරය, ගල් පහණ, ආසනඝරය, කළු ගලින් නිර්මාණය කරන ලද සක්මන් මළුව වක්‍ර වින්ද පහසුකම් සපයන ස්ථාන ලෙස සහ අධ්‍යාපනය සහ දැනුම වැඩිකරනු ලබන ස්ථානයක් මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය තුල පිහිටා ඇත.

නාමල් උයන අභ්‍යන්තරයේ ඇති කඳු පද්ධතියේ විවිධ ස්ථානවලින් කුඩා දිය පහරවල් ගලා එන සුවිශේෂී ස්ථානයක් දැකගත හැකිය. මෙහි එක් ස්ථානයක තිරුවානා කඳු පද්ධතිය අභ්‍යන්තරයෙන් ඇද හැලෙන කුඩා දිය ඇලි 3ක් හඳුනාගෙන හැක. ලෝකයේ පවතින පාෂාණ නිධි අධ්‍යන වලින් ග්‍රීසිය වටිනා පාෂාණ පිහිටා ඇති රට ලෙස හඳුනාගෙන ඇතත්, ඊට වඩා වටිනා පාෂාණ ස්තරයක් ලෙස නාමල් උයන රෝස තිරුවානා කන්ද විද්වතුන් හඳුනාගෙන ඇත. මෙම භූමිභාගය දේශීය විදේශීය සංචාරකයන්ගේ විනෝදාස්වාදය අධ්‍යාපනික දැනුම ලබාදෙන (Education path) අධ්‍යාපන මන්පෙතකි.

වර්තමානය වන විට රෝස තිරුවානා කඳුවැටියේ මතුපිට ඇති තිරුවානා පාෂාණය ඉක්මනින් දැඩිසූර්යතාපයට හා ජලයට නිරාවරණය වීමත් නිසා පැහැය අවපැහැ ගැන් වී ඇත. ශ්‍රී ලංකාවේ භූ ගර්භකලාප වලින් උසබිම් සංකීර්ණය (High land complex) සහ වන්නි සංකීර්ණයට (wanni complex) අයත්වන ලෙස නාමල් උයන පිහිටා ඇති අතර රෝස තිරුවානා නිදිය විපරීත පාෂාණ ලෙස පවතී.

2.4.11.2.4. වායු බැලූන් (Hot air ballooning)

***රූප සටහන අංක 2.10 :** වායු බැලුන්(සීගිරිය සංචාරක කලාපය)*

වායු බැලුන් (hot-air balloon) එකක් ගුවන් යානයකට වඩා බරින් අඩු අතර, එය බෑගයක් (envelope) ලෙස හඳුන්වයි, ගුවන් යානා තාක්ෂණය යොදා ගනිමින් මිනිසුන් විනෝදකාමී ගමනාන්තයන් වෙත ගෙනයාම සඳහා ඉතාමත් සාර්ථක නිර්මාණයක් ලෙස hot-air balloon හැදින්විය හැක. 1783 නොවැම්බර් 21 ප්‍රංශ හා පැරිස් විද්‍යාඥයන් විසින් සොයා ගත් අතර, 1793 ජනවාරි මස 9 වන දින පළමුවෙන්ම ඇමරිකාව විසින් වායු බැලුන් විනෝද චාරිකා සඳහා ගුවනට මුදා හරින ලදී. ශ්‍රී ලංකාවේ දැනට විසල් දඹුල්ල ප්‍රදේශය පමණක් වක්‍ර විනෝද පහසුකම් (passive recreational activity) ලෙස වායු බැලූන් විනෝද චාරිකා (Hot air ballooning) පුද්ගලික අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

පරිච්ඡේදය 02
මූලික අධ්‍යයනය

විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශයෙහි පවතින පොදු එළිමහන් විනෝද පහසුකම්

වක්‍ර විනෝද පහසුකම් ස්ථාන

දඹුල්ල කණ්ඩලම, සීගිරිය පිහිටීම සහ දේශගුණය, සුළගේ වේගය මෙන්ම ස්වභාවිකව භූ දර්ශනයේ චමත්කාර ජනක බව, සංස්කෘතික වටිනාකම් වලින් ඉහල අගයක් ගන්නා ලෝක උරුම ප්‍රදේශ, ගංගා, විල්, සංස්කෘතික වටිනාකම් වලින් සැදුම්ලත් ප්‍රදේශ මේ සඳහා ඉවහල් කර ගනිමින් දේශීය විදේශීය සංචාරකයින් සඳහා වක්‍ර විනෝද පහසුකම් (passive recreational) සපයනු ලබයි.

එමෙන්ම නොවෙනස්ව පවතින මහා වනාන්තර ප්‍රදේශ, ඓතිහාසික වාරිමාර්ග රටාව සහ වැව් පද්ධතිය ගල්පර්වත මතුපිට ස්තර, ඓතිහාසික නටබුන්, අඩි 2000-5000 පමණ උස ඉහල අහසේ සිට නැරඹීම මෙන්ම වනාන්තරයේ ගස් මුදුන් ස්ථරය සමාන්තරව ස්භාවික සෞන්දරය නැරඹීම ද වායු බැලුන් වලින් සිදුකරයි. තවද මින්නේරිය, හබරණ, සිගිරිය සහ කවුඩුල්ල අලි සෆාරි ප්‍රදේශද නැරඹීම ද මෙමඟින් සිදුකරයි.

03 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

පරිච්ඡේදය 03
සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

හැදින්වීම

හඳුනාගත් ගැටලු

සංචාරක සංවර්ධන පීඩනය සහ පුරාවිද්‍යාව / පරිසරය සංරක්ෂණය අතර සමතුලිතතාවය පවත්වා ගැනීමට නොහැකිවීම.

3.1. හැදින්වීම

විසල් දඹුල්ල නගර සංවර්ධන සැලසුම් මගින් ප්‍රදේශයේ පවතින විභවතාවයන් උපරිම ලෙස අනාගත සංවර්ධනය සඳහා යොදා ගැනීම හා ප්‍රදේශයේ දැනට පවතින සංවර්ධනය හේතුවෙන් ඇති වී ඇති විවිධ ගැටළු සහ සෘණාත්මක බලපෑම අවම කරමින් අනාගත නාගරික සංවර්ධනය නිවැරදි ලෙස මෙහෙයවීමෙන් ජනතාව සඳහා පහසුකම් සැලසීම, සුවපහසු පරිසරයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ.

ඒ අනුව විසල් දඹුල්ල ප්‍රදේශයේ පවතින ගැටළු හඳුනා ගැනීම සවිස්තරාත්මක විශ්ලේෂණය, පාර්ශවකරුවන්ගේ අදහස් හා සැලසුම් නිලධාරීන්ගේ දැක්ම අනුව සිදු කරන ලද අතර ඒවා අතරින් විසල් දඹුල්ල ප්‍රදේශයේ පවතින ප්‍රමුඛතා පිළිවෙලින් හඳුනා ගැනීම ප්‍රදේශයේ සන්දර්භය (Context) වැදගත්කම (Magnitude) හා විශේෂත්වය (Significance) අනුව සිදු කරන ලදි. එහිදි විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය සඳහා සංවර්ධන සැලසුමක් සකස් කිරීමේ අවශ්‍යතාවය සලකා බැලීමේදි ප්‍රධාන වශයෙන් වැදගත් වන කරුණු කිහිපයක් පහත පරිදි හඳුනාගත හැකිය.

3.2. හඳුනාගත් ගැටලු

3.2.1. සංචාරක සංවර්ධන පීඩනය සහ පුරාවිද්‍යාව / පරිසරය සංරක්ෂණය අතර සමතුලිතතාවය පවත්වා ගැනීමට නොහැකිවීම.



රූප සටහන අංක 3.1 : *ගැටළු අංක 01 හි විශ්ලේෂණය*

පරිච්ඡේදය 03
සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

හඳුනාගත් ගැටලු

සංචාරක සංවර්ධන පීඩනය සහ පුරාවිද්‍යාව / පරිසරය සංරක්ෂණය අතර සමතුලිතතාවය පවත්වා ගැනීමට නොහැකිවීම.

විසල් දඹුල්ල ප්‍රදේශය ප්‍රධාන වශයෙන් වින්‍යාසගත වී ඇති සාධකයක් ලෙස පුරාවිද්‍යාත්මක, ඓතිහාසික හා ස්වභාව සෞන්දර්යාත්මක පරිසරයද සමඟ අනොන්‍යාන්‍ය සබැඳියාවකින් යුක්ත වේ. මේ නිසාම මෙම ප්‍රදේශය ඉහල සංචාරක ආකර්ෂණයක් හිමි ප්‍රදේශයක් වේ.

නමුත් වර්තමානය වන විට විසල් දඹුල්ල ප්‍රදේශයේ වඩාත් නිරීක්ෂණය කළහැකි ප්‍රධාන කරුණක් වන්නේ පුරාවිද්‍යාත්මක හා වනාන්තර ප්‍රදේශ ආශ්‍රිතව සිදු කෙරෙන අවිධිමත් සංවර්ධන ප්‍රවණතාවය හඳුනාගත හැකි වීමයි. මෙම හේතුවෙන් පුරාවිද්‍යාත්මක ප්‍රදේශ හා රක්ෂිත ප්‍රදේශ විනාශ වීමත් හා පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වැදගත්කම හීන වීමත් සමඟ ප්‍රදේශ තුල අවිධිමත් තත්ත්වයන් උද්ගත වීමට හේතු වී ඇත.



රූප සටහන අංක 3.2 : *සංචාරක හෝටල් ව්‍යාප්තිය, 2018 (පුරාවිද්‍යාත්මක ප්‍රදේශ හා රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව සිදු කෙරෙන අවිධිමත් හෝටල් ව්‍යාප්තීන්)*

මේවන විට පුරාවිද්‍යාත්මක රක්ෂිත මායිම තුළ හෝටල් 3 ක්ද, වනජීවී සංරක්ෂණ සීමාව තුළ හෝටල් 154 ක්ද පිහිටා ඇත. හෝටල් 39 ක් පමණ සීගිරියේ පිටත ජල උද්‍යානයේ සිට කිලෝමීටර 1 ක දුර ප්‍රමාණයක ආරක්ෂිත කලාපයක් තුළ පිහිටා ඇත.

3.2.2. විසල් දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සහ මගීන්ට ප්‍රමාණවත් සමාජ හා භෞතික යටිතල පහසුකම් නොමැති වීම.



රූප සටහන අංක 3.3 : *ගැටළු අංක 02 හි විශ්ලේෂණය*

විසල් දඹුල්ල ප්‍රදේශය ආර්ථික වශයෙන්, සංචාරකමය වශයෙන් ඉහළ ආකර්ෂණයක් සහිත ප්‍රදේශයක් වේ. නමුත් මේ සඳහා ප්‍රමාණවත් වන පරිදි යටිතල පහසුකම් නොමැති වීම ප්‍රධාන ගැටළුවක් වී ඇත.

විශේෂයෙන්ම දෛනිකව පැමිණෙන ජනතාවට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම්, රථ වාහන නැවතුම් ස්ථාන, උද්‍යාන පහසුකම් හා විනෝදාත්මක පහසුකම් මෙන්ම ප්‍රමාණවත් තරම් අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් නොමැති වීම හේතුවෙන් ජනතාව වෙනත් ප්‍රදේශ වලට ඇදී යාම මෙන්ම විකල්ප මාර්ග පද්ධතියක් හා පරිසර හිතකාමී පරිසරයක් නගරය තුල නොවීම ප්‍රධාන ගැටළු වන අතර මේවා නිසි පරිදි කළමනාකරණය කරමින් විසල් දඹුල්ල ප්‍රදේශයේ නේවාසික හා නගරයට පැමිණෙන ජනයාට විධිමත් සංවර්ධිත යටිතල පහසුකම් සැපයීම සිදු කල යුතුය.

3.2.3 විසල් දඹුල්ල ප්‍රදේශයේ විභවතාවයන් නිසි පරිදි ආර්ථික සංවර්ධනය සඳහා උපයෝගි කර නොගැනීම.

විසල් දඹුල්ල ප්‍රදේශය ප්‍රධාන වශයෙන් සංචාරක ක්ෂේත්‍රය හා කෘෂි වෙළඳ ආර්ථික රටාවකට හුරු වී ඇත. නමුත් මේ සඳහා අවශ්‍ය දැනුම, අවබෝධය ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් පවතින විභවතාවයන් හෙවත් සංචාරක ආකර්ෂණීය ස්ථාන, පුරාවිද්‍යාත්මක ස්ථාන, කෘෂි කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන ආදි දේ පිළිබඳ ප්‍රමාණවත් තරම් සැලකිල්ල නොදැක්වීම හේතුවෙන් පවතින විභවතාවයන් නිසි පරිදි සංවර්ධනයට උපයෝගි කර ගැනීම අඩාල වී ඇත. මේ හේතුවෙන් ශ්‍රම බලකායෙන් බොහොමයක් පිරිස රැකියා විරහිතභාවයට පත්වීම හා රැකියා සඳහා වෙනත් ප්‍රදේශ වලට ඇදී යාම ප්‍රදේශයේ පවතින ගැටළුවක් වී ඇත.

3.3. හඳුනාගත් විභවතා

3.3.1. ආගමික, සංස්කෘතික හා පුරා විද්‍යාත්මක වශයෙන් හිමිව පවතින ප්‍රමුඛතාවය

ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුමයක්වූ “රංගිරි දඹුළු” රජ මහා විහාරය නගරය තුල පිහිටීම නගරයේ ආගමික නැඹුරුතාවයේ සුවිශේෂිතාවය ඉස්මතු කරන අතර, එය ශ්‍රී ලංකාවේ විශාලම ලෙන් විහාර සංකීර්ණයද වේ. එපමණක් නොව ලෝක පුදුම අතරින් 08 වන ස්ථානයේ හඳුන්වන I වන කාශ්‍යප රජු විසින් ඉදි කරනු ලබන ‘සීගිරිය’ මෙම ප්‍රදේශයේ ඓතිහාසික, පුරාවිද්‍යාත්මක වැදගත්කම ඉස්මතු කරන ස්ථාන අතරින් ප්‍රධාන තැනක් ගනි. තවද ශ්‍රී ලංකාවේ මධ්‍ය නිරූපණය කෙරෙන නාලන්දා ගෙඩිගේද මෙම ප්‍රදේශයේ පිහිටා තිබේ. තවද ජාතික නාමල් උයන හා රෝස තිරුවානා කන්ද, ඉබ්බන්කටුව ප්‍රාග් ඓතිහාසික සොහොන් බිම්, පිදුරංගල, මැණික්දෙන පුරාවිද්‍යා රක්ෂිතය, එඬේරගල වන සෙනසුන ආදි ආගමික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම මැනවින් ඉස්මතු කරන ස්ථාන අතර වේ.

එසේම වර්ෂ 1982 දී යුනෙස්කෝ (UNESCO) සංවිධානය මගින් ලෝක උරුම ප්‍රදේශයක් ලෙස නම් කල ‘සීගිරිය’ හා වර්ෂ 1991 දි ලෝක උරුමයක් ලෙස නම් කල වර්ග මීටර් 2100 කින් සමන්විත ‘රංගිරි දඹුළු’ ලෙන් විහාර සංකීර්ණයද ලෝක උරුමයන් ලෙස නම් කර තිබීම ප්‍රදේශයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම ලොවට කියා පාන ප්‍රධාන සාධකයක් වේ.

තවද ශ්‍රී ලංකාවේ සංස්කෘතික ත්‍රිකෝණයට අයත් ප්‍රදේශයක් ලෙසත් දඹුල්ල ප්‍රදේශය වැදගත්කම මැනවින් ඉස්මතු කරයි.

මෙම ප්‍රමුඛතාවන් හේතුවෙන් අවුරුද්ද මුළුල්ලේම සංචාරක සහ ආගමික ආකර්ෂණය හිමි ප්‍රදේශක් ලෙස විසල් දඹුල්ල ප්‍රදේශය වැදගත් වේ.

රූප සටහන අංක 3.4 : ඉබ්බන්කටුව මහශිලා සුසානය

රූප සටහන අංක 3.5 : දඹුල්ල ලෙන් විහාරය

රූප සටහන අංක 3.6 : සීගිරිය

රූප සටහන අංක 3.7 : පිදුරංගල

රූප සටහන අංක 3.8 : මැණික්දෙන

රූප සටහන අංක 3.9 : නාලන්දා ගෙඩිගේ

රූප සටහන අංක 3.10 : නාමල් උයන

රූප සටහන අංක 3.11 : කළුදිය පොකුණ

රූප සටහන අංක 3.12 : එබේරගල

3.3.2. හොඳින් ස්ථාපිත පුරාවිද්‍යා, පාරිසරික කෘෂි සංචාරක කර්මාන්තය

හඳුනාගත් විභවතා

විසල් දඹුල්ල ප්‍රදේශයේ පවත්නා පුරාවිද්‍යාත්මක හා පාරිසරික සංචාරක ආරක්ෂණය දිනාගත් ස්ථාන හා සම්ප්‍රදායික කෘෂි කර්මාන්තය මූලික කරගනිමින් සංචාරක කර්මාන්තය හොඳින් ව්‍යාප්ත වී ඇත. 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණි මුළු විදේශ සංචාරකයින් ප්‍රමාණයේ 25% ක අධික ප්‍රමාණයක් සීගිරිය ප්‍රදේශයේ සංචාරය සඳහා පැමිණ ඇත.

තවද, සංචාරක හෝටල් විශාල ප්‍රමාණයක් පැවතීම නිසා මෙම ප්‍රදේශය සංචාරකයින් සඳහා ප්‍රධාන ගමනාන්තයක් ලෙස ප්‍රසිද්ධියක් උසුලයි. මෙම විභවතාවයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා සංචාරක සංවර්ධන අධිකාරියේ උපාය මාර්ගික සැලැස්ම - 2020 මගින් දඹුල්ල හා සීගිරිය සංචාරක ගමනාන්තයක් ලෙස දියුණු කිරීමට හඳුනාගෙන තිබීම මෙම සැලැස්ම සඳහා ප්‍රධාන විභවයක් ලෙස හඳුනාගත හැකිය.

3.3.3. දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය පැවතීම

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි බෝග එක්රැස් කිරීමේ හා බෙදා හැරීමේ ආර්ථික මධ්‍යස්ථානය දඹුල්ල නගරයේ පිහිටා ඇත. මෙහි දෛනික කෘෂි බෝග රැස් කිරීම මෙට්‍රික් ටොන් 2500 ක් පමණ වේ. තවද, දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය මඟින් ශ්‍රී ලංකාවේ සියලු පළාත් වලට ද්‍රව්‍ය බෙදා හැරීම සිදු කරයි. ඒ අනුව, මෙම ආර්ථික මධ්‍යස්ථානය විසල් දඹුල්ල ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට ප්‍රධාන විභාවයක් වේ.

3.3.4. විසල් දඹුල්ල ප්‍රදේශයේ ස්ථානීය වැදගත්කම

මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාව මධ්‍යයේ තැනිතලා භූමි ප්‍රදේශයක පිහිටා ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර සම්බන්ධ කරන හොඳින් ව්‍යාප්ත වූ මාර්ග පද්ධතයකින් සමන්විතය. ඒ අනුව, ජාතික හා ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගැනීමටත්, යටිතලා පහසුකම් හා සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමටත් ඉතා යෝග්‍ය භූමි ප්‍රදේශයක් ලෙස විසල් දඹුල්ල ප්‍රදේශය හඳුනාගත හැකිය.

3.3.5. පවත්නා හා යෝජිත යටිතල පහසුකම් ව්‍යාපෘතිය

මේ වන විටද විසල් දඹුල්ල ප්‍රදේශයේ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයක්, ආර්ථික මධ්‍යස්ථානයක්, ගුවන් විදුලි සේවයක්, අභ්‍යන්තර ගුවන් තොටුපලක් හා හොඳින් ව්‍යාප්ත වූ මාර්ග ජාලයක් පවතී. මෙම පහසුකම් ප්‍රදේශයේ සංවර්ධනයට විභවතායක් ලෙස මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත.

තවදුරටත් යෝජිත කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය හා දඹුල්ල දක්වා යෝජිත මධ්‍යම අධිවේගි මාර්ගය ප්‍රදේශයේ සංවර්ධන විභවයන් වැඩිකරන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගෙන ඇත.

04 වන පරිච්ඡේදය

සංවර්ධන සැලසුම් රාමුව

4.1. දැක්ම

"The Great City of Agro Economy & Tourism of the Nation"
"ජාතියේ කෘෂි ආර්ථික හා සංචාරක කේන්ද්‍රස්ථානයේ මහා නගරය"

4.2. දැක්මේ ප්‍රකාශණය

විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම මගින් ප්‍රකාශ වන "ජාතියේ කෘෂි ආර්ථික හා සංචාරක කේන්ද්‍රස්ථානයේ මහා නගරය" වන දැක්මේ වාග් බාණ්ඩයන් තුලින් පිළිඹිබු වන අර්ථයන් ඔස්සේ වඩාත් නිවැරදි ලෙස අර්ථකථනය කල හැකිය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර හා ඍජු සම්බන්ධතාවයක් විසල් දඹුල්ල ප්‍රදේශයේ පවතී. එය ජාතික වශයෙන් විශාල වැදගත්කමක් වන අතර ප්‍රධාන වශයෙන් රට අභ්‍යන්තරයෙන් උතුර, දකුණ හා බටහිර, නැගෙනහිර යා කෙරෙන ප්‍රධාන දොරටුව වන්නේ ද මෙම ප්‍රදේශයය.

එමෙන්ම කෘෂි බෝග නිෂ්පාදන වල විශේෂයෙන්ම එළවළු ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ වෙළඳපල මිල තීරණය කෙරෙන ජාතික මට්ටමේ වෙළඳපලක් සහිත කෘෂි ආර්ථික වෙළඳ මධ්‍යස්ථානයකින් සමන්විත වේ.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික ත්‍රිකෝණය ආරම්භක ස්ථානය ලෙස හැඳින්විය හැකි දඹුල්ල ප්‍රදේශය දෙස් විදෙස් සංචාරකයින්ගේ ප්‍රධාන සංචාරක කේන්ද්‍රස්ථානය වේ. මෙහිදි ඓතිහාසික, පුරාවිද්‍යාත්ම වටිනාකමක් මෙන්ම ලෝක උරුම ස්ථාන වලින් සමන්විත මෙම ප්‍රදේශ කෙරෙහි පවතින දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කර ඒ තුලින් විසල් දඹුල්ල ප්‍රදේශයේ ජාතික හා අන්තර් ජාතික මට්ටමට නගා සිටුවීම ප්‍රධාන වේ. මෙමගින් ජාතික මට්ටමේ කෘෂි ආර්ථික කටයුතු හා සංචාරක කටයුතු පවතින ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කේන්ද්‍රස්ථානය වේ.

දැක්මේ ප්‍රකාශය

තවද මෙම සියලු කාරණා වලින් හෙබි නිශ්චිත වශයෙන් හඳුනාගෙන ඇති නාගරික කටයුතු ක්‍රියාත්මක වන කේන්ද්‍රස්ථානයක් වශයෙන් හඳුනාගෙන ඇති ජාතික මට්ටමේ විශාල වැදගත්කමක් ඇති මහා නගරයකි.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික කොරිඩෝවේ මධ්‍යයේ පිහිටි ප්‍රධාන ප්‍රදේශය විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය සීගිරිය හා රංගිරි දඹුල්ල රජ මහා විහාරය මුල්කරගත් ඉතා සශ්‍රීක ස්වයංපෝෂිත ආර්ථිකයක් සහිත ඓතිහාසික නගරයක්ව පැවත ඇත. එමෙන්ම මෙම ප්‍රදේශයයේ ඉතිහාසය ඉබ්බන්කටුව සොහොන් බිම් ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා ගෙන යනු ලැබේ. මෙවැනි පුරාවිද්‍යාත්මක ඓතිහාසික වැදගත්කමක් සහිත බොහෝ ස්ථාන වලින් සමන්විත මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුරාවිද්‍යාත්මක සංචාරක කේන්ද්‍රස්ථානයක් වේ.

වර්තමානය වන විට උද්ගතව පවතින සංවර්ධන නැඹුරුතාවය හේතුවෙන් මෙම ප්‍රදේශය පරිහානියට පත් වෙමින් පවතින අතර, එම ප්‍රදේශ නිසි ලෙස වෙන් කොට හඳුනා ගැනීමේ අවශ්‍යතාවය පවතී. එමෙන්ම දෙස් විදෙස් සංචාරකයන් හට අවශ්‍ය පහසුකම් ඉතා සීමිතව පැවතීම අවධානය යොමු කල යුතු කරුණක් වේ. එමෙන්ම දඹුල්ල නගරය පෙරටු කොට දඹුල්ල විශේෂ ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය ප්‍රධාන කොට ගෙන නගරයේ ආර්ථික, සාමාජීය හා පාරිසරික වටිනාකම් හේතුවෙන් මෙම නගරය ආර්ථිකමය කටයුතු සඳහා විශාල පිරිසකගේ අවධානයට ලක් වී තිබීමත් දිනෙන් දින සිදුවන නාගරිකරණයත් හේතුවෙන් සේවාවන් ලබා ගැනීම සඳහා වැඩි ජන සංඛ්‍යාවක් මෙම නගරය වෙත පැමිණේ. ඒ වෙනුවෙන් නගරය තුල පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, රථවාහන නැවතුම් ස්ථාන නොමැති වීම, පොදු විනෝද කටයුතු ස්ථාන නොමැති වීම මෙන්ම නාගරික ක්‍රියාවලිය විධිමත්ව නොවීම ආදි ගැටළු පවතින අතර, විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම තුලින් විද්‍යාමාන වන දැක්ම නාගරික වැසියන් හා නගරයට පැමිණෙන්නන් හට පහසුව ලබාදීම කෙරෙහිද අවධානය යොමු කොට ඇත.

මේ සියල්ලන්ගෙන් යුත් විසල් දඹුල්ල නාගරික කලාපයේ ආර්ථික, සාමාජීය,භෞතික හා පාරිසරික සංවර්ධනයන් පවතින විභවතාවයන් හා අවස්ථා ප්‍රයෝජනයට ගෙන සාමාජීය සහජීවනය සහිත මනා කළමණාකරනයකින් යුත් භෞතික සංවර්ධනය තුලින් ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා ගමන් කිරීම විසල් දඹුල්ල නගර සංවර්ධන සැලැස්මේ දැක්ම තුලින් පිළිඹිබු කරනු ලැබේ.

4.3. ඉලක්ක

ඉලක්ක 01

ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි වෙළඳ ආර්ථිකය පදනම් කරගත් වාණිජ දැවැන්තයා බවට පත් කිරීම.

ඉලක්ක 02

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයේ විධිමත් සංවර්ධනය වූ සමාජ හා භෞතික අපරවපුහ පහසුකම් සහිත ප්‍රදේශයක් බවට පත් කිරීම.

ඉලක්ක 03

මහ දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය පවතින ස්වභාවික ධනය සහ මානව නිර්මිත පරිසරය අතර සමබරතාවය ආරක්ෂාවන පරිදි අනාගත නගර ආකෘතිය නිර්මාණය කිරීම.

ඉලක්ක 04

නිරසාර වූ පුරාවිද්‍යාත්මක හා පාරිසරික සංචාරක කර්මාන්තයක් ඇති කිරීම.

4.4. අභිමතාර්ථ

ඉලක්ක 01

ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි වෙළඳ ආර්ථිකය පදනම් කරගත් වාණිජ දැවැන්තයා බවට පත් කිරීම.

අභිමතාර්ථ 1 : *කෘෂි පාදක ගබඩා ප්‍රවර්ධනය කිරීම සඳහා අක්කර 10 ක භූමි ප්‍රමාණයක් දඹුල්ල විශේෂිත ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය අසලින් වෙන් කිරීම.*

අභිමතාර්ථ 2 : *2032 වන විට දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයෙහි ප්‍රයෝජිත කෘෂි නිෂ්පාදන ප්‍රමාණය 90% ක් දක්වා ප්‍රවර්ධනය කිරීම.*

අභිමතාර්ථ 3 : *දඹුල්ල සහ ගලේවෙල යන ප්‍රදේශවල අක්කර 30 ක භූමි ප්‍රමාණයක් කෘෂි පාදක අගය එකතු කිරීමේ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වෙන් කිරීම.*

අභිමතාර්ථ 4 : *2024 වන විට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් කෘෂි අපනයන කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා සම්පත් මධ්‍යස්ථානයක් දඹුල්ලෙහි පිහිටුවීම.*

ඉලක්ක 02

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයේ විධිමත් සංවර්ධනය වූ සමාජ හා භෞතික අපරවායුහ පහසුකම් සහිත ප්‍රදේශයක් බවට පත් කිරීම.

අභිමතාර්ථ 1 :	*දඹුල්ලෙහි යෝජිත දුම්රිය ස්ථානයට හා අධිවේගී මාර්ග අන්තර් හුවමාරුවට යාබදව ඒකාබද්ධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම සඳහා හෙක්ටයාර් 50ක් වෙන් කිරීම.*
අභිමතාර්ථ 2 :	*2022 – 2032 වන විට දඹුල්ල නගරය ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධන කිරීම, දඹුල්ල විශේෂිත ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය සහ රංගිරි දඹුලු විහාරය අසල මාර්ග තදබදය සමනය කිරීම.*
අභිමතාර්ථ 3 :	*2032 වන විට දඹුල්ල, ගලේවෙල, හබරණ, සීගිරිය, නාඋල සහ මඩාටුගම නගරවල පදික මංතීරු වැඩි දියුණු කිරීම.*
අභිමතාර්ථ 4 :	*2032 වන විට හඳුනාගත් උප නගරවල අන්තර් සම්බන්ධතා වැඩි දියුණු කිරීම.*
අභිමතාර්ථ 5 :	*2026 වන විට අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයෙන් ප්‍රදේශයේ අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා භෞතික යටිතල පහසුකම් සැපයීම.*
අභිමතාර්ථ 6 :	*2026 වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගයෙන් ප්‍රදේශයේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා භෞතික යටිතල පහසුකම් සැපයීම.*

ඉලක්ක 03

විසල් දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය පවතින ස්වභාවික ධනය සහ මානව නිර්මිත පරිසරය අතර සමබරතාවය ආරක්ෂාවන පරිදි අනාගත නගර ආකෘතිය නිර්මාණය කිරීම.

අභිමතාර්ථ 1 :	*මානව නිර්මිත පරිසරය තුල පවතින ගෘහනිර්මාණ ශිල්පීය අගයන්ගෙන් යුත් ගොඩනැගිලි / ස්ථාන හා ස්වභාවික ධනය ලෙස පවතින ස්වභාවික භූ දර්ශන අගයන් ඉහල ස්ථානයන් සෘජු හා වක්‍ර විනෝද පහසුකම් ලෙස සංවර්ධනය කිරීම.*
අභිමතාර්ථ 2 :	*2032 වර්ෂය වන විට අවරෝධක කලාප සහ විශේෂ මාර්ගගොපදේශ භාවිතා කරමින් ජලමූලාශ්‍ර සහ වනාන්තර රක්ෂිත තුල සිදුවන භෞතික සංවර්ධන කටයුතු පාලනය කිරීම.*
අභිමතාර්ථ 3 :	*2032 වර්ෂය වන විට හෙක්ටයාර 33,000ක් ලෙස පවතින වනාන්තර පද්ධතිය ආරක්ෂා කිරීම සහ වනගහනය 30% දක්වා ඉහල නැංවීම.*
අභිමතාර්ථ 4 :	*තෙත් බිම් කලාපිකරන සැලසුම් හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම මගින් පවත්නා තෙත් බිම් කුඹුරු ඉඩම් ආරක්ෂා කිරීම .*

පරිච්ඡේදය 04
සංවර්ධන
සැලසුම් රාමුව

ඉලක්ක 04

තිරසාර වූ පුරාවිද්‍යාත්මක හා පාරිසරික සංචාරක කර්මාන්තයක් ඇති කිරීම.

අභිමතාර්ථ

අභිමතාර්ථ 1 : *2032 වන විට සංචාරක ආකර්ෂණය දිනාගත් ප්‍රදේශ 13 ක් සම්බන්ධ කරමින් කි.මී 100 දිගකින් යුතු දර්ශණීය මාර්ගයක් සංවර්ධනය කිරීම.*

අභිමතාර්ථ 2 : *2025 වන විට පැල්වැහැර, වෑවල වැව සහ හිරිවඩුන්න ප්‍රදේශ කෘෂි සංචාරක කර්මාන්තය සඳහා ප්‍රවර්ධනය කිරීම.*

අභිමතාර්ථ 3 : *2022 වන විට හඳුනාගත් පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ප්‍රදේශ සඳහා මායිම් නිර්ණය කිරීම.*

05 වන පරිච්ඡේදය

ශ.දු.අ.ත. විශ්ලේෂණය

5.1. සංක්ෂිප්ත ශ. දු. අ. ත. විශ්ලේෂණය

විසල් දඹුල්ල නගර සංවර්ධන සැලැසුම මගින් අපේක්ෂිත දැක්ම ලගා කර ගැනීම සඳහා හඳුනාගත් ඉලක්ක තුලින් විසල් දඹුල්ල ප්‍රදේශයේ පවතින ශක්තීන් (Strengt), දුර්වලතාවයන් (Weakness), අවස්ථා (Opportunity) හා තර්ජන (Threats) හඳුනා ගැනීම සඳහා SWOT විශ්ලේෂණය හා අනෙකුත් විශ්ලේෂණයන් කිහිපයක් මෙහිදි භාවිතා කරන ලදි.

5.1.1. ඉලක්ක 01

ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි වෙළඳ ආර්ථිකය පදනම් කරගත් වාණිජ දැවැන්තයා බවට පත් කිරීම

ශක්තීන්

- *විසල් දඹුල්ල ප්‍රදේශය විවිධ කෘෂි පාරිසරික කලාපවල පිහිටා ඇති අතර, විවිධ බෝග වගා කිරීමට හැකිවීම. (DL1, IM3, IL2)*
- *ප්‍රදේශයේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 32% ක් කෘෂි කර්මාන්තය සඳහා යොදා ගැනීම සහ 40% ක ජනගහනයක් කෘෂි කර්මාන්තයේ නියැලි සිටීම.*
- *සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගත්/පවරාගත් ඉඩම් පිහිටීම. (දඹුල්ල - අක්කර 52.2, නාඋල - අක්කර 04, ගලේවෙල - අක්කර 22)*
- *දෛනිකව කි.ග්‍රෑම් මිලියනයක පමණ එළවළු සහ පළතුරු එකතුවක් ඇති දඹුල්ල විශේෂිත ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය මෙම ප්‍රදේශය තුල පිහිටීම.*
- *කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය ජලය සපුරාලීමට ප්‍රමාණවත් හොඳින් ව්‍යාප්ත වුනු වාර්මාර්ග පද්ධතියක් පැවතීම.*
- *විසල් දඹුල්ල ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම නිසා ප්‍රධාන නගර අතර හොඳින් ව්‍යාප්ත වුනු සම්බන්ධතාවයක් පැවතීම.*

දුර්වලතා

- *දඹුල්ල විශේෂිත ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ශීතාගාර පහසුකම් හා සකසුරුවම් පහසුකම් නොමැති වීම.*
- *කෘෂි කර්මාන්තය සඳහා පෞද්ගලික ආයෝජකයින් නොමැති වීම මෙම අංශයේ ව්‍යාප්ති සීමා කිරීම. (CIC පැල්වැහැර සහ Bio Foods පෞද්ගලික සමාගම පමණක් මෙම ප්‍රදේශයේ ආයෝජනය කර ඇත.)*
- *ප්‍රදේශය තුල කෘෂි පාදක අගය එකතු කිරීමේ කර්මාන්ත නොමැති වීම.*
- *කෘෂි නිෂ්පාදකයින් සහ වෙළෙන්දන් පිළිබදව නිවැරදි තොරතුරු එක්රැස් කර නොමැති වීම.*
- *විසල් දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍ය-ස්ථානයට රැස්කරන පාරිභෝගික භාණ්ඩ වන එළවළු හා පළතුරු ප්‍රමාණයෙන් 40% ක ප්‍රමාණයක් අපතේ යාම.*

අවස්ථා

- *රජයේ ප්‍රතිපත්ති 2020 තුලින් නව තාක්ෂණික ක්‍රමවේද උපයෝගි කර ගනිමින් ගොවිතැන ආකර්ෂණීය වෘත්තියක් බවට පත් කිරීමට අවධානය යොමු කර තිබීම.*
- *උෂ්ණත්වය හා ආද්‍රතාවය පාලනය කළ හැකි ටොන් 5000ක ධාරිතාවයකින් යුතු ගබඩා සංකිර්ණයක් ඉදිකිරීම. (ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 2.8)*
- *යෝජිත අධිවේගි මාර්ගය මගින් කොළඹ වරාය සහ දඹුල්ල, ගලේවෙල වැනි ප්‍රදේශ අතර නව සම්බන්ධතාවයක් ඇති කිරීම.*
- *යෝජිත ආසියානු සුපිරි අධිවේගි මාර්ගය මෙම ප්‍රදේශය සෘජුවම ආසියානු කලාපයට සම්බන්ධ කිරීම.*
- *යෝජිත කුරුණෑගල - හබරණ දුම්රිය සේවාව භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගත හැකි වීම.*
- *තුළු බඩු සඳහා ලෝක වෙළඳපොල සහ ආසියානු වෙළඳපොල වාර්ෂිකව 5% ක අනුපාතයකින් වර්ධනය වීම.*

තර්ජන

- *ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ නියුතු ජනගහනය වාර්ෂිකව 0.71 (2019 - 2018) ක ශීඝ්‍රතාවයකින් අඩු වීම.*
- *මියන්මාරය සහ වියට්නාමය වැනි අපනයන කරුවන්ගේ ඉහළ ඵලදායිතාවය නිසා ලෝක වෙළඳපොලේ කෘෂි බෝග අපනයනය සඳහා තරගයක් ඇති වීම.*

5.1.2. ඉලක්ක 02

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයේ විධිමත් සංවර්ධනය වූ සමාජ හා භෞතික අපරවපුහ පහසුකම් සහිත ප්‍රදේශයක් බවට පත් කිරීම

ශක්තීන්

- *විසල් දඹුල්ල ප්‍රදේශය පුරා හොඳින් ව්‍යාප්ත වූ පාසල් හා රෝහල් ජාලයක් පැවතීම.*
- *දඹුල්ල, නාඋල සහ සීගිරිය ප්‍රදේශයන්හි වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටා තිබීම.*
- *අනාගත ඉල්ලුම සැපයිය හැකි ජල විදුලි ජාලයක් පැවතීම.*
- *දිගම්පතහ ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් පිහිටුවා තිබීම.*
- *ස්වභාවික වැසි ජල කළමනාකරණ පද්ධතියක් පිහිටා තිබීම.*
- *ශ්‍රී ලංකාවේ ජාතික මාර්ග ජාල 02 ක් වන අඹේපුස්ස - ත්‍රිකුණාමලය (A6) ප්‍රධාන මාර්ගයත්, මහනුවර - යාපනය යා කෙරෙන (A9) මාර්ගයත් විසල් දඹුල්ල ප්‍රදේශය හරහා විහිදී තිබීම.*
- *සීගිරිය ගෘහස්ථ ගුවන් තොටුපොල මෙම ප්‍රදේශයේ පිහිටා තිබීම.*
- *භූගෝලීය වශයෙන් පැතලි භූමියක පිහිටීම නිසා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පහසු වීම.*

දුර්වලතා

- *පාසල් හා රෝහල් වල භෞතික සම්පත් හිග වීම.*
- *ප්‍රදේශය තුල උසස් අධ්‍යාපන පහසුකම් නොමැති වීම.*
- *2032 දී පුරෝකථනය කරන ලද ජනගහනය සඳහා ප්‍රමාණවත් විනෝදාත්මක පහසුකම් නොමැති වීම.*
- *ප්‍රධාන වාණිජ නගරවන දඹුල්ල සහ ගලේවෙල ප්‍රදේශයන්හි මධ්‍යම මලාපවාහන පද්ධතියක් නොමැති වීම.*
- *නගර මධ්‍යස්ථාන වල වාහන නැවැත්වීමේ පහසුකම් නොමැති වීම.*
- *දඹුල්ල ප්‍රධාන බස් නැවතුම්පොල නිසි ලෙස ක්‍රියාත්මක නොවීම.*
- *නගර මධ්‍යස්ථානවල සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම.*

අවස්ථා

- *අනාගත පානීය ජල ඉල්ලුම සපුරාලීම සඳහා විසල් දඹුල්ල ජල යෝජනා ක්‍රමයේ ධාරිතාවය ප්‍රමාණවත් වීම.*
- *යෝජිත අධිවේගී මාර්ගය හා යෝජිත විදුලි දුම්රිය මාර්ග නැවතුම් ස්ථාන දඹුල්ල නාගරික කලාපය ආශ්‍රිතව පිහිටීම.*
- *දඹුල්ල හරහා යෝජිත ආසියානු අධිවේගී මාර්ගය ජාත්‍යන්තර සම්බන්ධතාව වැඩි දියුණු කිරීම.*

තර්ජන

- *වැඩි දියුණු වූ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් පවතින මාතලේ, මහනුවර, කුරුණෑගල සහ අනුරාධපුර වැනි ප්‍රදේශයන් සඳහා මෙම ප්‍රදේශයේ ජනතාව ආකර්ෂණය වීම.*

5.1.3. ඉලක්ක 03

විසල් දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය පවතින ස්වභාවික ධනය සහ මානව නිර්මිත පරිසරය අතර සමබරතාවය ආරක්ෂාවන පරිදි අනාගත නගර ආකෘතිය නිර්මාණය කිරීම.

ශක්තීන්

- *ජෛව විවිධත්ව සේවාවන් සහ ජෛව විවිධත්ව අගයන් ඉහල මට්ටමක පවතින තෙත් බිම් වනාන්තර සහ එහි පවතින වෙළඳපොල මත පදනම් නොවන වටිනා-කම් මෙන්ම ඓතිහාසික වටිනාකම් වලින් අනූන මානව නිර්මිත පරිසර භූදර්ශනය.*
- *මුළු භූමි පරිහරණයෙන් 6% වන ගංගා පද්ධති සහිත ජල සම්පත හා ඓතිහාසික වාරිකර්මාන්ත පවත්නා පරිසරය හා සම්බන්ධ වෙමින් නීලහරිත ප්‍රදේශයක් නිර්මාණය වී තිබීම.*
- *මුළු භූමි පරිහරණයෙන් 70% පමණ වන ලෙස කෘෂිකාර්මික ඉඩම්, කුඹුරු ඉඩම්, වනාන්තර, ගෙවතු වගා ඉඩම් හරිත ප්‍රදේශ ලෙස පැවතීම.*
- *අලි ඇතුන්ගේ වාසස්ථාන පිහිටා තිබීම.*
- *පුනර්ජනනීය බලශක්ති උද්‍යාන සකස් කිරීම සඳහා යොදාගත හැකි පුනර්ජනනීය බලශක්ති සම්පත් ලෙස සුළග සහ සූර්යබල ශක්තිය ලැබෙන ප්‍රදේශ සංවර්ධන බල ප්‍රදේශය තුල පිහිටා තිබීම.*
- *නගර හරිතකරන භූ දර්ශන සැලසුම් සඳහා මෙන්ම සෘජු හා වක්‍ර විනෝද (ACTIVE & PASSIVE RECREATIONAL) පහසුකම් සඳහා මානව නිර්මිත භූදර්ශනය හා ස්වභාවික පරිසරය බැදී පවතින සීගිරිය, දඹුල්ල, පිදුරංගල, නාමල් උයන උද්‍යාන භූ දර්ශනය යොදා ගැනීමෙන් සංචාරක කර්මාන්තය තුලින් නගර ආර්ථිකට සඳහා ඉහල දායකත්වයක් ලබා දීම.*

දුර්වලතා

- *පවතින වනාන්තර සීමාවන් සහ එහි රක්ෂිත සීමාවන් නිවැරදිව හඳුනාගත නොහැකි වන ලෙස අනවසර ඉදිකිරීම් සහ කෘෂිකාර්මික කෙටි කාලීන බෝග වගාවන් ව්‍යාප්තව වීම.*
- *නගරයට ආසන්නව පවතින වනාන්තර රක්ෂිත සීමාවල ඉඩම්වල වටිනාකම් ඉහල අගයක් ගන්නා බැවින් හෝටල් සහ නාවතැන් පහසුකම් සංවර්ධනය සඳහා අනවසර අල්ලා ගැනීම් සහ ඉදිකිරීම් සීග්‍රයෙන් ඉහළයාම.*
- *අප ජලය ජලමූලාශ්‍ර වලට මුදාහැරීම හේතුවෙන් දඹුල්ල නගරයේ මතුපිට හා අභ්‍යන්තර ජලය දූෂණය වීම. තම්මැන්නා ඇළ ,මිරිස්ගොනියව ඇළ සහ දඹුල්ල ඔයට අපවිත්‍ර ජලය බැහැරලීම හේතුවෙන් ජලය දූෂණය වීම සහ දුර්ගන්ධය ඇතිවේ.*

අවස්ථා

- *තිරසාර සංවර්ධන අරමුණු.*
- *දේශගුණික විපර්යාස ප්‍රතිපත්තිය.*
- *රජයේ ප්‍රතිපත්ති 2020 - තිරසාර පරිසර ප්‍රතිපත්තිය.*
- *ජාතික භෞතික සැලැස්මහි නාගරික සංවර්ධන උපායමාර්ග යටතේ හඳුන්වාදෙන ලද ඇවිදීමේ පහසුකම් සහිත සියලු දෙනාටම විනෝද පහසුකම් ඇතුලත් නගර, තිරසාර හරිත නගර ඇති කිරීම.*
- *2011–2030 ජාතික භෞතික සැලැස්මට අනුව පාරිසරික අධි සංවේදි කලාපයට අයත් වීම.*
- *සිගිරිය - යුනෙස්කෝ ගැසට් පත්‍රය.*
- *වන දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පාලන, ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නාගරික සංවර්ධන අධිකාරිය ආදී ආයතන මගින් ක්‍රියාත්මක කරන ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම සඳහා නීති රීති තිබීම.*

තර්ජන

- *සංචාරක අංශයේ සීග්‍ර වර්ධනය හේතුවෙන් රට අදාල සංවර්ධන කාර්ය වනාන්තර ඇතුලතට ව්‍යාප්තවීමෙන් වනාන්තර තුල ජීවත්වන සත්ව හා ශාක විශේෂවලට හානි සිදුවීම.*
- *අනවසර අල්ලාගැනීම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සංවේදී ප්‍රදේශවලට ව්‍යාප්තවීම.*
- *අලි මිනිස් ගැටුම ඇතිවීම.*

5.1.4. ඉලක්ක 04

තිරසාර වූ පුරාවිද්‍යාත්මක හා පාරිසරික සංචාරක කර්මාන්තයක් ඇති කිරීම

ශක්තීන්

- *දඹුල්ල විහාරය, සීගිරිය, පිදුරංගල, ඉබ්බන්කටුව, කළුදිය පොකුණ, නාලන්දා ගෙඩිගේ, වාසල කෝට්ටේ පල්ලිය, බම්බාව විහාරය, නාමල් උයන ආදි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්ථාන මෙම ප්‍රදේශයේ පිහිටා තිබීම.*
- *පාරිසරික සංචාරක කටයුතු සඳහා සංචාරකයින්ගේ ආකර්ෂණය දිනා ගත හැකි ස්වභාවික වනාන්තර පද්ධතියක් මෙම ප්‍රදේශයේ පිහිටා තිබීම.*
- *හබරණ ප්‍රදේශයේ වන අලි ගහණය ඉහළ මට්ටමක පැවතීම සහ පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් ඉසිලීම.*
- *අත්කම්, මැටි භාණ්ඩ, අත් යන්ත්‍ර හා බතික්, මැණික් හා ස්වර්ණාභරණ වැනි සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රදේශයන් පිහිටා තිබීම.*
- *සාම්ප්‍රදායික ගොවිතැන් හා ශිල්ප ක්‍රම ආශ්‍රිත සංචාරක කර්මාන්ත ප්‍රදේශ පිහිටා තිබීම.*
- *ස්වභාවික ආපදා ඉතා අඩු ප්‍රදේශයක් ලෙස විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් හඳුනාගෙන තිබීම.*
- *සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ ඉඩම් ලබා ගත හැකි වීම.*

දුර්වලතා

- *සංචාරකයින් ආකර්ෂණය කර ගන්නා ගමනාන්තයන් සංචාරකයන්ගේ අවශ්‍යතා සැපිරිය හැකි ලෙස සංවර්ධන කර නොමැති වීම. (මාර්ග, වැසිකිළි, රථවාහන නැවතුම් ස්ථාන)*
- *පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වැදගත්කමකින් යුතු ස්ථානවල මායිම් පැහැදිලිව හඳුනාගෙන නොමැති වීම.*
- *සංචාරක මාර්ගෝපදේශ සිතියමේ දඹුල්ලෙහි බොහෝ ස්ථාන ඇතුලත් වී නොමැති වීම.*

අවස්ථා

- *සීගිරිය (1982) හා දඹුල්ල (1991) ලෝක උරුම ලෙස යුනෙස්කෝව මගින් ප්‍රකාශයට පත් කර තිබීම.*
- *සැලසුම් ප්‍රදේශය මධ්‍යම සංස්කෘතික ත්‍රිකෝණය තුල පිහිටා තිබීම.*
- *වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය සහ පළාත් පාලන ආයතන මගින් බලාත්මක කරනු ලබන ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම සඳහා නීති පැවතීම.*
- *ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන මණ්ඩලය විසින් දඹුල්ල ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස හඳුනාගෙන තිබීම.*

තර්ජන

- *ගෝලීය වසංගත හා ත්‍රස්ත ප්‍රහාර වැනි හේතූන් සංචාරක කර්මාන්තය තුල අවිනිශ්චිත තාවයන් ඇති කර තිබීම.*

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

5.2. සවිස්තරාත්මක ශ.දු.අ.ත. දත්ත විශ්ලේෂණය

5.2.1. ඉලක්ක 01

ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි වෙළඳ ආර්ථිකය පදනම් කරගත් වාණිජ දැවැන්තයා බවට පත් කිරීම

ඉලක්ක 01 | ශක්තීන්

ශක්තීන් 01 – විසල් දඹුල්ල ප්‍රදේශය විවිධ කෘෂි පාරිසරික කලාපවල පිහිටා ඇති අතර, විවිධ බෝග වගා කිරීමට හැකිවීම. (DL1, IM3, IL2)

ශ්‍රී ලංකාවේ වියළි දේශගුණික කලාපයට අයත්වන විසල් දඹුල්ල ප්‍රදේශය මධ්‍යම කඳුකරයේ තෙත් දේශගුණික කලාපය ආසන්නයේ පැවතීම නිසා කෘෂිකර්මාන්තයට හිතකර දේශගුණික තත්වයක් මෙම ප්‍රදේශයේ පවතී.

වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 1200ත් 1500ත් අතර වන අතර වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 26ත් 31ත් අතර අගයක් ගනී. එමෙන්ම වර්ෂයේ අධික වර්ෂාපතන කාලයක් හෝ අධික උෂ්ණත්ව කාලයක් ඇති නොවේ. මෙය කෘෂිකර්මාන්තය සඳහා වඩාත් හිතකර වේ. මෙය විසල් දඹුල්ල ප්‍රදේශයේ පවතින ප්‍රධාන විභවතාවයක් වේ.



ප්‍රස්තාර අංක 5.1 : සාමාන්‍ය මාසික උෂ්ණත්වය
මූලාශ්‍රය : *https://www.weather2visit.com/asia/sri-lanka/dambulla.htm, 2020*

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

——

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය



	Jan	Feb	Mar	Apr	May	Jun	Jul	Aug	Sep	Oct	Nov	Dec
inches	3.6	3.1	3.5	7.3	4.4	2.4	2.7	2.5	4	11	11.4	9
Rainy days	5	4	6	11	9	8	7	7	9	14	15	13

ප්‍රස්තාර අංක 5.2 : සාමාන්‍ය මාසික වර්ෂාපතනය
මූලාශ්‍රය : *https://www.weather2visit.com/asia/sri-lanka/dambulla.htm, 2020*

දඹුල්ල ප්‍රදේශයට උපරිම වර්ෂාපතනයක් පවතින්නේ සැප්තැම්බර් හා ඔක්තෝම්බර් යන මාසයන් වලදිය. එය මාසයේ දින 15 ක් පමණ පවති. අවම වර්ෂාපතනයක් මැයි මාසයේ වාර්තාවන අතර එය 60 mm ක් පමණ වේ.



	Jan	Feb	Mar	Apr	May	Jun	Jul	Aug	Sep	Oct	Nov	Dec
Hrs sunshine	7.5	8.3	9	8.3	7	6.6	6.4	6.9	6.7	6.6	6.3	6.4

ප්‍රස්තාර අංක 5.3 : දෛනික සූර්යාලෝකය පවත්නා පැය ගණන
මූලාශ්‍රය : *https://www.weather2visit.com/asia/sri-lanka/dambulla.htm, 2020*



CLIMATIC ZONE		AGRO-ECOLOGICAL REGION	75% EXPECTANCY VALUE OF ANNUAL RAINFALL (MM)
WET ZONE	UP COUNTRY	WU 1	> 3,100
		WU2a	> 2,400
		WU2b	> 2,200
		WU3	> 1,800
	MID COUNTRY	WM1a	> 3,300
		WM1b	> 2,900
		WM2a	> 2,200
		WM2b	> 1,800
		WM3a	> 1,600
		WM3b	> 1,400
	LOW COUNTRY	WL1a	> 3,200
		WL1b	> 2,800
		WL2a	> 2,400
		WL2b	> 2,200
		WL3	> 1,700
INTERMEDIATE ZONE	UP COUNTRY	IU1	> 2,400
		IU2	> 2,100
		IU3a	> 1,900
		IU3b	> 1,700
		IU3c	> 1,600
		IU3d	> 1,300
		IU3e	> 1,400
	MID COUNTRY	IM1a	> 2,000
		IM1b	> 2,000
		IM1c	> 1,300
		IM2a	> 1,800
		IM2b	> 1,600
		IM3a	> 1,400
		IM3b	> 1,200
		IM3c	> 1,100
	LOW COUNTRY	IL1a	> 1,400
		IL1b	> 1,100
		IL1c	> 1,300
		IL2	> 1,600
		IL3	> 1,100
DRY ZONE	LOW COUNTRY	DL1a	> 1,100
		DL1b	> 900
		DL1c	> 900
		DL1d	> 900
		DL1e	> 900
		DL1f	> 800
		DL2a	> 1,300
		DL2b	> 1,100
		DL3	> 800
		DL4	> 750
		DL5	> 650

සිතියම් අංක 5.1 : *කෘෂි පාරිසරික කලාප*
මූලාශ්‍රය: *කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2020*

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප 58 කට වෙන්කර ඇත. ඒ සඳහා වාර්ෂික වර්ෂාපතනය හා උනන්තාංශය වැනි භූගෝලීය සාධක සලකා බලා ඇත. ඒ අනුව විසල් දඹුල්ල ප්‍රදේශය කෘෂි පාරිසරික කලාප 03 කට අයත් වේ. පහත වගුවෙන් විසල් දඹුල්ලෙහි ප්‍රදේශයන් අයත්වන කෘෂි පාරිසරික කලාපය හා වගා කරනා බෝග පිළිබඳව සංක්ෂිප්ත වාර්තාවක් දැක්වේ.

ප්‍රදේශය	*කෘෂි පාරිසරික කලාපය*	*ප්‍රධාන වශයෙන් වගා කළ හැකි බෝග*
දඹුල්ල, මඩාටුගම, සීගිරිය, හබරණ	*DL 16*	*වී, ළූණු, මිශ්‍ර ගෙවතු වගා අනෙකුත් වැසි ජලයෙන් වගා කරන උඩරට බෝග*
ගලේවෙල	*IM 36*	*මිශ්‍ර ගෙවතු වගා, අපනයන වාණිජ බෝග, රබර්, එළවළු බෝග, වී*
නාඋල	*IL 2*	*මිශ්‍ර ගෙවතු වගා, වී, අනෙකුත් වැසි ජලයෙන් වගා කෙරෙන උඩරට බෝග, උක්, දොඩම් වර්ග*

වගු අංක 5.1 : *කෘෂි පාරිසරික කලාපය හා වගා කරනා බෝග*
මූලාශ්‍රය : *කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2020*

ශක්තීන් 02 – ප්‍රදේශයේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 32% ක් කෘෂි කර්මාන්තය සඳහා යොදා ගැනීම සහ 40% ක ජනගහනයක් කෘෂි කර්මාන්තයේ නියැලීසිටීම.

විසල් දඹුල්ල මුළු භූමි ප්‍රමාණයෙන් මේ වන විටත් 32% ක ප්‍රතිශතයක කෘෂිකාර්මික වගාවන් සඳහා යොදා ගෙන ඇත. එය මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 34,500 ක් වේ. තවද, හෙක්ටයාර් 21,000 වී වගාවටද (19%), හෙක්ටයාර් 2,200 මිශ්‍ර බෝග වගාවටද (21%), අනෙකුත් වගාවන් සඳහා හෙක්ටයාර් 11,300 ක් ද වෙන් වී ඇත. ප්‍රධාන වශයෙන් ගම්මිරිස්, කජු ආදි කෘෂි අපනයන බෝග මෙම ප්‍රදේශයේ වගා කරයි. තවද, විසල් දඹුල්ල ප්‍රදේශයේ ජනතාවගේ 40%ක ප්‍රමාණයක් කෘෂිකාර්මික අංශයේ නියැලි සිටින අතර, එය ශ්‍රී ලංකාවට සාපේක්ෂව ගත් කල වැඩි ප්‍රමාණයක් ලෙස සැලකිය හැකිය.

මේ අනුව කෘෂිකාර්මික ඉඩම් ව්‍යාප්තිය හා කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ ජනගහන ව්‍යාප්තිය විසල් දඹුල්ල නගර සංවර්ධන සැලැස්මේ ඉලක්ක වෙත ලගා වීමට ශක්තියක් ලෙස සැලකිය හැකිය.



ප්‍රස්තාර අංක 5.4 : *භූමි පරිභෝජන රටාව (2020)*
මූලාශ්‍රය : *භූගෝලීය තොරතුරු පද්ධති අංශය, නාගරික සංවර්ධන අධිකාරිය (2020)*

භෝග වර්ගය	**ඉඩම් ප්‍රමාණය (Ha)**
කුරුඳු	20
කෝපි	54
ගම්මිරිස්	889
කජු	540
කරාබු නැටි	2
බුලත්	18
පුවක්	169
අඹ	698
දොඩම්	137
දෙහි	159
කොස්	528
කෙසෙල්	486
පෙපොල්	123
අන්නාසි	12
මුලු එකතුව	**3,835**

වගු අංක 5.2 : *කෘෂි අපනයන භෝග සඳහා වෙන්කර ඇති ඉඩම් |* ***මූලාශ්‍රය :*** *විසල් දඹුල්ල පළාත් පාලන ආයතන (2017)*

ශක්තීන් 03 – සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගත්/පවරාගත් ඉඩම් පිහිටීම. (දඹුල්ල - අක්කර 52.2, නාඋල - අක්කර 04, ගලේවෙල - අක්කර 22)

විසල් දඹුල්ල ප්‍රදේශයේ සංවර්ධනය කලහැකි හිස් ඉඩම් පැවතීම මෙම ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය සඳහා පවතිව විභවතාවයක් වේ.

සවිස්තරාත්මක ශ.දු.අ.ත. විශ්ලේෂණය

Town	*පිඹුරුපත් අංක*	*ඉඩම් ප්‍රමාණය*	*දැනට පවතින ඉඩම් පරිහරණ*	*ව්‍යාපෘති යෝජනාව*
දඹුල්ල	*මු.පි.මා. 931*	*අක්කර 8.5*	*හිස් ඉඩම්*	*ශීතාගාර සහ කෘෂි නිෂ්පාදන කර්මාන්ත*
ගලේවෙල	*346/345*	*අක්කර 22.0*	*කුඹුරු ඉඩම්*	*කෘෂි නිෂ්පාදන කර්මාන්ත*



සිතියම් අංක 5.2 : *සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි ඉඩම් පිහිටීම*

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

නාගරික සංවර්ධන අධිකාරිය සතු දඹුල්ල නගරයේ ඉඩම් ව්‍යාප්තිය



සිතියම් අංක 5.3 : *නාගරික සංවර්ධන අධිකාරිය සතු දඹුල්ල නගරයේ ඉඩම් ව්‍යාප්තිය*

අංකය	PPM අංකය	ඉඩම් ප්‍රමාණය	දැනට පවතින ඉඩම් පරිහරණ	ව්‍යාපෘති
1	1537	2 A	පරිපාලන සංකීර්ණ අදියර I සහ II	පරිපාලන සංකීර්ණ අදියර III සහ IV
2	842	350 P	වාණිජ සහ නේවාසික	සාප්පු සංකීර්ණය
3	1275	120 P	වාණිජ සහ කුළී වාහන රථගාල	පොදු රථගාල
4	1275	16 A	මූල්‍ය ආයතන සහ හිස් ඉඩම	පොදු රථගාල
5	931	8.5 A	හිස් ඉඩම	සිසිල් කාමර සහ කර්මාන්ත
6	931	5 A	නේවාසික සහ වාණිජ	පූජා භූමි සංවර්ධනය • හරිත පටි සංවර්ධනය (අදියර II) • නව A 9 මාර්ග සංවර්ධනය • තොරතුරු මධ්‍යස්ථානය සහ පහසුකම් මධ්‍යස්ථානය
7	1230	9.5 A	හිස් ඉඩම	පූජා භූමි සංවර්ධනය • නැවත ස්ථානගත කිරීම
8	969	1 A	වාණිජ (කඩ 50)	පූජා භූමි සංවර්ධනය • වාණිජ • වාහන උද්‍යානය
9	924	4.75 A	උඩවැව වැව	පූජා භූමි සංවර්ධනය
10	පිඹුරුපත් අංක Ma/DMB/20/13/206	1 A	නේවාසික සහ වාණිජ	පූජා භූමි සංවර්ධනය
11	968	214P	උඩවැව වැව වාණිජ සහ නේවාසික	පූජා භූමි සංවර්ධනය
එකතුව		**52 A**		

වගු අංක 5.3 : නාගරික සංවර්ධන අධිකාරිය සතු දඹුල්ල නගරයේ ඉඩම් ව්‍යාප්තිය

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

නාගරික සංවර්ධන අධිකාරිය සතු ගලේවෙල නගරයේ ඉඩම් ව්‍යාප්තිය (ලේනාවල ඉඩම)



සිතියම් අංක 5.4 : *නාගරික සංවර්ධන අධිකාරිය සතු ගලේවෙල නගරයේ ඉඩම් ව්‍යාප්තිය*

අනුඅංක	*පිඹුරුපත් අංක*	*ඉඩම් ප්‍රමාණය*	*දැනට පවතින ඉඩම් පරිභරණ*	*ව්‍යාපෘති යෝජනාව*
1	*346/345*	*අක්කර 22*	*කුඹුරු ඉඩම්*	*නව නගර සංවර්ධනය*

වගු අංක 5.4 : *නාගරික සංවර්ධන අධිකාරිය සතු ගලේවෙල නගරයේ ඉඩම් ව්‍යාප්තිය*

නාගරික සංවර්ධන අධිකාරිය සතු නාඋල නගරයේ ඉඩම් ව්‍යාප්තිය - (පෙනෙලබොඩ ඉඩම)



සිතියම් අංක 5.5 : නාගරික සංවර්ධන අධිකාරිය සතු නාඋල නගරයේ ඉඩම් ව්‍යාප්තිය

අනුඅංක	*පිඹුරුපත් අංක*	*ඉඩම් ප්‍රමාණය*	*දැනට පවතින ඉඩම් පරිහරණ*	*ව්‍යාපෘති යෝජනාව*
1	*263*	*අක්කර 4*	*මුඩු ඉඩම්*	*නිවාස යෝජනා ක්‍රමය*

වගු අංක 5.5 : *නාගරික සංවර්ධන අධිකාරිය සතු නාඋල නගරයේ ඉඩම් ව්‍යාප්තිය*

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

ශක්තීන් 04 – දෛනිකව කි.ග්‍රෑම් මිලියනයක පමණ එළවළු සහ පළතුරු එකතුවක් ඇති දඹුල්ල විශේෂිත ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය මෙම ප්‍රදේශය තුල පිහිටීම.

වර්ෂ 1999 දී පමණ ආරම්භ කළ දඹුල්ල විශේෂ ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ නැවුම් එළවළු බෙදාහැරීමේ ප්‍රධානතම වෙළඳ මධ්‍යස්ථානය වේ. වෙළඳසැල් 155 කින් පමණ සමන්විත මෙහි එළවළු වෙළඳසැල් 116ක්, පලතුරු වෙළඳසැල් 05ක්, කරවල වෙළඳසැල් 07ක්, සිල්ලර බඩු වෙළඳසැල් 20ක් හා ආපනශාලා 09 කින් සමන්විත වේ. පෝයදින හැර දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක රථවාහන නැවතුම් ස්ථාන, මූල්‍ය පහසුකම් ආයතන ආදියෙන් සමන්විත මෙහි සියලුම එළවළු හා පලතුරු බෙදා හැරීම සිදුකරනු ලබයි.

එමෙන්ම, පොළොන්නරුව, නුවරඑළිය, වව්නියාව, මාතර, මහනුවර, තිස්සමහාරාමය, අනුරාධපුරය ආදි ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් මෙම ස්ථානයට එළවළු හා පලතුරු තොග වෙළඳාම සඳහා ගෙනෙන අතර, සාමාන්‍යයෙන් දිනකට මෙට්‍රික්ටොන් 2500ත් 3000ත් අතර ප්‍රමාණයක් ලැබේ. සාමාන්‍යයෙන් සතියකට බෙදා හැරීමේ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 26500ක් පමණ වේ.

කෘෂි ආර්ථිකය පදනම් කරගත් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආර්ථික මධ්‍යස්ථානය වන දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයට පවතින ප්‍රධානතම වාණිජ සම්පත වේ.

***රූප සටහන අංක 5.1 :** දඹුල්ල විශේෂ ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය*



ප්‍රස්තාර අංක 5.5 : *දෛනික භාණ්ඩ එකතු කිරීම*
Source: *JICA Sri Lanka marketing survey (2012)*

පළාත	භාණ්ඩ ගලා ඒම (mt)	%	පිටතට ගලා යාම (mt)	%
මධ්‍යම	526	39%	245	20%
වයඹ	111	8%	195	16%
උතුරු මැද	343	25%	205	17%
ඌව	73	5%	26	2%
උතුර	51	4%	68	6%
නැගෙනහිර	65	5%	118	10%
සබරගමුව	55	4%	113	9%
දකුණ	31	2%	55	5%
බස්නාහිර	107	8%	175	15%
එකතුව	1362	100%	1200	100%

වගු අංක 5.6 : *දෛනික වෙළඳ භාණ්ඩ ගලා ඒම සහ පිටතට ගලා යාම*
Source: *JICA Sri Lanka marketing survey (2012)*



***රූප සටහන අංක 5.2 :** දෛනික වෙළඳ භාණ්ඩ ගලා ඒම සහ පිටතට ගලා යාම*
***Source :** JICA Sri Lanka marketing survey (2012)*

ශක්තීන් 05 – කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය ජලය සපුරාලීමට ප්‍රමාණවත් හොඳින් ව්‍යාප්ත වූ වාර්මාර්ග පද්ධතියක් පැවතීම.

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය පුරාම ව්‍යාප්ත වූ ස්වභාවික ජල මූලාශ්‍ර ජාලය භූමි ප්‍රමාණයක් 6% ක පමණ ප්‍රමාණයක් නියෝජනය කරයි.

ජල මූලාශ්‍ර -දඹුල්ල

1. මිරිස්ගෝනියාව
2. වෑවල
3. පුවගෙල වැව
4. මැණික්කන්ද වැව
5. ඉහළ වැව
6. ගලෙනුවත්ත වැව
7. පහල වැව
8. ඇතැබැදි වැව
9. අළුත් වැව
10. උඩ වැව
11. සියඹලාව වැව
12. වල්මීනගොල්ල වැව
13. ගමේ වැව
14. මහ වැව
15. ගල්පිට වැව
16. බුලාගල වැව
17. රන්දෙණිය වැව
18. කුරුකැල්කටුවේ වැව

19. අඹගහ දළුපොත වැව
20. වල්ගම් වැව
21. තිඹිටගස් වැව
22. අගුණකොලපැලැස්ස වැව
23. කුණාගොන වැව
24. කොරකහගොල්ල වැව
25. වානේ වැව
26. ඇවුල වැව
27. තිඹිරි අත්ත වැව
28. පතහබිදිවිවි වැව
29. වෙලගහන්ද වැව
30. පැල්වෙහෙර වැව
31. මාදමුල්ල වැව
32. කරගහ වැව
33. රණවීර වැව
34. බෝදිලියනගේ වැව
35. රත්මලේ වැව
36. වැගොල්ල වැව
37. කණ්ඩලම වැව
38. දඹුළු ඔය රක්‍ෂිතය
39. හළුඅපුල්ලන වැව
40. පොහොරන් වැව

රක්‍ෂිත ජල මූලාශ්‍ර - දඹුල්ල

41. යක්කුරා ඔය
42. මාල ඔය
43. වැවල ඔය
44. නාගොල්ල ඔය
45. බෙල්ලන්ගේ ඔය
46. වාර්මාර්ග ඇල
47. මහගොනා ඔය
48. කුඩාගෝනා ඔය
49. කළුන්දෑව ඔය
50. ඇරැව්වල ඔය
51. කඩලමාන ඇල

ශක්තීන් 06 – විසල් දඹුල්ල ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම නිසා ප්‍රධාන නගර අතර හොදින් ව්‍යාප්ත වුනු සම්බන්ධතාවයක් පැවතීම.

ශ්‍රී ලංකාවේ මධ්‍ය නගරය ලෙස පිහිටා ඇති දඹුල්ල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ උතුර දකුණ යා කෙරෙන ප්‍රධාන දොරටුව වේ. එමෙන්ම ඒ සඳහා ත්‍රිකුණාමලය - අඹේපුස්ස (A 6) ප්‍රධාන මාර්ගයත්, මහනුවර - යාපනය යා කෙරෙන A 9 මාර්ගයත් ප්‍රධාන වශයෙන් දායක වේ.

මෙම පිහිටීම හා සංවර්ධනය වූ මාර්ග ජාලය ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනයට දායක වන ප්‍රධාන මූලාශ්‍රය වේ.

සිතියම් අංක 5.6 : මාර්ග ජාල සම්බන්ධතා - ශ්‍රී ලංකාව



සිතියම් අංක 5.7 : මාර්ග ජාල සම්බන්ධතා - විසල් දඹුල්ල

ඉලක්ක 01 | දුර්වලතා

දුර්වලතා 01 – දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ශීතාගාර පහසුකම් හා සකසුරුවම් පහසුකම් නොමැති වීම.

සාමාන්‍යයෙන් දිනකට කි.ග්‍රෑ 1,000,000 වෙළඳ භාණ්ඩ ඒකරාශි වීමක් සහිත දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විසල් දඹුල්ල ප්‍රදේශයට ශක්තියක් වුවද, එහි පවතින හඳුනාගත් දුර්වලතාවයන්ද ඇත. ඒ අනුව භාණ්ඩ හුවමාරුව සඳහා පවතින ප්‍රදේශයන්ගේ ඉඩකඩ මදිකම, වාහන නවත්වන ස්ථානයන්ගේ හිඟකම, ගබඩා පහසුකම්වල හිඟකම හා සකසුරුවම් පහසුකම් නොමැතිකම හඳුනාගත හැක.

රූප සටහන අංක 5.3 : *දඹුල්ල විශේෂිත ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය - ප්‍රමාණවත් ගබඩා පහසුකම්, ශීතාගාර පහසුකම් හා සකසුරුවම් පහසුකම් නොමැති වීම.*



රූප සටහන අංක 5.4 : *දඹුල්ල විශේෂිත ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය ඉදිරිපස මාර්ගය*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය, මාතලේ කාර්යාලය (2021)*

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානයට රැගෙන එන වෙළඳ භාණ්ඩ සියල්ලම එළවළු පළතුරු හා අනෙකුත් බෝග බැවින් කල් තබා ගැනීමේ අපහසුතාවයන් පවතී. දෛනික වෙළඳ භාණ්ඩ එකතුවෙන් 40%ක පමණ ප්‍රමාණයක් අපද්‍රව්‍ය ලෙස බැහැර කිරීමට සිදු වේ.

උදාහරණයක් ලෙස පෙබරවාරි මාසයේදී දෛනිකව මෙට්‍රික් ටොන් 1000 පමණ පාරිභෝගික භාණ්ඩ එකතුවක් අපතේ යයි.

වර්ගය අනුව සාමාන්‍ය දෛනික භාණ්ඩ එකතු කිරීම



අනෙකුත් ක්ෂේත්‍ර බෝග: සහල් හැර අනෙකුත් ප්‍රධාන
භෝග (අල, ළූණු, බෝංචි, බඩ ඉරිඟු සහ මිරිස්)

ප්‍රස්තාර අංක 5.6 : වර්ගය අනුව සාමාන්‍ය දෛනික භාණ්ඩ එකතුව
මූලාශ්‍රය: JICA Sri Lanka marketing survey (Dec. 2012)



***ප්‍රස්තාර අංක 5.7 :** සාමාන්‍ය දෛනික භාණ්ඩ එකතු කිරීම සහ සාමාන්‍ය නාස්තිය*
***මූලාශ්‍රය :** Market Information. (2019). HARTI Sri Lanka*

ඊට අමතරව දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානයට පැමිණෙන රථ වාහන නිසා ඒ ඉදිරිපස ප්‍රධාන මාර්ගයේ (A9) මධ්‍යය කලාපයේදී රථ වාහන තදබදයක් දැකගත හැක.



***ප්‍රස්තාර අංක 5.8 :** දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය වෙත සතියේ දිනක පැයට රථ වාහන ගලා ඒම සහ පිටතට ගලා යාම | **මූලාශ්‍රය :** JICA Sri Lanka marketing survey (2012)*

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

ප්‍රධාන වශයෙන් ආර්ථික මධ්‍යස්ථානයට භාණ්ඩ රැගෙන පැමිණෙන රථ වාහන පෙ.ව 10.00 සිට ප.ව 3.00 අතර පැය 5 ක පමණ කාල සීමාවකදී අධිකව පැමිණෙන අතර, ආර්ථික මධ්‍යස්ථානයෙන් භාණ්ඩ රැගෙන යන රථ වාහන ප.ව 4.00 සිට ප.ව 10.00 අතර කාල සීමාවේදි අධිකව පවතී. එම නිසා මේ අතරතුර කාලයේදි ලොරි රථ සඳහා නැවතුම් පහසුකම් හිඟතාවයක් පවතී.

මෙම පහසුකම් හිඟකම දඹුල්ල නාගරික සංවර්ධන සැලැස්මේ අරමුණු වෙත ලඟා වීමට දුර්වලතාවයක් වන අතර නව ව්‍යාපෘතීන් හරහා විසදා ගත යුතු වේ.

දුර්වලතා 02 – කෘෂි කර්මාන්තය සඳහා පෞද්ගලික ආයෝජකයින් නොමැති වීම මෙම අංශයේ ව්‍යාප්තීන් සීමා කරයි. (CIC පැල්වැහැර සහ Bio Foods පෞද්ගලික සමාගම පමණක් මෙම ප්‍රදේශයේ ආයෝජනය කර ඇත.)



විසල් දඹුල්ල ප්‍රදේශය තුළ ආර්ථික දියුණුව සඳහා උපයෝගි කරගත හැකි විභවතාවයන් බෙහෝමයක් පැවතියද පෞද්ගලික අංශයේ ආයෝජකයින් කෘෂි ආර්ථික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා දායකත්වය නොදක්වා සිටීම දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැක.

දැනට මෙම ප්‍රදේශය තුළ හඳුනාගත් පෞද්ගලික අංශයේ ආයෝජකයින් වනුයේ CIC සමාගම සහ 'Bio Foods' පෞද්ගලික සමාගම පමණි.

රූප සටහන අංක 5.5 : *CIC පැල්වැහැර සහ Bio Foods පෞද්ගලික සමාගමෙහි පිහිටීම*
මූලාශ්‍රය : *ගූගල් සිතියම්*

දුර්වලතා 03 – ප්‍රදේශය තුල කෘෂි පාදක අගය එකතු කිරීමේ කර්මාන්ත නොමැති වීම.

දිනකදී දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානයට ඒකරාශි වන වෙළඳ භාණ්ඩයන්ගෙන් 40%ක පමණ ප්‍රමාණයක් අපතේ යෑම සිදුවේ. මෙම නාස්තිය වළක්වා ගැනීමට හැකිවන ලෙස අගය එකතු කිරීමේ කර්මාන්ත නොමැති කම මෙම ප්‍රදේශයේ පවතින ප්‍රධාන දුර්වලතාවයන් ලෙස හඳුනාගත හැක.

තවද අගය එකතු කිරීමේ නිෂ්පාදන ඇති කිරීම සඳහා නව තාක්‍ෂණික අවස්ථා මෙම ප්‍රදේශ තුළ හඳුන්වා නොදීම විසල් දඹුල්ල සංවර්ධන සැලැස්මේ ඉලක්ක වෙත ළඟා වීම සඳහා දුර්වලතාවයන් ලෙස හඳුනාගෙන ඇත.

දුර්වලතා 04 – කෘෂි නිෂ්පාදකයින් සහ වෙළෙන්දන් පිළිබදව නිවැරදි තොරතුරු එක්රැස් කර නොමැති වීම.

කෘෂි බෝග අපනයනය කර්මාන්තයක් ලෙස පවත්වාගෙන යාම සඳහා නිෂ්පාදන ප්‍රමාණය, නිෂ්පාදනය කරන්නන්ගේ තොරතුරු, අගය එකතු කිරීමේ නිෂ්පාදන ප්‍රමාණයන් සහ කල්තබා ගන්නා ක්‍රමවේදයන් පිළිබදව දත්ත සංචිතයක් නොමැති වීම දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය.

ඉලක්ක 01 | අවස්ථා

අවස්ථා 01 – රජයේ ප්‍රතිපත්ති 2020 තුලින් නව තාක්‍ෂණික ක්‍රමවේද උපයෝගී කර ගනිමින් ගොවිතැන ආකර්ෂණීය වෘත්තියක් බවට පත් කිරීමට අවධානය යොමු කර තිබීම.

රජයේ ප්‍රතිපත්ති 2020 මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ජනතා කේන්ද්‍රිය ආර්ථිකයක් බවට පත් කිරීමට යෝජනා කර ඇත. මේ අනුව ‘තාක්‍ෂණය හා මුසුවන අපේ ගොවිතැන’ සංකල්පය යටතේ සම්ප්‍රදායික කෘෂි කර්මාන්ත ක්‍රමයන්ගෙන් ඔබ්බට ගොස් වැඩි අස්වැන්නක් ලබා ගැනීම සහ කෘෂි කර්මාන්තය ආකර්ෂණීය වෘත්තීයක් බවට පත් කිරීමට කටයුතු කරනු ඇත.

තවද, අපනයනය පදනම් කරගත් සියලු අපනයන බෝග ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය තාක්‍ෂණික පහසුකම් ප්‍රවර්ධනය, සැකසුම් හා අගය එකතු කිරීමේ නිෂ්පාදන සහ වෙළඳපොල ප්‍රවර්ධනය සඳහා පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදීම මගින් විසල් දඹුල්ල සංවර්ධන සැලැස්මෙහි ඉලක්ක වෙත ළඟා වීමට පිටුවහල් වනු ඇත.

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

අවස්ථා 02 – උෂ්ණත්වය හා ආද්‍රතාවය පාලනය කළ හැකි ටොන් 5000ක ධාරිතාවයකින් යුතු ගබඩා සංකීර්ණයක් ඉදිකිරීම. (ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 2.8)

පසු අස්වනු හානිය අවම කිරීම සහ කෘෂි පාදක නිෂ්පාදන සඳහා වඩා හොඳ ගබඩා පහසුකම් ඇති කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ විශාලතම කෘෂි එකතු කිරීමේ මධ්‍යස්ථානය වන දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානයට ආසන්නයෙන් ටොන් 5,000ක උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය පාලනය කරන ලද ගබඩාවක් ඉදිකිරීම සිදුකරයි.

අස්වනු නෙළන කාලය තුළ, කෘෂි නිෂ්පාදන බොහොමයකට අධික සැපයුම හේතුවෙන් අඩු මිලක් ලැබේ. කෙසේ වෙතත්, උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද ගබඩාව ඉදිකරමින් ඇති අතර, එය කෘෂි නිෂ්පාදන යම් කාලයක් සඳහා ගබඩා කිරීමට සහ අස්වනු අඩු කාලවලදී වෙළඳපොළට මුදා හැරීමට උපකාරී වේ. ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු ගබඩා කිරීමේ පහසුකම් නොමැතිකම නිසා අස්වැන්නෙන් 40% ක් පමණ අහිමි වන බව සැලකේ.

***රූප සටහන අංක 5.6 :** ව්‍යාපෘතියේ පිහිටීම*

ගොඩනැගිල්ලේ නම	*බිම් ප්‍රමාණය (වර්ග මීටර්)*
ගබඩාව	*3,873.66*
අගය එකතු කිරීමේ කර්මාන්ත මධ්‍යස්ථානය	*244.89*
ආපන ශාලා, භෝජනාගාර, විවේක ස්ථාන	*67.86*
කාර්යය මණ්ඩල නවාතැන්	*202.14*
වෙනත්	*174.21*
මුළු බිම් ප්‍රමාණය	***4,562.76***

***වගු අංක 5.7 :** ව්‍යාපෘතියේ තොරතුරු*

අවස්ථා 03 – යෝජිත අධිවේගී මාර්ගය මගින් කොළඹ වරාය සහ දඹුල්ල, ගලේවෙල වැනි ප්‍රදේශ අතර නව සම්බන්ධතාවයක් ඇති කිරීම.

අධිවේගී මාර්ග අන්තර් හුවමාරු 2 ක් දඹුල්ල සහ ගලේවෙල නගර මධ්‍යස්ථාන වලට ආසන්නව යෝජනා කර ඇත. යෝජිත උතුරු අධිවේගී මාර්ගය දඹුල්ල සිට කොළඹ දක්වා ගමන් කාලය පැය 1 දක්වා අඩු කරනු ඇත. නව සම්බන්ධතාවය කොළඹ වරායට භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ හැකියාව වැඩි කරයි.



රූප සටහන අංක 5.7 : යෝජිත අධිවේගී මාර්ග
මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්ති සැලසුම්කරණය 2017 – 2050

අවස්ථා 04 – යෝජිත ආසියානු සුපිරි අධිවේගි මාර්ගය මෙම ප්‍රදේශය සෘජුවම ආසියානු කලාපයට සම්බන්ධ කිරීම.

යෝජිත ආසියානු සුපිරි අධිවේගි මාර්ග ජාලය කිලෝමීටර් 125,000 කට වඩා වැඩි මාර්ග වලින් සමන්විත වන අතර ඒවා United Nations Economic and Social Commission for Asia and the Pacific (ESCAP) කලාපය තුළ මෙන්ම ආසියාව සහ යුරෝපය අතර ජාත්‍යන්තර වෙළඳාමට සේවය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරයි.

සිතියම් අංක 5.8 : යෝජිත ආසියානු සුපිරි අධිවේගි මාර්ග ජාලයෙහි කොටසක්

අවස්ථා 05 : යෝජිත කුරුණෑගල - හබරණ දුම්රිය සේවාව භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදා ගත හැකි වීම.

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්ති සැලසුම්කරණය 2017 – 2050 ට අනුව හඳුනාගත් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් වන යෝජිත කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය හා දුම්රිය ස්ථානය විසල් දඹුල්ල ප්‍රදේශයේ ස්ථාපිත වීම හඳුනාගත් අරමුණු කරා ළඟාවීමට ඇති අවස්ථාව වැඩි කරයි.

අවස්ථා 06 – කුළු බඩු සඳහා ලෝක වෙළඳපොල සහ ආසියානු වෙළඳපොල වාර්ෂිකව 5% ක අනුපාතයකින් වර්ධනය වීම.

ශ්‍රී ලංකාවේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව වාර්ෂිකව කුළුබඩු සඳහා ඇති ඉල්ලුම ඉහළ යන බව හඳුනාගෙන තිබේ. තවද, අත්‍යවශ්‍ය තෙල්, රසය වැඩි කිරීමේ ද්‍රව්‍ය සහ සුවඳ විලවුන් වැනි අගය එකතු කල අපනයන භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම ඉහළ යමින් පවතී.

ඉලක්ක 01 | තර්ජන

තර්ජන 01 – ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ නියුතු ජනගහනය වාර්ෂිකව 0.71 (2019 - 2018) ක ශීඝ්‍රතාවයකින් අඩු වීම.



ප්‍රස්තාර අංක 5.9 : *කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ නියුතු ජනගහනය*
මූලාශ්‍රය : *Economy and Social Statistics of Sri Lanka. (2019). Central Bank of Sri Lanka.*

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

තර්ජන 02 – මියන්මාරය සහ වියට්නාමය වැනි අපනයන කරුවන්ගේ ඉහළ ඵලදායිතාවය නිසා ලෝක වෙළඳපොලේ කෘෂි බෝග අපනයනය සඳහා තරගයක් ඇති වීම.

සැපයුම් මට්ටම් හේතුවෙන් ගෝලීය අපනයනකරුවන් අතර තරගය ඉහළ ගොස් තිබේ. නිෂ්පාදකයින්ගේ ඵලදායිතාව උපරිම කිරීම අපනයන වෙළඳපොලේ භාණ්ඩ වල මිල අඩු කිරීමට හේතුවී ඇත. එබැවින් නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම වැදගත්ය.

මූලාශ්‍රය: අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

5.2.2 ඉලක්ක 02

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයේ විධිමත් සංවර්ධනය වූ සමාජ හා භෞතික අපරවපුහ පහසුකම් සහිත ප්‍රදේශයක් බවට පත් කිරීම

ඉලක්ක 02 | ශක්තීන්

ශක්තීන් 01 – විසල් දඹුල්ල ප්‍රදේශය පුරා හොදින් ව්‍යාප්ත වූ පාසල් හා රෝහල් ජාලයක් පැවතීම.

විසල් දඹුල්ල ප්‍රදේශය අධ්‍යාපන කලාප 03 කට අයත් වේ. ඉන් ගලේවෙල අධ්‍යාපන කොට්ඨාශයෙහි පාසල් 42 ක්ද, දඹුල්ල අධ්‍යාපන කොට්ඨාශයෙහි පාසල් 42 ක්ද, නාඋල අධ්‍යාපන කොට්ඨාශයෙහි පාසල් 26 ක්ද පිහිටා ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	පාසල් සංඛ්‍යාව					
	ජාතික පාසල්	වෙනත් පාසල්				
		1 AB පාසල්	1 C පාසල්	2 වන බාණ්ඩයේ පාසල්	3 වන බාණ්ඩයේ පාසල්	එකතුව
ගලේවෙල	-	1	13	12	16	42
දඹුල්ල	1	-	7	14	20	42
නාඋල	1	-	6	12	7	26
මුළු එකතුව						**110**

වගු අංක 5.8 : ප්‍රාදේශීය කොට්ඨාශය අනුව පාසල් වර්ගීකරණය - 2018
මූලාශ්‍රය : සම්පත් පැතිකඩ - 2018

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

තවද, විසල් දඹුල්ල ප්‍රදේශයේ පිහිටන ප්‍රධාන රෝහල වන්නේ දඹුල්ල මූලික රෝහලයි. මීට අමතරව සීගිරිය, ලෙනදොර, ගලේවෙල, මාදිපොල, නාලන්ද හා හබරණ ප්‍රදේශයන්හි ප්‍රාදේශීය රෝහල් පිහිටා ඇත.

අංකය	රෝහලේ නම	වාට්ටු සංඛ්‍යාව	ඇඳන් සංඛ්‍යාව
01.	*දඹුල්ල මූලික රෝහල*	*11*	*298*
02.	*සීගිරිය ප්‍රාදේශීය රෝහල*	*4*	*34*
03.	*ලෙනදොර ප්‍රාදේශීය රෝහල*	*2*	*12*
04.	*ගලේවෙල ප්‍රාදේශීය රෝහල*	*6*	*81*
05.	*මාදිපොල ප්‍රාදේශීය රෝහල*	*4*	*39*
06.	*නාලන්ද ප්‍රාදේශීය රෝහල*	*4*	*37*
07.	*හබරණ ප්‍රාදේශීය රෝහල*		

***වගු අංක 5.9 :** විසල් දඹුල්ල ප්‍රදේශයේ රෝහල්*
***මූලාශ්‍රය :** සම්පත් පැතිකඩ - 2018*



සිතියම් අංක 5.9 : *විසල් දඹුල්ල ප්‍රදේශයේ පාසල් ව්‍යප්තිය*



සිතියම් අංක 5.10 : *විසල් දඹුල්ල ප්‍රදේශයේ රෝහල් ව්‍යාප්තිය*

ශක්තීන් 02 – දඹුල්ල, නාඋල සහ සීගිරිය ප්‍රදේශයන්හි වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටා තිබීම.

රූප සටහන අංක 5.18 : දඹුල්ල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය



රූප සටහන අංක 5.8 : *දඹුල්ල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය*

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

ශක්තීන් 03 – අනාගත ඉල්ලුම සැපයිය හැකි ජල විදුලි ජාලයක් පැවතීම.

2030 දී අපේක්ෂිත ජනගහනය සඳහා නල ජලය ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවයක් විසල් දඹුල්ල ජල ව්‍යාපෘතියට ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ දිනකට ඝන මීටර් 32,000ක ජල ධාරිතාවක් නිකුත් කිරීමේ හැකියාවක් ඇති අතර, එය වර්ග කිලෝමීටර 228 ක ප්‍රමාණයක් මුළු ප්‍රදේශය තුල ආවරණය කරයි. එය ගලේවෙල, දඹුල්ල, කණ්ඩලම, තිත්තවැල්ගොල්ල, කිතුල්හිටියාව, ඉනාමළුව, සීගිරිය, හබරණ යන ප්‍රදේශ ආවරණය කොටගෙන ව්‍යාප්තව පවතී.

ශක්තීන් 04 – දිගම්පතහ ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් පිහිටුවා තිබීම.

දිගම්පතහ කසළ කළමනාකරණ පද්ධතියෙහි දෛනිකව ටොන් 50 ක ප්‍රතිචක්‍රීකරණ ධාරිතාවයක් ඇත. මෙහි කසළ කොම්පෝස්ට් බවට පත් කිරීමෙහි ක්‍රියාවලිය සිදු කරයි. මේ වන විටත් දඹුල්ල, නාඋල, ගම්පොල, ගෙලිඔය, ගලේවෙල, අනුරාධපුර හා කැකිරාව ප්‍රදේශයන්හි රැස්වන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා මෙම කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට බැහැර කරයි.

***රූප සටහන අංක 5.9 :** දිගම්පතහ ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය ඉදි කිරීමට පෙර*

***රූප සටහන අංක 5.10 :** දිගම්පතහ ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය ඉදි කිරීමෙන් පසු*

ශක්තීන් 04 – ස්වභාවික වැසි ජල කළමනාකරණ පද්ධතියක් පිහිටා තිබීම.

ශක්තීන් 05 – ශ්‍රී ලංකාවේ ජාතික මාර්ග ජාල 02 ක් වන අඹේපුස්ස - ත්‍රිකුණාමලය (A6) ප්‍රධාන මාර්ගයත්, මහනුවර - යාපනය යා කෙරෙන (A9) මාර්ගයත් විසල් දඹුල්ල ප්‍රදේශය හරහා විහිදී තිබීම.

ත්‍රිකුණාමලය - අඹේපුස්ස යා කෙරෙන A 6 ප්‍රධාන මාර්ගයත්, යාපනය - මහනුවර යා කෙරෙන A 9 මාර්ගයත් විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය හරහා ව්‍යාප්තව පැවතීම ප්‍රදේශයේ ගමනා ගමන, ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීමට පවතින ප්‍රධාන විභවතාවයක් වේ.



සිතියම් අංක 5.11 : *දඹුල්ල හා ප්‍රධාන නගර අතර සම්බන්ධතා*

ශක්තීන් 06 – සීගිරිය ශෛලස්ථ ගුවන් තොටුපොල මෙම ප්‍රදේශයේ පිහිටා තිබීම.

ශක්තීන් 07 : භූගෝලීය වශයෙන් පැතලි භූමියක පිහිටීම නිසා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පහසු වීම.



රූප සටහන අංක 5.11 : *විසල් දඹුල්ල ප්‍රදේශයේ භූගෝලීය පිහිටීම*

ඉලක්ක 02 | දුර්වලතා

දුර්වලතා 01 – පාසල් හා රෝහල් වල භෞතික සම්පත් හිඟ වීම.

කාර්යය මණ්ඩලය	**පවතින තත්වය**	**ස්ථාවරයන්**	**වෙනස**
විශේෂඥ වෛද්‍යවරුන් (Specialist Doctors)	*15*	*18*	*3*
වෛද්‍යවරුන් (Doctors)	*66*	*89*	*23*
මේට්‍රන් (Metrans)	*2*	*2*	*0*
හෙදියන් (Nurses)	*172*	*178*	*6*
සිස්ටර්ස් (Sisters)	*11*	*16*	*5*
මහජන සෞඛ්‍ය පරීක්ෂක (P H I)	*15*	*18*	*3*
පරිපාලන නිලධාරී (Administrative Officers)	*1*	*1*	*0*
ඖෂධවේදීන් (Pharmacists)	*8*	*10*	*2*
රසායනාගාර කාර්මික ශිල්පීන් (Lab Technicians)	*7*	*10*	*3*
එක්ස් කිරණ 3 (X ray 3)	*3*	*4*	*1*
ඊ සී.ජී (E C G)	*2*	*2*	*0*
අක්ෂි පරීක්ෂක (Eye Technician)	*3*	*3*	*0*
භෞතික චිකිත්සක (Physio Therapy)	*1*	*2*	*1*
බෙහෙත්ශාලා (Dispensary)	*3*	*3*	*0*
සැලසුම් හා වැඩසටහන් නිලධාරී (Planning and Program Officer)	*1*	*1*	*0*
සංවර්ධන නිලධාරී (Development Officer)	*4*	*2*	*-2*
කළමනාකාර සහකාර(Management Assistant)	*8*	*10*	*2*

කාර්යය මණ්ඩලය	පවතින තත්වය	ස්ථාවරයන්	වෙනස
මහජන සෞඛ්‍ය රසායනාගාර කාර්මික ශිල්පීන් (Public Health Lab Technician)	1	1	0
රියදුරා (Drivers)	5	5	0
දුරකථන ක්‍රියාකරුවන් (Telephone operator)	1	3	2
උපස්ථායක (Attendant)	28	65	37
සෞඛ්‍ය සේවක (Health care worker)	66	125	59
සිවිල් නිලධාරීන් (Casual Officer)	19	-	-
එකතුව	**442**	**572**	**130**

වගු අංක 5.10 : දඹුල්ල රෝහලේ සම්පත් හිග ප්‍රමාණයන්

දුර්වලතා 02 – ප්‍රදේශය තුල උසස් අධ්‍යාපන පහසුකම් නොමැති වීම.

දුර්වලතා 03 – 2030 දී පුරෝකථනය කරන ලද ජනගහනය සඳහා ප්‍රමාණවත් විනෝදාත්මක පහසුකම් නොමැති වීම.

2018 වර්ෂයේදී විසල් දඹුල්ල ප්‍රදේශය තුළ පවත්නා හෙක්ටයාර් 121 විවෘත විනෝද භූමි ප්‍රමාණයට අමතරව 2030 වන විට හෙක්ටයාර් 300 පමණ භූමි ප්‍රමාණයක් අනාගත ජනතාවගේ අවශ්‍යතා සැපිරීමට සපයා දිය යුතුය. මෙය විසල් දඹුල්ල මුළු භූමි ප්‍රමාණයෙන් 0.4%ක පමණ ප්‍රමාණයක් වේ.

වර්ෂය	ජනගහනය	විවෘත විනෝද භූමි ප්‍රමාණය (හෙක්.)
2018	247,500	121
2030	298,500	418

වගු අංක 5.11 : විනෝදාත්මක පහසුකම්

දුර්වලතා 04 – ප්‍රධාන වාණිජ නගර වන දඹුල්ල සහ ගලේවෙල ප්‍රදේශයන්හි මධ්‍යම මලාපවාහන පද්ධතියක් නොමැති වීම.

දුර්වලතා 05– නගර මධ්‍යස්ථාන වල වාහන නැවැත්වීමේ පහසුකම් නොමැති වීම.

දුර්වලතා 06 – දඹුල්ල ප්‍රධාන බස් නැවතුම්පොල නිසි ලෙස ක්‍රියාත්මක නොවීම.

සිදුකරන ලද මාර්ගගත සමීක්ෂණයට අනුව දඹුල්ල ප්‍රධාන බස්නැවතුම බොහෝ මගීන් භාවිතා නොකරයි. ඒ ආසන්නයෙන් ඇති බස් නැවතුම්පොළවල් දෙකක් දුර ගමන් බස් නැවතීම සඳහා භාවිතා වේ. මෙම බස් නැවතුම්පොළවල් අසල නිසි පහසුකම් පවා හිඟතාවයක් පවතී.

විදේශීය සංචාරකයින්ගේ අදහස් :

“What I call Dambulla Main bus stop is just a bus stop along the road. No bus stations!”

“There is a proper bus station in Dambulla. But the actual Dambulla bus station is quite useless as it almost only serves short distance buses, like the bus to Sigiriya.”



රූප සටහන අංක 5.12 : *දඹුල්ල ප්‍රධාන බස්නැවතුමේ පිහිටීම*

දුර්වලතා 07 – නගර මධ්‍යස්ථානවල සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම.

ඉලක්ක 02 | අවස්ථා

අවස්ථා 01 – අනාගත පානීය ජල ඉල්ලුම සපුරාලීම සඳහා විසල් දඹුල්ල ජල යෝජනා ක්‍රමයේ ධාරිතාවය ප්‍රමාණවත් වීම.

විසල් දඹුල්ල ජල ව්‍යාපෘතිය යටතේ වර්ග කිලෝමීටර 1600 ප්‍රදේශයකට ජලය සැපයීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතියේ දෛනික ජල සැපයුම් ධාරිතාව ඝනමීටර 30,000 පමණ වේ. ඉබ්බන්කටුව ජලාශය හා දඹුළුඔය මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන ජල ප්‍රභවය ලෙස හඳුනාගෙන ඇත.



සිතියම් අංක 5.12 : *විසල් දඹුල්ල ජල ව්‍යාපෘතියේ ජල සැපයුම් ප්‍රදේශය*

අවස්ථා 02 – යෝජිත අධිවේගී මාර්ගය හා යෝජිත විදුලි දුම්රිය මාර්ග නැවතුම් ස්ථාන දඹුල්ල නාගරික කලාපය ආශ්‍රිතව පිහිටීම.



***සිතියම් අංක 5.13:** යෝජිත කුරුණෑගල - හබරණ විදුලි දුම්රිය මාර්ගය හා යෝජිත අධිවේගී මාර්ගය*

ඉලක්ක 02 | තර්ජන

තර්ජන 01 – වැඩි දියුණු වූ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් පවතින මාතලේ, මහනුවර, කුරුණෑගල සහ අනුරාධපුර වැනි ප්‍රදේශයන් සඳහා මෙම ප්‍රදේශයේ ජනතාව ආකර්ෂණය වීම.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල අනුව පාසල් පෙළ ගැස්විමේ දි පළමු පාසල් 50 අතර පවතින පාසල් රූපසටහනෙහි දක්වා ඇත. විසල් දඹුල්ල ප්‍රදේශයෙහි මෙම වර්ගීකරණයට අයත් එකදු පාසලක් හෝ පිහිටා නැත.

තවද, පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ශිෂ්‍යයන් ඇතුලත් කර ගන්නා කඩයිම් ලකුණු මට්ටම් සහිත එකදු පාසලක්වත් විසල් දඹුල්ල ප්‍රදේශය තුළ පිහිටා නොමැත. මීට අමතරව ආසන්න ප්‍රධාන නගරයන්හි පිහිටා ඇති ජනප්‍රිය පාසල් ප්‍රස්ථාර අංක 5.1 න් දැක්වේ.

***සිතියම් අංක 5.14 :** සාමාන්‍ය පෙළ ප්‍රතිඵල මත පදනම්ව ශ්‍රේණිගත පාසල් | **මූලාශ්‍රය :** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පාසල් කාර්යය සාධක දර්ශකය සාමාන්‍ය පෙළ*



***ප්‍රස්ථාර අංක 5.10 :** ශ්‍රේණියේ ශිෂ්‍යත්ව කඩඉම් ලකුණු මත පදනම් වූ ජනප්‍රිය පාසල් ගණන*

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

රූප සටහන් අංක 5.24 හි දඹුල්ල නගරයට ආසන්න නගර වල පිහිටා ඇති ප්‍රධාන රෝහල් දක්වා ඇත. ආසන්න වශයෙන් අනුරාධපුර රෝහල හා මාතලේ රෝහල පැය 1 විනාඩි 15 ක පමණ දුරින් ද, කුරුණෑගල රෝහල හා පොලොන්නරුව රෝහල පැය 1 විනාඩි 30 ක පමණ දුරින් ද මහනුවර රෝහල පැය 2 විනාඩි 15 ක පමණ දුරින් ද පිහිටා ඇත.



රූප සටහන අංක 5.13 : අසන්න නගර වල සෞඛ්‍ය පහසුකම් ව්‍යාප්තිය

5.2.3. ඉලක්ක 03

මහ දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය පවතින ස්වභාවික ධනය සහ මානව නිර්මිත පරිසරය අතර සමබරතාවය ආරක්ෂාවන පරිදි අනාගත නගර ආකෘතිය නිර්මාණය කිරීම.

ඉලක්ක 03 | ශක්තීන්

ශක්තීන් 01 – ජෛව විවිධත්ව සේවාවන් සහ ජෛව විවිධත්ව අගයන් ඉහල මට්ටමක පවතින තෙත් බිම් වනාන්තර සහ එහි පවතින වෙළඳපොල මත පදනම් නොවන වටිනාකම් මෙන්ම ඓතිහාසික වටිනාකම් වලින් අනූන මානව නිර්මිත පරිසර භූදර්ශනය.

එමෙන්ම පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස වනාන්තර ප්‍රදේශ 27ක් (තෘණ භූමි ඇතුලත්ව) එනම් හෙක්ටයාර් 38179 ක් පුරා පැතිර පවතින අතර නාමල් උයන රක්ෂිතය, මැණික්දෙන රක්ෂිතය, සිගිරිය රක්ෂිතය ප්‍රධාන වනාන්තර ලෙස පිහිටා ඇත. වනාන්තර හා තෘණ භූමි ලෙස, ශේෂ කඳු පන්තින්ද ඇතුලත්ව භූමි පරිහරණ රටාව තුල 38% ප්‍රතිශතයක් පෙන්නුම් කරයි. රැම්සා තෙත් බිම් නිර්වචනයට අනුව ශ්‍රී ලංකාවේ තෙත්බිම් ප්‍රධාන කොටස් තුනකට වෙන් කර ඇත. එම වර්ගීකරණයට අනුව මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය තුල මිනිසා විසින් නිර්මිත තෙත් බිම් ලෙස කුඹුරු ඉඩම්, වැව්, ජලාශ හඳුනාගත හැකි අතර අභ්‍යන්තර ස්වාභාවික මිරිදිය තෙත් බිම් ලෙස ගංගා, දිය පහර, ඇළ, වගුරු බිම හදුනා ගත හැක. මානව නිර්මිත තෙත් බිම් ලෙස කුඹුරු ඉඩම් මුළු භූමි පරිහරණයෙන් 15% පමණ වේ. විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය කෘෂි ආර්ථික රටාවක් මත පදනම් වී ඇත. මෙම සංවර්ධන සැලැස්ම තුල තෙත් බිම් සහ වනාන්තර පද්ධතිය මගින් නගර ආර්ථිකයට විශාල දායකත්වයක් සැපයීම මෙන්ම අවට පරිසරයේ ජීවී අජීවී කොටස්වලට පරිසර පද්ධති සේවාව (ecosystem service) හා පරිසර පද්ධති අගයන් (ecosystem values) සැපයෙන අතර ගංවතුර පාලනය, නාගරික උෂ්ණත්වය පාලනය මෙන්ම ජීවී අජීවී පරිසරයට ජෛව විවිධත්ව අගයන් සහ ජෛව විවිධත්ව සේවාවන් ලබා දේ. එමෙන්ම දඹුල්ල මහා නාගරික ප්‍රදේශය තුල පිහිටා ඇති සංවේදී ස්ථාන වෙළඳ පොළ මත පදනම් නොවන වටිනාකම් (non market base value) ලෙස ප්‍රතිපාදන සේවා, නියාමන සේවා, සංස්කෘතික සේවා, උපකාරක සේවා සපයනු ලබයි. සංස්කෘතික සේවාවන් හා වටිනාකම් ලෙස (cultural services and values), ආගමික වටිනාකම් සහිත ප්‍රදේශ, (සිගිරිය පිදුරංගල) අධ්‍යාපනික දැනුම ඉහල නන්වන ස්ථාන සහ පාරිසරික සංචාරක කර්මාන්තය (eco-tourism) සඳහාම වෙන් වූ ස්ථානයන් පිහිටීම අධ්‍යාත්මික, මානසික හා ශාරීරික සුවය ඇතිකරනු ලබන විනෝදාත්මක ප්‍රදේශ පිහිටා තිබීම මහා දඹුල්ල නාගරික ප්‍රදේශයේ සුවිශේෂී ලක්ෂණයකි. එමෙන්ම මිනිසාගේ අවශ්‍යතා වන ආහාර සැපයීම ඉන්දන වශයෙන් දැව සැපයීම පාරිසරික වායු තත්වය මනා ලෙස පවත්වා ගෙනයාම, ජලය පිරිසිදු කිරීම (water purification) පස සංවර්ධනය කිරීම (soil formation) ජල චක්‍රය (water cycle) පවත්වාගන යාම ප්‍රධාන වශයෙන් සිදුවේ.

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

ශක්තීන් 02 – මුළු භූමි පරිභරණයෙන් 6% වන එල්ලංගා පද්ධති සහිත ජල සම්පත හා ඓතිහාසික වාරිකර්මාන්ත පවත්නා පරිසරය හා සම්බන්ධ වෙමින් නිලහරිත ප්‍රදේශයක් නිර්මාණය වී තිබීම.



සිතියම් අංක 5.15 : *විසල් දඹුල්ල ප්‍රදේශයේ ජල මුලාශ්‍ර පද්ධතිය*

ශක්තීන් 03 – මුළු භූමි පරිභරණයෙන් 70% පමණ වන ලෙස කෘෂිකාර්මික ඉඩම්, කුඹුරු ඉඩම්, වනාන්තර, ගෙවතු වගා ඉඩම් හරිත ප්‍රදේශ ලෙස පැවතීම.

ශක්තීන් 04 – අලි ඇතුන්ගේ වාසස්ථාන පිහිටා තිබීම.

ශක්තීන් 05 – පුනර්ජනනීය බලශක්ති උද්‍යාන සකස් කිරීම සඳහා යොදාගත හැකි පුනර්ජනනීය බලශක්ති සම්පත් ලෙස සුළඟ සහ සූර්යබල ශක්තිය ලැබෙන ප්‍රදේශ සංවර්ධන බල ප්‍රදේශය තුල පිහිටා තිබීම.

ශක්තීන් 06 – නගර හරිතකරන භූ දර්ශන සැලසුම් සඳහා මෙන්ම සෘජු හා වක්‍ර විනෝද (active & passive recreational) පහසුකම් සඳහා මානව නිර්මිත භූදර්ශනය හා ස්වභාවික පරිසරය බැදී පවතින සිගිරිය, දඹුල්ල, පිදුරංගල, නාමල් උයන උද්‍යාන භූ දර්ශනය යොදා ගැනීමෙන් සංචාරක කර්මාන්තය තුලින් නගර ආර්ථිකට සඳහා ඉහල දායකත්වයක් ලබා දීම.

ඉලක්ක 03 | දුර්වලතා

දුර්වලතා 01 – පවතින වනාන්තර සීමාවන් සහ එහි රක්ෂිත සීමාවන් නිවැරදිව හදුනාගත නොහැකි වන ලෙස අනවසර ඉදිකිරීම් සහ කෘෂිකාර්මික කෙටි කාලීන බෝග වගාවන් ව්‍යාප්තව වීම.

දුර්වලතා 02 – නගරයට ආසන්නව පවතින වනාන්තර රක්ෂිත සීමාවල ඉඩම්වල වටිනාකම් ඉහල අගයක් ගන්නා බැවින් හෝටල් සහ නාවතැන් පහසුකම් සංවර්ධනය සඳහා අනවසර අල්ලා ගැනීම් සහ ඉදිකිරීම් සීග්‍රයෙන් ඉහළයාම.

දුර්වලතා 03 – අප ජලය ජලමූලාශ්‍රවලට මුදාහැරීම හේතුවෙන් දඹුල්ල නගරයේ මතුපිට හා අභ්‍යන්තර ජලය දූෂණය වීම. තම්මැන්නා ඇළ, මිරිස්ගොනියව ඇළ සහ දඹුල්ල ඔයට අපවිත්‍ර ජලය බැහැරලීම හේතුවෙන් ජලය දූෂණය වීම සහ දුර්ගන්ධය ඇතිවේ.

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

රූප සටහන අංක 5.25 : *තම්මැන්න ඇළට අපද්‍රව්‍ය බැහැර කරන ආකාරය*

ඉලක්ක 03 | අවස්ථා

අවස්ථා 01 – තිරසාර සංවර්ධන අරමුණු

එක්සත් ජාතීන් විසින් 2015 වර්ෂයේ දී සාමාජික රටවල් 193 සහභාගිත්වයෙන් තිරසාර සංවර්ධන අරමුණු (sustainable development goal) 17ක් හඳුන්වා දී ඇත. මෙහි මූලික අරමුණ වූයේ දුගීභාවය තුරන් කිරීම, සෞභාග්‍යය ඇතිකිරීම සහ පෘතුවිය ආරක්ෂා කිරීමයි.

අවස්ථා 02 – දේශගුණික විපර්යාශ පිළිබඳ ප්‍රතිපත්ති.

අවස්ථා 03 – රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය - තිරසාර පරිසර ප්‍රතිපත්තිය

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය හි ඇතුලත් තිරසාර පරිසර ප්‍රතිපත්තිය තුල ජෛව විවිධත්වය (biodiversity) වායුගෝලය (Atmosphere) ජනාවාස හා නගර (Settlement and city) හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය (Solid waste management) තුලින් පරිසර සමතුලිතතාවය ඇති කිරීම සඳහා උපාය මාර්ග හදුන්වා දී ඇත. වනගහනය 30% දක්වා ඉහල නැංවීම, වායුගෝලයේ පවතින ජීවී පරිසරයට අහිතකර වායුන් CO, SO අවම කිරීම හා අඩු කිරීමට නාගරික වන වගා ඇති කිරීම, මාර්ග දෙපස ගස් සිටුවීම උපාය මාර්ග ලෙස හදුන්වා දී ඇත

ජනාවාස හා නගර සංවර්ධනයේ දී පාරිසරික සංවේදී ප්‍රදේශ තුල මහා පරිමාණ සංවර්ධන කටයුතු සඳහා අවසර නොදීමත් පරිසරය හා බැදුණු කුඩා ප්‍රමාණ ව්‍යපෘති සඳහා පරිසරයට හානි නොවන පරිදි සිදුකිරීම. ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේදී දැනට පවතින රේඛිය ආර්ථිකය linear economy වෙනුවට චක්‍රාකාර ආර්ථික ක්‍රමයක් (Circular economy) හදුන්වා දීම තුලින් අපද්‍රව්‍ය අමුද්‍රව්‍යක් ලෙස භාවිතා කිරීම මගින් නව නිෂ්පාදන හදුනාගැනීම .

අවස්ථා 04 – ජාතික භෞතික සැලැස්මහි නාගරික සංවර්ධන උපායමාර්ග යටතේ හඳුන්වාදෙන ලද ඇවිදීමේ පහසුකම් සහිත සියලු දෙනාටම විනෝද පහසුකම් ඇතුලත් නගර, තිරසාර හරිත නගර ඇති කිරීම

ප්‍රකාශයට පත් කර ඇති ජාතික භෞතික සැලැස්ම 2020-2050 මගින් නාගරික සංවර්ධන උපාය මාර්ග යටතේ තිරසාර හරිත පරිසරයක් (green & sustainable environment) ඇවිදීමේ මං තීරු සහිත නගර (walkable city) විවේක විනෝද පහසුකම් සියලුම ජනතාවට (recreational facility for all) හදුන්වා දී ඇත. මේ අනුව නගරයේ ආර්ථික සංවර්ධනය පමණක් නොව තිරසාර සංවර්ධනයක් කරා ලගාවීමට අවශ්‍ය අවකාශයන් සැකසී ඇත.

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත. විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත. විශ්ලේෂණය

අවස්ථා 05 – 2011 – 2030 ජාතික භෞතික සැලැස්මට අනුව පාරිසරික අධි සංවේදි කලාපයට අයත් වීම.

***සිතියම් අංක 5.16 :** පාරිසරික අධි සංවේදි කලාපය*
***මූලාශ්‍රය :** ජාතික භෞතික සැලැස්ම 2011-2030*

2011 - 2030 ජාතික භෞතික සැලසුමට අනුව හඳුනාගත් පාරිසරික අධි සංවේදි කලාපයට අයත් වීම හේතුවෙන් පාරිසරික ප්‍රදේශ ආරක්ෂා කිරීමට අවශ්‍ය නීතිමය රාමුව සැකසී තිබීම විසල් දඹුල්ල ප්‍රදේශයේ පාරිසරික සංරක්ෂණයට පවතින වැදගත් අවස්ථාවක් වේ.

අවස්ථා 06 – ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, ගෘහනිර්මාණාත්මක හා භූ දර්ශනයන්ගෙන් අනූන සීගිරි මහා නිර්මාණය සහ අවට ස්වභාවික වන රක්ෂිතය සහිත ප්‍රදේශය යුනිස්කෝ ආයතනය මගින් ප්‍රකාශයට පත් කිරීම.

අවස්ථා 07 – වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය සහ පළාත් පාලන ආයතන මගින් බලාත්මක කරනු ලබන ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම සඳහා නීති පැවතීම.

පාරිසරික පද්ධතිය ආරක්ෂා කර ගැනීමට ඉහත සඳහන් ආයතන මගින් පහත ආකාරයේ නීති පනවා තිබීම විසල් දඹුල්ල දියුණු කිරීමට මහගු අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය.

- විසල් දඹුල්ල ප්‍රදේශ තුළ පරිසරය සහ වනජීවී සම්පත ආරක්ෂා කර ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මගින් ජාතික පරිසර පනත (NATIONAL ENVIRONMENTAL ACT) අංක 47 හඳුනාගත හැකිය.

- 1885 අංක 10 වන වනාන්තර පනත මගින් වන සම්පත් පාලනය කිරීම හා ඒවාට ප්‍රවේශ වීම දැඩි කිරීම සහ මහජනයාට ඉතා සීමිත ප්‍රවේශයක් ලබාදීම හඳුනා ගත හැකිය. මෙහි මූලිකම වැදගත්කම ලෙස වන සම්පත් ආරක්ෂා කර ගැනීම සහ අවිධිමත් ලෙස පරිහරණය කිරීම අවම කර ඇත.

- ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය ඇතුළු ස්වභාවික උරුමයන් සහ වන සම්පත් සංරක්ෂණය කිරීම සඳහා තිබූ පනත අසාර්ථක වී ඇති බැවින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙම ගැටළුව විසඳීමට ශ්‍රී ලංකා රජය 1988 දී අංක 03 දරණ ජාතික උරුම හා වනාන්තර ප්‍රදේශ පනත බලාත්මක කළේ ය.

- 1940 පුරාවස්තු පනත මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව දේපල සඳහා කිසිදු මැදිහත් වීමක් කිරීමේ අවසරය තහනම් කර ඇත. මේ අනුව පුරාවිද්‍යා වස්තූන් සහ සිතුවම් සංරක්ෂණය හා අධීක්ෂණය කිරීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වගකීමකි.

- 1981 අප්‍රේල් 16 දින අංක 137 දරණ ගැසට් නිවේදනය මගින් රන්ගිරි දඹුළු සහ ඒ අවට ප්‍රදේශය පූජනීය ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කර ඇත.

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත. විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත. විශ්ලේෂණය

ඉලක්ක 03 | තර්ජන

තර්ජන 01 – සංචාරක අංශයේ සීඝ්‍ර වර්ධනය හේතුවෙන් ඊට අදාල සංවර්ධන කාර්ය වනාන්තර ඇතුලතට ව්‍යාප්තවීමෙන් වනාන්තර තුල ජීවත්වන සත්ව හා ශාක විශේෂවලට හානි සිදුවීම.

තර්ජන 02 – අනවසර අල්ලාගැනීම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සංවේදී ප්‍රදේශවලට ව්‍යාප්තවීම.

තර්ජන 03 – අලි මිනිස් ගැටුම් ඇතිවීම.

2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල පරාශය තුල අලි මිනිස් ගැටුම් හේතුවෙන් දේපල හානි පමණක් නොව මිනිස් ජීවිත මෙන්ම අලි ඇතුන්ගේ ජීවිතද දිනෙන් දින අඩු වෙමින් පවතී. 2010–2019 වර්ෂවලදී අලි ඇතුන් මරණ සංඛයාව ඉහල අගයක් පවතී. ප්‍රස්ථාර සටහන 5.2 අනුව අම්පාර, පොලොන්නරුව, බදුල්ල, මොනරාගල ප්‍රදේශවල දේපල හානි ඉහල අගයක් ගන්නා අතර ඊට සාපේක්ෂව එම ප්‍රදේශවල අලි මිනිස් මරණද ඉහල අගයක් ගනී . එමෙන්ම අනුරාධපුර, පොලොන්නරුව සහ මාතලේ දිස්ත්‍රික්ක තුල වැඩි ප්‍රදේශයක අලි ඇතුන් සංචරණය සිදුවන බැවින් දේපල හානි සහ අලි මිනිස් ජීවිත හානි ඉහල අගයක් පෙන්නුම් කෙරේ.



***ප්‍රස්තාර අංක 5.11 :** අලි මිනිස් ගැටුම නිසා සිදුවන දේපල හානි*

5.2.4 ඉලක්ක 04

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සංවර්ධනය වූ පුරාවිද්‍යාත්මක හා පාරිසරික සංචාරක කර්මාන්තයක් ඇති කිරීම.

ඉලක්ක 04 | ශක්තීන්

ශක්තීන් 01 – දඹුල්ල විහාරය, සීගිරිය, පිදුරංගල, ඉබ්බන්කටුව, කළුදිය පොකුණ, නාලන්දා ගෙඩිගේ, වාසල කෝට්ටේ පල්ලිය, බම්බාව විහාරය, නාමල් උයන ආදි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්ථාන මෙම ප්‍රදේශයේ පිහිටා තිබීම.



රූප සටහන අංක 5.26 : *පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්ථාන*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය - මාතලේ දිස්ත්‍රික් කාර්යාලය, දඹුල්ල*

	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ගම	ස්මාරකය	ගැසට් අංකය හා දිනය
1	දඹුල්ල	දඹුල්ල	දඹුළුගල ඇති සෙල්ලිපි	227/1976/08/20
2	දඹුල්ල	දඹුල්ල	දඹුළු විහාරය	11164/1957/08/30
3	දඹුල්ල	ඇතාබැදි වැව	මැණික්දෙන ගල්ලෙනවත්ත ආරණ්‍යය	11112/1957/04/26
4	දඹුල්ල	කුඹුක්කඳන් වැව	කළුදිය පොකුණ පුරාවිද්‍යාත්මක භූමිය	8146/1935/09/20
5	දඹුල්ල	වැවල වැව	වැවල වැව සේනාසනය	-
6	දඹුල්ල	එඬේරගල	එඬේරගල විහාරය	-
7	දඹුල්ල	කළුන්දෑව	දිය බුබුල	-

***වගු අංක 5.12 :** පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ තොරතුරු*

ශක්තීන් 02 – පාරිසරික සංචාරක කටයුතු සඳහා සංචාරකයින්ගේ ආකර්ෂණය දිනා ගත හැකි ස්වභාවික වනාන්තර පද්ධතියක් මෙම ප්‍රදේශයේ පිහිටා තිබීම.



***සිතියම් අංක 5.17 :** වනාන්තර හා ස්වාභාවික වෘක්ෂලතාදිය*

ශක්තීන් 03 – හබරණ ප්‍රදේශයේ වන අලි ගහණය ඉහළ මට්ටමක පැවතීම සහ පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් ඉසිලීම.

හබරණ යනු ත්‍රිකුණාමලය, මඩකලපුව සහ පොළොන්නරුව වෙත යන ප්‍රධානතම මාර්ගයෙහි පිහිටා ඇති නගරයක් වන අතර එය සංචාරක ආකර්ෂනය ඉහළින් දිනාගන්නා ලද ප්‍රදේශයකි. පලුගස්වැව සහ හබරණ ගම්මාන තුල පිළිවෙලින් පවුල් 453 සහ 621 ක් පදිංචිව සිටී.

මෙම ප්‍රදේශය තුල වන අලි ගහණය ද ඉහළ මට්ටමක ඇති අතර මින්නේරිය ජාතික වනෝද්‍යානය, හබරණ රක්ෂිතය, සීගිරිය අභය භූමිය වැනි ප්‍රදේශ තුලට අලි ඇතුන් නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරක ආකර්ෂණ වැඩිවීම විසල් දඹුල්ල තුළ දක්නට ඇති විශාලම ශක්තියක් ලෙස දැක්විය හැකිය. මිනිසුන්ගේ ආහාර ලබා ගැනීමට අලින් පුරුදු වී ඇති අතර ඔවුන් ආක්‍රමනශීලි බවින් අඩුය. එබැවින් මෙම ප්‍රදේශයන්හි සංචාරකයින්ගේ ආකර්ශනය ඉහළ මට්ටමක පවති.

ශක්තීන් 04 – අත්කම්, මැටි භාණ්ඩ, අත් යන්ත්‍ර හා බතික්, මැණික් හා ස්වරණාභරණ වැනි සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රදේශයන් පිහිටා තිබීම.

ශක්තීන් 05 – සාම්ප්‍රදායික ගොවිතැන් හා ශිල්ප ක්‍රම ආශ්‍රිත සංචාරක කර්මාන්ත ප්‍රදේශ පිහිටා තිබීම.

රූප සටහන් අංක 5.27 : *හිරිවඩුන්න ප්‍රදේශයේ පාරිසරික සංචාරක කර්මාන්තයේ ව්‍යාප්තිය*

විසල් දඹුල්ල ප්‍රදේශය තුළ වර්ථමානයේදී සම්ප්‍රදායික සිරිත් විරිත් අනුගමනය කරනු ලබන අතර එමඟින් දෙස් විදෙස් සංචාරක ආකර්ශනය තම ප්‍රදේශයන් තුළට විශාල ලෙස ආකර්ශනය කර ගැනීම නිසා ආර්ථික ආදයම් මාර්ගය ඉහළ නැංවීම සඳහා කටයුතු සිදු කරගනු දැකිය හැකිය.

විශේෂයෙන්ම පළුගස්වැව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වෙසෙන වැසියන් සම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම භාවිතා කරමින් ආහාර නිශ්පාදනය කරනු ලැබේ. තවද ආවේනික ආහාර නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන ක්‍රමවේදයන් ඔස්සේ මෙම ප්‍රදේශයේ ගොවීන්ට සැලකිය යුතු ආදායමක් ගෙන එන අතර, ඊට අමතරව ජන කතා, ජන ගී, චාරිත්‍ර වාරිත්‍ර, සම්ප්‍රදායික උත්සව පැරණි අත්කම් මෙම ප්‍රජාව සමඟ තවමත් පවතින අතර මෙම ප්‍රදේශ සඳහා ආකර්ෂණය වන සංචාරකයින්හටද සම්ප්‍රදායික ක්‍රියාකාරකම් වල නිරත වීමට අවස්ථාව උදා වෙයි.

ශක්තීන් 06 – ස්වභාවික ආපදා ඉතා අඩු ප්‍රදේශයක් ලෙස විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් හදුනාගෙන තිබීම.

විසල් දඹුල්ල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ වියළි කලාපයට අයත්වන තැනිතලා භූමි භාගයක පිහිටා ඇත. මෙම ප්‍රදේශය මුහුදු මට්ටමේ සිට අඩි 1118 උසකින් පිහිටා ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් දඹුල්ල ස්වාභාවික අපදා වලින් තොර ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත.

ශක්තීන් 07 – සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ ඉඩම් ලබා ගත හැකි වීම.

විසල් දඹුල්ල ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තය නගා සිටු වීමට රජයට අයිති ඉඩම් ලබා ගත හැකි වීම ශක්තියන් ලෙස හඳුනා ගත හැකිය. තවද මෙම ප්‍රදේශයන් තුළ සංචාරක අත්දැකීම් ඉහළ නැංවීම, සොබා දහම හා සබැඳි ක්‍රියාකාරකම් තුළින් විභවතාවයන් ලබා ගැනීම සඳහා මෙම ඉඩම් විවිධ ක්‍රියාකාරකම් සඳහා යොදාගත හැකිය.

ඉලක්ක 04 | දුර්වලතා

දුර්වලතා 01 – සංචාරකයින් ආකර්ෂණය කර ගන්නා ගමනාන්තයන් සංචාරකයන්ගේ අවශ්‍යතා සැපිරිය හැකි ලෙස සංවර්ධන කර නොමැති වීම. (මාර්ග, වැසිකිළි, රථවාහන නැවතුම් ස්ථාන)

විසල් දඹුල්ල ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක ස්ථාන, වනාන්තර සහ සංචාරක ආකර්ෂනය ලබා ගත් ප්‍රදේශයකි. කෙසේ වෙතත් මෙම ස්ථාන වල වැසිකිලි මාර්ග සහ වාහන නැවැත්වීමේ පහසුකම් ඉතා විරල අතර ඉහත ස්ථාන නැරඹීමට පැමිණෙන දේශීය සහ විදේශිය පුද්ගලයන් සඳහා සනීපාරක්ෂක පහසුකම් ද නොමැත.



Source : Booking.com. Trip Advisor, 2020

***රූප සටහන අංක 5.28 :** දඹුල්ල පිළිබඳ සංචාරකයින්ගේ අදහස්*

දුර්වලතා 02 – පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වැදගත්කමකින් යුතු ස්ථානවල මායිම් පැහැදිලිව හදුනාගෙන නොමැති වීම.

විසල් දඹුල්ල තුළ පුරාවිද්‍යා සහ ඉතිහාසය වටිනාකමකින් යුත් ස්ථාන රාශියක් පවතියි. එහෙත්, මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන දුර්වලතාවයක් ලෙස අදාල ස්ථාන වල පැහැදිලි සීමාවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන නොමැති වීම හඳුනාගත හැක. එහෙයින් විසල් දඹුල්ල සංවර්ධන කිරීමේදී මෙය විශාල ගැටළුවක් වෙයි.

දුර්වලතා 03 – සංචාරක මාර්ගෝපදේශ සිතියමේ දඹුල්ලෙහි බොහෝ ස්ථාන ඇතුලත් වී නොමැති වීම.

ශ්‍රී ලංකා සංචාරක දෙපාර්තමේන්තුව මගින් සකස් කර ඇති සංචාරක සිතියමෙහි දඹුල්ලේ ඇති ප්‍රසිද්ධ සීමිත ඓතිහාසික ස්ථාන පමණක් දක්නට ලැබෙයි. නමුත් ඊට අමතරව විසල් දඹුල්ල තුළ ඉතිහාසාත්මක වටිනාකමකින් යුත් ප්‍රදේශ රාශියක් පවතින අතර, එම ප්‍රදේශ මෙම සිතියම තුළට ඇතුළත් කර නොමැත.

ඉලක්ක 04 | අවස්ථා

අවස්ථා 01 – සීගිරිය (1982) හා දඹුල්ල (1991) ලෝක උරුම ලෙස යුනෙස්කෝව මගින් ප්‍රකාශයට පත් කර තිබීම.

වර්ෂ 1982 සීගිරිය පුරාවිද්‍යාත්මක කලාපයත්, වර්ෂ 1991 රංගිරි දඹුළු පූජා භූමි කලාපයක් ලෝක උරුම නගර ලෙස යුනෙස්කෝ (UNESCO) සංවිධානය මගින් නම් කර තිබීම විසල් දඹුල්ල ප්‍රදේශයේ පූජනීයත්වයට හා ඓතිහාසික වැදගත්කමට බලපාන ප්‍රධාන විභවතාවයක් වේ.

අවස්ථා 02 – සැලසුම් ප්‍රදේශය මධ්‍යම සංස්කෘතික ත්‍රිකෝණය තුල පිහිටා තිබීම.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන්ට හිමිකම් කියන ප්‍රධාන ප්‍රදේශ ලෙස අනුරාධපුර, පොළොන්නරු, මිහින්තලය, සීගිරිය, රිටිගල, දඹුල්ල හා මහනුවර අයත් වේ. මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පාලනය වන මෙම ප්‍රදේශ ශ්‍රී ලංකාවේ ඓතිහාසික ආගමික, සංස්කෘතික, ශ්‍රී විභූතිය ලොවට කියාපාන ප්‍රධාන විභවතාවයකි.

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය



රූප සටහන අංක 5.29 : *මධ්‍යම සංස්කෘතික ත්‍රිකෝණයේ පිහිටීම*
මූලාශ්‍රය : *https://www.kuoni.co.uk/sri-lanka/a-guide-to-sri-lankas-cultural-triangle*

අවස්ථා 03 – වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය සහ පළාත් පාලන ආයතන මගින් බලාත්මක කරනු ලබන ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම සඳහා නීති පැවතීම.

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

අවස්ථා 04 : ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන මණ්ඩලය විසින් දඹුල්ල ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස හඳුනාගෙන තිබීම.



***සිතියම් අංක 5.18 :** ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන මණ්ඩලයේ සැලැස්ම*

ඉලක්ක 04 | තර්ජන

පරිච්ඡේදය 05
ශ.දු.අ.ත.
විශ්ලේෂණය

සවිස්තරාත්මක ශ.දු.අ.ත.
විශ්ලේෂණය

තර්ජන 01 – ගෝලීය වසංගත හා ත්‍රස්ත ප්‍රහාර වැනි හේතූන් සංචාරක කර්මාන්තය තුල අවිනිශ්චිත තාවයන් ඇති කර තිබීම.

රටෙහි සිදුවන වසංගත තත්ත්ව මෙන්ම හදිසි අවස්ථා තුළදී රටෙහි අස්ථාවරත්වයක් ඇති වීම මගින් විසල් දඹුල්ලෙහි සේවා සැපයීම, ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සැපයීම සඳහා විශාල බාධාවක් විය.

2019 ඇති වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් විසල් දඹුල්ල ප්‍රදේශය තුළ මුස්ලිම් ප්‍රදේශ හරහා වැඩ වර්ජන ක්‍රියාත්මක වීමක් ද දක්නට ලැබූ අතර සංචාරක ව්‍යාපාරය තුළද දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය අඩු විය.

06 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්ම

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

සංකල්පිත දැක්ම

6.1. සංකල්පිත දැක්ම

සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගත් අරමුණ හා පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම තුළින් සංවර්ධන දැක්ම ළගා කර ගැනීම සඳහා විසල් දඹුල්ල නාගරික සංවර්ධන ප්‍රදේශයේ 2032 වසර වන විට අපේක්ෂිත සංවර්ධනය සිදුවිය යුතු ආකාරය සංකල්පිත සංවර්ධන සැලැස්ම තුළින් සරලව විග්‍රහ කරනු ලබයි. දඹුල්ල මූලික කරගත් විසල් දඹුල්ල ප්‍රදේශය වින්‍යාසගත වීම පිළිබඳව සලසා බැලීමේ දී ප්‍රධාන වශයෙන් සීගිරිය, දඹුල්ල ලෙන් විහාර ලෝක උරුමයන් පදනම් කරගත් සංචාරක කර්මාන්තය ස්ථාපිත වී ඇත. කෘෂි ආර්ථිකය දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථානය මත පදනම් වේ. තවද, මෙම සැලැස්ම මඟින් ප්‍රධාන වශයෙන් පවතින සංවර්ධන ප්‍රවණතා, ස්වාභාවික සම්පත්, සංචාරක ආකර්ෂණය හා ස්ථානීය පිහිටීම යන කරුණු පිළිබඳවද අවධානය යොමු කරන ලදි.

සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දි ජාතික මට්ටමේ යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම් මෙන්ම ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවණතා ද සලකා බලන ලදි. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය 2017-2050 සැලැස්මේ හඳුනාගත් විභවයන් සහ යෝජනා සැලකිල්ලට ගනිමින් දඹුල්ල නගරය විසල් දඹුල්ල සම්බන්ධ කිරීමේ මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය. තවද ගලේවෙල, නාඋල , හබරණ සහ මඩාටුගම යන නගර නිශ්චිත අරමුණක් සඳහා අවධානය යොමු කරමින් පර්ෂධ නගරයන් ලෙස සංවර්ධනය කිරීමට නියමිතය. ගලේවෙල නගරයේ පවත්නා භෞතික ස්වරූපය ඉඩම් අත්පත් කර ගැනීමේ හැකියාව සහ යෝජිත මාර්ග සංවර්ධන ව්‍යාපෘති තුළින් වර්ධනය වන අන්තර් සම්බන්ධතා ද පදනම් කරගනිමින් කෘෂි - ආර්ථික කර්මාන්ත ස්ථාපිත කිරීමට නියමිතය. විසල් දඹුල්ලට අයත් යෝග්‍යතම නේවාසික මධ්‍යස්ථානය ලෙස නාඋල නගරය සංවර්ධනය කිරීමට නියමිතය. හබරණ මඩාටුගම නගර දැනට පවතින සංචාරක ආකර්ෂණයන් මත පදනම්ව සංචාරක කර්මාන්තය සඳහා සංවර්ධනය කිරීමට යෝජිතය.

2032 සංවර්ධන සැලැස්මේ පවත්නා අරමුණු හා දැක්ම සාක්ෂාත් කර ගැනීම තුළින් ප්‍රශස්ත ආර්ථික හා භෞතික සංවර්ධනයක් ලගා කර ගැනිම සඳහාත් පොදු විනෝදාස්වාදයක් සඳහාත් යොදා ගනිමින් ප්‍රදේශය පුරා පවතින ජල සම්පත් සහ පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම කෙරෙහි ද මෙමගින් අවධානය යොමු කර ඇත.

මේ සියලු කාරණා සැළකිල්ලට ගෙන විසල් දඹුල්ල ප්‍රදේශයේ පාරිසරික සම්පත් උපරිම අයුරින් සංරක්ෂණය කරමින් සංචාරක කර්මාන්තය හා කෘෂි වෙළඳ ආර්ථිකය හරහා මෙම ප්‍රදේශයට නවෝත්පාදනයන් ලබා දෙමින් ප්‍රදේශය සෑම අංශයකින්ම ස්වයංපෝෂිත ප්‍රදේශයක් බවට පත් කිරීමට අනාගත තත්ත්වයන් සංකල්පනාත්මකව ඉදිරිපත් කරනු ලැබේ. මෙහි ප්‍රධාන වශයෙන් සංවර්ධන සැලසුම් සකස් කිරීමේදි ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක ප්‍රදේශ ආරක්ෂා කිරීම හා පාරිසරික සුරක්ෂිතතාවය යන ප්‍රධාන අංශයන් ඔස්සේ අවධානය යොමු කරමින් සංකල්පිත සැලසුම සකස් කරන ලදි.

ඒ අනුව, පහත සිතියම් අංක 6.1 මගින් දැක්වෙන මෙම සංකල්පිත සැලැස්ම මත පදනම්ව ජාතියේ කෘෂි ආර්ථික හා සංචාරක කේන්ද්‍රස්ථානයේ මහා නගරය ලෙස සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.



සිතියම් අංක 6.1 : *සංකල්පිත සැලැස්ම*

6.2. යෝජිත භූමි පරිහරණ සැලැස්ම

විසල් දඹුල්ල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ජාතියේ කෘෂි ආර්ථික හා සංචාරක කේන්ද්‍රස්ථානයේ මහා නගරය යන දැක්ම මූලික කරගෙන සංවර්ධනය කිරීම හා නගරයෙහි පවතින සංවර්ධන විභවතාවයන් සැලකිල්ලට ගෙන මහජනතාවට ජීවත් වීම සඳහා වඩා සුවපහසු වට පිටාවක් නිර්මාණය කිරීමත් රටේ ජාතික අවශ්‍යතාවයන් සඳහා මූලික තැන දෙමින් උපාය මාර්ගික ව්‍යාපෘති තුලින් බිහිවන නාගරික ආකෘතියේ පිළිඹිබුව යෝජිත භූමි පරිහරණ සැලැස්ම හරහා විසල් දඹුල්ල නාගරික සංවර්ධන ප්‍රදේශයේ අනාගත සංවර්ධනය නිරූපණය කෙරේ.

වර්තමානය වන විට විසල් දඹුල්ල ප්‍රදේශය දඹුල්ල නගරය මූලික කරගෙන සීඝ්‍රයෙන් නාගරීකරණය වෙමින් පවතින ප්‍රදේශයකි. දඹුල්ල නගරය කේන්ද්‍ර කර ගනිමින් ප්‍රධාන වශයෙන් එළවළු තොග බෙදා හැරීමේ හා සේවා සැපයීම ප්‍රමුඛ වී ඇති අතර එමගින් ප්‍රදේශයේ නිර්මිත පරිසරය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් මත නගරය සැකසෙමින් පවති. එමෙන්ම රංගිරි දඹුල්ල රජ මහා විහාරය හා පුරාවිද්‍යාත්මක ප්‍රදේශ ආශ්‍රිත පූජා භූමිය කේන්ද්‍ර කර ගනිමින් නගරයේ සංචාරක ක්ෂේත්‍රයද සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවති.

මේ හේතුවෙන් සමස්ත භූමි පරිහරණ සැලැස්ම මූලික වශයෙන් කෘෂි ආර්ථිකය හා සංචාරක ක්ෂේත්‍රය කේන්ද්‍ර කර ගනිමින් ප්‍රධාන කොටස් දෙකක් යටතේ හදුනාගත් අතර ප්‍රදේශයේ නාගරික ප්‍රදේශ භූමියේ පිහිටීම හා භූමි භාවිතයන් සලකා බලා තිරස් සංවර්ධනයක් සිදු කිරීමට යෝජනා කෙරේ. මෙහිදි ප්‍රධාන වශයෙන් දඹුල්ල නාගරික ප්‍රදේශය, නාඋල නාගරික ප්‍රදේශය, ගලේවෙල නාගරික ප්‍රදේශය, මඩාටුගම නාගරික ප්‍රදේශය හා හබරණ නාගරික ප්‍රදේශය ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනයන් හා මංසන්ධි සංවර්ධනයක් මගින් සංවර්ධනය කිරීමට යෝජිතය. එමෙන්ම විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයේ නාගරික අවකාශයේ භෞතික ස්වරූපය, අනාගත අවකාශයේ හැඩය හා ප්‍රමාණයේ සැකැස්ම නිසි පරිදි ප්‍රදේශයේ ඉදිරි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා අනාගත ආකෘතියක් සැපයීම සඳහා යෝජිත ඉඩම් පරිහරණ සැලසුම සකස් කරන ලදි. එහිදි ප්‍රධාන වශයෙන් සංවර්ධන කලාප 10 ක් වේ. එනම්,

1. පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය
2. ගුවන් තොටුපල කලාපය
3. පරිසර සංරක්ෂණ කලාපය
4. කාර්මාන්ත කලාපය
5. මිශ්‍ර සංවර්ධන කලාපය - I
6. මිශ්‍ර සංවර්ධන කලාපය - II
7. මිශ්‍ර නේවාසික කලාපය
8. සංචාරක සංවර්ධන කලාපය
9. ස්වභාවික තෙත්බිම් සංරක්ෂණ කලාපය
10. කුඹුරු වගා සහ තෙත්බිම් කෘෂිකාර්මික කලාපය

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

යෝජිත භූමි පරිහරණ සැලැස්ම

වශයෙන් හඳුනා ගන්නා ලද අතර යටිතල පහසුකම් සංවර්ධනය, සේවා පහසුකම් සැලසීම සඳහා යෝජිත ව්‍යාපෘතීන් මගින් තවදුරටත් මෙම කලාප සංවර්ධනය කරමින් නිසි ගොඩනැගිලි හා ඉදිකිරීම් ව්‍යුහයක් විසල් දඹුල්ල ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව තුළ ඇති කිරීමට අපේක්ෂිතය.

යෝජිත භූමි පරිහරණ රටාවේ A හා B ලෙස මිශ්‍ර සංවර්ධන කලාපයේ සිට පුරා-විද්‍යා සංරක්ෂණ කලාපය දක්වා දඹුල්ල පූජා භූමි ප්‍රදේශය ඡේදනය වන ලෙස අඳිනු ලබන හරස්කඩ අනුව එම ප්‍රදේශයේ අනාගත ගොඩනැගිලි හා ඉදිකිරීම් ව්‍යුහය හඳුනාගත හැකිය.



රූප සටහන් අංක 6.1 : යෝජිත භූමි පරිහරණ රටාවේ හරස්කඩ

ඒ අනුව, යෝජිත මිශ්‍ර සංවර්ධන කලාපය යෝජිත මාර්ග, ජලාපවහනය හා මලාපවහනය මෙන්ම සේවා සැපයුම් මගින් සංවර්ධනය කරනු ලබන යටිතල පහසුකම් හේතුවෙන් නගරයට පැමිණෙන සංචාරකයින්ට මෙන්ම දෛනිකව පැමිණෙන ජනගහනයට ද සේවා සැපයීම සඳහා ඉහළ සංවර්ධන තීව්‍රතාවයකින් යුතුව සංවර්ධනය වන අතර ඉහළ ගොඩනැගිලි සනත්ව සංවර්ධනය ලඟාකර ගැනීමට එමගින් ඉඩ සලසයි.

මිශ්‍ර සංවර්ධන කලාපයේ සිට පැමිණෙන විට දඹුල්ල හා ගලේවෙල නගරයේ පවතින කුඹුරු ඉඩම් සංවර්ධන අවශ්‍යතාවය මත සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය අධ්‍යයනයන්ගෙන් පසුව යොදා ගන්නා අතර අනෙකුත් කුඹුරු ඉඩම් එලෙසින්ම සංවර්ධන සීමා ප්‍රදේශයන් ලෙස පවත්වාගෙන යාමට අපේක්ෂිතය.

එමෙන්ම දඹුල්ල නගරයේ මිශ්‍ර සංවර්ධන කලාපය ආශ්‍රිතව පවතින පූජා භූමිය ආශ්‍රිතවත් සංවර්ධනය කිරීමටත් අපේක්ෂිතය එහිදි පූජා භූමිය ආසන්නව වාණිජ කලාපය විශේෂිත භාවිතයන්ට එනම්, පූජා භූමිය සඳහා වන වාණිජ භාවිතයන්ට පමණක් අවසර ලබා දෙන අතර එහි ගොඩනැගිලි උස පූජා භූමි භාවිතයට ගැලපෙන පරිදි සීමා කිරීමට යෝජිතය. මිශ්‍ර සංවර්ධන කලාපයේද හඳුනා ගන්නා ලද වීථි වල ගොඩනැගිලි මුහුණත පෙනුම දඹුල්ල ප්‍රදේශයේ අනන්‍යතාවයට ගැලපෙන පරිදි සංවර්ධනයට අවශ්‍ය මාර්ගෝපදේශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙනු ලැබේ.

ගලේවෙල නගර මධ්‍ය ප්‍රදේශයේ යෝජිත මිශ්‍ර සංවර්ධන කලාපය ගලේවෙල නගර මධ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයක් සමග යෝජිත නව නගර සංවර්ධන ප්‍රදේශය මගින් යෝජිත ව්‍යාපෘති හරහා ගලේවෙල නගරයට අවශ්‍ය සේවා හා සැපයුම් වැඩි දියුණු කිරීමත් යෝජිත අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයටත් අපේක්ෂිතය. එමෙන්ම ගලේවෙල නගර මධ්‍ය වැව ආශ්‍රිත ප්‍රදේශය නාගරික උද්‍යානයක් ලෙස සංවර්ධනය කරමින් ඉහළ සංවර්ධන තීව්‍රතතාවයකින් යුතු ප්‍රධාන වාණිජ කලාප දක්වා සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

නාඋල නගර මධ්‍ය කලාපයේ යෝජිත මිශ්‍ර සංවර්ධන කලාපයන් ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙන් විධිමත් නගර සංවර්ධනයක් සිදු කිරීමට අපේක්ෂිතය. එමෙන්ම ශ්‍රී ලංකාවේ මධ්‍ය නිරූපණය කරන නාලන්දා ගෙඩිගේ පුරාවිද්‍යාත්මක ප්‍රදේශය ආශ්‍රිතව පවතින පුරාවිද්‍යාත්මක ප්‍රදේශ වලට පවතින සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමද මෙමගින් යෝජිතය. එමෙන්ම නාඋල සිට ගලේවෙල දක්වා වැමැඩිල්ල හරහා ඇති අතුරු මාර්ගය සංවර්ධනය තුලින් විධිමත් මාර්ග ජාලයක් ඇති කිරීමටත් මෙමගින් අපේක්ෂිතය.

එසේම සීගිරිය පුරාවිද්‍යාත්මක කලාපය මූලික කරගෙන සංචාරක කලාපය ආශ්‍රිතව අවශ්‍ය යටිතල පහසුකම් සේවා සැපයුම් සංවර්ධනය කිරීම මෙමගින් අපේක්ෂිතය. එමගින් සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කර ගැනීමත් පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සැපයීමත් මෙමගින් අපේක්ෂිත වේ.

තවද, සීගිරිය ලෝක උරුමය රැක ගැනීමටත් එහි අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමටත් ගැලපෙන ලෙස භූමි භාවිතය, ගොඩනැගිලි ඉදිකිරීම් සැලැස්මකට අනුව සිදු කිරීමට යෝජිතය.

හබරණ නගර මධ්‍යයේ සංවර්ධනය කේන්ද්‍ර කරගෙන මිශ්‍ර සංවර්ධන කලාපය තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් හබරණ ප්‍රදේශය ආශ්‍රිත පාරිසරික සංචාරක කලාපය ආශ්‍රිතව සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීමත් මෙමගින් අපේක්ෂිතය. එසේම යෝජිත කුරුණෑගල–හබරන දුම්රිය මාර්ගය මූලික කරගෙන හබරණ ප්‍රදේශය සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

කෘෂි නිෂ්පාදන පදනම් කරගෙන සංවර්ධනය කළ හැකි නගරයක් ලෙස මඩාටුගම උප නගරය හඳුනාගත හැක. මහවැලි ‘එච්’ (H) කලාපයට අයත් වාරි කර්මාන්තය හා පසුබිම් වූ කලාපයක් වන මෙම ප්‍රදේශය වී, එළවළු, පළතුරු වගාව හා කිරි නිෂ්පාදනයද බහුල වශයෙන් ව්‍යාප්ත ප්‍රදේයකි. කෘෂි කාර්මික පසුබිමකින් යුත් මෙම ප්‍රදේශයේ නගරය ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අපේක්ෂිත වේ. එසේම ජාතික නාමල් උයන හා රෝස තිරුවානා කන්ද නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් හට අවශ්‍ය පහසුකම් සැපයීමත් මෙමගින් අපේක්ෂිත වේ.

6.3. සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග

2032 වර්ෂය වන විට විසල් දඹුල්ල ප්‍රදේශය, ජාතියේ කෘෂි ආර්ථික හා සංචාරක කේන්ද්‍රස්ථානයේ මහා නගරය බවට පත් කිරීමේ අනාගත දැක්ම ළඟාකර ගැනීම සඳහා, යෝජිත ඉලක්ක අතරින් දෙවන ඉලක්කය වන විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය විධිමත්ව සංවර්ධනය වූ සමාජීය හා භෞතික අපරව්‍යුහ පහසුකම් සහිත ප්‍රදේශයක් බවට පත් කිරීම සහ ආර්ථික සංවර්ධනය පදනම් කරගත් පළමු හා සිව්වන ඉලක්ක වන පිළිවෙලින්, ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි වෙළඳ ආර්ථිකය පදනම් කර ගත් වාණිජ දැවැන්තයා බවට පත් කිරීම හා විධිමත්ව සංවර්ධනය වූ පුරා විද්‍යාත්මක හා පාරසරික සංචාරක කර්මාන්තයක් ඇති කිරීම සඳහාද, විධිමත්ව සංවර්ධනය වූ සමාජීය හා භෞතික යටිතල පහසුකම් පද්ධතියක් පවත්වා ගැනීම ප්‍රමුඛ කාර්යයක් වේ.

ඒ අනුව, යෝජිත සේවා සැපයුම් සැලැස්ම හා මාර්ග හා ප්‍රවාහන උපායමාර්ගික සැලැස්ම යටතේ අදාළ අරමුණු කරා ළඟා වීමට විසල් දඹුල්ල නගර සංවර්ධන සැලැස්ම යටතේ බලාපොරොත්තු වේ.

6.3.1. සාමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

වර්ග කිලෝමීටර් 1070 කින් පමණ සමන්විත විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය වර්ෂ 2017 දී ජනගහනය 250,000 ක් පමණ වූ අතර එහි වර්ධන වේගයට අනුව 2032 වර්ෂය වනවිට ජනගහනය 320,000 ක් පමණ වන බව පුරෝකථනය කළ හැකිය. මෙලෙස වැඩිවන නේවාසික ජනගහනයට අමතරව ප්‍රදේශයේ පූජනීය ස්ථානයන්හි පිහිටීම හේතුවෙන් සහ ලෝක උරුම ස්ථාන පිහිටීම හේතුවෙන් ඉතා විශාල දෙස් විදෙස් සංචාරකයින් ආකර්ෂණය වන ප්‍රදේශයක් වේ.

තවද, 2017 වසරේදී දඹුල්ල, සීගිරිය ප්‍රදේශයේ සංචාරක පැමිණීම මාසිකව 90,000 – 100,000 ක් පමණ වන අතර පෙබරවාරි, මාර්තු, අගෝස්තු, දෙසැම්බර් යන මාස කිහිපය තුළ සංචාරකයින් පැමිණීම ඉහළ මට්ටමක පවතින බව හඳුනාගත හැකිය. විශේෂයෙන් දේශීය සංචාරකයින් මේ කාල පරාසය භාවිතා කරනු ලබන්නේ පාසල් නිවාඩු සමය වීම හේතුවෙනි. එමෙන්ම දේශීය වශයෙන් සති අන්ත හා පොහොය නිවාඩු යන දිනයන්හීදි දේශීය සංචාරකයින්ගේ ප්‍රමාණය දෛනිකව ඉතා ඉහළ අගය පරාසයකට ගමන් කරනු ලබයි. මෙම තත්ත්වය සීගිරිය පුරාවිද්‍යා පරිශ්‍රයට දරාගත නොහැකි ඉලක්කයකට යමින් පවති.

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග

සාමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

තවද, ප්‍රදේශය තුළ පවත්නා සංවර්ධන විභවතා වන දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය, පූජනීය ස්ථාන හා ලෝක උරුම ස්ථාන හේතුවෙන් 2020 වර්ෂයේදී දෛනිකව 170,000ක පමණ පාවෙන ජනගහනයක් විසල් දඹුල්ල ප්‍රදේශය කරා ආකර්ෂණය වී ඇත.

විසල් දඹුල්ල ප්‍රදේශය තුළ පර්ෂද නගර ඇති කිරීම තුළින් ප්‍රදේශය පුරා ව්‍යාප්ත වූ නගර ඇති කිරීමට බලාපොරොත්තු වේ. මෙම පර්ෂද නගර සංරචක 03 ක් ඔස්සේ, එනම් සංවර්ධනය කළ හැකි ප්‍රදේශ පැවැතීම, මාර්ග පද්ධතිය අනුව අවට ප්‍රදේශ සමඟ පවත්නා සම්බන්ධතා හා 2032 වර්ෂයේදී අපේක්ෂිත ජනගහණය අනුව ප්‍රමුඛතා ශ්‍රේණියක් අනුව වර්ග කර ඇත.

ප්‍රමුඛතා ශ්‍රේණිය අනුව නගර මධ්‍යස්ථානවල තොරතුරු සටහන පහත පරිදි වේ.

නගර මධ්‍යස්ථාන ධුරාවලිය	නගර කේන්ද්‍රය	පළාත් පාලන ආයතනය	ඇස්තමේන්තුගත නේවාසික ජනගහනය 2032	ඇස්තමේන්තුගත නිවාස ඒකක	නිවාස + සංසරණය සඳහා අවම ඉඩම් අවශ්‍යතාවය (හෙක්)	ජල අවශ්‍යතාවය (දිනකට කියුබික් මීටර්)
පළමු පෙළ නගර	දඹුල්ල	දඹුල්ල මහ නගර සභාව	26,000	6,500	197	3,250
දෙවන පෙළ නගර	ගලේවෙල	ගලේවෙල ප්‍රාදේශීය සභාව	12,000	3,000	91	1,500
	නාඋල	නාඋල ප්‍රාදේශීය සභාව	9,000	2,250	68	1,125
	මඩාටුගම	කැකිරාව ප්‍රාදේශීය සභාව	11,000	2,750	83	1,375
	හබරණ	කැකිරාව ප්‍රාදේශීය සභාව	5,000	1,250	38	625
තුන්වන පෙළ නගර	දේවහුව	ගලේවෙල ප්‍රාදේශීය සභාව	12,000	3,000	91	1,500
	හිරිවඩුන්න	කැකිරාව ප්‍රාදේශීය සභාව	1,500	375	11	188
	කණ්ඩලම	දඹුල්ල ප්‍රාදේශීය සභාව	3,000	750	23	375
	ලේනදොර	දඹුල්ල ප්‍රාදේශීය සභාව	3,000	750	23	375
	නිකවටවන	දඹුල්ල ප්‍රාදේශීය සභාව	4,000	1,000	30	500
	පැල්වැහැර	දඹුල්ල මහ නගර සභාව	3,500	875	27	438
	රනාව	කැකිරාව ප්‍රාදේශීය සභාව / පලාගල ප්‍රාදේශීය සභාව	8,500	2,125	64	1,063
	කිඹිස්ස	දඹුල්ල ප්‍රාදේශීය සභාව	5,000	1,250	38	625

***වගු අංක 6.1 :** ප්‍රමුඛතා ශ්‍රේණිය අනුව නගර මධ්‍යස්ථාන*

වගු අංක 6.1 හි වර්ගීකරණය අනුව පළමු හා දෙවන වර්ගයේ නගර 2030 වර්ෂය වන විට සංවර්ධනය කිරීමට යෝජිතය.



රූප සටහන් අංක 6.2 : ප්‍රමුඛතා ශ්‍රේණිය අනුව නගර මධ්‍යස්ථාන

2032 වර්ෂය වන විට ස්වභාවික ජනගහණය වර්ධනය අනුව 265,000 ක පමණ නේවාසික ජනගහණයක්ද, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්ති හා සැලැසුම 2050 ට අනුව 500,000 ක පමණ නේවාසික ජනතාවක් දඹුල්ල නගරයෙහි අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2032 දි අපේක්ෂිත නේවාසික ජනගහණයට සහ පාවෙන ජනගහණයට අවශ්‍ය නේවාසික, විනෝද, සෞඛ්‍යය හා අනෙකුත් පහසුකම් ක්‍රමවත්ව සංවර්ධනය කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

ඒ අනුව, පළමු පෙළ ප්‍රධාන නගරය වන දඹුල්ල නගරය සඳහා ප්‍රධාන ව්‍යාපෘතීන් 12 ක්ද, දෙවන පෙළ පර්ෂද නගරයක් වන ගලේවෙල සඳහා ප්‍රධාන ව්‍යාපෘතීන් 10 ක්ද, නාඋල පර්ෂද නගරය සඳහා ප්‍රධාන ව්‍යාපෘතීන් 11 ක්ද, හබරණ - සීගිරිය පර්ෂද නගරය සඳහා ප්‍රධාන ව්‍යාපෘතීන් 7 ක්ද, මඩාටුගම පර්ෂද නගරය සඳහා ප්‍රධාන ව්‍යාපෘතීන් 3 ක්ද හඳුනා ගන්නා ලදි.

6.3.1.1. සෞඛ්‍ය සේවා සැලැස්ම

විසල් දඹුල්ල නාගරික සංවර්ධන කලාපය තුළ පිහිටි සෞඛ්‍ය මධ්‍යස්ථාන අතරින් ප්‍රධාන රෝග සුව කිරීමේ මධ්‍යස්ථානය වන්නේ දඹුල්ල මූලික රෝහලයි. මීට අමතරව මෙම ප්‍රදේශය තුළ ගලේවෙල ප්‍රාදේශීය රෝහල, නාලන්ද ග්‍රාමීය රෝහල, හබරණ ප්‍රාදේශීය රෝහල හා සීගිරිය ග්‍රාමීය රෝහලද පවතින අනෙකුත් රජයේ රෝහල්ද වේ.

නමුත් වර්තමානයේ පවත්නා සෞඛ්‍ය පහසුකම් මෙම ප්‍රදේශයේ නේවාසික ජනතාවගේ සේවා සැපයීමට ප්‍රමාණවත් ලෙස පහසුකම් වලින් යුක්ත නොවේ. මේ හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා මාතලේ, මහනුවර, කුරුණෑගල, අනුරාධපුරය හා පොළොන්නරුව යන ප්‍රදේශවල පවතින ප්‍රධාන රෝහල් කරා ඇදී යාම දක්නට ලැබේ.

එසේම විසල් දඹුල්ල ප්‍රදේශයේ නේවාසික ජනගහනයට අමතරව අධික ජන සංඛ්‍යාවක් දෛනිකව ආකර්ෂණය වන ප්‍රදේශයකි. එනම් සංචාරක ක්ෂේත්‍රය මූලික කරගෙන හා දඹුල්ල විශේෂ ආර්ථික වෙළඳ මධ්‍යස්ථානය මූලික කරගෙන නගරය වෙත ඇදී එන ජනතාව හට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සඳහා පවතින පහසුකම් ප්‍රමාණවත් නොවේ. විශේෂයෙන්ම විදේශීය සංචාරකයින් හට අවශ්‍ය හා තත්ත්වයෙන් උසස් සෞඛ්‍ය මධ්‍යස්ථානයක අවශ්‍යතාව මෙහිදී අත්‍යවශ්‍යව ඇත.

එසේම දැනට දඹුල්ල නගරයේ පවතින ප්‍රධාන රෝහලේ පහසුකම් ප්‍රමාණවත් නොවන අතර දඹුල්ල රෝහල නගර මධ්‍යයේම පිහිටීම හේතුවෙන් රෝහල් පහසුකම් වැඩි දියුණු කොට පුළුල් කිරීම සඳහාද භූමිය ප්‍රමාණවත් නොවේ.

දඹුල්ල නගර මධ්‍යයේ පිහිටා ඇති දඹුල්ල මූලික රෝහලෙහි, පහසුකම් වැඩි දියුණු කරමින් පහසුවෙන් ප්‍රවේශ විය හැකි හා හොඳින් ඉඩකඩ සහිත ප්‍රදේශයක් වන දහයියාගල ප්‍රදේශයෙහි ප්‍රතිස්ථාපනය කිරීමට බලාපොරොත්තු වේ. යෝජිත භූමිය දඹුල්ල නගරයේ සිට කි.මී 03 ක් පමණ දුරකින් පිහිටා ඇත. මෙම රෝහල දිස්ත්‍රික් රෝහලක් දක්වා වැඩි දියුණු කොට දෙස් විදෙස් සංචාරකයින්ට ගැලපෙන පරිදි උසස් ප්‍රමිතියෙන් සංවර්ධන කිරීමට අපේක්ෂිතය. එසේම ප්‍රදේශයේ පවතින අනෙකුත් ප්‍රාදේශීය රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කොට 2030 වර්ෂය වන විට අපේක්ෂිත ජනගහනයට හා සංචාරක ක්ෂේත්‍රයට අවශ්‍ය විශ්වාසනීයව පහසුකම් සැපයීම සඳහා ප්‍රමාණවත් වන අයුරින් විසල් දඹුල්ල ප්‍රදේශයේ රෝහල් සංවර්ධනය කළ යුතුය.

තවද, දඹුල්ල නගරයෙහි ක්‍රමවත් වැසිකිළි පහසුකම් ඇති කිරීම සඳහා හඳුනාගත් ස්ථාන 03 ක වැසිකිළි පද්ධති ඉදිකිරීමට අපේක්ෂිතය. ඒ අනුව, පවත්නා දඹුල්ල මූලික රෝහල ඉදිරිපිට රථවාහන නැවතුම් ස්ථානය ආසන්නයේද, මිරිස්ගෝනියාව ප්‍රදේශයේද, දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා කඩ 50 ප්‍රදේශයේද (දඹුල්ල පූජා භූමි කලාපයේද) වැසිකිළි පද්ධතීන් ඉදිකිරීමට යෝජිතය.



සිතියම් අංක 6.2 : *සෞඛ්‍ය සේවා සැලැස්ම*

පර්ෂද නගරයක් වන ගලේවෙල නගරයෙහි පොදු සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම සඳහා නගර මධ්‍යයේ පවත්නා බස් රථ නැවතුම් ස්ථානයේ පොදු වැසිකිළියක් ඉදිකිරීමටද, නාඋල නගරයෙහි පවත්නා පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරීමටද, හබරණ නගරයෙහි සතිපොළ භූමිය ආසන්නයේ පවතින පොදු සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමටද යෝජිතය.

6.3.1.2. අධ්‍යාපන සේවා සැලැස්ම

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයෙහි දඹුල්ල, ගලේවෙල හා නාඋල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල අධ්‍යාපන පහසුකම් අධ්‍යාපන කළාප 02 ක් යටතේ පාලනය වේ. ඒ අනුව, ගලේවෙල අධ්‍යාපන කලාපයෙහි පාසල් 82 ක් පමණ පිහිටා ඇති අතර, නාඋල අධ්‍යාපන කලාපයෙහි පාසල් 23 ක් පමණ පිහිටා ඇත.

විසල් දඹුල්ල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රාථමික, ද්විතික හා තෘතික අධ්‍යාපන ආයතනවල පිහිටීමේ සිට කිලෝමීටර් හතරක පරිධියක් යටතේ සිදු කළ සේවා ප්‍රදේශ විශ්ලේෂණය අනුව ප්‍රදේශයම ආවරණය වන පරිදි ප්‍රාථමික, ද්විතික හා තෘතික අධ්‍යාපන පහසුකම්හි ව්‍යාප්ත වීම හඳුනාගෙන ඇත.

විසල් දඹුල්ල ප්‍රදේශයේ වත්මන් ජනගහනය 250,000 ක් ලෙස වාර්තා වී ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත අනුව වාර්තා වී ඇති පාසල් අධ්‍යාපන ජනගහනය 35,500 කි. එය ප්‍රතිශතයක් ලෙස ප්‍රදේශයේ නේවාසික ජනගහනයෙන් 14% කි. තවද 2018 වර්ෂය වන විට ගුරු ශිෂ්‍ය අනුපාතිකය 1:17 ක් පමණ වේ. ඒ අනුව පවතින ප්‍රාථමික, ද්විතික හා තෘතික අධාපන පහසුකම් සහ ඒවායේ සේවා ප්‍රදේශ යටතේ විසල් දඹුල්ල නාගරික ප්‍රදේශ තුළ වත්මන් හා අනාගත අවශ්‍යතා උදෙසා අධ්‍යාපන පහසුකම් ප්‍රශස්ත මට්ටමක පවතින බව තහවුරු කළ හැකිය.



සිතියම් අංක 6.3 : *අධ්‍යාපන සේවා සැලැස්ම*

තව දුරටත් අධ්‍යාපන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා පහත ව්‍යාපෘතීන් හඳුනා-ගෙන ඇත.

1. ප්‍රාථමික පාසල් වන ඩී.එස්.සේනානායක ප්‍රාථමික විද්‍යාලය, ඉනාමළුව ප්‍රාථමික විද්‍යාලය, ගලේවෙල ප්‍රාථමික විද්‍යාලය, ආදර්ශ පාසල් ලෙස සංවර්ධනය කිරීම.
2. දඹුල්ල අධ්‍යාපන කොට්ඨාශයේ වීර මොහාන් මධ්‍යම මහා විද්‍යාලය හා ගලේවෙල අධ්‍යාපන කොට්ඨාශයේ ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලය ආදර්ශ ද්විතික පාසල් ලෙස සංවර්ධනය කිරීම.
3. දඹුල්ල නගරයේ ප්‍රධාන පාසල් වන රංගිරි දඹුල්ල ජාතික පාසල හා දඹුල්ල ප්‍රාථමික විද්‍යාලය සංවර්ධනය කිරීම.

6.3.1.3. නේවාසික සැලැස්ම

2032 වර්ෂය සඳහා ජනගහනය පුරෝකථනය යටතේ ජාතික, කලාපීය මෙන්ම ප්‍රාදේශීය වශයෙන් ජනගහනය වැඩි වීමේ ප්‍රවණතාවයක් පවතී. ජාතික වශයෙන් සලකා බලන විට ජාතික භෞතික සැලසුමට අනුව විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය ප්‍රධානම ආර්ථික තීරය වන නැගෙනහිර - බටහිර ආර්ථික තීරයට (East – West Economic Corridor) අයත් වේ.

මෙම තීරයේ වසර 2050 සම්පූර්ණ වන විට ජනගහනය 20% - 25% දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර දඹුල්ල ප්‍රදේශය තුළ අපේක්ෂිත ජනගහන ඝනත්වය වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 750-1500 ක පරාසයකි. ඒ අනුව වැඩිම ජන ඝනත්වයකින් ජනගහනය වර්ධනය වුවහොත් 2050 වන විට 500,000 ක ජනගහනයක් සඳහා ජාතික භෞතික සැලැස්මට අනුව පුරෝකථනය කළ හැක.

ඒ අනුව විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රදේශයේ හර ප්‍රදේශය ඉහළ ඝනත්වයක් යටතේ සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. විසල් දඹුල්ල නාගරික සංවර්ධන සැලැස්ම යටතේ කෘෂිකාර්මික හා සංචාරක නගරයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂිත බැවින් රැකියා අවස්ථා හේතු කොට ගෙන ප්‍රදේශයට සංක්‍රමණික ජනගහනයක් වර්ධනය වීමට ප්‍රවණතාවයක් ඇත.

ඒ අනුව වර්ධනය වේ යැයි අපේක්ෂිත අනාගත ජනහනය හරහා ප්‍රදේශයේ නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය යෝජිත එක් එක් කලාපයට අනුව මෙන්ම ඒවාට ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වන ඉඩම් පරිහරණ භාවිතයන්ට අනුවද වෙනස්කම් වලට ලක් වේ.



සිතියම් අංක 6.4 : *නේවාසික සැලැස්ම*

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

මෙලෙස පුරෝකථනය කල ජනගහනය සහ ඊට අනුබද්ධව යෝජිත නිවාස ඝනත්වය, සංවර්ධන සැලැස්ම මගින් ළඟා කර ගැනීමට බලාපොරොත්තු වන අනාගත දැක්ම, පාරිසරික විශ්ලේෂණයන්ගේ ප්‍රතිඵල සහ සංවර්ධන විභවතාවයන්ට අනුකූල වන පරිදි ඝනත්ව කලාප වශයෙන් බෙදා වෙන් කිරීම පහත පරිදි වේ. එහිදි උපකල්පනයක් මත ඝනත්ව කලාපවල අනාගතයේදී දිරිගන්වන ප්‍රමුඛ භාවිතය පදනම් කර ගනිමින් ජනගහන වර්ධන වේගයන් සලකා බලා ඇත.

යෝජිත කලාප නාමය	ප්‍රමාණය (වර්ග කිලෝමීටර්)	2032 සඳහා යෝජිත ජනගහනය	යෝජිත ජන ඝනත්වය (වර්ග කිලෝමීටරයට පුද්ගලයන්)	යොජිත නිවාස ඒකක ප්‍රමාණය
1. පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය	19.35	5,000	258	1250
2. ගුවන් තොටුපල කලාපය	5.22	2,000	383	500
3. පරිසර සංරක්ෂණ කලාපය	400.27	59,000	147	14750
4. කාර්මාන්ත කලාපය	19.76	5,000	253	1250
5. මිශ්‍ර සංවර්ධන කලාපය - I	78.01	48,000	615	12000
6. මිශ්‍ර සංවර්ධන කලාපය - II	102.59	48,000	468	12000
7. මිශ්‍ර නේවාසික කලාපය	356.85	122,000	342	30500
8. සංචාරක සංවර්ධන කලාපය	86.65	25,000	289	6250
	1070.00	**314,000**	**293**	**78500**

සටහන :- නාගරික සංවර්ධන අධිකාරිය , මාතලේ කාර්යාලය මඟින් ඇස්තමේන්තු කරන ලදි.

වගු අංක 6.2 : යෝජිත කලාප අනුව ජනගහන ව්‍යාප්තිය

එම ගණනය කිරීම මත විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයේ 2032 වන විට අපේක්ෂිත නේවාසික ජනගහනය 320,000 ක් වේ. මෙම ජනගහනය පවුල් ඒකකයක අවම පුද්ගලයන් ගණන සැළකිල්ලට ගනිමින් කලාප අනුව නිවාස ව්‍යාප්තිය සහ ඝණත්වය ගණනය කොට ඇත.

ප්‍රධාන නගරය වන දඹුල්ල නගර මධ්‍යයේ සිට කි.මී 01 ක පමණ උතුරු දෙසින් යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ආසන්නයේ නගරයට සංචරණය වන ජනතාව මූලික කර ගනිමින් මධ්‍යම පාන්තික නේවාසික ව්‍යාපෘති සඳහා භූමිය වෙන් කිරීමට අපේක්ෂිතය. තවද, ප්‍රධාන නේවාසික පර්ෂද නගරයක් වන නාඋල, නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 04 ක පමණ භූමියෙහි මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

6.3.1.4. පරිපාලන හා විනෝද පහසුකම් සැපයීමේ සැලැස්ම

හඳුනාගත් පළමු පෙළ හා දෙවන පෙළ නගරයන්හි නේවාසික හා දෛනිකව නගරය කරා ඇදී එන ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා කාර්යාලීය, වාණිජ හා විනෝද කටයුතු වැඩි දියුණු කිරීමට පහත ව්‍යාපෘතීන් හඳුනා ගන්නා ලදි.

ඒ අනුව, දඹුල්ල නගරයෙහි පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා මිරිස්ගෝනියාව ප්‍රදේශයෙහි පවත්නා පරිපාලන සංකීර්ණය තවදුරටත් වැඩි දියුණු කිරීමටත්, නාඋල පර්ෂද නගර මධ්‍යයෙහි පවත්වා පොදු වාහන නැවතුම් ස්ථානය, මහේස්ත්‍රාත් උසාවිය, වන අධවි කාර්යාලය, තැපැල් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වාණිජ භාවිතාවන්ගෙන් වෙන් වන පරිදි වෙනත් ප්‍රවේශ මාර්ගයක් ඔස්සේ ප්‍රවේශ වීමට හැකිවන පරිදි නැවත සකස් කිරීමටත් යෝජිතය. හබරණ පර්ෂද නගරයෙහි පවත්නා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යාල භූමිය උපයෝගි කරගනිමින් පරිපාලන සංකීර්ණයක් ඇති කිරීම මගින් නගරය පුරා ව්‍යාප්ත වී පවතින කාර්යාල එක් ස්ථානයක ස්ථාපිත කිරීමට යෝජිතය.

යෝජිත ප්‍රධාන නගරය හා පර්ෂද නගරයන්හි විනෝද කටයුතු වැඩි දියුණු කිරීම සඳහා හඳුනාගත් ව්‍යාපෘතින් පහත පරිදි වේ. දඹුල්ල නගරයෙහි ඉදි කිරීම් අරඹා කර මේ වන විට තාවකාලිකව නවතා ඇති විවෘත රංග ශාලාව ඉදිකිරීම නිම කිරීමද, ගලේවෙල නගරයෙහි ප්‍රාදේශිය සභාව ආසන්නයේ පවතින ළමා උද්‍යානය නැවත සංවර්ධනය කිරීමද, නාඋල නගරයෙහි පවත්නා පොදු වෙළඳ සැල් භූමියෙහි විනෝද කටයුතු සඳහා මධ්‍යස්ථානයන් ඉදිකිරීමද, මඩාටුගම නගරයෙහි දේශිය සංචාරකයින් හා වන්දනාකරුවන් සඳහා පහසුකම් ඇති කිරීමේ ව්‍යාපෘතියද හඳුනා ගෙන ඇත.



සිතියම් අංක 6.5 : *පරිපාලන හා විනෝද පහසුකම් සැපයීමේ සැලැස්ම*

6.3.2 භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රවාහන තීර හතරක් වන මහනුවර - යාපනය හා කොළඹ - ත්‍රිකුණාමලය අතර මධ්‍යයේ පිහිටා ඇති ඉතා විශිෂ්ට ජාතික සහ කලාපීය මාර්ග සම්බන්ධතාවයන් සහිත ප්‍රදේශයක් ලෙස සඳහන් කළ හැකිය. එසේම ශ්‍රී ලංකාවේ රට අභ්‍යන්තරයෙන් භූමියේ උතුර දකුණ යා කෙරෙන ප්‍රධාන මංසන්ධිස්ථානය වන්නේද දඹුල්ල නගරය වේ.

එසේම අතීත සහ වත්මන් කාල පරාසය තුළ මාර්ග ජාලය සම්බන්ධව සිදුවූ සංවර්ධන වෙනස්කම් නාගරික බල ප්‍රදේශයක් ලෙස වාණිජ, කෘෂිකාර්මික, සංචාරක හා අනෙකුත් නාගරික සේවාවන් කැපී පෙනෙන වෙනසක් ඇති කරවන්නට සමත්ව ඇත. තවද, ජාතික භෞතික සැලසුමට අනුව යෝජිත කුරුණෑගල - දඹුල්ල අධිවේගී මාර්ගයත්, යෝජිත කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගයත් හඳුනාගත හැකිය. මෙහි වාසියද උකහා ගනිමින් අනාගතයේ සිදු විය හැකි සංවර්ධන ප්‍රවණතාවයක් මත උපාය මාර්ගික මහා මාර්ග සැලැස්මක අවශ්‍යතාවය මතුව පවතී.

ඒ අනුව මාර්ග හා ප්‍රවාහන සංවර්ධන සැලසුම යටතේ ප්‍රධාන මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග කිහිපයක් පහත පරිදි හඳුනා ගන්නා ලදි.

6.3.2.1. මාර්ග සංවර්ධන සැලැස්ම

විසල් දඹුල්ල ප්‍රදේශයේ හොඳින් ව්‍යාප්ත වී පවත්නා මාර්ග පද්ධතිය තව දුරටත් සංවර්ධනය කිරීම සඳහා පහත ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත.

1. විකල්ප මාර්ග සංවර්ධනය කිරීම
2. මාර්ග පද්ධතිය පුළුල් කිරීම.
3. අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම.
4. නව මාර්ග ඉදි කිරීම.
5. පදික මංතීරු ඉදි කිරීම.
6. දඹුල්ල නගර මධ්‍ය කලාපය තුල දුර ගමන් සහ කෙටිදුර පොදු ප්‍රවාහන ගමන් සඳහා රථ වාහන සැලැස්මක් පිලියෙල කර ක්‍රියාත්මක කිරීම.



සිතියම් අංක 6.6 : *මාර්ග සංවර්ධන සැලැස්ම*

6.3.2.1.1 විකල්ප මාර්ග සංවර්ධනය කිරීම.

විකල්ප මාර්ග සංවර්ධනය යටතේ දඹුල්ල නගරය, ගලේවෙල නගරය හා හබරණ නගරය සඳහා විකල්ප මාර්ග ඉදි කිරීමට යෝජිතය.

- දඹුල්ල පිටත වටරවුම් මාර්ගය සංවර්ධන කිරීම
  - කුරුණෑගල මාර්ගයේ (ඒ 6) සිට අනුරාධපුර මාර්ගය (ඒ 9) දක්වා
  - මහනුවර මාර්ගයේ (ඒ 9) සිට හබරණ මාර්ගය (ඒ 6) දක්වා
  - මහනුවර මාර්ගයේ (ඒ 9) සිට කුරුණෑගල මාර්ගය (ඒ 6) දක්වා
  - අනුරාධපුර මාර්ගයේ (ඒ 9) සිට හබරණ මාර්ගය (ඒ 6) දක්වා
- ගලේවෙල පත්කොලගොල්ල හරහා ඒ 6 මාර්ගයට විකල්ප මාර්ගයන් සංවර්ධනය කිරීම.
- හබරණ පිටත වටරවුම් මාර්ගය සංවර්ධනය කිරීම.
  - ත්‍රිකුණාමල මාර්ගයේ (ඒ 6) සිට පොළොන්නරුව මාර්ගය (ඒ 11) දක්වා
  - පොළොන්නරුව මාර්ගයේ (ඒ 11) සිට දඹුල්ල මාර්ගය (ඒ 6) දක්වා
  - දඹුල්ල මාර්ගයේ (ඒ 6) සිට අනුරාධපුර මාර්ගය (ඒ 11)දක්වා
  - අනුරාධපුර මාර්ගයේ (ඒ 11) සිට ත්‍රිකුණාමල මාර්ගය (ඒ 6) දක්වා

6.3.2.1.2 මාර්ග පද්ධතිය පුළුල් කිරීම.

- ඒ 9 මාර්ගයේ සිට යෝජිත දුම්රිය ස්ථානය දක්වා අනුපරයාය මාර්ගය මංතීරු 4 ක් දක්වා පුළුල් කිරීම.
- දම්බුල්ල නිශ්ශන්ක මන්සන්දියේ සිට ආර්තික මධ්‍යස්තානය ඉදිරිපසින් සනස මාර්ග මන්සන්ධිය දක්වා ඒ 9 මාර්ගය මන්තීරු 5ක් දක්වා පුලුල් කිරීම.
- ඒ 6 මාර්ගයේ සිට යෝජිත දම්බුල්ල රෝහල් භූමිය හරහා ඒ 9 මාර්ගය දක්වා ඇති මාර්ගය මන්තීරු 4ක් දක්වා පුලුල් කිරීම.
- ඒ 9 මාර්ගයේ සිට ඒ 6 මාර්ගය දක්වා කාර්මික විද්‍යාල මාර්ගය මංතීරු 4 ක් සහිතව පුළුල් කිරීම.
- ඒ 9 මාර්ගය හා ඒ 6 මාර්ගය සම්බන්ධ කරමින් කාර්මික කලාපය හරහා ඇති ඇතාබැඳි වැව මාර්ගය සංවර්ධනය කිරීම හා පුළුල් කිරීම.
- නාඋල ඒ 9 මාර්ගය හා ගලේවෙල ඒ 6 මාර්ගය සම්බන්ධ කෙරෙන වැමැඩිල්ල මාර්ගය සංවර්ධනය කිරීම.
- ගලේවෙල නගර මධ්‍යයේ ඒ 6 මාර්ගය මංතීරු 06ක් හා වාහන නැවතීම් මංතීරු සහිතව පුළුල් කිරීම.
- වාලේවෙල - මාතලේ මාර්ගය මංතීරු 02 ක් දක්වා සංවර්ධනය කිරීම.
- හබරණ නගර මධ්‍යය කලාපයේ පොළොන්නරුව - අනුරාධපුර මාර්ගය හා ඒ 6 මාර්ගය මංතීරු 04ක් දක්වා පුළුල් කිරීම.
- ඉනාමළුව හා හබරණ මාර්ගය සීගිරිය හරහා මංතීරු 02ක් දක්වා පුළුල් කිරීම.
- නාඋල නගර මධ්‍යයේ A9 මාර්ගය මංතීරු 04 ක් දක්වා පුළුල් කිරීම.

6.3.2.1.3 අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම.

- නාඋල නගරයෙහි සෙත්මඟ මාර්ගය ඒ 9 මාර්ගයේ සිට ඇලහැර මාර්ගය දක්වා සංවර්ධනය කිරීම.
- නාඋල වැව පිවිසුම් මාර්ගය ඒ 9 මාර්ගයේ සිට කරවිලහේන මංසංධිය දක්වා සංවර්ධනය කිරීම.
- නාඋල කලාප අධ්‍යාපන කාර්යාල මාර්ගය සංවර්ධනය කිරීම.
- ගලේවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාල මාර්ගය සංවර්ධනය කිරීම.
- ගලේවෙල පවත්නා පොදු සති පොල පරිශ්‍රය හරහා මාර්ගය, ඒ 6 මාර්ගයේ සිට ගලේවෙල - මාතලේ මාර්ගය දක්වා සංවර්ධනය කිරීම.
- ගලේවෙල රෝහල් පරිශ්‍රයට යාබදව පවතින මාර්ගය A6 මාර්ගයේ සිට කළාවැව මාර්ගය දක්වා සංවර්ධනය කිරීම.
- කණ්ඩලම මාර්ගයේ සිට සීගිරිය දක්වා වෑවල වැව මාර්ගය සංවර්ධනය කිරීම.

6.3.2.1.4 නව මාර්ග ඉදිකිරීම.

- ඉදිගොල්ල ඔය සිට නිශ්ශංක හන්දිය දක්වා මංතීරු 4 කින් යුක්තව නව ඒ 9 මාර්ගය ඉදිකිරීම.
- යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හා යෝජිත නගර මධ්‍යය වෙළඳ සංකීර්ණය අතර මාර්ගය ඉදිකිරීම.
- ආර්තික මධ්‍යස්ථානයේ සිට දඹුල්ල යෝජිත දුම්රිය ස්ථානය දක්වා මන්තීරු 2ක් සහිතව සේවා මාර්ගය ඉදිකිරීම.

6.3.2.1.5 පදික මංතීරු ඉදිකිරීම.

- දම්බුල්ල, ගලේවෙල, හබරන නගරවල පදික මංතීරු ඉදිකිරීම.

6.3.2.2. රථගාල් හා මාර්ගස්ථ මගී පහසුකම් සංවර්ධන සැලැස්ම.

විසල් දඹුල්ල ප්‍රදේශය පොදු ප්‍රවාහන පහසුකම් සංවර්ධනය සඳහා බස්රථ නැවතුම් පොල සංවර්ධනය කිරීම හා ප්‍රධාන මාර්ගයන් හි පවත්නා බස්රථ නැවතුම් ස්ථාන සංවර්ධනය කිරීම අපේක්ෂිතය. ඒ අනුව, ගලේවෙල හා සීගිරිය බස්රථ නැවතුම්පොල සංවර්ධනය කිරීම හඳුනාගෙන ඇත.

ඊට අමතරව, ප්‍රධාන මාර්ග ඔස්සේ නගර මධ්‍යය ප්‍රදේශයන්හි බස්රථ නැවැත්විමේ ස්ථාන සංවර්ධනය කෙරේ. ඒ සඳහා දඹුල්ල නගර මධ්‍යයේ ඒ 9 හා ඒ 6 මාර්ගය ඔස්සේ පවත්නා බස් නැවතුම් ස්ථාන සංවර්ධනයද, හබරණ නගරයේ ඒ6 මාර්ගයේ හා ඒ 11 මාර්ගයේ පවත්නා බස් නැවතුම් ස්ථාන 8 ක් සංවර්ධනය ද හඳුනාගෙන ඇත.



සිතියම් අංක 6.7 : *රථගාල් හා මාර්ගස්ථ මගී පහසුකම් සංවර්ධන සැලැස්ම*

ප්‍රධාන නගරය හා පර්ශද නගර ආශ්‍රිතව රථ වාහන නැවතුම් පහසුකම් සපයා දීම හා වැඩි දියුණු කිරීම සඳහා පහත ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත.

- සීගිරියෙහි - දේශීය සංචාරකයින් සඳහා රථ වාහන නැවතුම් ස්ථානය.
- දඹුල්ල නගරයෙහි මරදමන්යාය ප්‍රදේශයේ රථ වාහන නැවතුම් ස්ථානය.
- ගලේවෙල නගරයෙහි - ලේනාවල ඉඩම ආශ්‍රිතව රථ වාහන නැවතුම් ස්ථානය.
- හබරණ නගරයෙහි පවත්නා සතිපොල භූමියට ඉදිරියෙහි රථ වාහන නැවතුම් ස්ථානය.

6.3.2.3. ප්‍රවාහන මධ්‍යස්ථාන සංවර්ධන සැලැස්ම

යෝජිත කුරුණෑගල- හබරණ දුම්රිය මාර්ගයෙහි දඹුල්ල දුම්රිය නැවතුම් ස්ථානය හා යෝජිත අධිවේගී මාර්ගයෙහි දඹුල්ල පිටවුම් ස්ථානය කේන්ද්‍ර කර ගනිමින්ද, රජයේ ප්‍රතිපත්ති 2020 අනුව දඹුල්ල සහ සම්බන්ධිත නගරයක් (Connecting Cities) ලෙස දියුණු කිරීමට අපේක්ෂාවෙන් ද දඹුල්ල නගරය ශ්‍රී ලංකාව මධ්‍යයේ පිහිටා ඇති භූගෝලීය වැදගත්කමද උපයෝගි කර ගනිමින් දඹුල්ල නගරය ශ්‍රී ලංකාවේ ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය.

2020 වර්ෂයේ දි, දඹුල්ල නගරය හරහා කොළඹ සිට දෛනිකව 310 කට අධික මගී ප්‍රවාහන බස්රථ ප්‍රමාණයක්ද, සාමාන්‍යයෙන් 10,000 කට අධික මගීන් ප්‍රමාණයක් ද පැමිණේ. මෙය 2030 වන විට 12,000 ක මගීන් ප්‍රමාණයක් දක්වා වර්ධනය වන බව පුරෝකථනය කර ඇත. ඊට අමතරව මහනුවර - යාපනය මාර්ගයෙන් ද අමතර මගීන් සංඛ්‍යාවක් හා බස්රථ සංඛ්‍යාවක් දඹුල්ල නගරයට පැමිණේ. තවද යෝජිත අධිවේගී මාර්ගය හරහා 2026 වර්ෂය වන විට 8,000 ක පමණ මගීන් සංඛ්‍යාවක් ද 2036 වන විට 17,000 කට අධික මගීන් සංඛ්‍යාවක් ද පැමිණෙනු ඇති බව ගණනය කර ඇත.

ඒ අනුව, දඹුල්ල නගරයෙහි බහුවිද ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අපේක්ෂිතය. මේ සඳහා දඹුල්ල නගරයට කිලෝ මීටර් 01 පමණ උතුරු දෙසින් පිහිටා ඇති හෙක්ටයාර් 60 පමණ භූමි ප්‍රමාණයක් සුදුසු ස්ථානයක් ලෙස තෝරාගෙන ඇත. යෝජිත ස්ථානයෙහි දුම්රිය, බස්රථ හා අනෙකුත් සුළු ප්‍රවාහන මාධ්‍ය පහසුකම් සැපයිමටත්, දුම්රිය හා බස්රථ කාල සටහන් එකිනෙක සම්බන්ධ වන ලෙස ක්‍රියාත්මක කිරීමටත් යෝජිතය.

6.3.2.4. නගර අලංකරණ සැලැස්ම

හඳුනාගත් පළමු පෙල හා දෙවන පෙළ නගරයන් හි නාගරික ලක්ෂණ පෙන්නුම් කෙරෙන ලෙස හා ඒ ඒ නගරයන් හි අනන්‍යතාවය ඉස්මතු වන ආකාරයෙන් නාගරික මුහුණත සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.



සිතියම් අංක 6.8 : *නගර අලංකරණ සැලැස්ම*

ඒ අනුව, හඳුනාගත් ප්‍රධාන මාර්ගයන් ඔස්සේ නගර මධ්‍ය ප්‍රදේශයන් හි ගොඩනැගිලි මුහුණත නැවත සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. ඒ සඳහා හඳුනාගත් වර්ණයන් හා ගොඩනැගිලි මාධ්‍යය භාවිතය සිදුකිරීමට අපේක්ෂිතය. හඳුනාගත් ප්‍රදේශයන් පහත පරිදි වේ.

- දඹුල්ල නගර මධ්‍යය කලාපයේ ඒ9 මාර්ගය හා ඒ6 මාර්ගය දෙපස ගොඩනැගිලි මුහුණත සංවර්ධනය.
- ගලේවෙල, නාවුල, හබරන, සීගිරිය නගර මධ්‍යය කලාපයේ ප්‍රධාන මාර්ග දෙපස ගොඩනැගිලි මුහුණත සංවර්ධනය.

තවද, ප්‍රධාන නගරයෙහි හා පර්ෂද නගරයන්හි හඳුනාගත් ප්‍රධාන අභ්‍යන්තර මාර්ග දෙපස පදික මංතීරු ක්‍රමවත් කිරීම, මාර්ග දෙපස රුක් රෝපණය හා වීදි පහන් කණු ස්ථාපනය කිරීම සඳහා පහත ව්‍යාපෘතීන් හඳුනා ගන්නා ලදි.

	මාර්ගය	දුර
දඹුල්ල	A6 මාර්ගය	1.3 km
	A9 මාර්ගය	4 km
	කණ්ඩලම මාර්ගය	300 m
	පිරිවෙන මාර්ගය	1.88 km
	නිශ්ශංක මාවත	1 km
	කාර්මික විද්‍යාල මාර්ගය	500 m
	නාමල් උයන මාර්ගය	100 m
	අනුපරයාය මාර්ගය	700 m
	ගම්උදාව මාර්ගය	300 m
	නව පාදෙනිය මාර්ගය	1.1 km
ගලේවෙල	A6 මාර්ගය	2 km
	ගලේවෙල - මාතලේ මාර්ගය	200 m
	කලාවැව මාර්ගය	300 m
	පත්කොලගොල්ල මාර්ගය	400 m
	දඹගොල්ල මාර්ගය(මධ්‍ය විද්‍යාලය මාර්ගය)	300 m
	ප්‍රාදේශීය ලේකම් කාර්යාල මාර්ගය	300 m
නාඋල	A9 මාර්ගය	2 km
	වීරගොල්ලයාය මාර්ගය	1 km
	නාඋල විදුලි බල මණ්ඩල සංචාරක බංගලාව මාර්ගය	450 m
	මහවැලි සංවර්ධන අධිකාරි කාර්යාලය හරහා සෙත්මග මාර්ගය	800 m

	මාර්ගය	දුර
නාඋල	ජනඋද්‍යානගම මාර්ගය	700 m
	කලාප අධ්‍යාපන කාර්යාල මාර්ගය	500 m
	ඇලහැර මාර්ගය	550 m
	නාහිස්ස රජමහා විහාර මාර්ගය	500 m
	කරවිලහේන මාර්ගය	300 m
	බිබිල මාර්ගය	500 m

වගු අංක 6.3 : යෝජිත අභ්‍යන්තර මාර්ග සංවර්ධන ව්‍යාපෘති

තවදුරටත්, මඩාටුගම නගරය ආශ්‍රිතව පවත්නා නාමල් උයන ඓතිහාසික ස්ථානයෙහි අනන්‍යතාවය ඉස්මතු වන අයුරින් නාමල් උයන පිවිසුම් දොරටුව සංවර්ධනය කිරීමටත්, මඩාටුගම මංසන්ධිය සංවර්ධනය කිරීමටත් යෝජිතය.

හබරණ නගරය මුලික කරගනිමින් සංචාරක කර්මාන්තය ඉස්මතු වන ආකාරයෙන්ද ආකර්ෂණය වැඩිවන ආකාරයෙන් ද හබරණ නගර අලංකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

6.3.2.5. මලාපවාහන හා අපජල කළමනාකරණ සැලැස්ම

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශය ස්වභාවික ජල මාර්ග උපයෝගි කරගත් එනම් තම්මැන්නා ඇල, මිරිස්ගෝනියා ඔය, නාඋල හා ගලේවෙල නගරයන්හි ඇති ඇල මාර්ග ස්වාභාවික වැසි ජල කළමනාකරණ පද්ධතියකින් යුක්තය.

දඹුල්ල නගරයෙහි තම්මැන්නා ඇල හා මිරිස්ගෝනියා ඔය ආශ්‍රිතව වැසි ජල බැස්ම ක්‍රමවත් කිරීම සඳහා දඹුල්ල නගර මධ්‍යයෙහි වැසි ජල කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් හඳුනා ගන්නා ලදි.

ගලේවෙල නගර මධ්‍යයෙහි ඇති කළුගල ඇල හා පත්කොලගොල්ල ආසන්නයේ පවතින ඇල ඉවුරු සංවර්ධනය කර ජලය බැසීම ක්‍රමවත් කිරීම යෝජිතය. ඒ අනුව, ගලේවෙල පර්ෂද නගරය තුළ ස්වාභාවික වැසි ජල කළමානාකරණ පද්ධතිය වැඩි දියුණු කෙරෙනු ඇත.

නාඋල නගර මධ්‍යයේ, එනම් මහජන ක්‍රීඩාංගනය හා පොදු බස් රථ නැවතුම් පොළෙහි පවත්නා වැසි ජල බැස්මේ දුර්වලතාවයන් මඟහරවා ගනිමින් නාඋල නගරයට උතුරු දෙසින් අදාළ මාර්ගය සමග සම්බන්ධතාවය වැඩි දියුණු කරගනිමින් ස්වාභාවික වැසි ජල කලමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජිතය. තවද හබරණ නගරයෙහි පවත්නා ස්වාභාවික ජල බැස්ම ක්‍රමවත් කිරීමට අපේක්ෂිතය.

හඳුනාගත් නගර අතරින් 2050 වන විට 500,000 ක පමණ ජනගණයක් අපේක්ෂිත දඹුල්ල නගරයෙහි මධ්‍යගත මලාපවාහන හා අපජල කලමානාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීමේ වැදගත්කම මෙම සැලැස්ම මඟින් හඳුනා ගන්නා ලදී. ඒ අනුව, දඹුල්ල නගර මධ්‍ය ප්‍රදේශය මුලික කරගනිමින් මධ්‍යගත මලාපවාහන හා අපජල කලමානාකරණ පද්ධතියක් ඉදි කිරීමට යෝජිතය.

6.3.2.6. ඝන අපද්‍රව්‍ය කලමනාකරණ සැලැස්ම

2020 වර්ෂයේදී විසල් දඹුල්ල ප්‍රදේශයෙන් දෛනිකව මෙට්‍රික් ටොන් 20ක පමණ ඝන අපද්‍රව්‍ය නිෂ්පාදනයක් සිදු වේ. එම ප්‍රමාණයෙන් 90% ක පමණ ප්‍රතිශතයක් දඹුල්ල විශේෂිත ආර්ථික මධස්ථානය මඟින් නිපද වේ. එම ඝන අපද්‍රව්‍ය ලෙස ඉවතලන එළවළු හා පළතුරු ප්‍රමාණය 2032 වර්ෂය වන විට අවම අගයකට පත් කිරීම සඳහා ව්‍යාපෘති හා යෝජනා මෙම සැලැස්මෙහි කෘෂි කාර්මික සංවර්ධන සැලැස්ම යටතේ විස්තර කෙරේ.

වර්තමානයේ දී, දිගම්පතහ ප්‍රදේශයේ ස්ථාපනය කර ඇති ඝන අපද්‍රව්‍ය කළමනා-කරණ මධ්‍යස්ථානයෙහි දෛනික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ධාරිතාවය මෙට්‍රික්ටොන් 50 ක් පමණ වේ. එම ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් නිශ්පාදන ක්‍රියාවලියක්ද සිදුකෙරේ. දඹුල්ල ප්‍රධාන නගරයෙහි නිෂ්පාදිත ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය 2032 වන විටද මෙම ව්‍යාපෘතිය මඟින් කළමනාකරණය කිරීමේ හැකියාව ඇත.

තවදුරටත්, ගලේවෙල නගරයෙහි නිශ්පාදිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සිදු කිරීම සඳහා දොරකැටිවල ප්‍රදේශයෙහි පිහිටා ඇති ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ භූමිය විධිමත්ව සංවර්ධනය කිරීමට ද , නාඋල නගරයෙහි නිෂ්පාදිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා ලේනදොර ප්‍රදේශයෙහි පවත්නා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානය විධිමත්ව සංවර්ධනය කිරීමටත් යෝජිතය.

තවදුරටත් ඝන අපද්‍රව්‍ය නිෂ්පාධිතය කි.ග්‍රෑ 100 වැඩි ව්‍යාපෘතීන් සඳහා ජීව වායු ඒකක එම ව්‍යාපෘති මට්ටමින්ම ක්‍රියාත්මක කිරීම නිර්දේශ කිරීමට යෝජිතය.

ඉහත විස්තරාත්මකව දැක්වූ භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්මට අදාල ව්‍යාපෘතීන් පහත සිතියම් අංක 6.9, සිතියම් අංක 6.10, සිතියම් අංක 6.11, සිතියම් අංක 6.12, සහ සිතියම් අංක 6.13 හි දැක්වේ.



සිතියම් අංක 6.9 : *සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම - දඹුල්ල*



සිතියම් අංක 6.10 : *සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම - ගලේවෙල*



සිතියම් අංක 6.11 : *සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම - නාඋල*



සමාජීය,භෞතික යටිතල හා ආර්ථික සංවර්ධන උපාය මාර්ග සැලැස්ම - හබරණ 2022 - 2032

මාතලේ දිස්ත්‍රික් කාර්යාලය | විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම(2022 – 2032) | නාගරික සංවර්ධන අධිකාරිය අප්‍රේල් 2021

සිතියම් අංක 6.12 : *සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම - හබරණ*



සිතියම් අංක 6.13 : *සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග සැලැස්ම - සීගිරිය*

6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ග

විසල් දඹුල්ල නාගරික කලාපය තුල වර්ෂ 2032 වන විට අපේක්ෂිත ආර්ථික සංවර්ධනය කරා ළඟාවීමට ප්‍රධාන වශයෙන් ඉලක්ක කරගත් ඉලක්ක අංක 01 : ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි වෙළඳ ආර්ථිකය පදනම් කරගත් වාණිජ දැවන්තයා බවට පත් කිරීම ද, ඉලක්ක අංක 04 තිරසාර පුරාවිද්‍යාත්මක හා පාරිසරික සංචාරක කර්මාන්තයක් ඇති කිරීම ද මෙම උපායමාර්ගික සැලැස්ම මගින් අපේක්‍ෂා කෙරේ.

2018 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදනය සඳහා මධ්‍යම පළාතේ දායකත්වය 12% ට ආසන්න අගයක පවතී. කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයෙන් 9% ක් ද කර්මාන්ත ක්ෂේත්‍රයෙන් 31% ක් ද සේවා අංශයෙන් 60% ක් ද මේ සඳහා දායක වේ.

විසල් දඹුල්ල ප්‍රදේශයේ ශ්‍රම බලකාය මුළු ජනගහනයෙන් 63% ක ප්‍රමාණයක් වේ. ඉන් 55% ක ජනතාවක් ආර්ථික වශයෙන් සක්‍රීයව ක්‍රියා කරයි. ඒ අනුව, 40% ක ප්‍රමාණයක් කෘෂිකාර්මික අංශයේ ද, 26% කර්මාන්ත අංශයේ ද, 34% ක් සේවා අංශයේ ද රැකියාවල නියලී සිටී. විසල් දඹුල්ල ප්‍රදේශයේ 1:0.58 යැපීම් අනුපාතයක් ඇත.

විසල් දඹුල්ල ප්‍රදේශයේ භූමි ප්‍රමාණයෙන් 32 % කට අධික ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය සඳහා 2020 වර්ෂය වන විට භාවිත කෙරෙන අතර, 70% ට අධික ප්‍රමාණයක් වී වගාව සඳහා භාවිතා කෙරේ. තවද, මාතලේ දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන් ආර්ථික බෝග වගාවට ප්‍රසිද්ධියක් උසුලන අතර, වර්ෂ 2018 හිදී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතරින් කෘෂි අපනයන බෝග වගාව සඳහා වෙන්කර ඇති භූමි ප්‍රමාණය අනුව 5වන ස්ථානයෙහි පවතී.

තවද, ශ්‍රී ලංකාවේ ආර්ථික මධ්‍යස්ථාන අතරින් දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය හොඳින් ව්‍යාප්තව කෘෂි බෝග රැස් කිරීමේ හා බෙදා හැරීමේ ජාලයකින් සමන්විතය. ඒ අනුව, සාමාන්‍යයෙන් මාසික කෘෂි බෝග රැස් කිරීමේ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2500 ඉක්මවයි. ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ ලෙස එළවළු, ලොකු ළූණු, අල, කරවල හා පළතුරු රැස් කරයි. පාරිභෝගික භාණ්ඩ එකතුවෙන් සාමාන්‍යයෙන් 40% ක ප්‍රමාණයක් ප්‍රවාහනයේදී කල්තබා ගැනීමේ පහසුකම් නොමැතිකමින්, ඇසුරුම් හා අගය වැඩි කිරීමේ කර්මාන්ත නොමැති කමින් අපතේ යයි.

විසල් දඹුල්ල ප්‍රදේශයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ඉබ්බන්කටුව සුසාන භූමිය, නාමල් උයන, දඹුල්ල ලෙන් විහාරය, නාලන්දා ගේඩිගේ, කලුදිය පොකුණ, සීගිරිය, එඬේරගල වන සෙනසුන, පිදුරංගල, මැණික්දෙන ආදී ස්ථානද පාරසරික වටිනාකම්කින් යුතු කණ්ඩලම වැව, ඉබ්බන්කටුව වැව, මොරගහකන්ද ජලාශය, හබරණ, පැල්වැහැර, හිරුවඩුන්න ආදි ස්ථානද මේ වන විටද හොඳින් ව්‍යාප්ත වී පවත්නා සංචාරක කර්මාන්ත තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට දායක වේ.

2018 වර්ෂයේදී විසල් දඹුල්ල සැලසුම් කලාපයට 1,000,000 ට අධික දේශිය හා විදේශිය සංචාරකයන් පිරිසක් පැමිණ ඇත. ඒ අතරින් 50% ක පමණ ප්‍රමාණයක් විදේශිය සංචාරකයන් වේ. තවද, 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණි විදේශිය සංචාරකයන් ප්‍රමාණය 2,000,000 පමණ වන අතර, ඒ අනුව, ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිය සංචාරකයින්ගෙන් 25% ක පමණ ප්‍රමාණයක් විසල් දඹුල්ල ප්‍රදේශයට පැමිණේ. තවදුරටත්, හොඳින් ව්‍යාප්ත වී පවතින සංචාරක හෝටල් ජාලය, විසල් දඹුල්ල ප්‍රදේශය සංචාරක නවාතැන් පලක් බවට පත් කර ඇත. 2018 වර්ෂය වන විට දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ පමණක් සංචාරක හෝටල් 84ක්ද, නේවාසික පහසුකම් සපයන නිවාස (Home Stay) 478ක ප්‍රමාණයක්ද පවති. ඒ අනුව, 1182ක සංචාරක නේවාසික කාමර ප්‍රමාණයක් පවති. මෙම නැවතුම් ස්ථාන හා හෝටල් සඳහා මාසිකව 34,725ක පමණ සංචාරකයින් ප්‍රමාණයක් දඹුල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය වෙත නවාතැන් ගැනීම සඳහා පැමිණේ.

වාණිජ සැලැස්ම, කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම හා සංචාරක සංවර්ධන සැලැස්ම යටතේ විසල් දඹුල්ල ප්‍රදේශයෙහි ආර්ථික සංවර්ධන උපායමාර්ග විස්තර කෙරේ.

6.4.1. වාණිජ සැලැස්ම

නවීන වාණිජ පහසුකම් ඇති කිරීම යටතේ දඹුල්ල නගරයෙහි, පැරණි පොළ පවතින භූමියෙහි නවීන වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමටත්, මරදමන්යාය නාගරික සංවර්ධන අධිකාරිය සතු භූමියෙහි වාහන නැවතුම් ස්ථාන හා වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමටත්, දඹුල්ලෙහි පවත්නා සතිපොළට සමීපව පොදු වෙළඳ පොළ සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීමටත් යෝජිතය.

ගලේවෙල නගර මධ්‍යයෙහි පොදු උද්‍යාන හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීමටත්, පවත්නා පොදු සති පොළ භූමිය සංවර්ධනයටත් යෝජිතය.

නාඋල පර්ෂද නගරයෙහි පවත්නා සති පොළ හා පොදු වෙළඳ සංකීර්ණය සංවර්ධනයටත්, යාපනය - මහනුවර (ඒ 9) මාර්ගයට හා කණුමුලයාය මාර්ගයට යාබඳව පිහිටි ඉඩමෙහි වාණිජ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමටත් යෝජිතය.

හබරණ පර්ෂද නගරයෙහි පවත්නා ඉන්ධන පිරවුම් හල ආසන්නයෙහි වෙළඳ සංකීර්ණයන් ඉදි කිරීමටත් පවත්නා සති පොල භූමියෙහි නවීන පොදු වෙළඳ සංකීර්ණයන් ඉදි කිරීමටත් යෝජිතය.

6.4.2. කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම

ප්‍රධාන වශයෙන් කෘෂි අපනයන කර්මාන්තය සංවර්ධනය හා කෘෂි නිෂ්පාදන ප්‍රමුඛ කරගත් ආර්ථිකයක් ගොඩ නැඟීම මෙමඟින් අපේක්ෂිතය. ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති 02ක් යටතේ එනම්, දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කලාප සංවර්ධන ව්‍යාපෘතිය හා කෘෂි අපනයන බෝග කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සැලැස්මේ පළමු ඉලක්කය කරා ළඟාවීමට සැලසුම් කෙරේ.

දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කලාප සංවර්ධන ව්‍යාපෘතියෙහි අනු ව්‍යාපෘති ලෙස පහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට හඳුනා ගෙන ඇත. මෙම ප්‍රවර්ධන හා සංවර්ධන ව්‍යාපෘතීන් දඹුල්ල විශේෂිත ආර්ථික මධස්ථනයෙහි ක්‍රියාකාරකම් වලට සමගාමීව ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

- කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම් කර්මාන්ත ඇති කිරීම.
- කෘෂි බෝග ගබඩා කිරීම සඳහා ශීතාගාර පහසුකම් ඇති කිරීම.
- විධිමත් බෝග ගබඩා පහසුකම් ඇති කිරීම.
- දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට සමගාමීව නාවුල සහ ගලේවෙල නගර වල එළවලු, පලතුරු සහ ධාන්‍ය එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීම.

තවද, අපනයන බෝග වගාව පිළිබඳව වගාකරුවන් හා කර්මාන්තයෙහි නියැලෙන්නන් දැනුවත් කිරීම සඳහා සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීමට අපේක්ෂිතය. යෝජිත දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන කලාපයෙහි ප්‍රවාහන පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පහත ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත.

- නිශ්ශංක මංසන්ධියේ සිට පවත්නා දඹුල්ල බස් නැවතුම්පොල දක්වා ඒ 9 මාර්ගය මංතීරු 5ක් දක්වා පුළුල් කිරීම.
- යෝජිත බහුවිධ ප්‍රවාහන මධස්ථානය හා ආර්ථික කලාපය අතර සම්බන්ධතා මාර්ගයක් ඇති කිරීම.

දෙවන ප්‍රධාන ව්‍යාපෘතිය ලෙස කෘෂි අපනයන බෝග කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත. ඒ අනුව, ගලේවෙල, ලේනාවල ඉඩම කෘෂි බෝග ආශ්‍රිත කර්මාන්ත සඳහා වෙන් කිරීමටත්, පවත්නා ඇතාබැඳිවැව කාර්මික කලාපයෙහි කෘෂි අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමටත් යෝජිතය.



රූප සටහන් අංක 6.3 : දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කලාප සංවර්ධන ව්‍යාපෘති

6.4.3. සංචාරක සංවර්ධන සැලැස්ම

විසල් දඹුල්ල ප්‍රදේශයේ පවත්නා ලෝක උරුම වන සීගිරිය හා දඹුළු ලෙන් විහාරය මුල්කර ගනිමින්ද, පවත්නා දර්ශණීය පාරසරික හා සම්ප්‍රදායික කෘෂිකර්මාන්ත උපයෝගී කරගනිමින්ද පුරාවිද්‍යාත්මක, පාරිසරික හා කෘෂි සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමට යෝජිතය. ඒ සඳහා ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස විසල් දඹුල්ල ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතින සංචාරක ආකර්ෂණීය ස්ථාන එක් කරමින් දර්ශණීය මාවතක් සංවර්ධනය කිරීමට යෝජිතය. එය පිළිවෙලින් නාලන්දා ගෙඩිගේ, මොරගහකන්ද ජලාශය, ඉබ්බන්කටුව වැව, ජාතික නාමල් උයන, පැල්වැහැර කෘෂි කාර්මික කලාපය, එඬේරගල වන සෙනසුන, කාණ්ඩලම වැව, කලුදිය පොකුණ, සීගිරිය, පිදුරංගල, හිරිවඩුන්න හා හබරණ යා කරමින් සංවර්ධනය කිරීමට යෝජිතය. යෝජිත දර්ශණීය මාවතෙහි මුළු දුර කිලෝමීටර් 106ක් පමණ වේ. මෙම දර්ශණීය මාවතෙහි, මාර්ග සංවර්ධනය, පදික මංතීරු සංවර්ධනය, පා පැදි මංතීරු සංවර්ධනය, භූමි දර්ශණ අලංකරණය සිදු කිරීමට යෝජිතය. මෙම මාර්ගය භාවිතා කරන සංචාරකයින් සඳහා වැඩිදුරටත් පහසුකම් සැපයීමට, හඳුනාගත් ස්ථානයන්හි විනෝද කටයුතු හා අනෙකුත් අවශ්‍යතා සපුරාලීමට කුඩා උද්‍යාන ඉදිකිරීමට යෝජිතය. මෙම උද්‍යාන වල විවේක ගැනීමේ ස්ථාන, සනීපාරක්ෂක පහසුකම්, රථ වාහන නැවතීමේ පහසුකම්, ආහාර පාන ලබාගැනීමේ පහසුකම් හා අනෙකුත් සමගාමී පහසුකම් සපයා දීමට බලාපොරොත්තු වේ. කුඩා උද්‍යාන ඉදිකිරීමට හඳුනාගත් ස්ථාන පහත පදිරි වේ.

- A9 මාර්ගයෙහි දඹුළු ඔය ආසන්නයේ 38 කණුව ස්ථානය.
- ඉබ්බන්කටුව වැව ආසන්න ස්ථානය.
- ජාතික නාමල් උයන ආසන්න ස්ථානය.
- මඩාටුගම නගරය ආසන්න ස්ථානය.
- කණ්ඩලම වැව ආසන්න ස්ථානය.
- කළුදිය පොකුණ ආසන්න ස්ථානය.
- සීගිරිය වැව ආසන්න ස්ථානය.
- හබරණ වැව ආසන්න ස්ථානය.

සංචාරකයන්ගේ ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා විසල් දඹුල්ල නගරය තුළ ආකර්ශණීය ප්‍රවාහන පහසුකම් ඇති කිරීමට මෙම උපායමාර්ගික සැලැස්ම මඟින් අපේක්ෂා කෙරේ. ඒ අනුව සීගිරිය තුළ පවත්නා ගුවන්තොටුපල, අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා විවෘත කිරීමට යෝජිතය. එමෙන්ම හබරණ, සීගිරිය හා කණ්ඩලම ප්‍රදේශ පාදක කරගනිමින් උණුසුම් වායු බැලුන් විනෝදාත්මක ප්‍රවාහන ක්‍රමය ප්‍රවර්ධනය කිරීමට යෝජිතය. කණ්ඩලම හා ඉබ්බන්කටුව වැව ආශ්‍රිතව මුහුදු - ගුවන් (Sea-plane) රථ මඟින් සංචාරකයින් ප්‍රවාහනය කිරීමේ අවස්ථා ඇති කිරීමට යෝජිතය. තවදුරටත්, මොරගහ කන්ද ජලාශය මූලික කර ගනිමින් කේබල් - කාර් ව්‍යාපෘතියක්ද, සුඛෝපබෝගී මගී ප්‍රවාහන බෝට්ටු ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

පවත්නා සංචාරක කර්මාන්තය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා හඳුනාගත් නගර එනම්, සීගිරිය- පිදුරංගල, දඹුල්ල හබරණ හා නාඋල - මොරගහකන්ද ආදී ප්‍රදේශ සංචාරක කර්මාන්තය මුල් කරගනිමින් සංවර්ධනය කිරීමට යෝජිතය.

ඒ අනුව, විසල් දඹුල්ල ප්‍රදේශයේ ප්‍රධාන සංචාරක මධ්‍යස්ථානය ලෙස සීගිරිය - පිදුරංගල කලාපය සංවර්ධනය කිරීමට යෝජිතය. එබැවින් එම ප්‍රදේශය ආශ්‍රිතව සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා මුළු භූමි ප්‍රමාණයෙන් 8%ක පමණ ප්‍රමාණයක් (හෙක්ටයාර 8665) සංචාරක කලාපය ලෙස වෙන්කර ඇත.

සීගිරිය - පිදුරංගල සංචාරක කලාපයේ හඳුනාගත් ව්‍යාපෘතීන් පහත පරිදි වේ.

- සීගිරිය - කිඹිස්ස ඇවිදින මංතීරු ඉදිකිරීම් ව්‍යාපෘතිය.
- සීගිරිය විදේශිකයන්ගේ රථ වාහන නැවතුම් පොල සංවර්ධන ව්‍යාපෘතිය.
- සීගිරිය නව නගර භූමියෙහි වෙළඳපොල සංවර්ධනය කිරීම, පොදු සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම, රථවාහන නැවතුම් ස්ථානය සංවර්ධනය කිරීම.
- දේශීය හා විදේශීය රථවාහන නැවතුම් ස්ථාන වල ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීම.
- සීගිරිය නව නගරය ආශ්‍රිතව කලාගාරයක් ඉදිකිරීම් ව්‍යාපෘතිය.
- සීගිරිය “සියවස් මාවත” සංවර්ධනය.
- සීගිරිය පැරණි වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය.
- සීගිරියෙහි අනන්‍යතාවය ඉස්මතු වන පරිදි මංසන්ධි සංවර්ධනය කිරීම.

- ඉනාමළුව මංසන්ධිය.
- කිඹිස්ස මංමන්ධිය.
- හෝටල් මංසන්ධිය.
- ටී.බී.තෙන්නකෝන් මංසන්ධිය.
- දිගම්පතහ මංසන්ධිය.
- පිදුරංගල මංසන්ධිය.

දඹුල්ල නගරයෙහි පූජාභූමි කලාපය මූලික කරගනිමින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධන කිරීමට යෝජිතය.

ඒ අනුව, දඹුල්ල කඩ 50 හා කඩ 40 ප්‍රදේශ ආශ්‍රිතව වෙළඳපොල සංවර්ධනය, රථ වාහන නැවතුම් ස්ථාන ඇති කිරීම, දේශීය හා විදේශිය සංචාරකයින් සඳහා සනීපාරක්‍ෂක පහසුකම් ඇති කිරීමට යෝජිතය.

තවද, දඹුල්ල නගරයෙහි ඓතිහාසික හා පූජනීය බව ඉස්මතු වන අන්දමින් නගරයට වාහල්කඩ 03ක් ඉදිකිරීමට යෝජිතය. ඒ අනුව ප්‍රධාන පිවිසුම් මාර්ග වන A 6 මාර්ගයෙහි දඹුළුඔය ප්‍රදේශයද, A 9 මාර්ගයෙහි ඉදිගොල්ල ප්‍රදේශයේද, නගරයට උතුරු දෙසින් මිරිස්ගෝනියාව ප්‍රදේශයද ඉදිකිරීමට අපේක්‍ෂිතය. තවද දඹුල්ල සංචාරක සංවර්ධන කලාපය තුල සංචාරක පොලිස් ස්ථානයක් ස්ථාපිත කිරීමටද අපේක්‍ෂිතය.

පාරිසරික සංචාරක කර්මාන්තයට ප්‍රසිද්ධියක් උසුලන හබරණ නගරට ආශ්‍රිතව පහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

- හබරණ නගරයෙහි දැනට පවතින ත්‍රීරෝද නැවතුම් ස්ථානය හා සෆාරි වාහන නැවතුම් ස්ථානය සංවර්ධනය කිරීම.
- විදේශික සංචාරකයින් සඳහා තොරතුරු මධ්‍යස්ථානය හා සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම.
- හබරණ නගරයෙහි අනන්‍යතාවය ඉස්මතු වන පරිදි ප්‍රවේශ ගේට්ටු සංවර්ධනය කිරීම.
- නාඋල හා නාලන්ද නගරය ආශ්‍රිතව පහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.
- මොරගහකන්ද ජලාශය හා නාලන්ද ජලාශය ආශ්‍රිතව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට මෙම සැලැස්ම මඟින් යෝජිතය.
- සංචාරක කර්මාන්ත සංවර්ධන වැඩ සටහන - පිළිහුඩුගොල්ල.
- නාඋල පුරාණ අම්බලම හරිත පුස්තකාලයක් ලෙස සංවර්ධනය කිරීම.
- ස්වාභාවික උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය - නාඋල.
- නාලන්ද ගෙඩිගේ මංසන්ධිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.
- නාලන්ද ගෙඩිගේ ආශ්‍රිතව රථවාහන නැවැත්වීමේ පහසුකම් හා සනීපාරක්‍ෂක පහසුකම් ඇති කිරීමේ ව්‍යාපෘතිය.

තවද, මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව වර්ධනය වෙමින් පවතින සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා එම ප්‍රදේශයේ ක්‍රමවත් විනෝද පහසුකම් හා රථවාහන නැවැත්වීමට පහසුකම් ඇති කිරීමට බලාපොරොත්තු වේ.



සිතියම් අංක 6.14 : *යෝජිත සංචාරක සංවර්ධන සැලැස්ම - විසල් දඹුල්ල*

ඉහත විස්තරාත්මකව දැක්වූ ආර්ථික සංවර්ධන උපායමාර්ග සැලැස්මට අදාල ව්‍යාපෘතීන් පහත සිතියම් අංක 6.15 සහ සිතියම් අංක 6.16 හි දැක්වේ.



***සිතියම් අංක 6.15 :** ආර්ථික සංවර්ධන උපායමාර්ග සැලැස්ම - දඹුල්ල*



සිතියම් අංක 6.16 : *ආර්ථික සංවර්ධන උපායමාර්ග සැලැස්ම - නාඋල*

6.5 තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග

විසල් දඹුල්ල නගර සංවර්ධන සැලැස්මේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා වන දෙවන අරමුණ වන්නේ ස්වභාවික පරිසර හා නිර්මිත පරිසරයෙහි සුසංයෝගය තුළින් නීල හරිත පරිසරයක් නිර්මාණය කිරීමයි. ඒ සඳහා වන තිරසාර පරිසර සංවර්ධන උපක්‍රමයක් පරිසර සංරක්ෂණ සැලසුම, භූ දර්ශන කළමනාකරණ සැලසුම්, ආපදා අවදානම් කළමනාකරණ සැලසුම් හා විවෘත භූමි සැලසුම් යන සැලසුම් මෙම තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම යටතේ හඳුනාගෙන ඇත.

6.5.1 යෝජිත පාරිසරික සංරක්ෂණ සැලැස්ම

විසල් දඹුල්ල නාගරික බල ප්‍රදේශය ජාතික භෞතික සැලසුමට අනුව පාරිසරික අධි සංවේදී කලාපයට අයත් වීම පාරිසරික සංරක්ෂණ සැලැස්ම සඳහා ඇති ප්‍රබල සාධකයක් වේ.

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය හා නාඋල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නැගෙනහිර සීමාව නක්ල්ස් රක්ෂිතයෙන් සීමාවේ වේ. ඊට අමතරව විසල් දඹුල්ල ප්‍රදේශයේ උතුරු දෙසින් පලාගල, කැකිරාව, මඩාටුගම යන ප්‍රදේශ ආශ්‍රිතව ජාතික නාමල් උයන හා රෝස තිරුවානා කන්ද පිහිටීමත් මෙම ප්‍රදේශයේ විශේෂිත ස්ථානයක් වේ. එසේම සීගිරිය, පිදුරංගල ආශ්‍රිත වන සංරක්ෂණ කලාපයත්, හබරණ නගරය ආශ්‍රිතව පවතින වන සංරක්ෂණ කලාපයත් මෙන්ම කණ්ඩලම, ඉබ්බන්කටුව ආදි ප්‍රධාන වැව් ආශ්‍රිතව පවතින වන රක්ෂිත ඇතුළු රක්ෂිත කලාප තවදුරටත් ආරක්ෂා කිරීම සඳහා පරිසර සංරක්ෂණ හා පාරිසරික සංවේදී කලාප යටතේ කලාපීකරණ සැලසුම මගින් ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලැබේ.

තවදුරටත් මෙලෙස කලාපීකරණ සැලසුම යටතේ පරිසර සංරක්ෂණය හා පාරිසරික සංවේදී කලාප ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශයන්හි සියළුම සංවර්ධන කටයුතු සංවර්ධන රෙගුලාසි මගින් පාලනය කරනු ලබන අතර, හඳුනාගත් ස්ථානවල පමණක් පරිසර හිතකාමී කදවුරු කලාප සඳහා අවස්ථාව දෙනු ලැබේ.

තවද විසල් දඹුල්ල ප්‍රදේශය කෘෂි කාර්මික ආර්ථිකය කේන්ද්‍ර කර ගනිමින් ව්‍යාප්තව පවතින ප්‍රදේශයක් වන අතර, මෙහි පවතී ඇළ මාර්ග, අතු ගංගා, වැව්, පොකුණු යන ජල මූලාශ්‍රයන් කෙරෙහි නාගරික සංවර්ධනයේ බලපෑම අවම කරමින් ජල මූලාශ්‍රවල සුරක්ෂිතතාවය හා ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් ගංගා හා ඇළ මාර්ග සඳහා 1935 අංක 19 ඉඩම් සංවර්ධන ආඥා පනත මගින් ප්‍රකාශිත රක්ෂිත ප්‍රදේශයන් බල ගැන්වීම.

ගංගා පළල (m)	*රක්ෂිත සීමා (m)*
4.6 ට අඩු	*20 (ඉවුරේ සිට දෙපසටම)*
4.6 – 15.2	*40 (ඉවුරේ සිට දෙපසටම)*
15.2 ට වැඩි	*60 (ඉවුරේ සිට දෙපසටම)*

***වගු අංක 6.4 :** ගංගා හා ඇළ මාර්ග සඳහා ප්‍රකාශිත රක්ෂිත ප්‍රදේශ*

6.5.2 යෝජිත පොදු එළිමහන් විවේක විනෝද පහසුකම් පිළිබඳ අවකාශීය සැලැස්ම

මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය තුලට ජනගහන සංක්‍රමනය සලකා බැලීමේදී මූලික වශයෙන් විවේක විනෝද පහසුකම් රැකි රක්ෂා සේවා පහසුකම් වෙනුවෙන් පැමිණෙන අතර මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය නගරය තුල පවතින විවේක විනෝද පහසුකම් වශයෙන් පොදු විවෘත ඉඩකඩ, ඓතිහාසික නාගරික උද්‍යාන, ජල උද්‍යාන, මණ්ඩප උද්‍යාන, ස්වභාවික උද්‍යාන (සීගිරිය, පිදුරංගල, නාමල් උයන) ක්‍රීඩාංගන, රේඛිය උද්‍යාන, දර්ශනීය ස්ථාන ක්‍රියාකාරී සහ අක්‍රිය පොදු විනෝද පහසුකම් ලෙස පවතී.

2020 වර්ෂයේ මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය තුල ජීවත්වන නේවාසික ජනගහනය 251,000 ක් වන අතර 2030 වර්ෂයට පුරෝකථනය කල ජනගහනය 29,843 පමණ වේ. පොදු එළිමහන් විනෝද පහසුකම් පිළිබඳ අවකාශීය සැලැසුම් සංකල්පයට අනුව පුද්ගලයින් 1000 සඳහා විනෝද කටයුතු වෙනුවෙන් අවශ්‍ය භූමි ප්‍රමාණය හෙක්ටයාර 1.0 කි. මේ අනුව 2030 වර්ෂයේ මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශයෙහි නේවාසික ජනගහනයට පොදු එළිමහන් විනෝද පහසුකම් සඳහා අවශ්‍ය භූමි ප්‍රමාණය හෙක්ටයාර 251කි. ක්‍රියාකාරී සහ අක්‍රිය විනෝද පහසුකම් ඉඩකඩ සැලකිල්ලට ගැනීමේදී පවතින ඉඩකඩ ප්‍රමාණය ඉහත අවශ්‍යතාවය සම්පූර්ණ කරන අතර සිගිරි උද්‍යානය, දඹුල්ල ලෙන් විහාර උද්‍යානය, පිදුරංගල ස්වභාවික උද්‍යානය, නාමල් උයන ස්වභාවික අධ්‍යාපනික උද්‍යානය, මැණික්දෙන ස්වභාවික උද්‍යානය වැනි මාධ්‍යම නගර උද්‍යානද එහි ඇතුලත් වේ. ඊට අමතරව මෙම ඉඩකඩ පහසුකම් සැපයීම සඳහා වන උපාය මාර්ග ලෙස,

- පරිසර සංරක්ෂණ සැලැස්මෙහි ඇතුලත් ජල මූලාශ්‍ර රක්ෂිත ප්‍රදේශ මෙන්ම දැනට බල ප්‍රදේශය තුල පවත්නා අඩු පහසුකම් සහිත ක්‍රීඩා පිටි වැඩි දියුණු කිරීම් තුලින් ප්‍රදේශය තුල ජීවත්වන ජනගහනයට අවශ්‍යය ක්‍රීඩා හා විනෝද පහසුකම් සැපයීම.
- මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය සහ යාබද ප්‍රදේශ සමග සම්බන්ද වන ජල මූලාශ්‍ර දෙපස රක්ෂිත ප්‍රදේශයන් ඇතුලත රේඛිය උද්‍යාන ඇතුලත් වන ලෙස නාගරික උද්‍යාන නිර්මාණය කිරීම
- එමෙන්ම මතුපිට උෂ්ණත්වය අධික ප්‍රදේශ පියසි උද්‍යාන (roof top garden) නිර්මාණය කිරීම සහ ප්‍රධාන නගර සහ උප නගර මාර්ග දෙපස ගස් සිටුවීම සහ විදුලි ආලෝකකරණය සමග රේඛීය උද්‍යානය ලෙස සංවර්ධනය කිරීම.

මහා දඹුල්ල නගරය තුල සංවර්ධනය කිරීමට යෝජිත ව්‍යාපෘති යටතේ හඳුනාගත් විවෘත ඉඩකඩ නාගරික කුඩා උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම. මහා දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය තුල පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම සඳහා පවතින පොදු එළිමහන් විනෝද පහසුකම් ඉඩකඩ සහ යෝජිත පොදු එළිමහන් විනෝද පහසුකම් වකාශීය ඉඩකඩ සිතියම් අංක 6.17 මගින් දැක්වේ.



සිතියම් අංක 6.17 : *පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම*

6.5.2.1 පොදු එළිමහන් විනෝද පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

1. දඹුල්ල නිශ්ශංක ළමා උද්‍යානය සහ ක්‍රීඩාපිටිය ප්‍රති සංවර්ධනය කිරීම.
2. දඹුල්ල රජ මහා විහාරය ඉදිරිපස මාර්ගය හා සම්බන්ධ හරිත තීරුව සංවර්ධනය කිරීම.
3. මිරිස්ගෝනියාව ඔය දෙපස හරිත උද්‍යාන සහිත විනෝද පහසුකම් සංවර්ධනය කිරීම.
4. තම්මැන්නාව ඇළ දෙපස භූදර්ශන ව්‍යාපෘතිය.
5. යෝජිත දුම්රිය ස්ථානය හා අධිවේගී මාර්ගය පිවිසුම් ස්ථානය ආශ්‍රිතව භූමි අලංකරණය කිරීම.
6. ගලේවෙල වැව ප්‍රදේශය නාගරික උද්‍යාන සංවර්ධනය .
7. හබරණ වැව ඇවිදීමේ මංතීරු සංවර්ධනය කිරීම.
8. නාඋල වැව ජලාභිමුක විනෝද සහසුකම් සඳහා සංවර්ධනය කිරීම .
9. සංචාරක ආකර්ෂණය සඳහා නිරන්තරය යොමුවන ශේෂ කදු මුදුන් නැරඹුම් ස්ථාන (view point) ලෙස සහ ස්වභාවික මං පෙත් සහිතව භූ දර්ශනය කිරීම.

    - දඹුල්ල ලෙන් විහාර ප්‍රදේශය - සංස්කෘතික වටිනාකම් සහ අධ්‍යාපනික දැනුම ඉහල නංවන අක්‍රිය විනෝද පහසුකම් ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම
    - පිදුරංගල -නරඹුම් ස්ථාන සහ අපරවයුහ පහසුකම් සහිතව ස්වභාවික මං පෙත් සංවර්ධනය කිරීම

10. උප නාගරික ප්‍රදේශ දේශීය විදේශීය සංචාරකයින්ගේ ආකර්ශනීය ස්ථාන ලෙස භූ දර්ශනය කිරීම.

    - ඉනාමළුව මංසන්දිය
    - කිබිස්ස මංසන්දිය
    - සිගිරිය පිවිසුම් ස්ථානය
    - සිගිරිය වැව අවට ප්‍රදේශය
    - පිදුරංගල පිවිසුම් ස්ථානය
    - හබරණ මංසන්දිය

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග

යෝජිත පොදු එළිමහන් විවේක විනෝද පහසුකම් පිළිබඳ අවකාශීය සැලැස්ම



***රූප සටහන් අංක 6.4 :** උප නාගරික ප්‍රදේශ ආශ්‍රිත දේශීය විදේශීය සංචාරකයින්ගේ ආකර්ශනීය ස්ථාන*

11. ජලාභිමුක භූදර්ශන ව්‍යාපෘතිය ප්‍රදේශය.ලෙස පහත ප්‍රදේශයන් සංවර්ධනය කිරීම. දේශීය විදේශීය සංචාරකයින් සහ යෝජිත ජනගහනය අවශ්‍ය අධ්‍යාපනික දැනුම සහ විනෝද පහසුකම් වෙනුවෙන් සහ සෞඛ්‍ය සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා සුදුසු වන පරිදි ස්වභාවික මං පෙත් නිර්මාණය කිරීම .

    - ඉබ්බන්කටුව වැව ආශ්‍රිත ප්‍රදේශය
    - සිගිරිය වැව ආශ්‍රිත ප්‍රදේශය
    - කන්දලම වැව ආශ්‍රිත ප්‍රදේශය

12. මොරගහකන්ද ජලාශය අශ්‍රිතව නරඹුම් මධ්‍යස්ථානය ඉදිකිරීම ,කේබල් කාර් ව්‍යාපෘතිය සහ විනෝදාත්මක බෝට්ටු සවාරි ව්‍යාපෘතිය.

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග

6.5.3 ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම

6.5.3.1 ගංවතුර සහ හදිසි ගංවතුර පාලන උපාය මාර්ග

විසල් දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය මෙන්ම අවට ප්‍රදේශය සීඝ්‍රයෙන් සිදුවන සංවර්ධන කටයුතු හේතුවෙන් පවතින ජල රැඳවුම් ස්ථාන අඩුවීම සහ මිරිස්ගොනියව ඇළ සහ තම්මැන්නාව ඇළ පිටාර ගැලීම තුලින් ප්‍රධාන වශයෙන් ගංවතුර අවදානමට ලක් වන අතර එමගින් විශාල බලපෑම් ඇතිකරනු ලබයි. එබැවින් ඒ සඳහා උපාය මාර්ග ලෙස,



***සිතියම් අංක 6.18 :** ඇල මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*

- ජලාශ්‍රිත කොරිඩෝ සක්‍රියව පවත්වාගෙන යාම. තම්මැන්න ඇළ මිරිස්ගොනියව ඇළ සහ අනෙකුත් ජල මුලාශ්‍රයන් සඳහා පවතින රක්ෂිතයන් පවත්වාගත යුතු අතර මේවා නඩත්තු කලයුතු ප්‍රදේශ ලෙස යෝජනා කෙරේ.
- ඉහත ජල මුලාශ්‍ර රක්ෂිත සීමාවන් තුල පවතින ඉදිකිරීම් ඉවත් කිරීම සහ අපද්‍රව්‍ය සහ අපජල බැහැර කිරීම් නැවැත්වීම සහ 2030 වර්ෂය වනවිට අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- සියලුම ජල මුලාශ්‍ර රක්ෂිත ප්‍රදේශ විවෘත ඉඩකඩ ලෙස භූදර්ශන කටයුතු සඳහා යොමුකිරීම හා ඇවිදීමේ මං තීරු ඇතුලත්ව රේඛීය උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම. (පොදු විවේක විනෝද පහසුකම් අවකාශීය සැලැස්මෙහි ඇතුලත් වේ.)
- දඹුල්ල ප්‍රධාන නගරය හරහා ගලා බසින ස්වභාවක ඇළ මාර්ග වන මිරිස්ගොනියව ඇළ සහ තම්මැන්නාව ඇළ දෙපස ගංවතුර පාලන බැමි ඉදිකිරීම තුලින් දඹුල්ල නගරය ගංවතුර තත්වය අවම කිරීම.

6.5.3.2 අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා උපායමාර්ගික ව්‍යාපෘති

වනාන්තර රක්ෂිත සීමා වලට යාබද ඉඩම් වල සිදුකරනු ලබන බෝග වගා (බඩ ඉරිඟු, වී, කෙසෙල්) සහ අලිමන්කඩ තුල නිවාස ඉදිකිරීම හේතුවෙන් අලි මිනිස් ගැටුම නිර්මාණය වී ඇත.

01. දෙහි /දොඩම් /අන්නාසි වගා ව්‍යාපෘතිය

මේ සඳහා සුදුසු වගාවන් ලෙස කටු සහිත බෝග වගාවන් හදුන්වා දීම. දෙහි /දොඩම් වගාව සඳහා ගොවි ජනතාව යොමු කිරීම සහ ගොවින් දැනුවත් කිරීම . සහභාගිත්ව ක්‍රමවේදය මෙන්ම මුල්‍යමය දායකත්වය රජය මගින් සැපයීම තුලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ අස්වැන්න මිලදීගැනීමේ ක්‍රමවේද පිළියෙළ කිරීම.

02. විදුලි වැට ඉදිකිරීම

අලි ඇතුන්ගේ වාසස්ථාන ප්‍රදේශ මායිම් වන ලෙස විදුලි වැට ඉදිකිරීම සහ අලි ඇතුන් සුදුසු අහාර සඳහා අවශ්‍ය ගස්වර්ග වනාන්තර ඇතුලත වගා කිරීම .

03. අගල් කැපීම

සුදුසු ප්‍රමාණය ගැඹුර සිටින ලෙස අගල් කැපීම සහ අගල් මායිම් ඇතුලත කටු සහිත වගාවන් සංවර්ධනය කිරීම



***රූප සටහන් අංක 6.5 :** ගැඹුර සිටින ලෙස අගල් කැපීම*

04. ජීව විද්‍යාත්මක වැටවල් සකස්කිරීමේ ව්‍යාපෘති

තල් ගස්, හන වර්ග සහ දෙහි දොඩම් ජීව විද්‍යාත්මක වැටවල් ලෙස අලි ඇතුන්ගේ වාසස්ථාන සහ මිනිස් ගම්මාන වෙන්වන ආකාරයට සකස්කිරීම .

6.5.4 තිරසාර පරිසර උපායමාර්ගික සැලැස්ම

විසල් දඹුල්ල නගර සහා බල ප්‍රදේශය තුළ ස්වාභාවික වනාන්තර , වගුරු බිම් කුඹුරු ඉඩම් ජලාශ්‍රිත ප්‍රදේශ ඇළ මාර්ග පිළිබඳව අවධානය යොමු කරමින් එකී සම්පත්වල ප්‍රමාණාත්මක භාවය ඇගයීම තුළින් හා එම ස්වභාවික සම්පත්වලින් නාගරික ජනගනයට මෙන්ම නිරන්තරයන් සේවා අවශ්‍යතා සඳහා සංක්‍රමණය වන ජනතාවට ලැබෙන ජෛව විවිධත්ව සේවාවන් සහ අගයන් සැලකිල්ලට ගනිමින් තිරසාර පරිසර උපායමාර්ග ලෙස පරිසර සංරක්ෂණ සැලැස්ම , අපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම (DRR) පිළියෙළ කරනු ලබයි.එමෙන්ම නාගරික ජනගහනයට අවශ්‍ය විවේක විනෝද පහසුකම් සැපයීම සඳහා පොදු විවේක විනෝද පහසුකම් සැලැස්ම (PORS)සහ එහි ඇතුලත් ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භුදර්ශන සැලැස්ම තිරසාර පරිසර උපාය මාර්ග ලෙස මේ සංවර්ධන සැලැස්මට ඇතුලත් වේ .

6.5.4.1. පරිසර සංරක්ෂණ සැලැස්ම

බල ප්‍රදේශය තුළ පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස වනාන්තර ප්‍රදේශ 27ක් (තෘණ භූමි ඇතුලත්ව) එනම් හෙක්ටයාර් 38179 ක් පුරා පැතිර පවතින අතර නාමල් උයන රක්ෂිතය වස්ගමුව රක්ෂිතය මැණික්දෙන රක්ෂිතය, සිගිරිය රක්ෂිතය ප්‍රධාන වනාන්තර ලෙස පිහිටා ඇත. එමෙන්ම වනාන්තර ප්‍රදේශ තුල ස්වභාව ධර්මයෙන් නිර්මාණය වූ ගල් පර්වත සමග එක් වූ මුළු ලෝකය පුදුම කරවන භූදර්ශන නිර්මාණයන් හා ගෘහනිර්මානත්මක ගොඩනැගිලිවලින් වලින් යුත් උද්‍යාන භූමි ප්‍රදේශ පවති.

තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා තෙත් බිම් යොදා ගැනීමත්, ඒවායේ විභවයන් සලකා බලා ජලය රඳවා ගැනීමේ හැකියාව සහ අනෙකුත් පාරිසරික ප්‍රතිලාභ සැලකීමට ගැනීමත් එමඟින් අනවසර අත්පත් කර ගැනීම් සහ නුසුදුසු භාවිතයන් වැලැක්වීමත් ය. තවද මෙම පරිසර සංරක්ෂණ සැලැස්ම මගින් ඉහත දක්වන ලද පරිසර සංවේදී ප්‍රදේශයන් සහ කුඹුරු වගා බිම් ප්‍රදේශ පහත පරිදි කලාපීකරණය සිදුකරනු ලබන අතර එම කලාප තුල ඇතුලත් විශේෂ සංරක්ෂණ ප්‍රදේශයන් හා අනිකුත් ප්‍රදේශ ඊට අදාල අනපනත් හා පවතින නීති රෙගුලාසිවලට අනුකූලව සංරක්ෂණය හා බැඳුණු ඥානාන්විත භාවිතයන් සඳහා යොමු කිරීම මෙම සැලැස්ම තුලින් බලාපොරොත්තු වේ.

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග

තිරසාර පරිසර උපායමාර්ගික සැලැස්ම

6.5.4.2. විසල් දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය පරිසර සංරක්ෂණ උපාය මාර්ග

පරිසර සංරක්ෂණ කලාප හා තෙත් බිම් කලාපිකරණය සහ අනුමත භාවිතයන් සහ කලපිකරන රෙගුලාසි හදුන්වාදීම.

I. විශේෂ පරිසර සංරක්ෂණ කලාපය
II. ස්වභාවික තෙත්බිම් සංරක්ෂිත කලාපය
III. කුඹුරු වගා සහ තෙත් බිම් කෘෂිකාර්මික කලාපය



සිතියම් අංක 6.19 : *පරිසර සංරක්ෂණ කලාපහා තෙත් බිම් කලාපිකරණය*

6.5.4.3. විශේෂ පරිසර සංරක්ෂණ කලාපය

ජාත්‍යන්තර සම්මුතියකින්, දේශීය පනතකින් හෝ ගැසට් පත්‍රයක් මගින් ආරක්ෂක හෝ විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ මෙම කලාපයට ඇතුලත් වේ. සිතියම් අංක 19 මෙම කලාපය ඇතුලත්.වේ.

6.5.4.3.1. විශේෂ පරිසර සංරක්ෂණ කලාපය සහ අනෙකුත් ප්‍රදේශ සඳහා පරිසර සංරක්ෂණ උපාය මාර්ගික ව්‍යාපෘති

විශේෂ පරිසර සංරක්ෂණ කලාපය සඳහා පරිසර සංරක්ෂණ උපාය මාර්ගික ව්‍යාපෘති



සිතියම් අංක 6.20 : *පවත්නා වනාන්තර කලාප*

1. හරිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සහ වන ගහනය 30% දක්වා වැඩි කිරීම සඳහා ඉහත කලාපය තුල ඇතුලත් ස්වභාවික රක්ෂිත, අභය භූමි සහ අනෙකුත් වනාන්තර ප්‍රදේශවල වන සතුන්ට ආහාර සැපයෙන සහ පවතින දේශගුණික තත්වයන්ට ගැලපෙන දේශීය ශාක සහ ඖෂධීය ශාක වගා කිරීම.

2. විසල් දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශයේ පවතින වනාන්තර ප්‍රදේශවල මායිම් සීමා ලකුණු කිරීම සහ රක්ෂිත සීමා මායිම් ලකුණු කිරීම.

6.5.5 අනෙකුත් ප්‍රදේශ සඳහා පරිසර සංරක්ෂණ උපාය මාර්ගික ව්‍යාපෘති

1. *2032 වර්ෂය වන විට දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.*

දඹුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ 2030 වර්ෂය සඳහා පුරෝකථන ජනගහනය, යෝජිත නිවාස හා අනෙකුත් ගොඩනැගිලි සහ සංවර්ධන ව්‍යාපෘති සැලකිල්ලට ගනිමින් මෙම ව්‍යාපෘති සිදුකිරීම තුලින් ප්‍රධාන ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම.



2. *පහත සඳහන් ස්ථාන තුල පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.*

තිරසාර පුනර්ජනනීය බලශක්ති ගබඩාකරණය සහ භාවිතය තුලින් පරිසරයට මුදාහරින කාබන්ඩයොක්සයිඩ් ප්‍රතිශතය අවම කිරීම සහ ගෝලීය උෂ්ණත්වය පාලනය කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම .

I. ස්වභාවික ජලාශ්‍රිත ප්‍රදේශ භාවිතා කරමින් පාවෙන සූර්ය බලශක්ති උද්‍යාන ව්‍යාපෘති පහත සඳහන් ජලාශ තුල නිර්මාණය කිරීම.

- කණ්ඩලම වැව
- මොරගහකන්ද ජලාශය
- ඉබ්බන්කටුව ජලාශය



***සිතියම් අංක 6.21 :** ස්වභාවික ජලාශ්‍රිත ප්‍රදේශ භාවිතා කරමින් පාවෙන සූර්ය බලශක්ති උද්‍යාන ව්‍යාපෘති*

පරිච්ඡේදය 06
සංවර්ධන සැලැස්ම

තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග

අනෙකුත් ප්‍රදේශ සඳහා පරිසර සංරක්ෂණ උපාය මාර්ගික ව්‍යාපෘති

II. සුළං බලශක්ති සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.



පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම මගින් මාතලේ දිස්ත්‍රික්කය තුල සුළං බල සංවර්ධනය සඳහා හඳුනා-ගෙන ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 15207 ක් වන අතර මෙම ප්‍රදේශය ලඳු කැලෑ සහ මුඩු ඉඩම් වලින් සමන්විත වේ. මෙමගින් උත්පාදනය කිරීමට යෝජිත සමස්ථ ධාරිතාවය මෙගාවොට් 1217 කි.

***සිතියම් අංක 6.22 :** බලශක්ති සංවර්ධන ව්‍යාපෘති*

III. පහත සඳහන් ජල මුලාශ්‍ර රක්ෂිත සිමා තුල ජලය පිරිසිදු කිරීමට සුදුසු ගස් වර්ග රෝපණය කිරීම සහ ස්වභාවික ඇවිදින මංපෙත් නිර්මාණය කිරීම සහ සාම්ප්‍රදායික මසුන් ඇල්ලීම සඳහා සුදුසු ස්ථාන සංවර්ධනය කිරීම.

වැවේ නම	*රක්ෂිතය (මීටර්)*
කලා වැව	
මොරගහකන්ද ජලාශය	
බළළු වැව	
කන්දලම වැව	
දේවහුව වැව	
ඉබ්බන්කටුව වැව	
බෝවතැන්න ජලාශය	
වැමැඩිල්ල ජලාශය	

6.6. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

6.6.1. හැඳින්වීම

විසල් දඹුල්ල නාගරික ප්‍රදේශයෙහි දැක්ම කරා ලගාවීමට හඳුනාගත් ව්‍යාපෘතීන්, එහි වැදගත්කම හා කාලීන භාවය අනුව ප්‍රමුඛතා පදනමින් වර්ගීකරණය කර ඇත.

6.6.2. ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම

6.6.2.1. පළමු පෙළ ප්‍රමුඛතා ව්‍යාපෘතිය

1. සංචාරක ආකර්ෂණීය ප්‍රවේශ සංවර්ධනය ව්‍යාපෘතිය
2. සීගිරිය - පිදුරංගල සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
3. මොරගහකන්ද සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
4. දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කලාප සංවර්ධන ව්‍යාපෘතිය
5. කෘෂි අපනයන බෝග කර්මානත සංවර්ධන ව්‍යාපෘතිය
   (ගලේවෙල, ලේනාවල කුඹුර ඇතාබැදි වැව)
6. දඹුල්ල පරිපාලන සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර
7. දඹුල්ල නගර මධ්‍යය වෙළඳ සංකීර්ණ ව්‍යාපෘතිය
8. මරදමන්යාය - පොදු රථගාල හා වාණිජ ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය
9. දඹුල්ල පොදු වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය
10. පොදු සනීපාරක්‍ෂක පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය
    (දඹුල්ල, ගලේවෙල, නාඋල, හබරණ, සීගිරිය)
11. නගර මධ්‍යය වාණිජ ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය - ගලේවෙල
12. මහජන පොළ සංවර්ධන ව්‍යාපෘතිය - ගලේවෙල
13. නාඋල නගර මධ්‍යය බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතිය (Civic Center)
14. පොදු වෙළඳපොල හා සතිපොල සංවර්ධන ව්‍යාපෘතිය - නාඋල
15. රථවාහන නැවතුම්පොළ සහ වාණිජ ගොඩනැගිල්ල - නාඋල ඉදිකිරීම් ව්‍යාපෘතිය
16. පොදු වාහන නැවතුම්පොළ සංවර්ධන ව්‍යාපෘතිය - හබරණ
17. පොදු වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය - හබරණ
18. බහුවිද ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
19. බස්නැවතුම්පොළ සංවර්ධන ව්‍යාපෘතිය - සීගිරිය
20. දඹුල්ල පිටත වටරවුම් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
21. ගලේවෙල පිටත වටරවුම් මාර්ගය ඉදිකිරීම් ව්‍යාපෘතිය (පන්කොළගොල්ල හරහා)
22. දඹුල්ල නගර මධ්‍යය පොදු රථවාහන නැවතුම්පොළ ඉදිකිරීම
23. ඒ 9 මාර්ගයේ සිට ඒ 6 මාර්ගය දක්වා පිරිවෙන මාර්ගය සංවර්ධනය කිරීම.
24. ඒ 9 මාර්ගයේ සිට ඒ 6 මාර්ගය දක්වා කාර්මික විද්‍යාල මාර්ගය මංතීරු 04ක් සහිතව පුළුල් කිරීම.
25. ඒ 9 මාර්ගය හා ඒ 6 මාර්ගය සම්බන්ධ කරමින් කාර්මික කලාපය හරහා ඇති ඇතාබැඳි වැව මාර්ගය සංවර්ධනය කිරීම හා පුළුල් කිරීම.

26. ගලේවෙල නගර මධ්‍යයේ ඒ 6 මාර්ගය මංතීරු 4 ක් හා වාහන නැවතීම් මංතීරු සහිතව පුළුල් කිරීම.
27. ගලේවෙල - මාතලේ මාර්ගය මංතීරු 4 ක් හා වාහන නැවතීම් මංතීරු සහිතව සංවර්ධනය කිරීම.
28. හබරණ නගර මධ්‍ය කලාපයේ පොළොන්නරුව - අනුරාධපුර මාර්ගය හා ඒ 6 මාර්ගය මංතීරු 04ක් දක්වා පුළුල් කිරීම.
29. නාඋල වැව පිවිසුම් මාර්ගය ඒ 9 මාර්ගයේ සිට කරවිලහේන මංසන්ධිය දක්වා සංවර්ධනය කිරීම.
30. ඉදිගොල්ල ඔය සිට නිශ්ශංක හන්දිය දක්වා මංතීරු 4 කින් යුත් නව ඒ 9 මාර්ගය ඉදිකිරීම.

6.6.2.2. දෙවන පෙළ ප්‍රමුඛතා ව්‍යාපෘති

1. දඹුල්ල සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
2. හබරණ සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
3. දඹුල්ල විවෘත රංග ශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය
4. දඹුල්ල මූලික රෝහල ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය
5. දඹුල්ල නගර මධ්‍යය අලංකරණ ව්‍යාපෘතිය
6. පවත්නා ළමා උද්‍යානය ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (දඹුල්ල, ගලේවෙල)
7. මධ්‍යම පාන්තික නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය - පෙනලබොඩ
8. මඩාටුගම නගර මංසන්ධිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
9. හබරණ නගර මධ්‍යය වාණිජ ගොඩනැගිල්ල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
10. ඒ 9 මාර්ගයේ සිට යෝජිත දුම්රිය ස්ථානය දක්වා අතුපරයාය මාර්ගය මංතීරු 4 ක් දක්වා පුළුල් කිරීම.
11. දඹුල්ල පූජනීය නගරයෙහි පෙරහැර මාර්ගය සංවර්ධනය කිරීම.
12. නාඋල ඒ 9 මාර්ගය හා ගලේවෙල ඒ 6 මාර්ගය සම්බන්ධ කෙරෙන වෑමැඩිල්ල මාර්ගය සංවර්ධනය කිරීම
13. ඉනාමළුව හා හබරණ මාර්ගය සීගිරිය හරහා මංතීරු 02ක් දක්වා පුළුල් කිරීම.
14. නාඋල නගරයෙහි සෙත්මඟ මාර්ගය ඒ 9 මාර්ගයේ සිට ඇලහැර මාර්ගය දක්වා සංවර්ධනය කිරීම.
15. නාඋල කලාප අධ්‍යාපන කාර්යාල මාර්ගය සංවර්ධනය කිරීම.
16. ගලේවෙල රෝහල් පරිශ්‍රයට යාබදව පවතින මාර්ගය A6 මාර්ගයේ සිට කලාවැව මාර්ගය දක්වා සංවර්ධනය කිරීම.

6.6.2.3. තෙවන පෙළ ප්‍රමුඛතා ව්‍යාපෘති

1. නාඋල, නාලන්ද සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
2. අන්තර් හා අභ්‍යන්තර සංචාරක ගුවන් ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය
3. මධ්‍යගත මලාපවහන පද්ධතිය හා අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය - දඹුල්ල
4. වැසි ජල කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (දඹුල්ල, ගලේවෙල, නාඋල, හබරණ, සීගිරිය)
5. මධ්‍යම පාන්තික නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය - දඹුල්ල
6. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය (ගලේවෙල, නාඋල)
7. පර්ෂද නගර මධ්‍ය අලංකරණ ව්‍යාපෘතිය (ගලේවෙල, නාඋල, සීගිරිය, හබරණ, මඩාටුගම)
8. නගර ශාලාව හා වාණිජ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය - නාඋල
9. නාඋල නගර මධ්‍යය පරිපාලන හා වාණිජ භාවිතයන් ප්‍රතිසංවිධානය කිරීමේ ව්‍යාපෘතිය
10. හබරණ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය
11. විසල් දඹුල්ල ප්‍රදේශයේ බස්නැවතුම් ස්ථාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
12. හබරණ පිටත වටරවුම් මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය
13. ගලේවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාල මාර්ගය සංවර්ධනය කිරීම.
14. කණ්ඩලම මාර්ගයේ සිට සීගිරිය දක්වා වෑවල වැව මාර්ගය සංවර්ධනය කිරීම.
15. යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හා යෝජිත නගර මධ්‍යය වෙළඳ සංකීර්ණය අතර මාර්ගය.
16. නාඋල කලාප අධ්‍යාපන කාර්යාලයේ සිට කනමුලයාය මාර්ගය දක්වා MOH කාර්යාල පරිශ්‍රය හරහා සම්බන්ධිත මාර්ගය සංවර්ධනය කිරීම.

6.6.3 ව්‍යාපෘති පිළිබඳ විස්තරය

1. *සංචාරක ආකර්ෂණීය ප්‍රවේශ සංවර්ධන ව්‍යාපෘතිය*

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	*සංචාරක ආකර්ෂණීය ප්‍රවේශ සංවර්ධන ව්‍යාපෘතිය*
ව්‍යාපෘතිය	*සංචාරක ආකර්ෂණීය ප්‍රදේශ සම්බන්ධ කරමින් පවතින මාර්ගය දර්ශනීය ලෙස සංවර්ධනය කිරීම.*
ව්‍යාපෘති යෝජනාව	1. *ප්‍රවේශ මාර්ගය පදිකයින්ට, පාපැදි කරුවන්ට, රථවාහන ගමනා ගමනයට සුදුසු පරිදි සංවර්ධනය කිරීම.* 2. *මාර්ගය දෙපස භූ දර්ශන සැලැස්මක් යටතේ සංවර්ධනය කිරීම.* 3. *සංචාරක පහසුකම් සැලැස්වීමේ මධ්‍යස්ථානයන් පහත ස්ථානයන්හි ඇති කිරීම. (විවේකීය ස්ථාන, සනීපාරක්ෂක පහසුකම්, රථවාහන නැවතුම් ස්ථාන, ආහාර ලබා ගැනීමේ ස්ථාන ආදි)* • *දඹුළුඔය 38 කණුව A9 මාර්ගය* • *ඉබ්බන්කටුව වැව ආශ්‍රිතව* • *නාමල් උයන පිවිසුම ආශ්‍රිතව* • *මඩාටුගම මංසන්ධිය ආශ්‍රිතව* • *කණ්ඩලම වැව් බැම්ම ආශ්‍රිතව* • *කළුදිය පොකුණ ආශ්‍රිතව* • *සීගිරිය වැව ආශ්‍රිතව* • *හබරණ වැව ආශ්‍රිතව*

ව්‍යාපෘතියේ පිහිටීම					
පිහිටීම	**පළාත**	මධ්‍යම	**සීමාවන්**	**උතුර**	
	දිස්ත්‍රික්කය	මාතලේ		**නැගෙනහිර**	
	ප්‍රාදේශීය සීමාව	මහ දඹුල්ල බල ප්‍රදේශය		**දකුණ**	
	පරිපාලන ඒකකය	නාඋල, පලාගල සහ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය		**බටහිර**	
ප්‍රවේශය					

පිහිටීම දක්වන සිතියම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	**සංරක්ෂණය**		**ව්‍යාපෘති ස්වභාවය**	**නව**	√
	වාණිජ			**දියුණු කළ යුතු**	
	භූ දර්ශන	√		**විස්තීරණය කළ යුතු**	
	උරුමයන්	√		**භූමිය සංවර්ධනය කිරීම පමණක්**	
	නිවාස		**ව්‍යාපෘතියේ ඉලක්ක**	**ආර්ථික**	√
	ප්‍රතිස්ථාපන			**සාමාජීය**	
	වෙනත්			**පාරිසරික**	
				භෞතික	
ව්‍යාපෘති ඉලක්ක	*1. හඳුනාගත් ස්ථාන 12 ක විදේශීය සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීම.* *2. හඳුනාගත් සංචාරක ස්ථාන 14 අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීම.* *3. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිතව දේශීය කර්මාන්ත ප්‍රාදේශීය මට්ටමින් නගා සිටුවීම.*				
ව්‍යාපෘතියේ පදනම	*2018 වර්ෂයේදි සීගිරිය නැරඹීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින්ගෙන් 25% ක් දඹුල්ල ප්‍රදේශයට පැමිණේ. (මධ්‍යම සංස්කෘතික අරමුදල 2018) හඳුනාගෙන ඇති විදේශීය සංචාරක ස්ථාන 14 දඹුල්ල නගරයේ සිට කි;මි 25 ක පරාසයක් තුළ පිහිටා ඇති බැවින්, එම ස්ථාන ක්‍රමවත්ව සංවර්ධනයක් සිදු කිරීම මගින් දඹුල්ල නගරයට පැමිණෙන විදේශීය සංචාරකයින් එම ස්ථානකරා යොමු කිරීම මෙම ව්‍යාපෘතියෙන් සිදු කරයි. දැනට සීගිරිය හා දඹුල්ල නගරය අවට සංචාරක ලැගුම් හල් 400 කට අධික ප්‍රමාණයක් පිහිටා ඇති අතර, වාර්ෂිකව දේශීය හා විදේශීය සංචාරකයින් මිලියනයක පමණ ප්‍රමාණයක් පැමිණේ.*				

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	*නා.සං.අ.*		*පෞද්ගලික*		*රජයේ*	√	*වෙනත්*	

ඉඩමේ වර්තමාන තත්වය	*බොරළු මාර්ග සහ කාපට් මාර්ග*	**ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය**	
ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය	*රජය*		

මිනින්දෝරු සැලැස්ම	**අංකය**	**මිනින්දෝරුගේ නම**	**දිනය**	**ඉඩමේ ප්‍රමාණය**		
				අක්.	**රූ.**	**පර්.**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	*PPP*	**ක්‍රියාත්මක කළ යුතු ආයතනය**	*නාගරික සංවර්ධන අධිකාරිය, සංචාරක සංවර්ධන අධිකාරිය*	**අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය**	*රාජ්‍ය අරමුදල්* *විදේශීය ආයෝජනයන්*

කලාපය	*මිශ්‍ර සංවර්ධන කළාපය*	**කලාපීකරණ අනුකූලභාවය**	*අනුකූල වේ*

2. සීගිරිය - පිදුරංගල සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘති මාතෘකාව	සීගිරිය - පිදුරංගල සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘතිය	සීගිරිය - පිදුරංගල සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	ව්‍යාපෘති යෝජනාව - සීගිරිය - පිදුරංගල ප්‍රදේශය විශේෂයෙන් පුරාවිද්‍යාත්මක සංචාරක ස්ථානයක් ලෙස වැදගත්කමක් ගනු ලැබේ. ඒ අනුව සීගිරිය සහ පිදුරංගල ආශ්‍රිතව සංචාරක කේෂ්ත්‍රයේ සංවර්ධනය සඳහා පහතින් දැක්වෙන ව්‍යාපෘති අංග ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. • සීගිරිය - කිඹිස්ස ඇවිදින මංතීරු ඉදිකිරීම් ව්‍යාපෘතිය. • සීගිරිය විදේශිකයන්ගේ රථ වාහන නැවතුම් පොල සංවර්ධන ව්‍යාපෘතිය. • සීගිරිය නව නගර භූමියෙහි වෙළඳපොල සංවර්ධනය කිරීම, පොදු සනීපාරක්‍ෂක පහසුකම් ඇති කිරීම, රථවාහන නැවතුම් ස්ථානය සංවර්ධනය කිරීම. • දේශීය හා විදේශීය රථවාහන නැවතුම් ස්ථාන වල ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීම. • සීගිරිය නව නගරය ආශ්‍රිතව කලාගාරයක් ඉදිකිරීම් ව්‍යාපෘතිය. • "සියවස් මාවත" සංවර්ධනය. • සීගිරිය පැරණි වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය. • සීගිරියෙහි අන්‍යනතාවය ඉස්මතු වන පරිදි මංසන්ධි සංවර්ධනය කිරීම. I. ඉනාමළුව මංසන්ධිය. II. කිඹිස්ස මංමන්ධිය. III. හෝටල් මංසන්ධිය. IV. ටී.බී.තෙන්නකෝන් මංසන්ධිය. V. දිගම්පතහ මංසන්ධිය. VI. පිදුරංගල මංසන්ධිය.

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	**පළාත**	මධ්‍යම	**සීමාවන්**	**උතුර**	
	දිස්ත්‍රික්කය	මාතලේ		**නැගෙනහිර**	
	ප්‍රාදේශීය සීමාව	දඹුල්ල ප්‍රා. ස		**දකුණ**	
	පරිපාලන ඒකකය	දඹුල්ල ප්‍රා. ස		**බටහිර**	
ප්‍රවේශය					

පිහිටීම දක්වන සිතියම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම					
ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	√
	වාණිජ	√		දියුණු කළ යුතු	√
	භූ දර්ශන	√		විස්තීරණය කළ යුතු නිවාස	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	නිවාස		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	√
	ප්‍රතිස්ථාපන			සාමාජීය	√
	වෙනත්			පාරිසරික	
				භෞතික	

ව්‍යාපෘති ඉලක්ක	1. සීගිරිය සහ පිදුරංගල සංචාරක කලාපයෙහි සංචාරක ආකර්ෂණය වැඩිදියුණු කිරීම. 2. ප්‍රාදේශීය මට්ටමින් ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම.
ව්‍යාපෘතියේ පදනම	සීගිරිය 1982 වර්ෂයේදී ලෝක උරුමයක් ලෙස යුනෙස්කෝ සංවිධානයෙන් නම් කර ඇති අතර, එය 08 වන ලෝක පුදුමය ලෙසද ජාත්‍යන්තර වශයෙන් සැලකේ. තවද, දෛනිකව සීගිරිය සහ පිදුරංගලට 2000 ක පමණ විදේශීය සංචාරකයින් ප්‍රමාණයක් පැමිණේ. ඒ අනුව, පැමිණෙන සංචාරකයින්ගේ ආකර්ෂණය පවත්වා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය								
ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අ.		පෞද්ගලික		රජයේ	√	වෙනත්	
ඉඩමේ වර්තමාන තත්වය	බොරළු මාර්ග සහ කාපට් මාර්ග			ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය				
ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය	රජය							

මිනින්දෝරු සැලැස්ම	අංකය	මිනින්දෝරුගේ නම	දිනය	ඉඩමේ ප්‍රමාණය		
				අක්.	රූ.	පර්.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම					
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	PPP	ක්‍රියාත්මක කළ යුතු ආයතනය	නාගරික සංවර්ධන අධිකාරිය	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	රාජ්‍ය අරමුදල් විදේශීය ආයෝජනයන්
කලාපය	මිශ්‍ර සංවර්ධන කළාපය		කලාපීකරණ අනුකූලභාවය		අනුකූල වේ

වින්‍යාශ සැලැස්ම







“සියවස් මාවත” සංවර්ධනය
Source : SUDP, 2020

සීගිරිය - කිඹිස්ස ඇවිදින මංතීරු ඉදිකිරීම් ව්‍යාපෘතිය
Source: UDA,2021

3. මොරගහකන්ද සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	මොරගහකන්ද සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘතිය	මොරගහකන්ද සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	ශ්‍රී ලංකාවේ විශාලතම ජලාශය වන මොරගහකන්ද ජලාශය මූලික කරගනිමින් පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට පහත ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත. 1. මොරගහකන්ද නැරඹුම් ස්ථානය ආශ්‍රිතව රථවාහන නැවැත්වීමේ පහසුකම් සහ විවේක හා විනෝද කටයුතු සඳහා ස්ථාන සංවර්ධනය කිරීම. 2. මොරගහකන්ද ජලාශය අවට කඳු මුදුන් යා කරමින් කේබල් කාර් (Cable Car) ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සහ බෝට්ටු මඟින් ප්‍රවාහන පහසුකම් ඇති කිරීම.

ව්‍යාපෘතියේ පිහිටීම					
ස්ථීම	පළාත	මධ්‍යම	සීමාවන්	උතුර	
	දිස්ත්‍රික්කය	මාතලේ		නැගෙනහිර	
	ප්‍රාදේශීය සීමාව	නාඋල ප්‍ර ස		දකුණ	
	පරිපාලන ඒකකය	නාඋල ප්‍ර ස		බටහිර	
ප්‍රවේශය					

පිහිටීම දක්වන සිතියම

ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම					
ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	√
	වාණිජ	√		දියුණු කළ යුතු	
	භූ දර්ශන	√		විස්තීරණය කළ යුතු නිවාස	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	නිවාස		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	
	ප්‍රතිස්ථාපන			සාමාජීය	
	වෙනත්			පාරිසරික	
				භෞතික	

ව්‍යාපෘති ඉලක්ක	1. මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව සංචාරක කටයුතු ප්‍රවර්ධන කිරීම. 2. ප්‍රාදේශීය ජනතාවගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම.
ව්‍යාපෘතියේ පදනම	දෛනිකව මොරගහකන්ද ජලාශය නැරඹීමට පාසල් ශිෂ්‍යයන් හා දේශීය සංචාරකයින් 500 ක අධික ප්‍රමාණයක් මෙම ස්ථානයට පැමිණේ. (මොරගහකන්ද ව්‍යාපෘති කාර්යාලය 2020) ඒ අනුව, ආසන්න ප්‍රදේශයෙහි රථවාහන නැවැත්වීමට හා විනෝද කටයුතු පහසුකම් ඇති කිරීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අ.		පෞද්ගලික		රජයේ	√	වෙනත්	

ඉඩමේ වර්තමාන තත්වය	බොරළු මාර්ග සහ කාපට් මාර්ග	**ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය**	
ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය	රජය		

මිනින්දෝරු සැලැස්ම	**අංකය**	**මිනින්දෝරුගේ නම**	**දිනය**	**ඉඩමේ ප්‍රමාණය**		
				අක්.	**රූ.**	**පර්.**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	PPP	**ක්‍රියාත්මක කළ යුතු ආයතනය**	නාගරික සංවර්ධන අධිකාරිය	**අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය**	රාජ්‍ය අරමුදල් විදේශීය ආයෝජනයන්
කලාපය	මිශ්‍ර සංවර්ධන කළාපය	**කලාපීකරණ අනුකූලභාවය**	අනුකූල වේ		

වින්‍යාශ සැලැස්ම

4. දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථාන කලාප සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථාන කලාප සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘතිය	දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථාන කලාප සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	දඹුල්ල වෙළඳ මධ්‍යස්ථාන ආශ්‍රිතව පහත අනු ව්‍යාපෘතීන් යටතේ ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය නගා සිටුවීමට යෝජිතය. • කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ කර්මාන්ත ඇති කිරීම. • කෘෂි බෝග ගබඩා කිරීම සඳහා අධි ශීතකරණ පහසුකම් ඇති කිරීම. • විධිමත් බෝග ගබඩා පහසුකම් ඇති කිරීම. • ධාන්‍ය සහ කුළුබඩු වෙළඳාම සඳහා පොදු වෙළඳ පොළක් ඇති කිරීම. • නිශ්ශංක මංසන්ධියේ සිට පවත්නා දඹුල්ල බස් නැවතුම්පොල දක්වා ඒ 9 මාර්ගය මංතීරු 5ක් දක්වා පුළුල් කිරීම. • යෝජිත බහුවිධ ප්‍රවාහන මධස්ථානය හා ආර්ථික කලාපය අතර සම්බන්ධතා මාර්ගයක් ඇති කිරීම. • ආර්ථික මධ්‍යස්ථාන ප්‍රවේශ මාර්ගයේ ආර්ථික මධ්‍යස්ථාන පිවිසුමේ සිට තම්මැන්නා ඇල රක්ෂිතය සහ ආර්ථික මධ්‍යස්ථාන රථ වාහන නැවතුම්පල අතර කලාපය හරහා ආර්ථික මධ්‍යස්ථාන ප්‍රවේශ මාර්ගයේ තම්මැන්නා ඇල හරහා ඇති පාලම දක්වා නව මාර්ගයක් පිහිටුවීම.

ව්‍යාපෘතියේ පිහිටීම					
පිහිටීම	පළාත	මධ්‍යම	සීමාවන්	උතුර	
	දිස්ත්‍රික්කය	මාතලේ		නැගෙනහිර	
	ප්‍රාදේශීය සීමාව	දඹුල්ල මහා න. ස.		දකුණ	
	පරිපාලන ඒකකය	දඹුල්ල ප්‍රා. ලේ.		බටහිර	
ප්‍රවේශය					

පිහිටීම දක්වන සිතියම

ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	**සංරක්ෂණය**		**ව්‍යාපෘති ස්වභාවය**	**නව**	√
	වාණිජ	√		**දියුණු කළ යුතු**	
	භූ දර්ශන			**විස්තීරණය කළ යුතු නිවාස**	
	උරුමයන්			**භූමිය සංවර්ධනය කිරීම පමණක්**	
	නිවාස		**ව්‍යාපෘතියේ ඉලක්ක**	**ආර්ථික**	
	ප්‍රතිස්ථාපන			**සාමාජීය**	
	වෙනත්			**පාරිසරික**	
				භෞතික	

ව්‍යාපෘති ඉලක්ක	*1. ආර්ථික මධ්‍යස්ථානය රැගෙන එන කෘෂි බෝග අපතේ යෑම 10% ක් දක්වා අවම කිරීම.* *2. කෘෂි බෝගවල අගය වැඩිකිරීම තුලින් කෘෂි අපනයන ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම.* *3. 2030 වර්ෂය වන විට කෘෂි බෝග ප්‍රවාහන මාධ්‍යයන් වැඩි දියුණු කිරීම.*
ව්‍යාපෘතියේ පදනම	*ආර්ථික මධ්‍යස්ථානයට එක්රැස් කරන කෘෂි බෝග වලින් 40% ක පමණ ප්‍රමාණයක් අපද්‍රව්‍ය ලෙස ඉවත් කෙරේ. එම කෘෂි බෝග කල්තබා ගැනීමේ පහසුකම් හා අගය එකතු කිරීමේ පහසුකම් ඇති කිරීම මඟින් අපතේ යාම අවම කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ. මේ වන විට A9 මාර්ගයෙහි ආර්ථික මධ්‍යස්ථානය ඉදිරිපිට දෛනිකව පවත්නා රථවාහන තදබදය අවම කිරීම ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීම මඟින් අපේක්ෂා කෙරේ. තවද, යෝජිත අපනයන කෘෂී ආර්ථිකය ප්‍රවර්ධනය සඳහා දඹුල්ල විශේෂිත වෙළඳ මධ්‍යස්ථානය හා යෝජිත දුම්රිය මාර්ගය හා අධිවේගි මාර්ගය අතර සම්බන්ධතා වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ.*

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	*නා.සං.අ.*		*පෞද්ගලික*	√	*රජයේ*		*වෙනත්*	

ඉඩමේ වර්තමාන තත්වය	*බොරළු මාර්ග සහ කාපට් මාර්ග*	**ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය**	
ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය	*රජය සහ පෞද්ගලික*		

මිනින්දෝරු සැලැස්ම	**අංකය**	**මිනින්දෝරුගේ නම**	**දිනය**	**ඉඩමේ ප්‍රමාණය**		
				අක්.	**රූ.**	**පර්.**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	*PPP*	**ක්‍රියාත්මක කළ යුතු ආයතනය**	*නාගරික සංවර්ධන අධිකාරිය,*	**අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය**	*රාජ්‍ය අරමුදල්* *විදේශීය ආයෝජනයන්*
කලාපය	*මිශ්‍ර සංවර්ධන කළාපය*	**කලාපීකරණ අනුකූලභාවය**	*අනුකූල වේ*		

වින්‍යාශ සැලැස්ම

කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ කර්මාන්ත ඇති කිරීම
Source: SUDP, 2020

5. කෘෂි අපනයන බෝග කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය (ගලේවෙල ලේනාවල කුඹුර,ඇතාබැදිවැව)

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	කෘෂි අපනයන බෝග කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය (ගලේවෙල ලේනාවල කුඹුර,ඇතාබැදිවැව)
ව්‍යාපෘතිය	කෘෂි අපනයන බෝග කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය (ගලේවෙල ලේනාවල කුඹුර,ඇතාබැදිවැව)
ව්‍යාපෘති යෝජනාව	1. කුළුබඩු හා ධාන්‍ය එකතු කිරීමේ හා අලෙවි කිරීමේ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. 2. ඇතාබැඳි වැව ප්‍රදේශය කර්මාන්ත කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	**පළාත**	මධ්‍යම	**සීමාවන්**	**උතුර**	
	දිස්ත්‍රික්කය	මාතලේ		**නැගෙනහිර**	
	ප්‍රාදේශීය සීමාව	දඹුල්ල සහ ගලේවෙල ප්‍රා ස		**දකුණ**	
	පරිපාලන ඒකකය	දඹුල්ල සහ ගලේවෙල ප්‍රා ලේ		**බටහිර**	
ප්‍රවේශය					

පිහිටීම දක්වන සිතියම

<table>
<tr><th colspan="6">ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම</th></tr>
<tr><td rowspan="8">ව්‍යාපෘති ප්‍රභේද</td><td>සංරක්ෂණය</td><td></td><td rowspan="4">ව්‍යාපෘති ස්වභාවය</td><td>නව</td><td>√</td></tr>
<tr><td>වාණිජ</td><td>√</td><td>දියුණු කළ යුතු</td><td></td></tr>
<tr><td>භූ දර්ශන</td><td></td><td>විස්තීරණය කළ යුතු නිවාස</td><td></td></tr>
<tr><td>උරුමයන්</td><td></td><td>භූමිය සංවර්ධනය කිරීම පමණක්</td><td></td></tr>
<tr><td>නිවාස</td><td></td><td rowspan="4">ව්‍යාපෘතියේ ඉලක්ක</td><td>ආර්ථික</td><td></td></tr>
<tr><td>ප්‍රතිස්ථාපන</td><td></td><td>සාමාජීය</td><td></td></tr>
<tr><td rowspan="2">වෙනත්</td><td rowspan="2">√</td><td>පාරිසරික</td><td></td></tr>
<tr><td>භෞතික</td><td></td></tr>
<tr><td>ව්‍යාපෘති ඉලක්ක</td><td colspan="5">1. දේශීය කෘෂි බෝග සඳහා අපනයන වෙළඳපොලක් ඇති කිරීම තුලින් දේශීය කෘෂි ආර්ථිකය නඟා සිටුවීම.
2. ප්‍රාදේශීයව රැකියා අවස්ථාඇති කිරීම.
3. කර්මාන්ත සංවර්ධන සඳහා අවස්ථා ලබා දීම.</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="5">ගලේවෙල හා ඒ අවට කලාපය කුළුබඩු හා ධාන්‍ය වගා කිරීම සඳහා විශේෂිත වේ. තවද ගලේවෙල නගරය ආශ්‍රිතව කර්මාන්ත සංවර්ධනය සඳහා සුදුසු විවෘත ඉඩ පහසුකම් ලබා ගැනීමේ හැකියාවක් ඇත. තවද, දැනටමත් ඇතාබැඳි වැව කලාපය කර්මාන්ත කටයුතු සඳහා විශේෂ නැඹුරුවක් දක්නට ලැබේ. ඒ අනුව, ඉහත ව්‍යාපෘති ප්‍රදේශයේ කෘෂි ආර්ථිකය නඟා සිටුවීම ක්‍රියාත්මක කිරීමට යෝජිතය.</td></tr>
</table>

<table>
<tr><th colspan="9">ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය</th></tr>
<tr><td>ඉඩමේ වර්තමාන අයිතිය</td><td>නා.සං.අ.</td><td>√</td><td>පෞද්ගලික</td><td>√</td><td>රජයේ</td><td></td><td>වෙනත්</td><td></td></tr>
</table>

<table>
<tr><td>ඉඩමේ වර්තමාන තත්වය</td><td colspan="3">විවෘත ඉඩම්</td><td>ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය</td><td colspan="3"></td></tr>
<tr><td colspan="3">ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය</td><td colspan="5">නා.සං.අධි.</td></tr>
<tr><td rowspan="3">මිනින්දෝරු සැලැස්ම</td><td>අංකය</td><td colspan="2">මිනින්දෝරුගේ නම</td><td>දිනය</td><td colspan="3">ඉඩමේ ප්‍රමාණය</td></tr>
<tr><td rowspan="2"></td><td colspan="2" rowspan="2"></td><td rowspan="2"></td><td>අක්.</td><td>රූ.</td><td>පර්.</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td colspan="8">ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</td><td>PPP</td><td>ක්‍රියාත්මක කළ යුතු ආයතනය</td><td colspan="2">නාගරික සංවර්ධන අධිකාරිය</td><td>අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය</td><td colspan="2">රජය</td></tr>
<tr><td>කලාපය</td><td colspan="3">මිශ්‍ර සංවර්ධන කළාපය</td><td colspan="2">කලාපීකරණ අනුකූලභාවය</td><td colspan="2">අනුකූල වේ</td></tr>
<tr><td colspan="8">වින්‍යාශ සැලැස්ම</td></tr>
</table>



6. දඹුල්ල පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේ දෙවන අදියර සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	දඹුල්ල පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය
ව්‍යාපෘතිය	දඹුල්ල පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේ දෙවන අදියර
ව්‍යාපෘති යෝජනාව	දඹුල්ල පරිපාලන ගොඩනැගිල්ලේ 4 වන මහල ඉදිකර කාර්යාල කටයුතු සඳහා ඉඩ පහසුකම් ලබාදීම

ව්‍යාපෘතියේ පිහිටීම					
පිහිටීම	පළාත	මධ්‍යම	සීමාවන්	උතුර	මිරිස්ගෝනියා ඔය
	දිස්ත්‍රික්කය	මාතලේ		නැගෙනහිර	ප්‍රවේශ මාර්ගය
	ප්‍රාදේශීය සීමාව	දඹුල්ල ම. න. ස.		දකුණ	ගම්උදාව ක්‍රීඩා පිටිය
	පරිපාලන ඒකකය	දඹුල්ල ප්‍රා. ලේ.		බටහිර	ප්‍රවේශ මාර්ගය
ප්‍රවේශය					

පිහිටීම දක්වන සිතියම

ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම					
ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	
	වාණිජ			දියුණු කළ යුතු	√
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු නිවාස	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	නිවාස		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	
	ප්‍රතිස්ථාපන			සාමාජීය	
	වෙනත්	√		පාරිසරික	
				භෞතික	

ව්‍යාපෘති ඉලක්ක	1. දඹුල්ල නගර සීමාවේ රාජ්‍ය ආයතන එක් ස්ථානයකට ස්ථානගත කිරීම
ව්‍යාපෘතියේ පදනම	දඹුල්ල නගර සීමාව තුළ රාජ්‍ය ආයතන විවිධ ස්ථානවල ස්ථානගත වී ඇති බැවින් ව්‍යාපෘති හඳුනාගෙන 2020 වර්ෂය වන විට පළමු අදියර අවසන් කර ඇත. ඒ අනුව ව්‍යාපෘතියෙහි දෙවන අදියර මෙම සංවර්ධන සැලැස්ම යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අ.	√	පෞද්ගලික		රජයේ		වෙනත්	

ඉඩමේ වර්තමාන තත්වය	පරිපාලන ගොඩනැගිල්ල	**පුනිස්ථාපනය පිළිබඳ විස්තරය**	
ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය	රජය		

මිනින්දෝරු සැලැස්ම	**අංකය**	**මිනින්දෝරුගේ නම**	**දිනය**	**ඉඩමේ ප්‍රමාණය**		
				අක්.	**රූ.**	**පර්.**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	රජය	**ක්‍රියාත්මක කළ යුතු ආයතනය**	නාගරික සංවර්ධන අධිකාරිය	**අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය**	රජය
කලාපය	මිශ්‍ර සංවර්ධන කළාපය	**කලාපීකරණ අනුකූලභාවය**	අනුකූල වේ		

වින්‍යාශ සැලැස්ම



7. දඹුල්ල නගර මධ්‍ය වෙළඳ සංකීර්ණ ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	දඹුල්ල නගර මධ්‍ය වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
ව්‍යාපෘතිය	දඹුල්ල නගර මධ්‍ය වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	දඹුල්ල බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ව්‍යාපෘතියට සමගාමීව දඹුල්ල නගර මධ්‍ය කලාපයේ මහජන පොල සහ පොදු වෙළඳ පොල හා රථගාල පිහිටා ඇති ඉඩම් කොටස් ආශ්‍රිතව (සියලු පහසුකම් සහිතව බිම් මහළ සමග මහල් 4 ක් ඇතුලත් වන පරිදි) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිතය. එහි භාවිතයන් ලෙස සුපිරි වෙළඳ සැල් , සිනමා ශාලා ආපන ශාලා සහ නේවාසික පහසුකම් ආදි ඇති කිරීමට යෝජිතය.

ව්‍යාපෘතියේ පිහිටීම

ස්ථානය	පළාත	මධ්‍යම	සීමාවන්	උතුර	ප්‍රවේශ මාර්ගය
	දිස්ත්‍රික්කය	මාතලේ		නැගෙනහිර	පුද්ගලික ඉඩම්
	ප්‍රාදේශීය සීමාව	දඹුල්ල ම. න. ස.		දකුණ	නා.සං අ. ඉඩම්
	පරිපාලන ඒකකය	දඹුල්ල ප්‍රා. ලේ.		බටහිර	මාර්ගය
ප්‍රවේශය					

පිහිටීම දක්වන සිතියම

ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	√
	වාණිජ	√		දියුණු කළ යුතු	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු නිවාස	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	නිවාස		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	
	ප්‍රතිස්ථාපන			සාමාජීය	
	වෙනත්			පාරිසරික	
				භෞතික	

ව්‍යාපෘති ඉලක්ක	*1. දේශිය හා විදේශීය ජනතාවගේ වෙළඳපොල අවශ්‍යතාවයන් සපුරාලීම.* *2. දඹුල්ල නගර මධ්‍ය ඉඩම් නාගරික ප්‍රතිරූපය ඉස්මතු වන පරිදි සංවර්ධනය කිරීම.*
ව්‍යාපෘතියේ පදනම	*දඹුල්ල නගරයට පැමිණෙන දේශිය හා විදේශිය සංචාරකයින්ගේ වෙළඳපොල අවශ්‍යතා ඉටු කිරීමට විධිමත්ව නිර්මාණය වු වෙළඳපොලක් නොමැති වීම සහ දඹුල්ල නගරය මුලික කරගනිමින් විවිධ අවශ්‍යතාවයන් සඳහා දෛනිකව 200000 ක පමණ ජනතාවක් නගරය කරා පැමිණීම. මෙම ව්‍යාපෘතියට මුලික වි ඇත. තවද මෙම ව්‍යාපෘති භූමිය යෝජිත් බහුවිධ ප්‍රවාහන මධ්‍ය ස්ථානයට මිටර් 500 ක පමණ දුරින් පිහිටා ඇති බැවින් රට සමගාමීව විධිමත් සංවර්ධනයක් සිදු කිරීමට අපේක්ෂිතය.*

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	*නා.සං.අ.*	√	*පෞද්ගලික*		*රජයේ*		*වෙනත්*	

ඉඩමේ වර්තමාන තත්වය	*පැරණි තොග පොල*	**ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය**	*අධිකාරිය සතු ඉඩම් කොටසක*

ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය	*නා.සං.අ.*

මිනින්දෝරු සැලැස්ම	**අංකය**	**මිනින්දෝරුගේ නම**	**දිනය**	**ඉඩමේ ප්‍රමාණය**		
				අක්.	**රූ.**	**පර්.**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	*PPP*	**ක්‍රියාත්මක කළ යුතු ආයතනය**	*නාගරික සංවර්ධන අධිකාරිය*	**අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය**	*රජය සහ පුද්ගලික*

කලාපය	*මිශ්‍ර සංවර්ධන කළාපය*	**කලාපීකරණ අනුකූලභාවය**	*අනුකූල වේ*

වින්‍යාශ සැලැස්ම


rear side bird eye view


front facade view

8. මරදමන්යාය - පොදු රථගාල සහ වාණිජ ගොඩනැගිල්ල ඉදිකිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	*මරදමන්යාය - පොදු රථගාල සහ වාණිජ ගොඩනැගිල්ල ඉදිකිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය*
ව්‍යාපෘතිය	*මරදමන්යාය - පොදු රථගාල සහ වාණිජ ගොඩනැගිල්ල ඉදිකිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය*
ව්‍යාපෘති යෝජනාව	*නගර මධ්‍ය යේ A9 මාර්ගයට යාබදව මෙම අධිකාරියට අයත් අක්කර 01 පමණ ඉඩම් කොටස තුල බිම් මහල සමග මහල් දෙකකින් සමන්විත වන පරිදි වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ මෙම පරිශ්‍රය තුල පොදු රථගාලක් ඉදිකිරීම.*

ව්‍යාපෘතියේ පිහිටීම

පිහිටීම	**පළාත**	මධ්‍යම	**සීමාවන්**	**උතුර**	පුද්ගලික ඉඩම්
	දිස්ත්‍රික්කය	මාතලේ		**නැගෙනහිර**	මාර්ගය
	ප්‍රාදේශීය සීමාව	දඹුල්ල ම. න. ස.		**දකුණ**	මාර්ගය
	පරිපාලන ඒකකය	දඹුල්ල ප්‍රා. ලේ.		**බටහිර**	මාර්ගය
ප්‍රවේශය					

පිහිටීම දක්වන සිතියම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	√
	වාණිජ	√		දියුණු කළ යුතු	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු නිවාස	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	නිවාස		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	
	ප්‍රතිස්ථාපන			සාමාජීය	
	වෙනත්			පාරිසරික	
				භෞතික	

ව්‍යාපෘති ඉලක්ක	*01. විධිමත්ව සංවර්ධනය නොවූ නාගරික ඉඩම් ඵලදායි ලෙස සංවර්ධනය කිරීම.* *02. නාගරික රථවාහන නැවැත්වීමේ පහසුකම් වැඩි දියුණු කිරීම.* *03. නාගරික ජනතාවගේ වෙළඳපොල අවශ්‍යතා සපුරාලීම.*
ව්‍යාපෘතියේ පදනම	*මෙම ව්‍යාපෘතිය අදාලව වෙළඳපොල ඉල්ලුම සඳහා සමීක්ෂණයන් සිදු කර ඇති අතර, ඒ අනුව යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට විශාල ඉල්ලුමක් පවතින බව තහවුරු වී ඇත. ඉහළ වාණිජ වටිනාකමක් සහිත මෙම ඉඩම් කොටස අවිධිමත් ලෙස කුඩා වාණිජ ඒකකයන් සහිතව ක්‍රියාත්මක වේ.*

ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය

ඉඩමේ වර්තමාන අයිතිය	නා.සං.අ.	√	පෞද්ගලික		රජයේ		වෙනත්	

ඉඩමේ වර්තමාන තත්වය	වාණිජ	ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය	ඉඩම තුල
ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය	නා.සං.අ.		

මිනින්දෝරු සැලැස්ම	අංකය	මිනින්දෝරුගේ නම	දිනය	ඉඩමේ ප්‍රමාණය		
				අක්.	රූ.	පර්.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය	PPP	ක්‍රියාත්මක කළ යුතු ආයතනය	නාගරික සංවර්ධන අධිකාරිය	අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය	රජය සහ පුද්ගලික
කලාපය	මිශ්‍ර සංවර්ධන කළාපය	කලාපීකරණ අනුකූලභාවය	අනුකූල වේ		

වින්‍යාශ සැලැස්ම

9. දඹුල්ල පොදු වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය හඳුනා ගැනීම	
ව්‍යාපෘති මාතෘකාව	දඹුල්ල පොදු වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘතිය	දඹුල්ල පොදු වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය
ව්‍යාපෘති යෝජනාව	දැනට අබලන් තත්ත්වයේ පවතින පොදු වෙළඳපොල සඳහා රට ආසන්නයේ මෙම අධිකාරිය සතු පර්චස් 80 ක පමණ ඉඩම් කොටස තුළ වෙළඳ කුටි 100 ක් පමණ ඇතුළත් වන පරිදි බිම් මහලකින් පමණක් සමන්විත වූ පොදු වෙළඳපොල ගොඩනැගිල්ලක් ඉදිකිරීම

ව්‍යාපෘතියේ පිහිටීම					
ස්ථානය	පළාත	මධ්‍යම	සීමාවන්	උතුර	
	දිස්ත්‍රික්කය	මාතලේ		නැගෙනහිර	
	ප්‍රාදේශීය සීමාව	දඹුල්ල ම. න. ස.		දකුණ	
	පරිපාලන ඒකකය	දඹුල්ල ප්‍රා. ලේ.		බටහිර	
ප්‍රවේශය					

පිහිටීම දක්වන සිතියම



ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම					
ව්‍යාපෘති ප්‍රභේද	සංරක්ෂණය		ව්‍යාපෘති ස්වභාවය	නව	√
	වාණිජ	√		දියුණු කළ යුතු	
	භූ දර්ශන			විස්තීරණය කළ යුතු නිවාස	
	උරුමයන්			භූමිය සංවර්ධනය කිරීම පමණක්	
	නිවාස		ව්‍යාපෘතියේ ඉලක්ක	ආර්ථික	
	ප්‍රතිස්ථාපන			සාමාජීය	
	වෙනත්			පාරිසරික	
				භෞතික	
ව්‍යාපෘති ඉලක්ක	1. දෛනික වෙළඳපොල අවශ්‍යතාවයක් ඉටුකර ගැනීමට පැමිණෙන දඹුල්ල නාගරික ප්‍රජාව සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම.				
ව්‍යාපෘතියේ පදනම					

<table>
<tr><th colspan="10">ව්‍යාපෘතියේ දේපල පිළිබඳ විස්තරය</th></tr>
<tr><td>ඉඩමේ වර්තමාන අයිතිය</td><td>නා.සං.අ.</td><td>√</td><td>පෞද්ගලික</td><td></td><td>රජයේ</td><td>√</td><td>වෙනත්</td><td colspan="2"></td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන තත්වය</td><td colspan="3">හිස් ඉඩම</td><td colspan="2">ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය</td><td colspan="4"></td></tr>
<tr><td colspan="2">ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය</td><td colspan="8">නා.සං.අ.</td></tr>
<tr><td rowspan="3">මිනින්දෝරු සැලැස්ම</td><td>අංකය</td><td colspan="2">මිනින්දෝරුගේ නම</td><td>දිනය</td><td colspan="5">ඉඩමේ ප්‍රමාණය</td></tr>
<tr><td rowspan="2"></td><td colspan="2" rowspan="2"></td><td rowspan="2"></td><td>අක්.</td><td colspan="2">රූ.</td><td colspan="2">පර්.</td></tr>
<tr><td></td><td colspan="2"></td><td colspan="2"></td></tr>
<tr><th colspan="10">ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම</th></tr>
<tr><td>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</td><td>රජය</td><td>ක්‍රියාත්මක කළ යුතු ආයතනය</td><td colspan="2">නාගරික සංවර්ධන අධිකාරිය</td><td>අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය</td><td colspan="4">රජය</td></tr>
<tr><td>කලාපය</td><td colspan="3">මිශ්‍ර සංවර්ධන කළාපය</td><td colspan="2">කලාපීකරණ අනුකූලභාවය</td><td colspan="4">අනුකූල වේ</td></tr>
<tr><th colspan="10">වින්‍යාශ සැලැස්ම</th></tr>
</table>

10. පොදු සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (දඹුල්ල,ගලේවෙල,නාඋල,හබරණ.සීගිරිය)

ව්‍යාපෘතිය හඳුනා ගැනීම

ව්‍යාපෘති මාතෘකාව	පොදු සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (දඹුල්ල,ගලේවෙල,නාඋල,හබරණ.සීගිරිය)
ව්‍යාපෘතිය	පොදු සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (දඹුල්ල,ගලේවෙල,නාඋල,හබරණ.සීගිරිය)
7.4.8. අධිකාරිය විසින් සුදුසු යැයි හැගෙන අවස්ථාවල කලාපීකරණ භාවිතයන් සඳහා නියම කර ඇති සහ සංවර්ධන සැලැස්මේ ඇතුලත් කර ඇති කවර හෝ ප්‍රදේශයක් විශේෂ ව්‍යාපෘති ප්‍රදේශයක්, ප්‍රතිසංවර්ධන ප්‍රදේශයක්, පාරිසරික සංරක්ෂණ ප්‍රදේශයක් හෝ වෙනත් භාවිතය සඳහා වෙන් වු ප්‍රදේශයක් ලෙස පහත සදහන් කරුණු සලකා බැලීමට යටත්ව නියම කරනු ලැබිය හැකිය.

(අ) සංවර්ධන උපනතීන්	(ඇ) ස්වභාවික අලංකාරය රැකගැනීම
(ආ) පුරාවිද්‍යාත්මක ගවේශන	(ඇ) ස්වභාවික ආපදා වැලැක්වීම

පරිච්ඡේදය 07
සංවර්ධන කලාප හා කලාප නියමතා

සැලසුම් ප්‍රදේශ සඳහා වූ පොදු නියමතා

7.4.9. මෙම නියමතා වල කවර ආකාරයෙන් සඳහන් වුව ද අධිකාරිය විසින් සංවර්ධන සැලැස්මේ අරමුණු ඉටුකරගනු පිණිස කවර හෝ සංවර්ධන ක්‍රියාවක් තහනම් කිරීම හෝ සීමා කිරීම හෝ නියමතා ලිහිල් කිරීම මායිම් හෝ නව නියමතා හඳුන්වා දීම කල හැකි වන්නේය.

7.4.10. යම් දේපලක් හෝ ස්ථානයක් පුරාවිද්‍යාත්මක සංරක්ෂිත ප්‍රදේශයක් හෝ ස්ථානයක් ලෙස නම් කර තිබේ නම් එම ප්‍රදේශයේ හෝ ස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබාගත යුතුය.

7.4.11. යම් දේපලක් හෝ යම් ස්ථානයක් වන සංරක්ෂිත ප්‍රදේශයක් හෝ ස්ථානයක් ලෙස නම් කර තිබේ නම් එම ප්‍රදේශයේ හෝ ස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගත යුතුය.

7.4.12. යම් දේපලක් හෝ යම් ස්ථානයක්, බිම් ප්‍රදේශයක් වන සත්ව හා තුරුලතා ආඥා පනත යටතේ වන ජීවී ප්‍රදේශයක් ලෙස නම් කර ඇති විටක දී එම ප්‍රදේශයේ හෝ ස්ථානයේ සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා වනජීවී දෙපාර්තමේන්තුවෙන් නිර්දේශය ලබාගත යුතුය.

7.4.13. යම් දේපලක් හෝ යම්කිසි ස්ථානයක් හෝ බිම් ප්‍රමාණයක් මහවැලි සංවර්ධන ප්‍රදේශයක් ලෙස නම් කර ඇති විටක දී එම ප්‍රදේශයේ හෝ ස්ථානයේ සංවර්ධන කටයුතු සඳහා මහවැලි සංවර්ධන අධිකාරියේ නිර්දේශය ලබාගත යුතුය.

7.4.14. යම් දේපලක් හෝ යම්කිසි ස්ථානයක් කිසියම් ආයතනයක් යටතේ පාලනය වන කලාපයකට ඇතුලත් වී නොතිබුනද ,එස පරිශ්‍රයේ සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසුව අධිකාරිය විසින් නම් කරන ලද ආයතනයන්ගෙන් නිර්දේශ ලබාගත යුතුය.

7.4.15. නව ආගමික ගොඩනැගිල්ලක් සෑදීමේදී හෝ යම් ස්ථානයක් නව ආගමික ස්ථානයක් සඳහා වෙන් කිරීමේදී ස්ථානය නියෝජනය වන ජනතාවගේ එකඟතාවයක් සහිතව අදාළ ප්‍රදේශයේ, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයක් ලබා ගත යුතුයි.

7.4.16. සැලැස්මේ රෙගුලාසි බල පවත්වනු ලබන දිනය වන විට කිසියම් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කරනු ලබන භාවිතයක් එම කලාපයට නොගැලපේ නම් එකී භාවිතයෙහි කාලය දීර්ඝ කිරීම සහ අළුතින් කොටසක් එකතු කිරීම සලකා බැලීමේ බලය අධිකාරිය සතු වන්නේය.

7.4.17. ඕනෑම කලාපයක් තුල පවත්නා භාවිතයක් යෝජිත කලාපිකරණ සැලැස්ම සමග නොගැලපෙන්නේ නම්, එවැනි භාවිතයකට අදාලව පවත්නා ගොඩනැගිලි වැඩිදියුණු කිරීමක් හෝ කොටස් එකතු කිරීමක් සිදු කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මූලික සැලසුම් නිරාකරණයක් ලබාගත යුතු අතර ඒ අනුව පවත්නා භාවිතය ඉදිරියට ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

7.4.18. සංවර්ධන සැලසුමේ රෙගුලාසි වලින් ආවරණය නොවන්නා වූ යම් සංවර්ධන කටයුත්තක් පිළිබඳව තීරණය ගැනීමේ පූර්ණ බලය නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.

7.4.19. සංවර්ධන සැලැස්මේ ප්‍රතිපාදන නොමැති අවස්ථාවක, එකී සැලැස්මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා සිදු කරනු ලබන යම් ඉඩම් කොටසක් භාවිතා කිරීමට හෝ නඟනම් කිරීම හෝ පාලනය කිරීම හෝ යම් රෙගුලාසියක් නිදහස් කිරීම හෝ නව රෙගුලාසි හෝ මාර්ගෝපදේශ හඳුන්වා දීම නීත්‍යානුකූල වන්නේ නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව විසින් ගන්නා තීරණ මත පමණි.

7.4.20. යම් ඉඩම් කොටසක්, පළාත් පාලන ආයතන දෙකක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් අතර පිහිටන්නේ නම් එය අයත්වන පළාත් පාලන ආයතනය ලෙස සලකනු ලබනුයේ එහි ප්‍රධාන පිවිසුම් මාර්ගය අයත් පළාත් පාලන ආයතනයයි. එසේ පිවිසුම් මාර්ග දෙකක් ඇත්නම්, වැඩි පළලකින් යුතු මාර්ගය අයත් පළාත් පාලන ආයතනයද මාර්ග දෙක එකම ප්‍රමාණයෙන් සමන්විත වේ නම් එම ඉඩමේ වැඩි ප්‍රමාණයක් අයිති පළාත් පාලන ආයතනයද සැලකිල්ලට ගනු ලැබේ.

7.4.21. සියලුම කලාප තුල පවත්නා කුඹුරු ඉඩම් හා ජලය රඳවා ගැනීමේ පහත් බිම් ගොඩ කිරීම සඳහා අවසර ලබා දීම සම්බන්ධව පහත මූලික නිර්දේශ වලට යටත්ව සලකා බැලිය හැක.

a. ප්‍රදේශයේ ජල වහන රටාවට බලපෑමක් ඇති නොවීම.
b. යාබද කුඹුරු ඉඩම් සඳහා බලපෑමක් ඇති නොවීම.
c. යාබදව පවත්නා භූමි පරිභරණ රටාවට බලපෑමක් ඇති නොවීම.
d. යෝජිත භාවිතය සඳහා අපරව්‍යුහ පහසුකම් ප්‍රමාණවත් වීම.
e. මෙම සැලැස්ම මගින් සඳහන් කර ඇති අනෙකුත් රෙගුලාසි සමග ගැලපිය යුතුයි.

උක්ත කරුණු සියල්ල සපුරාලන්නේ නම් අදාළ භාවිතය සඳහා අවසර ලබා දීමට නාගරික සංවර්ධන අධිකාරිය මගින් සලකා බලනු ලැබේ. තවද යෝජිත සංවර්ධනය අදාළ කුඹුරු ඉඩම පවත්නා කළාපයේ රෙගුලාසි වලට අනුකූල විය යුතුයි.

7.4.22. යම් දේපලක් හෝ ගොඩනැගිල්ලක් කලාප දෙකක් තුළ පිහිටන අවස්ථාවන්හිදී අදාළ කලාපය ලෙස සලකනුයේ ප්‍රධාන ප්‍රවේශ මාර්ගය අයත් කලාපය වේ.

7.4.23. යම් දේපලක් කලාප දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තුළ පිහිටන අවස්ථාවන්හිදී සංවර්ධන සැලසුමෙහි අරමුණු ලඟා කර ගැනීම සඳහා වඩාත් උචිත කලාපය තීරණය කිරීම නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.

7.4.24. කලාප සැලැස්මේ සපයා දී ඇති X (දේශාංශ) Y (අක්ෂාංශ) මායිම් ඛණ්ඩාංක ප්‍රධාන ග්‍රීන්විච් මධ්‍යාහන රේඛාව (Greenwich meridian line) යටතේ විස්තර කර ඇත. යම් පරස්පරතාවයකදී Google earth වල දශමස්ථාන වලින් පෙන්වන මෙම X හා Y ඛණ්ඩාංක අවසාන මායිම වේ.

පරිච්ඡේදය 07
සංවර්ධන කලාප හා
කලාප නියමතා

සැලසුම් ප්‍රදේශ සඳහා වූ
පොදු නියමතා

7.4.25. කලාපීකරණ මායිම්, පෙන්වා ඇති භෞතික මායිම් හා භූගෝලීය ඛණ්ඩාංක මායිම් අතර වෙනසක් ඇති වන අවස්ථාවන්හිදී භෞතික මායිම්, අදාළ කලාපයේ මායිම ලෙස සැලකිය යුතු වන්නේය.

7.4.26. පොදු එළිමහන් හා විනෝද කටයුතු සැලසුම මඟින් හඳුනාගෙන ඇති පොදු එළිමහන් ප්‍රදේශ ක්‍රීඩා හා විනෝද කටයුතු සඳහා වන ප්‍රදේශ එකී කලාපයන්හි අනුමත භාවිතයන් සඳහා පමණක් යොදා ගත යුතුවේ.

7.4.27. සුසාන භූමි හෝ සොහොන් පිටි ඇතුලත කුමන හෝ සංවර්ධන කටයුත්තක් කිරීමේදී සුසාන භූමි ආඥාපනතේ මාර්ගෝපදේශ හා රෙගුලාසි අනුගමනය කල යුතුය.

7.4.28. අනුමත සුසාන භූමි වලින් පිටත ස්මාරක හා සොහොන් කොත් ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා දෙනු නොලැබේ.

7.4.29. ඉඩමක් හෝ ඉඩම් කොටසක් සුසාන භූමියක් ලෙස වෙන් කිරීමට පෙර අධිකාරියේ අවසරය ලබාගත යුතු වේ.

7.4.30. සුසාන භූමියක් ප්‍රතිස්ථාපනය කිරීමේදී හෝ නව ඉදිකිරීමකදී හෝ අදාහනාගාරයක් ඉදිකිරීමකදී අධිකාරියෙන් අනුමැතියක් ලබාගත යුතු වන්නේය.

7.4.31. හඳුනාගන්නා ලද පාරිසරික සංවේදී විශේෂ ප්‍රදේශ සඳහා ප්‍රේරක කලාප හෝ රක්ෂිතයන් යම් නීතියක්, රෙගුලාසියක් යටතේ වෙන්කර නොමැති අවස්ථාවක එහි ප්‍රේරක කලාප නම් කිරීම, එහි සංවර්ධන කටයුතු සීමා කිරීම හෝ තහනම් කිරීමේ බලය නාගරික සංවර්ධන අධිකාරිය සතු වන්නේය.

7.4.32. යම් භූමි භාගයක් හෝ දේපලක් කුමන හෝ භාවිතයක් සඳහා සංවර්ධන සැලසුම් තුළ සඳහන් කර නොමැති අවස්ථාවන්හිදී, එය යම් භාවිතයක් සඳහා යෝජනා කරන විට පවතින භූමි භාවිතය හා පරස්පර නොවිය යුතුය.

7.4.33. විශේෂ ව්‍යාපෘති ප්‍රදේශ සඳහා පනවනු ලබන විශේෂ රෙගුලාසි මෙම සැලසුමේ දක්වා ඇති රෙගුලාසි අභිනියෝජනය කරනු ඇත.

7.4.34. අනාගතයේදී ඇතිවිය හැකි විශේෂ තත්ත්වයන් හා සංවර්ධනයන් හේතුවෙන් කලාප සාධකය අඩු කිරීමට හා ඉහල නැංවීමේ බලය නාගරික සංවර්ධන අධිකාරිය සතුවේ.

7.4.35. ජල ප්‍රභවයකට යාබදව පිහිටි ඉඩමක් නම් එහි රක්ෂිතය සහ මාර්ගෝපදේශයන් පිළිබඳ අදාළ ආයතන මඟින් නිර්දේශ ලබාගත යුතුය.

08 වන පරිච්ඡේදය

සංවර්ධන කලාප නියමතා

2005 නොවැම්බර් මස 17 දින අංක 1419/10 දරණ ගැසට් නිවේදනය මගින් විසල් දඹුල්ල සංවර්ධන ප්‍රදේශය ප්‍රකාශයට පත් කරන ලදි. ඒ මගින් දඹුල්ල නගරය ප්‍රධාන කොට ඇති උප නගර 5 ක් සංවර්ධනය කිරීම සඳහා යෝජනා කර ඇත. ඉන් දඹුල්ල නාගරික ප්‍රදේශයේ විවිධ කලාප සහ ඒවා සඳහා පිලියෙල කරන ලද කලාපීකරණ රෙගුලාසි පහත දැක්වේ.

8.1. යෝජිත භූමි පරිහරණ කලාප

විසල් දඹුල්ල ප්‍රදේශය සඳහා කලාපීකරණ සිතියමේ දක්වා ඇති පරිදි භාවිතා කලාප පහත සදහන් පරිදි වේ.

1. පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය
2. ගුවන් තොටුපල කලාපය
3. පරිසර සංරක්ෂණ කලාපය
4. කාර්මාන්ත කලාපය
5. මිශ්‍ර සංවර්ධන කලාපය - I
6. මිශ්‍ර සංවර්ධන කලාපය - II
7. මිශ්‍ර නේවාසික කලාපය
8. සංචාරක සංවර්ධන කලාපය
9. ස්වභාවික තෙත්බිම් සංරක්ෂිත කලාපය
10. කුඹුරු වගා සහ තෙත්බිම් කෘෂිකාර්මික කලාපය

8.2. යෝජිත කලාපීකරණ නියමතා

විසල් දඹුල්ල සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත සංවර්ධන කලාප දහයක් (10) හඳුනාගෙන ඇති අතර, එයට අදාළ සංවර්ධන නියමතා පහත පරිදි වේ.

8.2.1. පුරාවිද්‍යා සංරක්ෂිත කලාපය

මෙම කලාපය ඓතිහාසික රංගිරි දඹුල්ල රජමහා විහාරය, සීගිරි පුරාවිද්‍යා ප්‍රදේශය, නාමල් උයන පුරාවිද්‍යා ප්‍රදේශය හා මැණික්දෙන පුරාවිද්‍යා ස්ථානය අයත් වේ.

මෙම කලාපය තුළ පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු වලට අවහිරතාවයක් හෝ බාධාවක් නොවන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත සංවර්ධන කටයුතු නිර්දේශ කිරීමේ බලය අධිකාරිය සතු වේ.

8.2.1.1. පුරාවිද්‍යා සංරක්ෂණ කලාපයට අදාළ නියමතා

කලාපීකරණ සීමාවන්	*සිතියම් අංක 7.1 හි දක්වා ඇත.*
කලාපීකරණ සංගුණකය	-
අවසරලත් උපරිම ගොඩනැගිලි උස සීමාව	*බිම් මහළ පමණි. ගොඩනැගිල්ලේ වහළයේ උස උපරිම මීටර් 06 කට නොවැඩි විය යුතුය.*
ගෙබිම් අනුපාතය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ 6 වන උපලේඛනයේ සදහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
උපරිම බිම් කට්ටි ආවරණය	*25%*
වෙනත් විස්තර	*පුරාවිද්‍යා සංරක්ෂිත කලාපයේ කටයුතු වලට අවහිරතාවයක් හෝ බාධාවක් නොවන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත සංවර්ධන කටයුතු නිර්දේශ කිරීමේ බලය නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.* *පුද්ගලික ඉඩම් සඳහා අවම බිම්කට්ටි ප්‍රමාණය පර්චස් 20 විය යුතු අතර අනෙකුත් ඉඩම් තවදුරටත් අනුබෙදුම් කිරීමට අවසර ලබා නොදේ.*

8.2.2. ගුවන් තොටුපල කලාපය

මෙම කලාපය සීගිරිය ගුවන් හමුදා කඳවුර ආශ්‍රිත ස්ථාපිත කර ඇති ගුවන් පථය පදනම් කරගෙන යෝජිතව ඇත.

8.2.2.1. ගුවන් තොටුපල කලාපයට අදාළ කලාපීයකරණ නියමතා

කලාපීකරණ සීමාවන්	*සිතියම් අංක 7.1 හි දක්වා ඇත.*
කලාපීකරණ සංගුණකය	-
අවසරලත් උපරිම ගොඩනැගිලි උස සීමාව	*සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිර්දේශයන් අනුව*
උපරිම ගෙබිම් අනුපාතය	*සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිර්දේශයන් අනුව*
උපරිම බිම් කට්ටි ආවරණය	*සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිර්දේශයන් අනුව*
වෙනත් විස්තර	*මෙම කලාපය තුළ සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නිර්දේශිත භාවිතාවන් සඳහා පමණක් අදාල ආයතනයන්ගේ නිර්දේශයන්ට යටත්ව අවසර දෙනු ලැබේ.*

8.2.2.2. අවසරලත් භාවිතාවන්

මෙම කලාපය තුළ සිවිල් ගුවන් සේවා අධිකාරියේ භාවිතාවන් සඳහා පමණක් පුරා විද්‍යා සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතනයන්ගේ නිර්දේශයන්ට යටත්ව අවසර දෙනු ලැබේ.

8.2.3. පරිසර සංරක්ෂණ කලාපය

විසල් දඹුල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය පවතින කාලගුණ හා දේශගුණික පාරිසරික තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රදේශයේ භෞතික සංවර්ධන කටයුතු ස්වාභාවික පරිසරයට හානි නොවන පරිදි සංවර්ධනයේ ව්‍යාප්තිය සිදු කිරීම මෙම කලාපය වෙන් කිරීමේ මූලික අරමුණ වේ.

ජාත්‍යන්තර සම්මුතියකින්, දේශීය පනතකින් හෝ ගැසට් පත්‍රයක් මගින් ආරක්ෂක හෝ විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ මෙම කලාපයට ඇතුලත් වේ. තවද මෙම කලාපය තුල ප්‍රාදේශීය ලේකම් සතු බදු දෙනු ලබන ඉඩම් සහ පුද්ගලික ඉඩම්ද ඇතුලත් වේ.

8.2.3.1. පරිසර සංරක්ෂණ කලාපයට අයත් නියමතා

කලාපීකරණ සීමාවන්	*සිතියම් අංක 7.1 හි දක්වා ඇත.*
කලාපීකරණ සංගුණකය	*0.5*
අවසරලත් උපරිම ගොඩනැගිලි උස සීමාව	*මෙම කලාපය තුල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථා වල උපරිම උස මීටර 10 ක් විය යුතුය.*
ගෙබිම් අනුපාතය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ 6 වන උපලේඛනයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
උපරිම බිම් කට්ටි ආවරණය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
වෙනත් විස්තර	*මෙම කලාපය තුල සිදු කරන සියලුම ඉදිකිරීම් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගත යුතුය .* *සංචාරක කර්මාන්ත සඳහා අවම බිම් ප්‍රමාණය අක්කර 1ක් විය යුතු අතර නේවාසික භාවිතාවන් සඳහා අවම බිම් ප්‍රමාණය පර්චස් 20 අනෙකුත් ඉඩම් තවදුරටත් අනුබෙදුම් කිරීමට අවසර ලබා නොදේ.*

8.2.3.2. අවසර දෙනු ලබන භාවිතයන්

1. වර්තමානයේ පවතින භාවිතයන් එලෙසම පවත්වාගෙන යෑමටත් ඒවායේ අලුත් වැඩියා කටයුතු සිදු කරගෙන යාමට ඉඩ දෙනු ලැබේ.
2. සංරක්ෂිත උද්‍යාන
3. කෘෂි හා පුෂ්ප උද්‍යාන
4. පවත්නා කෘෂිකාර්මික කටයුතු
5. පදිංචිය සඳහා නේවාසික ගොඩනැගිලි - අවම බිම් ප්‍රමාණය පර්චස් 20
6. ගෘහස්ත කර්මාන්තයට අදාළ භාවිතාවන් - අවම බිම් ප්‍රමාණය පර්චස් 20
7. සංචාරක කර්මාන්තයට අදාළ භාවිතාවන් - අවම බිම් ප්‍රමාණය අක්කර 1
8. අධ්‍යාපනික පර්යේෂණ කටයුතු
9. ඛනිජ සම්පත් කැණීම
10. ස්වභාවික රක්ෂිත, අභය භූමි සහ අනෙකුත් වනාන්තර ප්‍රදේශවල වන සතුන්ට ආහාර සැපයෙන සහ පවතින දේශගුණික තත්වයන්ට ගැලපෙන දේශීය ශාක සහ ඖෂධීය ශාක වගා කිරීම.
11. වනාන්තර ප්‍රදේශවල මායිම් සීමා ලකුණු කිරීම සහ රක්ෂිත සීමා මායිම් ලකුණු කිරීම සහ ඒ සඳහා වන සතුන්ට හානි නොවන වැටවල් /ජීව වැටවල්.
12. වනාන්තර මායිම් තුල අලි වැටවල් ඉදිකිරීම.
13. වනාන්තර මායිම් තුල නිවැරදි සැලැස්මක් යටතේ අලි අගල් කැපීම.
14. ජීව වැටවල් ලෙස රක්ෂිත මායිම් තුල දෙහි, දොඩම්, හණ ශාක වගා කිරීම.
15. අලි මංකඩ පිහිටා ඇති ස්ථාන හඳුනා ගැනීම සහ අලි මංකඩ නිදහස්කර පවත්වාගෙන යාම.
16. ස්වභාවික මංතීරු
17. නැරඹුම් ස්ථාන

අවසර ලබා නොදෙන භාවිතයන්

- පවතින හරිත රටාවට අනුශාංගික නොවන හා එයට අවහිරතාවයක් හෝ බාධාවක් ඇතිවන කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර ලබා නොදේ.

පරිච්ඡේදය 08
සංවර්ධන
කලාප නියමතා

යෝජිත කලාපීකරණ
නියමතා

කර්මාන්ත කලාපය

8.2.4. කර්මාන්ත කලාපය

කර්මාන්ත කලාපය A6 මාර්ගය A9 මාර්ගය සම්බන්ධ වන පරිදි ඇතාබැදිවැව - පන්නම්පිටිය මාර්ගයට යාබදව යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය හා කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය පදනම් කර ගනිමින් යෝජනා කර ඇති අතර, විසල් දඹුල්ල කලාපයේ ආනයන සංවර්ධනයට අදාළ ආයෝජන දිරි ගැන්වීම සඳහා මෙම කර්මාන්ත කලාපය ආයෝජන සඳහා වෙන්කර ඇත.

8.2.4.1. කලාපයට අදාළ නියමතා

කලාපීකරණ සීමාවන්	*සිතියම් අංක 7.1 හි දක්වා ඇත.*
කලාපීකරණ සංගුණකය	*0.75*
අවසරලත් උපරිම ගොඩනැගිලි උස සීමාව	*කලාපීකරණ සංගුණකය අනුව*
ගෙබිම් අනුපාතය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ 6 වන උපලේඛනයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
උපරිම බිම් කට්ටි ආවරණය	*නේවාසික 66%* *නේවාසික නොවන 80%*
වෙනත් විස්තර	*යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගයට අදාළ රෙගුලාසි සහ යෝජිත කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගයට අදාළ රෙගුලාසි මෙම කලාපයේ සංවර්ධන කටයුතු සඳහා අදාල වේ.*

8.2.4.2. අවසරලත් භාවිතාවන්

අවසරලත් භාවිතයන්		***අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)***	***උපරිම ගෙබිම් ප්‍රමාණය***
නිෂ්පාදන හා කර්මාන්ත	*කාර්මික උද්‍යාන*	*4000*	
	තාක්ෂණික කර්මාන්ත	*2000*	
	කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත	*2000*	
	ගල් වලවල් හා ඇඹරුම් කර්මාන්ත	*500*	
	පැල තවාන් කර්මාන්ත	*500*	
	ගොවිපල කර්මාන්ත	*500*	
	මිරිදිය මත්ස්‍ය කර්මාන්ත	*500*	
	මධ්‍යම පරිසර අධිකාරිය නිර්දේශ කරනා වෙනත් කර්මාන්ත	*500*	

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
සේවා කර්මාන්ත	සේවා මධ්‍යස්ථාන	1000	
	රථ වාහන අලුත් වැඩියා කිරීම	1000	
	ධාන්‍ය ඇඹරුම් හල්	500	
	වෑල්ඩින් හා පෑස්සුම් කර්මාන්ත	500	
	විදුලි උපකරණ අලුත් වැඩියා කර්මාන්ත	500	
	මධ්‍යම පරිසර අධිකාරිය නිර්දේශ කරනා වෙනත් කර්මාන්ත	500	
නේවාසික	පදිංචිය සඳහා නිවාස	250	
	නිවාස ඒකක	250	
වාණිජ	කඩ කාමර	150	
	සුපිරි වෙළඳසැල්	1000	
	ආපන ශාලා	250	
	විවෘත වෙළඳ පොළ (සති පොළ)	1000	
	ෆාමසි	150	
	රසායනාගාර සේවා හා සාම්පල් එක්රැස් කිරීමේ මධස්ථාන	150	
	පාරිභෝගික සේවා මධස්ථාන	150	
	ඉන්ධන පිරවුම් හල්	1000	
	ඉන්ධන පිරවුම් හල් හා වාහන සේවා මධ්‍යස්ථාන	2000	
	ඉන්ධන පිරවුම් හල් හා සුපිරි වෙළඳ සැල්	2000	
	ගෑස් පිරවුම් හල් හා විදුලි ආරෝපණ මධස්ථාන	500	
	රථ ගාල්	1000	
අවසර නොදෙන භාවිතයන්	පුපුරණ ද්‍රව්‍ය ගබඩා හා නිෂ්පාදන කර්මාන්ත		
	දූෂ්‍යකාරක කර්මාන්ත		

8.2.5. මිශ්‍ර සංවර්ධන කලාපය - I

මෙම කලාපය දඹුල්ල නගරය, ගලේවෙල නගරය, නාඋල නගරය, හබරණ නගරය, දිගම්පතහ හා මඩාටුගම නගරය පදනම් කරගෙන ඉදිරි සංවර්ධන අවශ්‍යතා සඳහා ඉඩ ප්‍රස්ථාව ලබාදීමට අදාළව මෙම කලාපයේ සංවර්ධන නියමතා සකස් කර ඇත.

8.2.5.1. මිශ්‍ර සංවර්ධන කලාපය I ට අදාළ නියමතා

කලාපීකරණ සීමාවන්	*සිතියම් අංක 7.1 හි දක්වා ඇත.*
කලාපීකරණ සංගුණකය	*2*
අවසරලත් උපරිම ගොඩනැගිලි උස සීමාව	*කලාපීකරණ සංගුණකය අනුව*
ගෙබිම් අනුපාතය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ 6 වන උපලේඛනයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
උපරිම බිම් කට්ටි ආවරණය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
වෙනත් විස්තර	1. *යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගයට අදාළ නියමතා මෙම කලාපයේ සංවර්ධන කටයුතු වලට අදාළ වේ.* 2. *යෝජිත හබරණ - කුරුණෑගල දුම්රිය මාර්ගයට අදාළ රෙගුලාසි මෙම කලාපයේ සංවර්ධන කටයුතු වලට අදාළ වේ.* 3. *මෙම කලාපය තුළ වෙනත් ජාතික මට්ටමේ ව්‍යාපෘති-යක් ක්‍රියාත්මක වන්නේ නම් එයට අදාළ රෙගුලාසි මෙම කලාපයේ සංවර්ධන කටයුතු වලට අදාළ වේ.* 4. *පුරාවිද්‍යාත්මක හා සංචාරක වටිනාකමකින් යුතු ස්ථානවල දර්ශන පථය ආවරණය වන ස්ථානයන්හි ඉදිකරන ගොඩ-නැගිලි වල උපරිම උස ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීමෙන් පසු තීරණය කරනු ලැබේ.*

8.2.5.2. අවසරලත් භාවිතාවන්

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
නේවාසික	පදිංචිය සඳහා නිවාස	150	
	නිවාස සංකීර්ණ	500	
	නිල නිවාස	150	
	මැඩිහිටි නිවාස	1000	
	විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා ගොඩනැගිලි	1000	
	ළමා නිවාස	1000	
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	500	
	නිවාස ඒකක	150	
සෞඛ්‍ය	පෞද්ගලික රෝහල්	1000	
	රජයේ රෝහල්	1000	
	වෛද්‍ය මධ්‍යස්ථාන	250	
	විද්‍යාගාර හා සාම්පල එකතු කිරීමේ ස්ථාන	150	
	ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන	250	
	සත්ව සායන මධ්‍යස්ථාන	150	
	සත්ව ප්‍රතිකාර රෝහල්	250	
	ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන	250	
වාණිජ භාවිතයන්	සුපිරි වෙළඳසැල්	250	
	සාප්පු සංකීර්ණ	500	
	රථවාහන අමතර කොටස් අලෙවි ස්ථාන	150	
	පලතුරු සහ එළවළු අලෙවි මධ්‍යස්ථාන	150	
	කුඩා පරිමාණ ගබඩා	1000	
	මහා පරිමාණ ගබඩා සංකීර්ණ	2000	
	කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානය	1000	
	රථවාහන ගාල් කිරීමේ සංකීර්ණ	1000	
	ෆාමසි	150	
	රථවාහන අලෙවි ස්ථාන	1000	
	තොග වෙළඳ මධ්‍යස්ථාන	500	
	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (Custermer care)	150	
	මත්පැන් අලෙවි සැල්	150	
	උත්සව ශාලා	1000	
	අවමංගල කටයුතු සඳහා අදාළ කුඩා පරිමාණ මල්ශාලා	500	

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
වාණිජ භාවිතයන්	අවමංගල කටයුතු සඳහා අදාළ මහා පරිමාණ මල්ශාලා (උත්සව ශාලා)	1000	
	ආපන ශාලා	150	
	සතිපොළ භූමි	2000	
	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැළ	500	
	ඉන්ධන පිරවුම් හල් (ප්‍රධාන මංසන්ධියේ සිට මීටර් 500 ක් ඇතුලත ඉඩ දෙනු නොලැබේ)	1000	
	ඉන්ධන පිරවුම් හල හා වාහන සේවා මධ්‍යස්ථාන (ප්‍රධාන මංසන්ධියේ සිට මීටර් 500 ක් ඇතුලත ඉඩ දෙනු නොලැබේ)	2000	
	ඉන්ධන පිරවුම් හල හා සාප්පු සංකීර්ණය (ප්‍රධාන මංසන්ධියේ සිට මීටර් 500 ක් ඇතුලත ඉඩ දෙනු නොලැබේ)	1000	
	ගෑස් පිරවුම් මධ්‍යස්ථාන හා විදුලිය ප්‍රති ආරෝපණය කිරීමේ මධ්‍යස්ථානය	1000	
	ගොඩනැගිල මත විදුලි සාම්ප්‍රේෂණ කුළුණු	150	
	විදුලි සාම්ප්‍රේෂණ කුළුණු	250	
	විවෘත රථ වාහන නැවතුම් ස්ථාන	500	
	ප්‍රදර්ශනාගාර	500	
අධ්‍යාපන	පූර්ණ ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	500	
	තාක්ෂණ විද්‍යාල/වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	1000	
	පෞද්ගලික උපකාර පන්ති	500	
	වෙනත් අධ්‍යාපන ආයතන	250	
	සංස්කෘතික මධ්‍යස්ථාන හා රංග ශාලා	1000	
	විශ්ව විද්‍යාල/තාක්ෂණ විශ්ව විද්‍යාල	4000	
	විද්‍යා හා තාක්ෂණ ආයතන	2000	
	ජීව විද්‍යාත්මක පර්යේෂණ මධ්‍යස්ථාන	4000	
	රසායනාගාර හා විද්‍යාගාර	2000	
	ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා	4000	
	විදුලි සංදේශ හා දත්ත සැකසුම් මධ්‍යස්ථාන	2000	
නිෂ්පාදන කර්මාන්ත	ආහාර හා මධ්‍යසාර නොවන කර්මාන්ත	500	
	අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ කර්මාන්ත	1000	
	ගෘහ කර්මාන්ත	250	
	පරිසර දූෂණයෙන් තොර කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත	500	
සේවා කර්මාන්ත	රථ වාහන අලුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථාන/වාහන පින්තාරු කිරීමේ මධ්‍යස්ථාන	500	
	කුළී රථ සේවා මධ්‍යස්ථාන	500	

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
සේවා කර්මාන්ත	රෙදි සේදීම්/පිරිසිදු කිරීමේ මධ්‍යස්ථාන	150	
	ධාන්‍ය ඇඹරුම් මධ්‍යස්ථාන	250	
	වෑල්ඩින් මධ්‍යස්ථාන	150	
	විදුලි උපකරණ අලුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථාන	150	
	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	250	
සමාජ සේවා හා මහජන සම්බන්ධතා	ප්‍රජා/සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	1000	
	ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	1000	
	මහජන පුස්තකාල	250	
	පුනරුත්ථාපන මධ්‍යස්ථාන	1000	
	නිරෝධායන මධ්‍යස්ථාන	1000	
සංචාරක	ආගන්තුක නිවාස හා ලැගුම්හල්	150	
	නාගරික හෝටල්	500	
	සංචාරක හෝටල්	1000	
	සංචාරකයින් සඳහා වන තොරතුරු ලබා ගැනීමේ මධ්‍යස්ථාන	150	
	ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන/ සම්භාහන මධ්‍යස්ථාන (Spa)	250	
	සෆාරි ජීප් රථ මධ්‍යස්ථාන	500	
	සංචාරකයින් සඳහා වූ කුළී රථ මධ්‍යස්ථාන	500	
	අත්කම්/සිහිවටන භාණ්ඩ අලෙවි මධ්‍යස්ථාන	150	
	වායු බැලුන් මෙහෙය වන මධ්‍යස්ථාන	1000	
විවේක හා විනෝද කටයුතු	සිනමා ශාලා	1000	
	ගෘහස්ථ ක්‍රීඩාගාර	1000	
	රංග ශාලා	1000	
	රාත්‍රී සමාජ ශාලා	1000	
	චිත්‍රාගාර හා කෞතුකාගාර	1000	
	එළිමහන් රංග ශාලා	2000	
	නාගරික උද්‍යාන	-	
	නාගරික වන ගොමු	-	
	ළමා උද්‍යාන	1000	
	හරිත තීරු	-	
අවසර නොදේ	පුපුරණ ද්‍රව්‍ය ගබඩා හා නිෂ්පාදන කර්මාන්ත		
	දූෂ්‍යකාරක කර්මාන්ත		

8.2.6. මිශ්‍ර සංවර්ධන කලාපය - II

මෙම කලාපය අපනයන සංවර්ධන අවශ්‍යතාවයන් සැළකිල්ලට ගනිමින් විසල් දඹුල්ල සංවර්ධන කලාපයේ ප්‍රධාන මාර්ග (A9, A6 කලාවැව ගලේවෙල මාර්ගය, මොරගහකන්ද මාර්ගය ආදි වශයෙන්) පදනම් කර ගනිමින් එම මාර්ග ආශ්‍රිත යෝජිතව ඇත.

8.2.6.1. මිශ්‍ර සංවර්ධන කලාපය II ට අදාළ නියමනා

කලාපීකරණ සීමාවන්	*සිතියම් අංක 7.6 හි දක්වා ඇත*
කලාපීකරණ සංගුණකය	*1.5*
අවසරලත් උපරිම ගොඩනැගිලි උස සීමාව	*කලාපීකරණ සංගුණකය අනුව*
ගොඩබිම් අනුපාතය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ 6 වන උපලේඛනයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
උපරිම බිම් කට්ටි ආවරණය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
වෙනත් විස්තර	1. *වයඹ ඇලට අදාළ රෙගුලාසි, මධ්‍යම අධිවේගී මාර්ගය හා සම්බන්ධ රෙගුලාසි හා කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගයට අදාළ රෙගුලාසි මෙම කලාපයේ සංවර්ධන කටයුතු වලට අදාළ වේ.* 2. *මෙම කලාපය තුළ වෙනත් ජාතික මට්ටමෙහි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන්නේ නම් එයට අදාළ රෙගුලාසි මෙම කලාපයේ සංවර්ධන කටයුතු වලට අදාළ වේ.* 3. *පුරාවිද්‍යාත්මක හා සංචාරක වටිනාකම්කන් යුතු ස්ථානවල දර්ශන පථය ආවරණය වන ස්ථානයන්හි ඉදිකරන ගොඩනැගිලි වල උපරිම උස ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීමෙන් පසු තීරණය කරනු ලැබේ.*

8.2.6.2. මිශ්‍ර සංවර්ධන කලාප II හි අවසරලත් භාවිතාවන්

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
නේවාසික	පදිංචිය සඳහා නිවාස	150	
	නිවාස සංකීර්ණ	500	
	නිවාස ඒකක	150	
	නිල නිවාස	250	
	මැඩිහිටි/ ආබාධිත අය සඳහා වූ නිවාස	1000	
	ළමා නිවාස	1000	
	දිවාසුරැකුම් මධ්‍යස්ථාන	500	
සෞඛ්‍ය	රෝහල්	2000	
	වෛද්‍ය මධ්‍යස්ථාන	250	
	වෛද්‍ය උපදේශන මධ්‍යස්ථාන	500	
	රසායනාගර හා සාම්පල් එකතු කිරීමේ මධ්‍යස්ථාන	150	
	ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන	250	
	පශු වෛද්‍ය හා ප්‍රතිකාර මධ්‍යස්ථාන	250	
වාණිජ	සුපරි වෙළඳසැල්	250	
	සාප්පු සංකීර්ණ	1000	
	මහපරිමාණ තාක්ෂණික මෙවලම් මධ්‍යස්ථාන	500	
	රථගාල්	1000	
	කඩ කාමර	150	
	ෆාමසි	150	
	තොග බඩු වෙළඳසැල්	500	
	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	150	
	මත්පැන් අලෙවිසැල්	150	
	අවමංගල්‍ය මල්ශාලා	500	
	අවමංගල්‍ය උත්සව ශාලා	1000	
	උත්සව ශාලා (වෙනත්)	1000	
	ආපන ශාලා	250	
	විවෘත වෙළඳ පොළ/සතිපොළ	1000	
	ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිසැළ	500	
	ඉන්ධන පිරවුම්හල් (ප්‍රධාන මංසන්ධියක සිට මීටර් 500ක් ඇතුලත අවසර ලබා නොදේ)	1000	

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
වාණිජ	ඉන්ධන පිරවුම් හා වාහන සේවා ස්ථාන (ප්‍රධාන මංසන්ධියක සිට මීටර් 500ක් ඇතුලත අවසර ලබා නොදේ)	2000	
	ඉන්ධන පිරවුම්හල් සහ සුපර් මාකට් (ප්‍රධාන මංසන්ධියක සිට මීටර් 500ක් ඇතුලත අවසර ලබා දේ)	1000	
	ගෑස් පිරවුම් ස්ථාන හා විදුලිය ආරෝපණ මධ්‍යස්ථාන (ප්‍රධාන මංසන්ධියක සිට මීටර් 500ක් ඇතුලත අවසර ලබා දේ)	500	
	දුරකථන සම්ප්‍රේෂණ කුළුණු (ගොඩනැගිලිමත)	150	
	දුරකථන කුළුණු	250	
	රථගාල්	250	
	ප්‍රදර්ශනාගාර	500	
	එළවළු හා පලතුරු වෙළඳසැල්, මාළු හා මත්ස්‍ය වෙළඳසැල්	150	
	පොහොර සහ කෘමි නාශක අලෙවිසැල්	250	
	බීජ රෝපණ ද්‍රව්‍ය අලෙවිසැල්	150	
	විසිතුරු පැල අලෙවිසැල්	150	
	විසිතුරු මාළු අලෙවිසැල්	150	
අධ්‍යාපන	පූර්ණ ළමාවිය මධ්‍යස්ථාන	250	
	තාක්ෂණ විද්‍යාල/වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන	1000	
	පෞද්ගලික උපකාරක පන්ති	500	
	සංස්කෘතික මධ්‍යස්ථාන සහ කලාගාර	500	
	අධ්‍යාපන කටයුතු වලට අදාළ වෙනත්	500	
	විශ්ව විද්‍යාල/තාක්ෂණ විශ්ව විද්‍යාල	4000	
	විද්‍යා හා තාක්ෂණ ආයතන	2000	
	ජීව විද්‍යාත්මක පර්යේෂණ මධ්‍යස්ථාන	4000	
	රසායනාගාර හා විද්‍යාගාර	2000	
ආයතන	බැංකු, රක්ෂණ හා මූල්‍ය ආයතන	150	
	කාර්යාල ගොඩනැගිලි	150	
	කාර්යාල සංකීර්ණ	1000	
	වෘත්තීය කාර්යාල	150	
නිෂ්පාදන හා කර්මාන්ත	ආහාර හා මධ්‍යසාර නොවන කර්මාන්ත	500	
	මල්පැල තවාන්	500	
	මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන	500	
	ගොවිපල	2000	
	ගෘහ කර්මාන්ත (සේවක සංඛ්‍යාව 4 නොඉක්මන, ස්වයං රැකියා)	250	

	අවසරලත් භාවිතයන්	අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
සේවා කර්මාන්ත	රථවාහන සේවා මධ්‍යස්ථාන (Service Center)	1000	
	වාහන අලුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථාන හා පින්තාරු කිරීමේ	500	
	කුළී රථ සේවා මධ්‍යස්ථාන	250	
	රෙදි වේලීම හා පිරිසිදු කිරීමේ මධ්‍යස්ථාන	150	
	ධාන්‍ය ඇඹරුම් හල්	250	
	වෑල්ඩින් හා පෑස්සුම් මධ්‍යස්ථාන	500	
සමාජ සේවා කටයුතු මහජන සම්බන්ධතා	විදුලි උපකරණ අලුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථාන	150	
	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	250	
	සංස්කෘතික මධ්‍යස්ථාන	1000	
	ශ්‍රවනාගාර හා සම්මන්ත්‍රණ ශාලා	1000	
	මහජන පුස්තකාල	150	
	පුනරුත්තාපන මධ්‍යස්ථාන	500	
	නිරෝධායන මධ්‍යස්ථාන	1000	
සංචාරක	නිවාඩු නිකේතන	500	
	ආගන්තුක නිවාස	250	
	නාගරික සංචාරක හෝටල් (City Hotel)	500	
	සංචාරකයින් සඳහා වන තොරතුරු ලබා ගැනීමේ මධ්‍යස්ථාන	150	
	ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන		
	/ සම්භාෂණ මධ්‍යස්ථාන (Spa)	250	
	සෆාරි ජීප් රථ මධ්‍යස්ථාන	500	
	සංචාරකයින් සඳහා වූ කුළී රථ මධ්‍යස්ථාන	500	
	අත්කම්/සිහිවටන භාණ්ඩ අලෙවි මධ්‍යස්ථාන	150	
	වායු බැලුන් මෙහෙය වන මධ්‍යස්ථාන	1000	
විවේක හා විනෝද කටයුතු	සිනමා ශාලා	1000	
	ගෘහස්ථ ක්‍රීඩාංගණ	1000	
	රංග ශාලා	1000	
	රාත්‍රි සමාජ ශාලා	1000	
	චිත්‍රාගාර හා කෞතුකාගාර	1000	
	එළිමහන් රංග ශාලා	2000	
	නාගරික උද්‍යාන	-	
	නාගරික වන ගොමු	-	
	ළමා උද්‍යාන	1000	
	හරිත තීරු	-	

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
අවසර නොදෙන භාවිතාවන්	පුපුරණ ද්‍රව්‍ය ගබඩා හා නිෂ්පාදන කර්මාන්ත	-	-
	දූෂ්‍යකාරක කර්මාන්ත	-	-

8.2.7. මිශ්‍ර නේවාසික කලාපය

විසල් දඹුල්ල යෝජිත සංවර්ධන බල ප්‍රදේශයේ නේවාසික භාවිතාවන් බහුල වශයෙන් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ පදනම් කර ගනිමින් නේවාසික භාවිතාවන්ට මූලිකත්වය ලබා දෙමින් ඊට අදාළ වෙනත් සංවර්ධන අවශ්‍යතාව ලබා දීම අරමුණ කර ගනිමින් මිශ්‍ර නේවාසික කලාපය යොජනා කර ඇත.

8.2.7.1. මිශ්‍ර නේවාසික කලාපයට අදාළ කලාපීයකරණ නියමතා

කලාපීකරණ සීමාවන්	සිතියම් අංක 7.1 හි දක්වා ඇත
කලාපීකරණ සංගුණකය	1.0
අවසරලත් උපරිම ගොඩනැගිලි උස සීමාව	කලාපීකරණ සංගුණකය අනුව
ගෙබිම් අනුපාතය	අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ 6 වන උපලේඛනයේ සදහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.
උපරිම බිම් කට්ටි ආවරණය	අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ සදහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.
වෙනත් විස්තර	1. කෘෂිකර්මාන්තය සහ නේවාසික භාවිතය සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ. 2. කෘෂිකාර්මික ඉඩම් වාණිජමය භාවිතයන් බවට පත් කිරීමට අවසර ලබා දෙනු නොලැබේ

8.2.7.2. මිශ්‍ර නේවාසික කළාපයේ අවසරලත් භාවිතයන්

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
නේවාසික	පදිංචිය සඳහා නිවාස	250	
	නිවාස ඒකක	150	
	නිවාස සංකීර්ණ	500	
	ආගන්තුක නිවාස	250	
	නිළ නිවාස	250	
	වැඩිහිටි හා අබාධිතයන් සඳහා වූ නිවාස	1000	
	ළමා නිවාස	1000	
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	500	
සෞඛ්‍ය	වෛද්‍ය මධස්ථානය (එක් වෛද්‍යවරයකුගේ සේවය ලබා දෙන)	150	
	වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන	500	
	මාතෘ හා ළමා සායන	500	
	පශු වෛද්‍ය රෝහල්	500	
	පශු වෛද්‍ය සායන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන	500	
	ආයුර්වේද වෛද්‍ය මධස්ථාන	250	
අධ්‍යාපන	පූර්ව ළමාවිය සංවර්ධන මධස්ථාන	250	
	ප්‍රාථමික අධ්‍යාපන ආයතන	4000	
	ද්වීතික අධ්‍යාපන ආයතන	4000	
	උසස් අධ්‍යාපන ආයතන	4000	
	පෞද්ගලික අධ්‍යාපන ආයතන	500	
ආයතන	කාර්යාල	250	
	බැංකු රක්ෂණ හා මූල්‍ය ආයතන	250	
සමාජ හා පොදු පහසුකම්	ප්‍රජා සංවර්ධන මධස්ථාන	250	
	සංස්කෘතික මධ්‍යස්ථාන	250	
	ආගමික මධස්ථාන	1000	
	ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	1000	
	මහජන පුස්ථකාල	250	
	පුනරුත්ථාපන මධ්‍යස්ථාන	500	
	අදාහනාගාර	500	
	සුසානභූමි	2000	

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
වාණිජ	කඩ කාමර	150	
	සුපිර් වෙළඳසැල්	250	
	උත්වස ශාලා	1000	
	ආපන ශාලා	250	
	විවෘත වෙළඳ පොළ (සති පොළ)	1000	
	ෆාමසි	150	
	රසායනාගාර සේවා හා සාම්පල් එක්රැස් කිරීමේ මධස්ථාන	150	
	පාරිභෝගික සේවා මධස්ථාන	150	
	අවමංගල්‍ය ශාලා	500	
	අවමංගල්‍ය ශාලා හා අවමංගල උත්සව ශාලා	1000	
	ඉන්ධන පිරවුම් හල්	1000	
	ඉන්ධන පිරවුම් හල් හා වාහන සේවා මධ්‍යස්ථාන	2000	
	ඉන්ධන පිරවුම් හල් හා සුපිරි වෙළඳ සැල්	2000	
	ගෑස් පිරවුම් හල් හා විදුලි ආරෝපණ මධස්ථාන	500	
	රථ ගාල්	1000	
සංචාරක	ආගන්තුක නිවාස හා ලගුම්හල්	250	
	සංචාරක හෝටල්	1000	
	සංචාරකයින් සඳහා වන තොරතුරු ලබා ගැනීමේ මධ්‍යස්ථාන	150	
	ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන	250	
	කබානා හෝටල් සහ අනෙකුත් හෝටල්	1000	
	සෆාරි ජීප් රථ මධ්‍යස්ථාන	500	
	සංචාරකයින් සඳහා වූ කුළී රථ මධ්‍යස්ථාන	500	
	අත්කම්/සිහිවටන භාණ්ඩ අලෙවි මධ්‍යස්ථාන	150	
	වායු බැලුන් මෙහෙය වන මධ්‍යස්ථාන	1000	
නිෂ්පාදන හා කර්මාන්ත	ආහාර හා මධ්‍යසාර නොවන කර්මාන්ත	500	
	මල්පැල තවාන්	500	
	මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන	500	
	ගොවිපල	2000	
	ගෘහ කර්මාන්ත	250	
සේවා කර්මාන්ත	රථවාහන සේවා මධ්‍යස්ථාන (Service Center)	500	
	වාහන අලුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථාන හා පින්තාරු කිරීමේ	500	
	කුළී රථ සේවා මධ්‍යස්ථාන	250	

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
සේවා කර්මාන්ත	රෙදි වේලීම හා පිරිසිදු කිරීමේ මධ්‍යස්ථාන	150	
	ධාන්‍ය ඇඹරුම් හල්	250	
	වෑල්ඩින් පැසසුම්	250	
	විදුලි උපකරණ අලුත් වැඩියා කිරීමේ මධ්‍යස්ථාන	150	
විනෝද කටයුතු	සිනමා ශාලා	1000	
	ගෘහස්ථ ක්‍රීඩාංගණ	1000	
	රංග ශාලා	1000	
	රාත්‍රි සමාජ ශාලා	1000	
	චිත්‍රාගාර හා කෞතුකාගාර	1000	
	එළිමහන් රංග ශාලා	2000	
	නාගරික උද්‍යාන	-	
	නාගරික වන ගොමු	-	
	ළමා උද්‍යාන	1000	
	හරිත තීරු	-	
අවසර නොදෙන	පුපුරණ ද්‍රව්‍ය ගබඩා හා නිෂ්පාදන කර්මාන්ත	-	
	දූෂ්‍යකාරක කර්මාන්ත	-	

8.2.8. සංචාරක සංවර්ධන කලාපය

ඉබ්බන්කටුව මහා ශිලා සුසානය, ඓතිහාසික දඹුල්ල රජමහා විහාරය, ඉබ්බන්කටුව ජලාශය, ජාතික නාමල් උයන ආරණ්‍ය සේනාසනය, මඩාටුගම හා ලෝක උරුම සීගිරිය පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක කේන්ද්‍රස්ථානය විසල් දඹුල්ල ප්‍රදේශය පත් කිරීම අරමුණු කර ගනිමින් අනාගත සංචාරක සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා මෙම කලාපය යෝජිතව ඇත.

8.2.8.1. සංචාරක සංවර්ධන කලාපයට අදාළ නියමතා

කලාපීකරණ සීමාවන්	*සිතියම් අංක 7.1 හි දක්වා ඇත*
කලාපීකරණ සංගුණකය	*0.5*
අවසරලත් උපරිම ගොඩනැගිලි උස සීමාව	*බිම් මහල සහ තවත් එක් මහලක් සඳහා පමණක් අවසර ලබාදේ. බිම් මට්ටමේ සිට ගොඩනැගිල්ලේ මහලයේ මුදුන දක්වා උස උපරිම මීටර් 10 කට නොවැඩි විය යුතුය.*
ගෙබිම් අනුපාතය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ 6 වන උපලේඛනයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
උපරිම බිම් කට්ටි ආවරණය	*අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.*
වෙනත් විස්තර	1. *මෙම කලාපය තුල යම් භාවිතාවක් සඳහා අවසර ලබා දීමේදී සංචාරක කර්මාන්තයෙහි භාවිතයන් සඳහා ප්‍රමුඛතාවය ලබාදේ.* 2. *අධිකාරිය විසින් ඉල්ලා සිටින පරිදි කලාපය තුළ කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ස්මාරක සහ ස්ථාන පිළිබඳ ජාත්‍යන්තර සභාව (ICOMOS), වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් නිර්දේශ ලබා ගත යුතුය.* 3. *පවතින හරිත රටාවට නොගැලපෙන ඕනෑම සංවර්ධන ක්‍රියාකාරකමක් සහ පවතින භූ දර්ශනයට බාධාවක් වන කිසිදු සංවර්ධනයකට ඉඩ ලබා දෙනු නොලැබේ.*

8.2.8.2. සංචාරක සංවර්ධන කලාපයේ අවසරලත් භාවිතාවන්

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
සංචාරක	නිවාඩු නිකේතන	-	
	ආගන්තුක නිවාස (කාමර 04 ට අඩු)	-	
	ආගන්තුක නිවාස (කාමර 04 ට වැඩි)	-	
	පාරිසරික සංචාරක හෝටල් (Eco Tourist Hotel)	1000	
	නාගරික හෝටල්	-	
	කබානා හෝටල්	-	
	තරු පන්තියේ සංචාරක හෝටල්	1000	
	ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන/ සම්භාහන මධ්‍යස්ථාන (Spa)	-	
	සංචාරකයින් සඳහා වන තොරතුරු ලබා ගැනීමේ මධ්‍යස්ථාන	150	
	සෆාරි ජීප් රථ මධ්‍යස්ථාන	1000	
	සංචාරකයින් සඳහා වූ කුළී රථ මධ්‍යස්ථාන	1000	
	අත්කම්/සිහිවටන භාණ්ඩ අලෙවි මධ්‍යස්ථාන	500	
	වායු බැලුන් මෙහෙය වන මධ්‍යස්ථාන	1000	
ශිල්පාදන හා කර්මාන්ත	ආහාර හා මධ්‍යසාර නොවන කර්මාන්ත	500	
	ගෘහ කර්මාන්ත	250	
	පරිසර දූෂණයෙන් තොර කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත	500	
සේවා කර්මාන්ත	පරිසර දූෂණයෙන් තොර කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත	500	
විනෝද කටයුතු	සිනමා ශාලා	1000	
	ගෘහස්ථ ක්‍රීඩාංගණ	1000	
	රංග ශාලා	1000	
	රාත්‍රි සමාජ ශාලා	1000	
	චිත්‍රාගාර හා කෞතුකාගාර	1000	
	එළිමහන් රංග ශාලා	1000	
	නාගරික උද්‍යාන	-	
	නාගරික වන ගොමු	-	
	ළමා උද්‍යාන	500	
	හරිත තීරු	-	

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
ආයතන	කාර්යාල	-	
	කාර්යාල සංකීර්ණය	-	
	වෘත්තීය කාර්යාලය	-	
	බැංකු, රක්ෂණ හා මූල්‍ය ආයතන	500	
නේවාසික	පදිංචිය සඳහා නිවාස	250	
	නිවාස ඒකක	150	
	නිවාස සංකීර්ණ	500	
	නිල නිවාස	250	
	වැඩිහිටි හා අබාධිත නිවාස	500	
	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	500	
	ළමා නිවාස	500	
වාණිජ	කඩ කාමර	150	
	සුපිරි වෙළඳසැල්	-	
	උත්වස ශාලා	1000	
	ආපන ශාලා	250	
	විවෘත වෙළඳ පොළ (සති පොළ)	2000	
	ෆාමසි	150	
	රසායනාගාර සේවා හා සාම්පල් එකරැස් කිරීමේ මධස්ථාන	150	
	පාරිභෝගික සේවා මධස්ථාන	150	
	ඉංධන පිරවුම් හල්	1000	
	ඉංධන පිරවුම් හල් හා වාහන සේවා මධ්‍යස්ථාන	2000	
	ඉංධන පිරවුම් හල් හා සුපිරි වෙළඳ සැල්	2000	
	ගෑස් පිරවුම් හල් හා විදුලි ආරෝපණ මධස්ථාන	500	
	රථ ගාල්	1000	
සෞඛ්‍ය	වෛද්‍ය මධස්ථානය (එක් වෛද්‍යවරයකුගේ සේවය ලබා දෙන)	150	
	වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන	500	
	මාතෘ හා ළමා සායන	500	
	පශු වෛද්‍ය රෝහල්	500	
	පශු වෛද්‍ය සායන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන	500	
	ආයුර්වේද වෛද්‍ය මධස්ථාන	250	

අවසරලත් භාවිතයන්		අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	උපරිම ගෙබිම් ප්‍රමාණය
සමාජ හා පොදු පහසුකම්	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	250	
	සංස්කෘතික මධ්‍යස්ථාන	1000	
	ආගමික මධ්‍යස්ථාන	1000	
	ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා	1000	
	මහජන පුස්තකාල	150	
	පුනරුත්ථාපන මධ්‍යස්ථාන	500	
	සුසානභූමි	1000	
අවසර බොලත්			

8.2.9. ස්වභාවික තෙත්බිම් සංරක්ෂිත කලාපය

ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීමට සහ පාලනය සඳහා හේතුවන තෙත්බිම්, ජල රැඳවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

8.2.9.1. ස්වභාවික තෙත්බිම් සංරක්ෂිත කලාපයට අදාළ නියමතා

කලාපීකරණ සීමාවන්	සිතියම් අංක 7.1 හි දක්වා ඇත
කලාපීකරණ සංගුණකය	0.5
අවසරලත් උපරිම ගොඩනැගිලි උස සීමාව	කුළුණු මත ඉදිවූ තනි මහලේ ගොඩනැගිලි සඳහා පමණක් අවසර ලබාදේ. උපරිම උස මීටර් 8 විය යුතුය.
ගෙබිම් අනුපාතය	අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ 6 වන උපලේඛනයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.
උපරිම බිම් කට්ටි ආවරණය	අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි වලට අනුකූල විය යුතුය.
වෙනත් විස්තර	1. තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපයේ ඉදිකරන සියලු ඉදිකිරීම් කුළුණු මත ඉදිවිය යුතුය. 2. මෙම කලාපයේ සියලු සංවර්ධන කටයුතු සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ සහ අදාල අනෙකුත් ආයතන වල නිර්දේශය ලබාගත යුතුය.

පරිච්ඡේදය 08
සංවර්ධන
කලාප නියමතා

යෝජිත කලාපීකරණ
නියමතා

ස්වභාවික තෙත්බිම්
සංරක්ෂිත කලාපය

8.2.9.2. ස්වභාවික තෙත්බිම් සංරක්ෂිත කලාපයේ අනුමත භාවිතයන්

1. තෙත්බිම් ස්වභාවික උද්‍යාන
2. පරිසර හිතකාමී අවන්හල්- වර්ග අඩි 1200 (කුළුණු මත ඉදිවූ)
3. කුඩා පරිමාණයේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන - (කුළුණු මත ඉදිවූ) වර්ග අඩි 1500, ආසන ධාරිතාවය - 75, වේදිකාව - 30'X 50'
4. එළිමහන් ශරීර සුවතා ප්‍රදේශ / ශාරීරික ව්‍යායාම් පහසුකම් ඇති ස්ථාන
5. තෙත්බිම් කෞතුකාගාර - වර්ග අඩි 1000 (කුළුණු මත ඉදිවූ)
6. කබානා (කුළුණු මත ඉදිවූ)
7. වියලි කාලගුණ තත්ත්වයේදී පමණක් ක්‍රීඩා කළ හැකි ස්ථාන
8. සම්ප්‍රදායික ධීවර කර්මාන්තය
9. මල් එකතු කිරීම
10. ජලාශ්‍රිත ගමනාගමනය
11. අලංකාර තෙත් බිම්
12. ජාතික වැදගත් කමක් සහිත රජයේ අනුමත පොදු අපරවසුහ ව්‍යාපෘති
13. නව මාර්මාර්ග ඉදිකිරීම /ගංවතුර ආරක්ෂණ ඉදිකිරීම
14. අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු
15. දැනට පවතින නේවාසික බාවිතාවන් එලෙසම පවත්වාගෙන යාමටත් නේවසික භාවිතාවයන් සදහා ක්ශේස්ත්‍ර පරීක්ශ්නයකින් තහවුරු කරගැනීමකින් පසුව මූලික අවශ්‍යතාවයක් ලෙස සැලකිල්ලට ගෙන බිම් මහලක් සදහා පමනක් අවසර ලබා දීම සලකා බලනු ලැබේ.

මෙම කලාපයේ වෙනත් කිසිදු භාවිතයක් සඳහා අවසර නොමැත.

8.2.9.3. අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම යටත් කරනු ලබන කොන්දේසි

අංකය	කලාප විශේෂිත සංවර්ධන කොන්දේසි	තෙත් බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය
1.	ගංවරතුර රැඳවුම් ධාරිතාව	ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව මගින් අනුමත මූලික සැලැස්මට අනුව පාලනය විය යුතු අතර, එය මාර්මාර්ග දෙපාර්තමේන්තුවට සහ තෙත්බිමේ නීතිමය අයිතිය පවතින ආයතනවල නීතිමය තත්වයට අනුකූල විය යුතුය.
2.	ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වන අවම බිම් කට්ටි ප්‍රමාණය	හෙක්ටයාර් 4 (අක්කර 10)
		කුඩා බිම් කට්ටි සඳහා ද අනුමත භාවිතයන් සමාන වන නමුත්, ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩ දෙනු නොලැබේ.
3.	උපරිම පිරවීම සඳහා අවසර දෙනු ලබන බිම් සීමාවන්	බිම් ප්‍රමාණයෙන් 2 % මාර්ග, වාහන නැවතුම්, වැසිකිළි සහ අපද්‍රව්‍ය බැහැර කිරීම් / ප්‍රතිකර්මයන් වැඩ බිම පාලනය සඳහා අවශ්‍ය නම් යොදා ගත හැකිය.

අංකය	කලාප විශේෂිත සංවර්ධන කොන්දේසි	තෙත් බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය
4.	උපරිම බිම් කට්ටි ආවරණය (ගොඩනැගිලි සඳහා යට වන ප්‍රදේශ)	මුළු ව්‍යාපෘති ප්‍රදේශයෙන් 1 % කි. කුළුණු මත සියළුම ගොඩනැගිලි අනුමත වේ. (මැසිකිළි හැර)
5.	අවසර ඇති උපරිම යටිතල පහසුකම් ව්‍යාපෘති (විදුලිය, ජලසැපයුම, දුරකථන, මහා මාර්ග ආදිය)	මුළු ව්‍යාපෘති ප්‍රදේශයෙන් 4% කි.
6.	වෙන වෙනම ගොඩනැගිලි සඳහා අනුමත උපරිම බිම් මහල විශාලත්වය	වර්ග මීටර් 100
7.	අවසර ඇති උපරිම ගොඩනැගිලි උස	පිහිටි පොළව මට්ටමේ සිට මීටර් 7 කි. (ප්‍රධාන සංකල්පයට ගැලපෙන පරිදි කුළුණු / නිරීක්ෂණ මධ්‍යස්ථාන, සැගවී සිට සතුන් නිරීක්ෂණය කල හැකි මධ්‍යස්ථාන හැර)
8.	ගොඩනැගිලි වර්ගය	සියළු ගොඩනැගිලි (මැසිකිලි හැර) තෙත්බිමෙහි කුළුණු මත ඉදිවිය යුතුය.(නොපිරවූ ප්‍රදේශ) ගොඩනැගිලි තනි තනිව පිහිටි හෝ දර්ශනීය සිත් ඇදගන්නා වූ වහල වලින් සමන්විත පොකුරු ලෙස තැබිය යුතුය. එහි දර්ශනීයත්වය විවෘත ප්‍රදේශයන්ට යාබද පොදු මාර්ග වලින් හා පොදු ප්‍රදේශ වලින් ආවරණය නොවන පරිසර හිතකාමී ලෙස පැවතිය යුතුය
9.	අනු බෙදුම්	අනුමැතිය නොමැත
10.	සීමා මායිම් ලකුණු කිරීම	මායිම් තාප්ප සඳහා අවසර නැත. පවතින උස් බිමකට යාවූ මායිමක් දිගේ පමණක් වැසි වතුර ගලා යාමට බාධා නොවන ලෙස, භූ දර්ශනයට ගැලපෙන, මායිම් වැටකට අනුමැතිය ලබා දිය හැක. අනෙකුත් මායිම් වල සීමාව සලකුණු කිරීම, භූ දර්ශනයට ගැලපෙන සලකුණු (මීටර් 10 ක අවම පරතරය සිටින සේ) යොදා සිදු කළ යුතුය. ඉහත අවස්ථා දෙකෙහිම එම වැඩ බිම විශේෂිත වන පදනමින් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියට යටත්ව සිදු කල යුතුය.
11.	විශේෂ අවස්ථාවන්හිදී ඉහත කොන්දේසි ලිහිල් කිරීම	වැදගත් පොදු අපර මහජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ දුර්ලභ අවස්ථාවකදී, ඉහත කොන්දේසි ලිහිල් කළ හැක.

8.2.10. කුඹුරු වගා සහ තෙත් බිම් කෘෂිකාර්මික කලාපය

පවතින වගා කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙනිය, ඔිවිට යනාදී අනුශාංගික ප්‍රදේශ තෙත්බිම් ආශ්‍රිත කෘෂි කර්මාන්තය සිදු කෙරෙන ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ. ජල මූලාශ්‍ර යන්නට මහා දඹුල්ල නාගරික බල ප්‍රදේශයේ පවතින ගංගා, ඇල, වැව්, ජලාශ අයත් වේ.

8.2.10.1. කුඹුරු වගා සහ තෙත් බිම් කෘෂිකාර්මික කලාපයට අදාළ නියමතා

I. මෙම කලාපීකරණය සැලැස්ම සහ මාර්ගෝපදේශ විසල් දඹුල්ල සංවර්ධන බල ප්‍රදේශය පිහිටි සියළු තෙත් බිම් සඳහා පමණක් වලංගු වේ.

II. දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන් වල තීව්‍රතාවය වැඩිවීම හා තෙත් බිම් වල සිදු කර ඇති ගොඩ කිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්‍රතාවය සැළකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ ඊට අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු, උපලේඛනයේ සඳහන් ආයතන වල නිර්දේශ අනුව සිදු කළ යුතුය.

III. පහත් බිමක්/පුරන්වූ කුඹුරු ඉඩමක් සහ වගා කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා සංවර්ධනය කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ සහ උපලේඛනයේ සඳහන් 01, 03,04,05,09 යන ආයතන වලින් නිර්දේශ / අනුමැතිය ලබා ගත යුතුයි. එසේම විවිධ පනත් මගින් තෙත් බිම් වල අයිතිය අදාළ ආයතන වල විෂය පථයට අයත් වන අවස්ථා වලදී එම ආයතන වලින් සහ අනෙකුත් අදාළ ආයතන වලින් අවශ්‍ය නිර්දේශය සහ අනුමැතිය ලබා ගත යුතුය.

IV. තෙත් බිම් ආශ්‍රිත පරිසරයට බලපෑම් ඇති විය හැකි ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා පහත උපලේඛනයේ සඳහන් අංක. 03 හා 05 දරණ ආයතන වලින් පරිසර නිර්දේශය හෝ පාරිසරික අනුමැතිය / පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු අතර නියමිත කාලය ඉක්මවීමට පෙර එකී බලපත්‍රයේ වලංගු කාලය දීර්ග කළ යුතුය.

V. ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත ඇළ මාර්ග රක්ෂිත සීමාවන් සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශ සඳහා අදාළ රක්ෂිත සීමාවන් පවත්වා ගත යුතුය.

VI. ජල බැස යාම් හා ගංවතුර රැඳවුම් ධාරිතාවයන්ට බාධා වන කිසිම ඉදිකිරීමක් තෙත් බිමක ජලාශ්‍රිතව හෝ ජල මාර්ග වල සිදු නොකළ යුතුය. නමුත් මහා සැලසුමකට (Master Plan) හෝ නිර්මාණ උපදේශක මාර්ගෝපදේශ සැලැස්මකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ට හෝ ජල ගැලීම් වලට හා ගංවතුර ඉසිලුම් ධාරිතාවයන්ට බාධා නොවන ලෙස එම සංවර්ධන කාර්ය සිදුකිරීම සඳහා උපලේඛනයේ සඳහන් අදාළ ආයතනයන් වල පමණක් නිර්දේශය අනුමැතියන් ලබාගතයුතුය .

VII. පාරිසරික සංවේදී වටිනාකම සහිත තෙත් බිම් වල ආගන්තුක ආක්‍රමණශීලී ශාක හා සතුන් හැර වෙනත් ශාක හා සතුන් ඉවත් නොකළ යුතුය.

VIII. තෙත් බිම් කලාප වල අවසරලත් සෑම ඉදිකිරීමක්ම නියම කරන ලද ශිල්පීය ප්‍රමිතීන් සහිත හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිර්මාණය විය යුතුය.

IX. ජල රැඳවුම් ධාරිතාවය විශේෂයෙන් වැදගත් වන සෑම තෙත් බිමකම සිදු කරන අනුමත භාවිතයකදී ජල රැඳවුම් ධාරිතාව අඩුවීම සහ (අනෙකුත් බලපෑම් සිදුවන) පාරිසරික සේවාවන්ට සිදුවන බලපෑමට හිලව් වන සේ විකල්ප ස්ථාන සුදුසු ලෙස ස්ථාපනය කල යුතුය. ඒ සඳහා උපලේඛනයේ සදහන් රට අදාළ ආයතනවල පමණක් අනුමැතිය ලබාගත යුතුය. තෙත්බිම් පිරවීම සඳහා නිර්දේශ වන ඉඩම් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශ අනුව තිරසාර වැසි ජල බැස යාමේ ක්‍රම භාවිතා කල යුතුයි. තෙත්බිම් පිරවීම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය පිළිබද මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබා ගත යුතුය.

X. තෙත් බිම් තුල අනුමත සංවර්ධන කටුත්තක් කිරීමේදී සංවර්ධනකරුවන් විසින් සැලසුම් නිර්මාණ සහ අධීක්ෂණ කටයුතුට සඳහා සුදුසුකම්ලත් වෘත්තීයවේදීන්ගේ සේවය ලබා ගත යුතුය.

XI. තෙත් බිම අනුමත කාර්යයන් සඳහා යෙදවීමේදී නීත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා සුදුසු ළඟම ස්ථානයක ස්ථාන ගත කල යුතුයි.

XII. ජල මූලාශ්‍ර භාවිතා කරමින් සිදු කරන සාම්ප්‍රදායික ධීවර කටයුතු හැර, මසුන් හෝ වෙනත් ජලජ ජීවීන් ඇල්ලීමේ ක්‍රියාවලියේදී යාන්ත්‍රික බෝට්ටු, ධීවර ආම්පන්න, ඉන්ධන හෝ වෙනත් යාත්‍රා භාවිතා නොකළ යුතුය.

XIII. පැහැදිලිව හඳුනාගත හැකි භූ දර්ශන / සංස්කෘතික / පුරා විද්‍යාත්මක / ජෛව විවිධත්වය ඉහල අගයන් ඇති ප්‍රදේශ සංරක්ෂණය කල යුතුය.

XIV. මසුන් සහ අනෙකුත් ජලජ ජීවීන් අභිජනනය වන සියලු ප්‍රදේශ විශේෂයෙන් ආරක්ෂා කල යුතුය.

XV. තෙත්බිම් වල කසළ බැහැර කිරීම සඳහා අවසර නොදිය යුතුය. (ගෘහස්ථ, ආයතනික, කාර්මික, වෙළඳ, විද්‍යුත්, සහ සායනික අපද්‍රව්‍ය) තෙත්බිම් වලට අපජලය බැහැර නොකළ යුතුය. නමුත් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය සහ අනෙකුත් ආයතනවල නිර්දේශවලට යටත්ව පිරිපහදු කළ ජලය පමණක් මුදාහැරිය හැකිය.

XVI. තෙත්බිම් කලාපයන්හි සංවර්ධන කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් උපලේඛනයේ සදහන් ආයතනයන් මගින් සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේදී මෙම මාර්ගෝපදේශයන් එම බලපත්‍රවල කොන්දේසි ලෙස ඇතුලත් කල යුතු අතර එකී කොන්දේසි කඩකිරීම එකී බලපත්‍රය අවලංගු කිරීමට හෝ දඩුවම් නියම කිරීමට හේතුවනු ඇත.

XVII. වැදගත් පොදු අපර ව්‍යුහ පහසුකම් සංවර්ධන ව්‍යපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ අවස්ථාවකදී නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියට යටත්ව ඉහත කොන්දේසි ලිහිල් කළ හැක. (අවසර ඇති යටිතල පහසුකම් ව්‍යාපෘති ලෙස පුනර්ජනනීය බල ශක්ති ව්‍යාපෘති, විදුලිය සැපයුම් , ජලසැපයුම, දුරකථන, මහා මාර්ග, දුම්රිය මාර්ග, අපජල කළමනාකරණ ව්‍යාපෘති ආදිය)

XVIII. 2019 වර්ෂයේ “රජයේ ප්‍රතිපත්ති 2020” ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජනතා කේන්ද්‍රිය ආර්ථිකයක් ඇතිකිරීම යටතේ පුරන් කුඹුරු යලි අස්වැද්දීම නව වැඩ පිළිවෙලට අනුව පවතින තෙත්බිම් ඉඩම් පරිභෝජන රටාව වෙනස් විය හැකි බැවින් වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා නිර්දේශ ලබාගැනීමට පෙර උපලේඛනයේ සඳහන් ආයතනයන්හි නිර්දේශයන්ට යටත්ව යෝජිත සංවර්ධන කටයුත්ත සඳහා අනුමැතිය ලබාගත යුතුය.

සැ යු

a. තෙත්බිමක් ආශ්‍රිතව හෝ තෙත්බිමක් තුල උස්බිම් ප්‍රදේශ (Highland areas) පවතින අවස්ථාවේදී යෝජිත සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීමට පෙර සීමා මායිම් නිර්ණය කර ගැනීම සඳහා මිනුම්දෝරු සැලැස්ම (Survey Plan) සලකා බැලිය යුතුය.

b. භූ ගෝලීය පිහිටුම් පද්ධතියට අනුව ස්ථානීය පිහිටීම නිවැරදිව නිර්ණය කරගැනීමේදී පවතින දෝෂ සහගත තත්ත්වය මගහරවා ගැනීම සඳහා තෙත්බිම් කලපීකරණයට අනුව යම් තෙත්බිම් කලාපයක මායිමේ සිට ගොඩබිම දෙසට මීටර් 20 ක දුර ප්‍රමාණයක් ආසන්න තෙත්බිම් කලාපයට අයත් වන අතර එම කලාපයේ අදාළ නීති නියමතා සහ අනුමත භාවිතයන්ට යටත්ව ක්‍රියාකල යුතුය.

උපලේඛනය

01. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,
02. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
03. මධ්‍යම පරිසර අධිකාරිය,
04. නාගරික සංවර්ධන අධිකාරිය,
05. අදාළ පළාත් පාලන ආයතනය ,
06. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
07. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
08. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය,
09. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,

8.2.10.2. අනුමත භාවිතයන්

1. පවතින වගා කුඹුරු හා පුරන් කුඹුරුබිම් සහ ඊට සම්බන්ධ දෙණිය, ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ තුල ගොවිජන සංවර්ධන පනතට අනුකූල වන අනුමත භාවිතයන් සඳහා පමණක් සිදු කල හැකිය.
2. තෙත්බිම් ආශ්‍රිතව සිදු කරන කෘෂිකර්මාන්තය
3. අපි ශාක වගාවන්
4. පරිසර හිතකාමී ජලජ ජීවී වගා පොකුණු, පන් වගාව

09 වන පරිච්ඡේදය

යෝජිත මාර්ග පළල, ගොඩනැගිළි සීමා සහ රක්ෂිත

9.1. ගොඩනැගිලි සීමා සහ යෝජිත මාර්ග පළල

9.1.1. ගොඩනැගිලි සීමා හා යෝජිත මාර්ග පළල - දඹුල්ල

යොමු අංකය	මාර්ගයේ නම	දිග කි.මී.	ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට	අයිතිය
1	මහනුවර -යාපනය මාර්ගය		15	මාර්ග සංවර්ධන අධිකාරිය
2	අඹේපුස්ස - ත්‍රිකුණාමලය මාර්ගය		15	මාර්ග සංවර්ධන අධිකාරිය
3	නිශ්ශංක මාවත		15	පළාත් සභාව
4	කණ්ඩලම පාර (දඹුල්ල - බකමූණ)		15	පළාත් සභාව
5	ආර්ථික මධ්‍යස්ථාන ප්‍රවේශ මාර්ගය		15	
6	නව පාදෙණිය මාර්ගය		15	
7	A9 විකල්ප මාර්ගය		15	
8	ඇතාබැදිවැව මාර්ගය		15	
9	වැවල වැව මාර්ගය		15	
10	ඇරැවුල මාර්ගය		15	
11	ජය මාවත		15	
12	25 සිට රොටවැව දක්වා	2	7.5	ප්‍රාදේශිය සභාව
13	අලකොල වැව ගමේ පාර	2 .05	7.5	ප්‍රාදේශිය සභාව
14	කුඹුක්කදන්වල ගම පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
15	ඉහළ ඇරැව්වල ගම පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
16	රත්මල්ගහ ඇල - නිත්තවැල්ගොල්ල පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
17	කළුගලයාය පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
18	අනුපරයාය පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
19	කණ්ඩලම පල්ලිය පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
20	දේවාල පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
21	දෙමදඹය ජනපද පාර	3	7.5	ප්‍රාදේශිය සභාව
22	නයා කුඹුර ගම පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
23	ඇතාබැදි වැව -කුරියාය පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
24	කණ්ඩලම - 25 කණ්ඩලම පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
25	කලෝගහඇල ගම මැද පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
26	පුවක්අත්තාව ගම්මැද්ද පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
27	හේන්වලයාගම නාගල වැව පාර	3	7.5	ප්‍රාදේශිය සභාව
28	ගල්වැටියාව ගල්කොරිය ඉහළින් දකුණට යන පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
29	දිගම්පතහ - නිතියාකොළ ඉදිගොල්ලව පාර	3	7.5	ප්‍රාදේශිය සභාව
30	උඩවලයාගම රෙඩ්බාන ගම පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
31	හේනවලයාගම පහළ පාර	3	7.5	ප්‍රාදේශිය සභාව

යොමු අංකය	මාර්ගයේ නම	දිග කි.මී.	ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට	අයිතිය
32	ඇටවරාහේන පන්සල පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
33	මහසෙන්ගම හේන්කුලටියාය පාර	3	7.5	ප්‍රාදේශිය සභාව
34	කපුවත්ත සියඹලාවැව පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
35	උඩවලයාගම කෙළවර පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
36	ජනක මිනිපුර පාර	3	7.5	ප්‍රාදේශිය සභාව
37	පල්ලේගම වෙල මැද පාර	0.3	7.5	ප්‍රාදේශිය සභාව
38	කලෝගඇල උණ පදුරුයාය පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
39	පොහොරන් වැව 91 කණුව පාර	0.75	7.5	ප්‍රාදේශිය සභාව
40	පල්ලේගම ජනපද පාර	1.03	7.5	ප්‍රාදේශිය සභාව
41	කණ්ඩලම 40 බෝගහ ඇල පාර	0.240	7.5	ප්‍රාදේශිය සභාව
42	කණ්ඩලම 50 කොටසේ උනබටයාය පාර	1.25	7.5	ප්‍රාදේශිය සභාව
43	දඹුළුඹය ගොවිපල පාර	2.05	7.5	ප්‍රාදේශිය සභාව
44	සීගිරිමුල්ල අතුරු පාර	අඩි 2150	7.5	ප්‍රාදේශිය සභාව
45	යාපාගම කනත්ත පාර	අඩි 500	7.5	ප්‍රාදේශිය සභාව
46	කිරලැස්ස පුවක්අත්තාවල පාර	1.25	7.5	ප්‍රාදේශිය සභාව
47	වැවල වැව ගම මැද පාර	1.20	7.5	ප්‍රාදේශිය සභාව
48	වවුල් අඹේ තිත්තවැල්ගොල්ල වැව පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
49	මිරිස්ගෝනියාය හන්දියේ සිට මානතොටුපල දක්වා	0.5	7.5	ප්‍රාදේශිය සභාව
50	කලාපුරවැව කෙටුව පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
51	සළුඅපුල්ලන වැව ගම මැද පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
52	කලෝගහඇල උණ පදුරුයාය පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
53	පල්ලේගම පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
54	දඹුල්ල තලවලන්ද පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
55	වෙන්දේසිවත්ත පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
56	කළුන්දැව කෝන්ගහමුල්ල පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
57	කිරලගොල්ල බණ්ඩාරවත්ත පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
58	වැවල වැව ගෝනවල පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
59	රොටවැව අතුරු පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
60	රත්මල්කටුව සුමිත් පියසිංහ පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
61	රත්මල්කටුව සමෘද්ධි මාවත	1.05	7.5	ප්‍රාදේශිය සභාව
62	ඇටවරාහේන සේරුගස්යාය නව මාර්ගය	1	7.5	ප්‍රාදේශිය සභාව
63	උඩවලයාගම හරස් පාර	0.05	7.5	ප්‍රාදේශිය සභාව
64	ලේනදොර කුරීහේන පාර	0.05	7.5	ප්‍රාදේශිය සභාව
65	කළුන්දැව කලෝගහ ඇල පාර	1.08	7.5	ප්‍රාදේශිය සභාව

යොමු අංකය	මාර්ගයේ නම	දිග කි.මී.	ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට	අයිතිය
66	කුරුණෑගල පාර ඉන්ධික ගොඩනැගිල්ල සිට අළුත්වත්ත පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
67	අනුපරයාය ඩී 4 ඇල පාර	2.06	7.5	ප්‍රාදේශිය සභාව
68	තිත්තවැල්ගොල්ල පාර	1.25	7.5	ප්‍රාදේශිය සභාව
69	පහලවැව පාර	11.5	7.5	ප්‍රාදේශිය සභාව
70	රත්මල්ගහඇල පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
71	ජයමාවත (ප්‍රාදේශිය සභා කොටස)	4	7.5	ප්‍රාදේශිය සභාව
72	රත්මල්ගහඇල තිත්තවැල්ගොල්ල පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
73	කළුන්දැව හඳුන්ගම පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
74	කළුන්දැව ඇටමුල පාර	2.05	7.5	ප්‍රාදේශිය සභාව
75	කළුන්දැව පන්නම්පිටිය පාර	2.05	7.5	ප්‍රාදේශිය සභාව
76	කිලෝගහඇල කළුන්දැව පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
77	ගල්වැටියාව පාර	6	7.5	ප්‍රාදේශිය සභාව
78	ඇරැවිල ගම පාර	5	7.5	ප්‍රාදේශිය සභාව
79	බටුයාය පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
80	සියඹලාවැව පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
81	යාපාගම ඉදිගස්යාය පාර	5.05	7.5	ප්‍රාදේශිය සභාව
82	මහායාය පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
83	සියඹලාවැව පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
84	බුලන සියඹලාවැව පාර	3	7.5	ප්‍රාදේශිය සභාව
85	කළුගලයාය පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
86	කුඹුක්කවන්වල ගමපාර	2	7.5	ප්‍රාදේශිය සභාව
87	පල්ලේගම කොළණිය පාර	3	7.5	ප්‍රාදේශිය සභාව
88	රන්දෙණි වැව මිටියාව පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
89	පොහොරන්වැව සොහොන්පිටිය පාර	3	7.5	ප්‍රාදේශිය සභාව
90	ලේනදොර හිරිකොටුව පාර	2.05	7.5	ප්‍රාදේශිය සභාව
91	සියඹලාවැව පාර	3.05	7.5	ප්‍රාදේශිය සභාව
92	වලිගම වැව ගම මැද පාර	1	7.5	ප්‍රාදේශිය සභාව
93	ලේනව අලකොල වැව පාර	2.05	7.5	ප්‍රාදේශිය සභාව
94	වැවල අලකොල වැව පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
95	පහල ඇරැව්වල පාර	5	7.5	ප්‍රාදේශිය සභාව
96	ඇරැව්වල කන්ඩලම පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
97	38 කණුව පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
98	අමුල්අඹේ පාර	3	7.5	ප්‍රාදේශිය සභාව
99	මැනික්හේන පාර	2	7.5	ප්‍රාදේශිය සභාව

යොමු අංකය	මාර්ගයේ නම	දිග කි.මී.	ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට	අයිතිය
100	පන්නම්පිටිය කිරලගල පාර	2	7.5	ප්‍රාදේශිය සභාව
101	මැණික්ගම පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
102	දඹුළුගම ගමවට පාර	0.75	7.5	ප්‍රාදේශිය සභාව
103	පාදෙණිය පාර	අඩි 295	7.5	ප්‍රාදේශිය සභාව
104	සළුඅපුල්ලන වැව පාර	1.05	7.5	ප්‍රාදේශිය සභාව
105	දෙවන පටුමග පාර	අඩි 300	7.5	ප්‍රාදේශිය සභාව

9.1.2. ගොඩනැගිලි සීමා හා යෝජිත මාර්ග පළල - ගලේවෙල

